**275 වන කාණ්ඩය - 6 වන කලාපය**
**தொகுதி 275 - இல. 6**
**Volume 275 - No. 6**

**2020 ජනවාරි 22 වන බදාදා**
**2020 சனவரி 22, புதன்கிழமை**
**Wednesday, 22nd January, 2020**

# පාර්ලිමේන්තු විවාද
## (හැන්සාඩ්)

# பாராளுமன்ற விவாதங்கள்
## (ஹன்சாட்)

# PARLIAMENTARY DEBATES
## (HANSARD)

## නිල වාර්තාව
அதிகார அறிக்கை
OFFICIAL REPORT

(අශෝධිත පිටපත /பிழை திருத்தப்படாதது /Uncorrected)

# අන්තර්ගත ප්‍රධාන කරුණු

**නිවේදන:**
පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු (ආචාර්ය) ජයම්පති වික්‍රමරත්න මහතාගේ ඉල්ලා අස්වීම

**ආංශික අධීක්ෂණ කාරක සභා වාර්තා**

**ප්‍රශ්නවලට වාචික පිළිතුරු**

**පෞද්ගලිකව දැනුම් දීමෙන් ඇසූ ප්‍රශ්නය:**
පරිසර සමතුලිතතාව පවත්වා ගැනීම

**ගරු රාජවරෝදියම් සම්පන්දන් මහතාගේ පෞද්ගලික කරුණු පැහැදිලි කිරීම**

**ගරු තිලංග සුමතිපාල මහතාගේ පෞද්ගලික කරුණු පැහැදිලි කිරීම**

**පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභාව**

**උසස් නිලතල පිළිබඳ කාරක සභාව**

**පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභාව:**
සාමාජිකයන් නම් කිරීම

**උසස් නිලතල පිළිබඳ කාරක සභාව:**
සාමාජිකයන් නම් කිරීම

**ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන පනත:**
නියෝග

**කල් තැබීමේ යෝජනාව:**
දේශපාලන පළිගැනීම් නැවැත්වීම සහ ජනතාවට සහන සැලසීම

---

# பிரதான உள்ளடக்கம்

**அறிவிப்புக்கள்:**
பாராளுமன்ற உறுப்பினர் மாண்புமிகு (கலாநிதி) ஜயம்பதி விக்ரமரத்னவினது இராஜினாமா

**துறைசார் மேற்பார்வைக் குழு அறிக்கைகள்**

**வினாக்களுக்கு வாய்மூல விடைகள்**

**தனி அறிவித்தல் மூல வினா:**
சுற்றாடல் சமநிலையைப் பேணுதல்

**மாண்புமிகு ராஜவரோதயம் சம்பந்தனினது சொந்த விளக்கம்**

**மாண்புமிகு திலங்க சுமதிபாலவினது சொந்த விளக்கம்**

**பாராளுமன்ற அலுவல்கள் பற்றிய குழு**

**உயர் பதவிகள் பற்றிய குழு**

**பாராளுமன்ற அலுவல்கள் பற்றிய குழு:**
உறுப்பினர்கள் நியமனம்

**உயர் பதவிகள் பற்றிய குழு:**
உறுப்பினர்கள் நியமனம்

**நிர்மாணத் தொழில் அபிவிருத்திச் சட்டம்:**
ஒழுங்குவிதிகள்

**ஒத்திவைப்புப் பிரேரணை:**
அரசியல் பழிவாங்கலைத் தடுத்தலும் மக்களுக்கு நிவாரணம் வழங்குதலும்

---

# PRINCIPAL CONTENTS

ANNOUNCEMENTS:
Resignation of Hon. (Dr.) Jayampathy Wickramaratne, Member of Parliament

SECTORAL OVERSIGHT COMMITTEE REPORTS

ORAL ANSWERS TO QUESTIONS

QUESTION BY PRIVATE NOTICE:
Maintenance of Ecological Balance

PERSONAL EXPLANATION BY HON. RAJAVAROTHIAM SAMPANTHAN

PERSONAL EXPLANATION BY HON. THILANGA SUMATHIPALA

COMMITTEE ON PARLIAMENTARY BUSINESS

COMMITTEE ON HIGH POSTS

COMMITTEE ON PARLIAMENTARY BUSINESS:
Nomination of Members

COMMITTEE ON HIGH POSTS:
Nomination of Members

CONSTRUCTION INDUSTRY DEVELOPMENT ACT:
Regulations

ADJOURNMENT MOTION:
Prevention of Political Victimization and Provision of Relief to the Public

# පාර්ලිමේන්තුව
# பாராளுமன்றம்
# PARLIAMENT

***2020 ජනවාරි 22 වන බදාදා***
*2020 சனவரி 22, புதன்கிழமை*
*Wednesday, 22nd January, 2020*

**අ.භා. 1.00ට පාර්ලිමේන්තුව රැස් විය.**
**නියෝජ්‍ය කථානායකතුමා**
**[ගරු ජේ.එම්. ආනන්ද කුමාරසිරි මහතා] මූලාසනාරූඪ විය.**
பாராளுமன்றம் பி.ப.1.00 மணிக்குக் கூடியது.
பிரதிச் சபாநாயகர் அவர்கள்
[மாண்புமிகு ஜே.எம். ஆனந்த குமாரசிறி] தலைமை வகித்தார்கள்.
The Parliament met at 1.00 p.m.,
MR. DEPUTY SPEAKER
[THE HON. J.M. ANANDA KUMARASIRI] in the Chair.

## නිවේදන
## அறிவிப்புக்கள்
## ANNOUNCEMENTS

### පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු (ආචාර්ය) ජයම්පති වික්‍රමරත්න මහතාගේ ඉල්ලා අස්වීම
### பாராளுமன்ற உறுப்பினர் மாண்புமிகு (கலாநிதி) ஜயம்பதி விக்ரமரத்னவினது இராஜினாமா
### RESIGNATION OF HON. (DR.) JAYAMPATHY WICKRAMARATNE, MEMBER OF PARLIAMENT

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු (ආචාර්ය) ජයම්පති වික්‍රමරත්න මහතා සිය පාර්ලිමේන්තු මන්ත්‍රී ධුරයෙන් ඉල්ලා අස්වීමේ ලිපිය පාර්ලිමේන්තුවේ මහ ලේකම්වරයා වෙත භාර දී ඇති බව පාර්ලිමේන්තුවට දැනුම් දීමට කැමැත්තෙමි. එම ලිපිය දැන් මහ ලේකම්වරයා විසින් කියවනු ලැබේ.

***අනතුරුව පහත සඳහන් ලිපිය මහ ලේකම් විසින් කියවන ලදී:***
*அதன்பிறகு, செயலாளர் நாயகத்தினால் பின்வரும் கடிதம் வாசிக்கப்பட்டது.*
*Whereupon the Secretary-General read the following letter:*

පාර්ලිමේන්තුව
பாராளுமன்றம்
**PARLIAMENT**

13.01.2020

Secretary-General
Parliament of Sri Lanka
Battaramulla.

Dear Sir,

**Resignation in terms of Article 66 (b) of the Constitution**

I hereby resign as a Member of Parliament with effect from 20.01.2020.

I wish to thank you and your staff for the kind co-operation extended to me.

Yours truly,

(Dr) Jayampathy Wickramaratne
Member of Parliament



## ආංශික අධීක්ෂණ කාරක සභා වාර්තා
## துறைசார் மேற்பார்வைக் குழு அறிக்கைகள்
## SECTORAL OVERSIGHT COMMITTEE REPORTS

**ගරු සන්දිත් සමරසිංහ මහතා**
(மாண்புமிகு சந்தித் சமரசிங்க)
(The Hon. Sandith Samarasinghe)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, තිරසර සංවර්ධනය සහ පරිසර සහ ස්වාභාවික සම්පත් පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාවේ සභාපතිතුමිය වෙනුවෙන් මම තිරසර සංවර්ධනය සහ පරිසර සහ ස්වාභාවික සම්පත් පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව වෙත යොමු කරන ලද,

(i) (469 අධිකාරය) වනසත්ව හා වෘක්ෂලතා ආරක්ෂක ආඥාපනතේ 2(2) වගන්තිය යටතේ නියම; සහ

(ii) 2015, 2016, 2017 සහ 2018 වර්ෂ සඳහා මහවැලි සංවර්ධන හා පරිසර අමාත්‍යාංශයේ වාර්ෂික කාර්ය සාධන වාර්තා හා ගිණුම් සම්බන්ධයෙන් වූ එකී කාරක සභාවේ වාර්තාව ඉදිරිපත් කරමි.

***සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.***
*சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.*
*Ordered to lie upon the Table.*

## ප්‍රශ්නවලට වාචික පිළිතුරු
## வினாக்களுக்கு வாய்மூல விடைகள்
## ORAL ANSWERS TO QUESTIONS

### එම්එම්ඊ ලියාපදිංචිය නොමැති ඉංජිනේරුවන්: රැකියා අවදානම
### எம்.எம்.ஈ. பதிவு செய்யாத பொறியியலாளர்கள்: தொழில் பாதுகாப்பின்மை
### ENGINEERS WITHOUT MME REGISTRATION: JOB INSECURITY

3/2020

**1. ගරු බුද්ධික පතිරණ මහතා**
( மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)

නිපුණතා සංවර්ධන, රැකීරක්ෂා හා කම්කරු සබඳතා අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) කටාර් රාජ්‍යයේ නාගරික හා පාරිසරික අමාත්‍යාංශය (MME) විසින් එම රජයේ සේවය කරන සියලු ඉංජිනේරු වෘත්තීයවේදීන් එම අමාත්‍යාංශය යටතේ ලියාපදිංචි විය යුතු බවට නව රෙගුලාසි පනවා ඇති බවත්;

(ii) ලියාපදිංචි නොවන වෘත්තීයවේදීන් වසර තුනක සිර දඬුවමකට හෝ රියාල් 100,000ක දඩයකට හෝ යටත් වන බවත්;

(iii) ශ්‍රී ලංකාව ද මෙම MME අනුමතිය අධ්‍යාපන ආයතන කිහිපයකට පමණක් ලබාගෙන ඇති බවත්;

(iv) ශ්‍රී ලංකාව තුළ මෙම MME ලැයිස්තුවට ඇතුළත් කළ හැකි ආයතන තවත් ඇති බවත්;

(v) ඉන්දියාව, පිලිපීනය වැනි රටවල්වල අඩු ගුණාත්මක බවක් ඇති ආයතනද මෙම ලැයිස්තුවට ඇතුළත් කිරීම හේතුවෙන් අප රටේ වෘත්තීයවේදීන්ගේ රැකියා අවස්ථා අවදානමකට ලක්වී ඇති බවත්;

එතුමා දන්නේද?

[ගරු බුද්ධික පතිරණ මහතා]

(ආ) (i) MME ලැයිස්තුව යාවත්කාලීන කිරීමට පියවර ගෙන තිබේද;

(ii) එසේ නම්, එයට ඇතුළත් කරන ලද නව ආයතන කවරේද;

(iii) උක්ත අනුමතිය නොමැතිවීම හේතුවෙන් රැකියා අහිමි වී ඇති ශ්‍රී ලාංකික වෘත්තීයවේදීන් වෙනුවෙන් රජය ක්‍රියාමාර්ග ගෙන තිබේද;

(iv) එසේ නම්, එම ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නේද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

திறன்கள் அபிவிருத்தி, தொழில்துறை மற்றும் தொழில் உறவுகள் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) கட்டார் அரசின் நகர மற்றும் சுற்றாடல் அமைச்சு, (MME)அந்த அரசில் பணியாற்றுகின்ற அனைத்து பொறியியல் தொழில்வாண்மையாளர்களும் அந்த அமைச்சின் கீழ் பதிவு செய்து கொள்ள வேண்டுமென புதிய ஒழுங்குவிதியொன்றை விதித்துள்ளதென்பதையும்;

(ii) பதிவு செய்து கொள்ளாத தொழில்வாண் மையாளர்கள் மூன்று வருடகால சிறை தண்டனைக்கு அல்லது 100,000 றியால் தண்டப்பணத்திற்கு ஆளாவர் எனவும்;

(iii) இலங்கையும் இந்த MME அனுமதியை சில கல்வி நிறுவனங்களுக்கு மாத்திரம் பெற்றுக்கொண் டுள்ளது என்பதையும்;

(iv) இலங்கைக்குள் இந்த MME பட்டியலில் சேர்த்துக் கொள்ளக்கூடிய மேலும் சில நிறுவனங்கள் இருக்கின்றதன என்பதையும்;

(v) இந்தியா, பிலிப்பைன்ஸ் போன்ற நாடுகள் தரத்தில் குறைந்த நிறுவனங்களைக் கூட இந்த பட்டியலில் சேர்த்துக்கொண்டதால் எமது நாட்டின் தொழில்வாண்மையாளர்களின் தொழில்வாய்ப்புகளுக்கு ஆபத்து நிலைமை ஏற்பட்டுள்ளது என்பதையும்,;

அவர் அறிவாரா?

(ஆ) (i) MME பட்டியலை இற்றைப்படுத்துவதற்கு நடவடிக்கை மேற்கொள்ளப் பட்டுள்ளதா என்பதையும்;

(ii) ஆமெனில், அதற்குள் சேர்க்கப்பட்ட புதிய நிறுவனங்கள் யாவை என்பதையும்;

(iii) மேற்படி அங்கீகாரம் இல்லாததன் காரணமாக தொழில் வாய்ப்புகளை இழந்துள்ள இலங்கை தொழில்வாண்மையாளர்கள் தொடர்பாக அரசாங்கம் நடவடிக்கை மேற்கொண்டுள்ளதா என்பதையும்;

(iv) ஆமெனில், அந் நடவடிக்கைகள் யாவை என்பதையும்;

அவர் குறிப்பிடுவாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Skills Development, Employment and Labour Relations:

(a) Is he aware that-

(i) the Ministry of Municipality and Environment (MME) in Qatar has imposed new regulations that all the professional engineers working under that Government need to register under that Ministry;

(ii) the professionals who do not register will be subjected to a three-year imprisonment or a fine of 100 000 riyal;

(iii) Sri Lanka too has obtained this MME approval only for a few educational institutions;

(iv) there are more institutions in Sri Lanka which can be included in this MME list; and

(v) countries like India and the Philippines have registered institutions that are low in quality and employment opportunities of our professionals are at stake?

(b) Will he state -

(i) whether steps have been taken to update the MME list;

(ii) if so, the names of the new institutions included in the list;

(iii) whether the Government has taken any steps on behalf of the Sri Lankan professionals who have lost jobs due to the unavailability of the aforesaid approval; and

(iv) if so, the steps that have been taken?

(c) If not, why?

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා (විදේශ සබඳතා අමාත්‍ය, නිපුණතා සංවර්ධන, රැකීරක්ෂා හා කම්කරු සබඳතා අමාත්‍ය සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා)**
(மாண்புமிகு தினேஷ் குணவர்தன - வெளிநாட்டு உறவுகள் அமைச்சரும் திறன்கள் அபிவிருத்தி, தொழில்துறை மற்றும் தொழில் உறவுகள் அமைச்சரும் பாராளுமன்றச் சபை முதல்வரும்)
(The Hon. Dinesh Gunawardena - Minister of Foreign Relations, Minister of Skills Development, Employment and Labour Relations and Leader of the House of Parliament)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

(අ) (i) කටාර් රාජ්‍යයේ ඉංජිනේරු වෘත්තිකයකු වශයෙන් සේවය කරන පුද්ගලයන් පිළිබඳව නියාමන කටයුතු 2005 අංක 19 දරන එරට නීතිය යටතේ සිදු කෙරේ. 2014 අංක 2 දරන නීතිය අනුව ඉහත සඳහන් වෘත්තිකයන් එරට නාගරික හා පාරිසරික අමාත්‍යාංශය යටතේ ලියාපදිංචිය ලබා ගත යුතුය.

(ii) කටාර් රාජ්‍යයේ නාගරික හා පාරිසරික අමාත්‍යාංශය යටතේ ලියාපදිංචි නොවූ ඉංජිනේරු වෘත්තිකයකු පහත සඳහන් දඬුවම්වලට යටත් විය හැක.

(අ) විධිමත් අවවාද කිරීම.

(ආ) අදාළ වෘත්තියේ යෙදීම එක් වසරකට නොවැඩි කාලයක් සඳහා තහනම් කිරීම.

(ඇ) කටාර් රියාල් ලක්ෂයකට නොවැඩි දඩයකට යටත් කිරීම.

(iii) ශ්‍රී ලංකාවේ මොරටුව, රුහුණු හා පේරාදෙණිය විශ්වවිද්‍යාල දැනට පිළිගැනීමට ලක්ව ඇත.

(iv) ශ්‍රී ලංකාව තුළ ඉංජිනේරු උපාධි පිරිනැමෙන අනෙකුත් විශ්වවිද්‍යාල සහ ඉංජිනේරු වෘත්තිකයන් වශයෙන් ශ්‍රී ලංකාවේ වෘත්තීය ආයතන විසින් පිළිගනු ලබන සුදුසුකම් පිළිබඳව මෙම ලැයිස්තුවට ඇතුළත් කළ යුතුව ඇත.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඉතාම හොඳ ඉල්ලීමක් ගරු මන්ත්‍රීතුමාගෙන් පැමිණෙන්නේ.

(v) ඉන්දියාව, පිලිපීනය වැනි රටවල වෘත්තීයවේදීන්ගේ එම රටවල පිළිගත් වෘත්තීය සුදුසුකම පිළිබඳව කටාර්හි අදාළ රාජ්‍ය ආයතනවල ලැයිස්තුවලට ඇතුළත් කිරීම හේතුවෙන් ශ්‍රී ලංකා ඉංජිනේරු වෘත්තිකයන්ගේ රැකියාවලට දැනට බලපෑමක් සිදු වී නැත. කටාර් රාජ්‍ය තුළ ශ්‍රී ලාංකික වෘත්තිකයන්ගේ දක්ෂතා දැනට ඉහළ පිළිගැනීමකට ලක්ව ඇති බැවින් අදාළ නීතිය මේ වන තුරු සම්පූර්ණයෙන් ක්‍රියාත්මක වී නොමැත.

(ආ) (i) MME ලැයිස්තුව යාවත්කාලීන කිරීමට අවශ්‍ය තොරතුරු කටාර්හි ශ්‍රී ලාංකික ඉංජිනේරු වෘත්තිකයන්ගේ සංගමය වෙතින් එරට පිහිටි තානාපති කාර්යාලය මාර්ගයෙන් ලබාගෙන ඇති අතර, එම ලැයිස්තුව යාවත්කාලීන කිරීමට අවශ්‍ය ක්‍රියා මාර්ග ගනිමින් සිටී. 2014 අංක 33 දරන ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන පනතේ ප්‍රතිපාදන අනුව සුදුසුකම් ලත් පුද්ගලයන්ගේ ලේඛනයක් පවත්වාගෙන යෑම ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරිය වෙත පැවරී ඇති අතර, සුදුසුකම් ලත් ශ්‍රී ලාංකික ඉංජිනේරු වෘත්තිකයන්ගේ තොරතුරු එම ලැයිස්තුවට ඇතුළත් කෙරමින් පවතින බව වාර්තා වී ඇත.

ඒ අනුව ශ්‍රී ලංකාවේ ඉංජිනේරු වෘත්තීය ආයතන වන ශ්‍රී ලංකා ඉංජිනේරු ආයතනය - IESL, ශ්‍රී ලංකා ගෘහ නිර්මාණ ශිල්පීන්ගේ ආයතනය - SLIA, ශ්‍රී ලංකා මිනින්දෝරු ආයතනය - IQSSL, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව - UGC - හා ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරිය වෙතින් තොරතුරු ලබාගෙන රාජ්‍ය තාන්ත්‍රික මට්ටමෙන් කටාර් නාගරික හා පාරිසරික අමාත්‍යාංශය වෙත ඉල්ලීමක් ඉදිරිපත් කිරීමට ශ්‍රී ලංකා විදේශ සේවා නියුක්ති කාර්යාංශය හා අමාත්‍යාංශය කටයුතු කරමින් පවතී.

(ii) දැනට ඇතුළත් කර ඇත්තේ මොරටුව, පේරාදෙණිය සහ රුහුණ යන විශ්වවිද්‍යාල පමණි.

අනෙකුත් ආයතනද ඇතුළත් කිරීම සඳහා මැදිහත්වීමට බලාපොරොත්තු වේ.

(iii) අදාළ අනුමතිය නොමැතිවීමෙන් රැකියා අහිමි වූ ශ්‍රී ලාංකිකයන් පිළිබඳ මෙතෙක් වාර්තා වී නැත. කටාර් රාජ්‍ය තුළ ශ්‍රී ලාංකික වෘත්තිකයන්ගේ දක්ෂතා ඉහළ පිළිගැනීමකට ලක්ව ඇති බැවින්, අදාළ නීතිය මේ වනතුරු එලෙස ක්‍රියාත්මක වී නැත.

(iv) දැනට රැකියා අහිමිවීමක් සිදු වී ඇති බව වාර්තා වී නොමැත.

මේ ආයතන තවත් පුළුල් කිරීමට කටයුතු කරමින් සිටී.

(ඇ) අදාළ නොවේ.

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)

ගරු විදේශ සබඳතා ඇමතිතුමනි, ඉතා දීර්ඝ සහ සවිස්තර පිළිතුරක් ලබා දීම ගැන මම ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා.

ගරු ඇමතිතුමනි, අපේ නුපුහුණු සේවකයන්ගෙන් අපේ රටට සහ ඔවුන්ට ලැබෙන ප්‍රතිලාභයට වඩා, මෙවැනි පුහුණු වෘත්තිකයන් හරහා අපේ රටට ලැබෙන ඩොලර් ප්‍රමාණය වාගේම ඒ අයටත් ලැබෙන ප්‍රතිලාභ වැඩියි කියන එක ඔබතුමාත් පිළිගන්නවා ඇති. දැන් ඔබතුමා සඳහන් කළේත්, රුහුණ විශ්වවිද්‍යාලයත්, පේරාදෙණිය විශ්වවිද්‍යාලයත්, මොරටුව විශ්වවිද්‍යාලයත් ගැන විතරයි. ඇත්තටම අපේ රටේ පෞද්ගලික අධ්‍යාපන ආයතන තිබෙනවා, පෞද්ගලික තෘතීයික අධ්‍යාපන ආයතන තිබෙනවා, රජය හා බද්ධ වුණු ආයතන තිබෙනවා. මේ සියල්ල ඇතුළත් කරගත්තොත් හොඳයි. ගරු අමාත්‍යතුමනි, මේ නීතිය යටතේ ඔබතුමා කියපු විධියටම, ලංකාවේ අය ගැන තිබෙන කීර්තිය නිසා කටාර් රියාල් ලක්ෂයක දඩයක් හෝ වසර තුනක සිර දඬුවම ක්‍රියාත්මක කරන්නේ නැහැ. නමුත්, අවදානම් තත්ත්වයකයි තිබෙන්නේ. ඒ නිසා දිගු කාලීනව කල්පනා කරලා ඉතිරි ඒවාත් එම ලැයිස්තුවට ඇතුළත් කර ගන්න. ඇත්තටම පසුගිය කාලයේ අපේ ශ්‍රී ලංකා රජය පැත්තෙන් එය කරන්න මැළිකමක් තිබුණා.

වර්තමාන රජයේ ඇමතිවරයකු වන ඔබතුමාගෙන් මම ඉල්ලනවා, ඔබතුමා මේ කාරණය කෙරෙහි විශේෂ අවධානයක් යොමු කරන්න කියලා. මේ කාරණය පිළිබඳ ප්‍රශ්නය පසුගිය අවුරුදු පහක කාලය තුළදී අවස්ථා ගණනාවකදීම මම මතු කළා. එය විසඳුණේ නැති නිසා තමයි ඔබතුමාට මා මේ ප්‍රශ්නය ඉදිරිපත් කරන්නේ.

කටාර් රාජ්‍යයේ වෘත්තීයවේදීන් විධියට ශ්‍රී ලාංකිකයන් විශාල පිරිසක් ඉන්නවා. ඒ වෘත්තීයවේදීන්ට සාධාරණයක් ඉටු වෙන්න මෙවැනි ආයතන තවතවත් ඇති කිරීම ඉතා වැදගත්. ඉන්දියාව, පිලිපීනය වාගේ රටවල තිබෙන, අපේ පුංචි ටියුෂන් පන්ති වාගේ ඒවාත් ප්‍රතීතනය කරලා ඒ අවස්ථාව අරගෙන තිබෙනවා. ඒවායේ අයත් වෘත්තීයවේදීන් විධියට කටාර්හි රැකියා කරනවා. එවැනි ටියුෂන් කඩ වාගේ නොවන හොඳ ආයතන අපේ රටේ තිබෙනවා.

ගරු අමාත්‍යතුමනි, ඔබතුමා නියෝජනය කරන කැලණිවැලි මිටියාවතේ, හෝමාගම ප්‍රදේශයේ තිබෙන NSBM Green University එක ගත්තත්, NIBM එක ගත්තත්, ඒ බොහෝ ආයතනවලට අදාළව මේ කියන තත්ත්වයට ගැළපෙන විධියට අපට ඒ කටයුත්ත කරන්න පුළුවන්. ඒ නිසා ඔබතුමා මේ ගැන දැඩි අවධානයක් කඩිනමින් යොමු කරලා ලංකාව තුළ තව ආයතන ගණනාවක් ප්‍රතීතනය කරන්න අවශ්‍ය මැදිහත්වීම කරනවාද කියලා මා දැනගන්න කැමැතියි.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

ගරු මන්ත්‍රීතුමා ඉදිරිපත් කරන කාරණය ඉතාම වැදගත්. මේ විශ්වවිද්‍යාල තුනට අතිරේකව තවත් ආයතන විශාල සංඛ්‍යාවක අය ඒ රටේ රැකියා ලබාගෙන තිබෙනවා. ඒ කියන්නේ IESL එකේ, SLIA එකේ ලියා පදිංචි වෙලා විභාග කරපු අය, මිනින්දෝරු ආයතනයේ අය විශාල පිරිසක් ඒ රටේ රැකියා ලබාගෙන තිබෙනවා.

ඔබතුමා කියන කාරණාව අනුව MME ලැයිස්තුවට ඇතුළත් කළ හැකි තවත් ආයතන රාශියක් තිබෙනවා. ඒ ආයතනත් ඇතුළත් කර ගැනීමට අවශ්‍ය වැඩ කටයුතු මූලිකව ආරම්භ කරන්න දැන් උපදෙස් දීලා තිබෙනවා. එය ඉක්මන් කිරීමේ

[ගරු දිනේෂ් ගුණවර්ධන මහතා]

කටයුත්තට අපි යනවා. මම ඔබතුමා කියන දේ පිළිගන්නවා. පසුගිය ආණ්ඩුව කාලයේ මේ පිළිබඳ කිසිම පියවරක් අරගෙන නැහැ. නමුත්, කටාර් රාජ්‍ය තුළ අපේ වෘත්තිකයන්ට තිබෙන ගෞරවය සහ අපේ රටට තිබෙන ළැදියාව මත අද වනතුරු ඒ අයට කිසිම බාධාවක් කරලා නැහැ. අපි මේ සඳහා ඉක්මනින් මැදිහත්වීමට කටයුතු කරනවාය කියන ප්‍රතිඥාව ගරු මන්ත්‍රීතුමාට දෙනවා.

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මෙයයි.

කටාර් රාජ්‍යයේ සිටින වෘත්තිකයන් හුඟක් වෙලාවට පවුල් විධියට තමයි ඒ රැකියාවලට සම්බන්ධ වෙලා ඉන්නේ. ඒ අයගේ දරුවන්ට ලංකාවේ අනන්‍යතාවත් එක්ක යන්න තිබුණු ආයතනයක් තමයි, කටාර්හි ස්ටැෆර්ඩ් ශ්‍රී ලංකන් පාසල. අපේ ආණ්ඩුව කාලයේ මේ සභාවේ දී මම පලු පැළෙන කල් කිව්වා ඒ ආයතනය හා සම්බන්ධ ප්‍රශ්නය ගැන. අපේ ආණ්ඩුවෙන් පත් කරපු තානාපතිවරු දෙදෙනෙක් ඒ කාලයේ ඒ ප්‍රශ්නයට මැදිහත් වුණා. ඒ වෙලාවේදී ඔබතුමන්ලාත් අපිත් එක්ක හිට ගත්තා. මම ඒ වෙලාවේ රජය පැත්තේ නොවෙයි හිටියේ. ඒ තානාපතිවරයාට එරෙහි පැත්තේයි මා සිටියේ. ඒ හිටපු තානාපතිවරයා එක පාරක් වර්තමාන අගමැතිතුමාටත් ගෙයක් දෙනවා කියලා, එතුමාත් අමාරුවේ දාන්න ගියා. ඒ.එස්.පී. ලියනගේ එතුමාත් අමාරුවේ දැම්මා. ඊට පසුව ඒ ගෙදර තිබුණු swimming pool එකේ වැලිත් අයින් කළා. ඒ.එස්.පී. ලියනගේ යටතේ කටාර් ස්ටැෆර්ඩ් ශ්‍රී ලංකන් පාසල,- [බාධා කිරීමක්] මා හිතන්නේ, කටාර්වල තිබෙන ඒ ඉස්කෝලයට අගමැතිතුමාත් ගිහිල්ලා තිබෙනවා.

**ගරු මහින්ද රාජපක්ෂ මහතා (අග්‍රාමාත්‍යතුමා සහ මුදල්, ආර්ථික සහ ප්‍රතිපත්ති සංවර්ධන අමාත්‍ය, බුද්ධශාසන, සංස්කෘතික සහ ආගමික කටයුතු අමාත්‍ය සහ නාගරික සංවර්ධන, ජල සම්පාදන සහ නිවාස පහසුකම් අමාත්‍යතුමා)**
(மாண்புமிகு மஹிந்த ராஜபக்ஷ - பிரதம அமைச்சரும் நிதி, பொருளாதாரம் மற்றும் கொள்கை அபிவிருத்தி அமைச்சரும் புத்தசாசன, கலாசார மற்றும் சமய அலுவல்கள் அமைச்சரும் நகர அபிவிருத்தி, நீர் வழங்கல் மற்றும் வீடமைப்பு வசதிகள் அமைச்சரும்)
(The Hon. Mahinda Rajapaksa - Prime Minister, Minister of Finance, Economy and Policy Development, Minister of Buddhasasana, Cultural and Religious Affairs and Minister of Urban Development, Water Supply and Housing Facilities)

ඔව්.

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)

පක්ෂ භේදයෙන් තොරව කවුරුත් පිළිගන්නවා, එය ඉතා හොඳ මට්ටමින් පැවැති ඉස්කෝලයක් කියලා. අද වන කොට ඒ ඉස්කෝලය නැති කර දමලා. ඒ ඉස්කෝලය විනාශ කර දමලා. ඒ පවින් පැවැති අපේ ආණ්ඩුවට ගැලවෙන්න බැහැ. ඒක මම ඉතා පැහැදිලිව කියනවා. හිටපු ජනාධිපතිතුමාට මම ඒ ගැන අවස්ථා ගණනාවක දීම කිව්වා. අගමැතිතුමාත්, කිරිඇල්ල ඇමතිතුමාත්, තව බොහෝ දෙනෙකුත් ඒ කාරණයේ දී හරි පැත්තේ හිටියා. නමුත් ඒ පාසල වැනසුණා. දැන් මේ පාසල තානාපති කාර්යාලයට අරගෙනයි තිබෙන්නේ. ලෝකයේ කොහේවත් නැහැ, තානාපති කාර්යාලයක් විසින් පාලනය කරන ඉස්කෝලයක්. ලංකාවේ කොළඹ මියුසියස් විද්‍යාලය ගත්තොත් ඒක පාලනය වෙන්නේ Board එකකින්. එක්කෝ ඒ විධියට සිදු වෙන්න ඕනෑ. එහෙම නැත්නම් ඒ පාසල පවත්වාගෙන ගිය විධියට යන්න ඉඩ දෙන්න ඕනෑ. මෙහිදී විදේශ කටයුතු අමාත්‍යාංශයේ ලේකම්වරයාත්, ඒ වාගේම හිටපු සමහර නිලධාරිනුත් තානාපතිත් එක්ක එකතු වෙලා සමහර කටයුතු කළා. ඒ, තානාපති දැන් නැහැ. ඒක වෙනම දෙයක්. මම අහන්නේ මේ ප්‍රශ්නයයි. මේ ස්ටැෆර්ඩ් ශ්‍රී ලංකා පාසල පිළිබඳව ඔබේ සහ වර්තමාන රජයේ ස්ථාවරය මොකක්ද? ඒක නැවත සැරයක් තානාපති කාර්යාලයේ පාලනයෙන් ඉවත් කරනවාද? නැත්නම් ඔය විධියටම තානාපති කාර්යාලය යටතේ තියෙන්න ඉඩ දීලා වැනසෙන්න අරිනවාද?

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

ගරු මන්ත්‍රීතුමා කියපු කාරණය අපි පිළිගන්නවා. පසු ගිය ආණ්ඩු කාලයේ මේ පාසල එම තත්ත්වයට පත්වීමට ඉඩ දී බලා සිටියා. අපි එහෙම රජයක් නොවෙයි. ඒක නිසා ඔබතුමා කියන යෝජනාව පරිදි මේ පාසල යළිත් ස්වාධීන කිරීමටත්, ඒ වාගේම එයට මැදිහත් වීම සඳහා අදාළ රාජ්‍යය සමඟ සාකච්ඡා කිරීමටත් අමාත්‍යාංශය තීරණයක් ගෙන තිබෙනවා. මේ කටාර් රාජ්‍යය සක්‍රිය ලෙස අපට සහයෝගය දක්වමින් තිබෙන රටක්.

මම විශේෂයෙන් මේ කාරණය ගැනත් සඳහන් කරන්නට ඕනෑ. අසර්බයිජාන්හි මිය ගිය අපේ ශිෂ්‍යාවන්ගේ දේහ මෙරටට ගෙන්වා ගැනීම සඳහා අපේ ගරු අගමැතිතුමාගේ මැදිහත්වීම මත අසර්බයිජාන් රජයත්, ටෙහෙරාන්හි අපේ තානාපතිතුමාත් කටයුතු කිරීම නිසා කෙටි කාලයකින් එම මරණ සහතික ලබා ගෙන ඔවුන්ගේ දේහ මෙරටට ගෙනෙන්න පුළුවන් වුණා. ඒ නිසා ඔබතුමා කියන ඔය අඩු පාඩුව පිරිමැසීමට අපේ රජය විදේශ කටයුතු අමාත්‍යාංශය හරහා පියවර ගැනීමට බලාපොරොත්තු වෙන බව මම කියන්න කැමැතියි.

## ඝන අපද්‍රව්‍ය කළමනාකරණය පිළිබඳ පුහුණු වැඩසටහන්: විස්තර
## திண்மக் கழிவுப்பொருள் முகாமைத்துவப் பயிற்சி நிகழ்ச்சித்திட்டம்: விபரம்
## TRAINING PROGRAMMES ON SOLID WASTE MANAGEMNT: DETAILS

43/2020

**2. ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)

රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) 2010 වර්ෂයේ සිට මේ දක්වා ඝන අපද්‍රව්‍ය කළමනාකරණය හා සම්බන්ධ ජාත්‍යන්තර පුහුණු වැඩසටහන්වලට සහභාගි වූ, පළාත් පාලන නියෝජිතයන් සංඛ්‍යාව, එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම නියෝජිතයන්ගේ නම් හා අදාළ පළාත් පාලන ආයතන කවරේද;

(iii) එම වැඩමුළු පැවති රටවල්, නගර හා කාලසීමා වෙන් වෙන් වශයෙන් කවරේද;

(iv) මෙම එක් එක් වැඩමුළුවලට සහභාගී වීම සඳහා වැය කළ මුදල් ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(v) එම වැඩමුළුවලින් පසුව කසළ කළමනාකරණය සඳහා වැඩසටහන් දියත් කළ පළාත් පාලන ආයතන කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

பொது நிர்வாக, உள்நாட்டலுவல்கள், மாகாண சபைகள் மற்றும் உள்ளூராட்சி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) 2010 ஆம் ஆண்டு தொடக்கம் இற்றைவரை திண்மக் கழிவுப்பொருள் முகாமைத்துவத்துடன் தொடர்புடைய சர்வதேச பயிற்சி நிகழ்ச்சித் திட்டங்களில் பங்குபற்றிய உள்ளூரதிகார சபை பிரதிநிதிகளின் எண்ணிக்கை ஆண்டுவாரியாக வெவ்வேறாக எவ்வளவு;

(ii) அந்த பிரதிநிதிகளின் பெயர்கள் மற்றும் ஏற்புடைய உள்ளூரதிகார சபைகள் யாவை;

(iii) அந்த செயலமர்வுகள் நடைபெற்ற நாடுகள், நகரங்கள் மற்றும் கால எல்லைகள் வெவ்வேறாக யாவை;

(iv) இந்த ஒவ்வொரு செயலமர்விலும் பங்கேற்பதற்காக செலவிடப்பட்ட பணத்தொகை வெவ்வேறாக எவ்வளவு;

(v) மேற்படி செயலமர்வுகளின் பின்னர் குப்பைகூள முகாமைத்துவத்திற்காக நிகழ்ச்சித்திட்டங்களை அமுலாக்கிய உள்ளூரதிகார சபைகள் யாவை;

என்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Public Administration, Home Affairs, Provincial Councils and Local Government:

(a) Will he inform this House -

(i) separately on per year basis, the number of representatives of local government bodies who participated in international training programmes on solid waste management in each year from 2010 to date;

(ii) the names of the aforesaid representatives and the names of the local government bodies they belong to;

(iii) separately, the names of countries and cities where the aforesaid training programmes were held and the duration of each of those programmes;

(iv) separately the amount of money that was spent on participating in those training programmes; and

(v) the names of local government bodies which implemented programmes for solid waste management after their representatives had participated in such training programmes?

(b) If not, why?

**ගරු ලසන්ත අලගියවන්න මහතා (රාජ්‍ය කළමනාකරණ හා ගිණුම් කටයුතු රාජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு லசந்த அலகியவன்ன - அரச முகாமைத்துவ மற்றும் கணக்கீட்டு அலுவல்கள் இராஜாங்க அமைச்சர்)
(The Hon. Lasantha Alagiyawanna - State Minister of Public Management and Accounting)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුරු දෙනවා.

(අ) (i) <u>වර්ෂය</u> <u>නියෝජිත සංඛ්‍යාව</u>

2010 - 06
2011 - 11
2012 - 07
2013 - 55
2014 - 156
2015 - 73
2016 - 03
2017 - --
2018 - 15
2019 - 09 (2019 මැයි මස 31 දක්වා )

(ii) ඇමුණුම 01 හි (4) සහ (2) තීරුවල දක්වා ඇත.

(iii) ඇමුණුම 01 හි (5) සහ (6) තීරුවල දක්වා ඇත.

ඇමුණුම **සභාගත*** කරමි.

(iv)

| **අනු අංකය** | **වර්ෂය** | **පළාත** | **වැය කළ මුදල් ප්‍රමාණය (රු)** |
|---|---|---|---|
| 01 | 2010 | මධ්‍යම | 900,000.00 |
| | | බස්නාහිර | 1,807,000.00 |
| | | වයඹ | 103,293.00 |
| | | සබරගමුව | 88,000.00 |
| 02 | 2011 | සබරගමුව | 945,000.00 |
| 03 | 2012 | දකුණ | 127,582.00 |
| 04 | 2013 | මධ්‍යම | 403,568.00 |
| | | බස්නාහිර | 7,260,802.17 |
| | | සබරගමුව | 944,135.00 |
| | | ඌව | 368,290.00 |
| 05 | 2014 | මධ්‍යම | 860,000.00 |
| | | බස්නාහිර | 6,166,046.38 |
| | | වයඹ | 13,042,944.90 |
| | | දකුණ | 4,100,231.70 |
| | | සබරගමුව | 3,816,354.00 |
| | | ඌව | 550,000.00 |
| 06 | 2015 | මධ්‍යම | 12,378,023.30 |
| | | සබරගමුව | 160,000.00 |
| | | උතුරුමැද | 200,000.00 |
| 07 | 2016 | බස්නාහිර | 80,021.75 |
| | | දකුණ | 53,107.50 |
| 08 | 2018 | වයඹ | 2,113,409.95 |
| | | ඌව | 1,150,601.00 |
| | | සබරගමුව | 1,728,842.11 |
| | | දකුණ | 295,776.60 |
| 09 | 2019 | මධ්‍යම | 588,161.70 |
| | | වයඹ | 121,000.00 |
| | | සබරගමුව | 268,160.00 |

---

***** **පුස්තකාලයේ තබා ඇත.**
* *நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
* *Placed in the Library.*

[ගරු ලසන්ත අලගියවන්න මහතා]

(v) 1. දෙහිවල ගල්කිස්ස මහා නගර සභාව
2. දොම්පේ ප්‍රාදේශීය සභාව
3. මීනුවන්ගොඩ ප්‍රාදේශීය සභාව
4. අම්බලන්ගොඩ ප්‍රාදේශීය සභාව
5. කිරින්ද පුහුල්වැල්ල ප්‍රාදේශීය සභාව
6. අයගම ප්‍රාදේශීය සභාව
7. ඉඹුල්පේ ප්‍රාදේශීය සභාව
8. රත්නපුර මහා නගර සභාව
9. කලවාන ප්‍රාදේශීය සභාව
10. කුරුවිට ප්‍රාදේශීය සභාව
11. නිවිතිගල ප්‍රාදේශීය සභාව
12. පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාව
13. කහවත්ත ප්‍රාදේශීය සභාව
14. ගොඩකවෙල ප්‍රාදේශීය සභාව
15. ඇහැලියගොඩ ප්‍රාදේශීය සභාව
16. රුවන්වැල්ල ප්‍රාදේශීය සභාව
17. කතරගම ප්‍රාදේශීය සභාව
18. කුරුණෑගල මහා නගර සභාව
19. ගල්ගමුව ප්‍රාදේශීය සභාව
20. වනාතවිල්ලුව ප්‍රාදේශීය සභාව
21. පඩුවස්නුවර ප්‍රාදේශීය සභාව
22. ගඟ ඉහළ කෝරලේ ප්‍රාදේශීය සභාව
23. පාතදුම්බර ප්‍රාදේශීය සභාව
24. පස්බාගේ ප්‍රාදේශීය සභාව
25. කුණ්ඩසාලේ ප්‍රාදේශීය සභාව
26. තලවාකැලේ ලිඳුල නගර සභාව
27. කල්මුණේ මහා නගර සභාව
28. මඩකලපුව මහා නගර සභාව
29. සමන්තුරේ ප්‍රාදේශීය සභාව
30. තිරුක්කෝවිල් ප්‍රදේශීය සභාව
31. ආලෙයියඩිවෙම්බු ප්‍රාදේශීය සභාව
32. පොතුවිල් ප්‍රාදේශීය සභාව
33. කරෙයිතිවු ප්‍රාදේශීය සභාව
34. අඩ්ඩාලච්චේනයි ප්‍රාදේශීය සභාව
35. නින්දවූර් ප්‍රාදේශීය සභාව
36. අම්පාර ප්‍රාදේශීය සභාව

(ආ) අදාළ නොවේ.

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පළමු වාරයේ දීම මෙම ප්‍රශ්නයට පිළිතුරු ලබාදීම වෙනුවෙන් ගරු රාජ්‍ය ඇමතිතුමාට ස්තුතිවන්ත වෙනවා. අපි පසු පෙළේ මන්ත්‍රීවරු හැටියට ප්‍රශ්නයක් ඇහුවාම පිළිතුරු දෙන්න සමහර අවස්ථාවල කල් ගන්නවා. ඒ නිසා පිළිතුරු ලබා දීම ගැන මම ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා.

ගරු රාජ්‍ය ඇමතිතුමනි, පළාත් පාලන ආයතන පමණක් නොවෙයි, කසළ කළමනාකරණය පිළිබඳව අද පවතින ආණ්ඩුවත්, පැවැති ආණ්ඩුවත් බරපතළ විධියට මුහුණ දුන් ප්‍රශ්නයක් බව අපි දන්නවා. දැන් ඔබතුමා සඳහන් කළ ආකාරයට එම පුහුණු වැඩ සටහන් සඳහා සහභාගි වූ පිරිස වෙනුවෙන් වෙන් කරපු මුදල ගත්තාම අතිවිශාල මුදලක්.

හැබැයි, මෙම පුහුණු වැඩසටහන්වල සහභාගි වූ සංඛ්‍යාවත්, ඒ අය සඳහා වෙන් කළ මුදලත් ගත්තාම, ඒ වියදම් වූ මුදලේ ප්‍රතිලාභ අපට ලැබී නැති බව මා ඔබතුමාට කියන්න කැමැතියි. අපි විදේශ රටකට පුහුණුව සඳහා යන්නේ අපේ රට තුළ අපට කරන්න බැරි යම් දෙයක් විදේශ රටක කරන විධිය බලාගෙන ඇවිත් මේ රටේ එය ක්‍රියාත්මක කරලා එහි ප්‍රතිලාභ ලබා ගන්නයි. නමුත් මේ කිසිම දෙයක් ඵලදායි ලෙස ක්‍රියාත්මක වෙලා නැති බව මම කියනවා. අද තරුණ ප්‍රජාව රටට ආදරෙයි. ඔවුන් රටට ආදරය කරන නිසා, මේ රටේ අනාගතය උදෙසා පරිසරය රැක ගැනීම වෙනුවෙන් රජයට කරන්න බැරි දේවල්, පළාත් පාලන ආයතනවලට කරන්න බැරි දේවල් ඔවුන්ට කරන්න පුළුවන් කියන කාරණය පෙන්වා දෙනවා. නමුත් ඇති වී තිබෙන ඛේදනීය තත්ත්වය නම්, මෙපමණ මුදලක් වියදම් කරලා විදේශ රටවලට යැව්වත්, වගකිව යුතු පළාත් පාලන ආයතන විධියට මේ කාර්යභාරය කරන්න බැරිවෙලා තිබෙන එකයි. ඒ නිසා මේ කටයුතු ඵලදායි නොවනවාය කියන කාරණය හඳුනා ගෙන තිබෙනවාද? සාධනීය වශයෙන් ඒ සම්බන්ධයෙන් ගන්නා අලුත් ක්‍රියාමාර්ග මොනවාද කියලා මම ඔබතුමාගෙන් දැන ගන්න කැමැතියි.

**ගරු ලසන්ත අලගියවන්න මහතා**
(மாண்புமிகு லசந்த அலகியவன்ன)
(The Hon. Lasantha Alagiyawanna)

විශේෂයෙන්ම කැළි කසළ කළමනාකරණය පිළිබඳව විදේශ රටවලට ගොස් පුහුණුව ලබා ගෙන පැමිණියත්, එම විදේශ රටවල ක්‍රියාත්මක වෙන තාක්ෂණය පළාත් පාලන ආයතන තුළ ප්‍රායෝගිකව යොදා ගන්න පුළුවන්ද කියන එක පිළිබඳ ප්‍රශ්නයක් තිබෙනවා. ඒ නිසා මෙවැනි පුහුණුවක් ලබා ගෙන පැමිණියත් ඵලදායිතාව පිළිබඳ ප්‍රශ්නයක් තිබෙනවා. ඒ කාරණය අපි පිළිගත යුතුයි. ඒ කෙසේ වෙතත් වර්තමාන ජනාධිපතිතුමාගේ "සෞභාග්‍යයේ දැක්ම" ප්‍රතිපත්ති ප්‍රකාශනය තුළ කැළි කසළ ප්‍රශ්නයට ස්ථිරසාර විසඳුම් ලබා දීමට පොරොන්දුවක් දීලා තිබෙනවා. ඒ අනුව, ඉදිරි අවුරුදු පහ තුළදී අපේ රටේ කැළි කසළ ප්‍රශ්නයට ස්ථිරසාර විසඳුම් ලබා දීමට අනිවාර්යයෙන්ම කටයුතු කරනවා.

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)

ගරු රාජ්‍ය ඇමතිතුමනි, ඒ සඳහා හොඳම කාලය එළැඹිලා තිබෙන්නේ දැන් කියලා මම හිතනවා. මොකද, අපි දන්නවා, අපේ රටේ වැඩියෙන්ම කුණු කසළ එකතු වෙන්නේ අපේ මුළුතැන්ගෙය තුළ බව. මුළුතැන්ගෙය කියන්නේ, අපේ කුස්සිය. මේ දවස්වල අපේ පළාත්වලත් දවසකට වේලක් විතරයි ආහාර ගන්නේ. අද පවතින බඩු මිලත් එක්ක ගෙවල්වල ඉවුම් පිහුම් කටයුතු සිද්ධ වෙන්නේ නැහැ. එම නිසා බරපතළ විධියට කුණු එක් රැස් වෙන්නේ නැහැ. කුස්සියේ කුණු නැතිවා විතරක් නොවෙයි, මේ වෙනකොට වැසිකිළි පවා පිරෙන්නේ නැති තත්ත්වයක් තමයි තිබෙන්නේ. ගෘහයන් තුළ පවා දෛනිකව කුණු එකතු වෙන්නේ නැහැ. එම නිසා මේ කටයුත්ත දැන් ඉඳලා ආරම්භ කළොත්, ගරු ජනාධිපතිතුමාගේ ප්‍රතිපත්ති ප්‍රකාශය තුළ තිබෙන පරිදි, කුණු කසළ ප්‍රශ්නය ඉතා කඩිනම්ව හා සාධනීයව විසඳන්න පුළුවන්. ගෙයින් ගෙට ගිහිල්ලා, භාජන දීලා, භාජනවලට වෙන වෙනම කුණු එකතු කරන ක්‍රමවේදය ආරම්භ කරන්න හොඳම අවස්ථාව මේකයි. එම නිසා මේ වෙලාවේ රටේ පවතින තත්ත්වයත් එක්ක ඉතා සාධනීය ලෙස මේ වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කරන්න ආණ්ඩුවට පුළුවන් කියලා අපි විපක්ෂය හැටියට යෝජනා කරනවා. ඒ සඳහා ප්‍රතිපාදන වෙන් කරලා, අදාළ පළාත් පාලන ආයතනවලට දන්වලා, මේ කටයුතු ආරම්භ කිරීමට සූදානම් විය හැකිද කියන එකයි මම දෙවැනි අතුරු ප්‍රශ්නය වශයෙන් අහන්නේ.

**ගරු ලසන්ත අලගියවන්න මහතා**
(மாண்புமிகு லசந்த அலகியவன்ன)
(The Hon. Lasantha Alagiyawanna)

ගරු මන්ත්‍රීතුමනි, මේ ප්‍රශ්නයට ඔබතුමා ඉදිරිපත් කළ කරුණු අනුව විසඳුම් සොයලා හරියන්නේ නැහැ. විශේෂයෙන්ම, එළවලු ආදී අපේ රටේ ජනතාවට අත්‍යවශ්‍ය දේවල්වල මිල සෑම වර්ෂයකදීම ඉහළ පහළ ගියා. එම නිසා ඔබතුමා ඉදිරිපත් කළ කරුණු මුල් කරගෙන කැළි කසළ ප්‍රශ්නයට විසඳුම් ලබා දීම මේ වෙලාවේ ප්‍රායෝගික වෙන්නේ නැහැ. ඊට වඩා පුළුල්ව බලලා, මේ ප්‍රශ්නයට ස්ථිරසාර විසඳුම් අනිවාර්යයෙන්ම ලබා දෙන බව මම වගකීමෙන් යුතුව ප්‍රකාශ කරනවා.

**ගරු එස්.එම්. මරික්කාර් මහතා**
(மாண்புமிகு எஸ்.எம். மரிக்கார்)
(The Hon. S.M. Marikkar)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි,- [බාධා කිරීමක්]

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

බොහොම කනගාටුයි, ගරු මන්ත්‍රීතුමනි. අතුරු ප්‍රශ්න දෙකයි අහන්න පුළුවන්.

## "සේවා පියස" වැඩසටහන: විස්තර
### "சேவா பியச" நிகழ்ச்சித்திட்டம்: விபரம்
### "SEVA PIYASA" PROGRAMME: DETAILS

71/2020

3. **ගරු හේෂා විතානගේ මහතා**
(மாண்புமிகு ஹேசா விதானகே)
(The Hon. Hesha Withanage)

රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) දිවයිනේ සෑම ග්‍රාම නිලධාරී වසමක් සඳහාම "සේවා පියස" කාර්යාලයක් ඉදිකිරීමට පියවර ගෙන තිබේද;

(ii) එසේ නම්, ඒ සඳහා වෙන්කර ඇති මුදල කොපමණද;

(iii) "සේවා පියස" එක් කාර්යාලයක් ඉදිකිරීමට ඇස්තමේන්තුගත මුදල කොපමණද;

(iv) මෙම වැඩසටහන අවසන් කිරීමට සැලසුම් කර ඇති දිනය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

பொது நிர்வாக, உள்நாட்டலுவல்கள், மாகாண சபைகள் மற்றும் உள்ளூராட்சி அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) நாட்டின் ஒவ்வொரு கிராம அலுவலர் பிரிவுக்கும் "சேவா பியச" அலுவலகம் ஒன்றை நிருமாணிப்பதற்கு நடவடிக்கை மேற்கொள்ளப்பட்டுள்ளதா என்பதையும்;

(ii) ஆமெனில், அதற்கு ஒதுக்கப்பட்டுள்ள பணத்தொகை யாதென்பதையும்;

(iii) "சேவா பியச" அலுவலகமொன்றை நிருமாணிப்பதற்கு மதிப்பீடு செய்யப்பட்டுள்ள பணத்தொகை யாதென்பதையும்;

(iv) இந்நிகழ்ச்சித்திட்டத்தை நிறைவுசெய்வதற்கு திட்டமிடப்பட்டுள்ள திகதி யாதென்பதையும்;

அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

asked the Minister of Public Administration, Home Affairs, Provincial Councils and Local Government:

(a) Will he inform this House-

(i) whether action has been taken to construct a "Seva Piyasa" office for each Grama Niladhari division in the island;

(ii) if so, the amount of money allocated for that purpose;

(iii) the estimated amount of money for the construction of a single "Seva Piyasa" office; and

(iv) the date on which this programme is planned to be completed?

(b) If not, why?

**ගරු ලසන්ත අලගියවන්න මහතා**
(மாண்புமிகு லசந்த அலகியவன்ன)
(The Hon. Lasantha Alagiyawanna)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු, පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යතුමා වෙනුවෙන් මා එම ප්‍රශ්නයට පිළිතුර ලබා දෙනවා.

(අ) (i) දිවයිනේ සෑම ග්‍රාම නිලධාරී වසමකටම නිල සෙවණ කාර්යාලයක් ඉදිකිරීම සඳහා සැලසුම් කර ඇත.

(ii) 2017 වර්ෂය සඳහා - රුපියල් මිලියන 1,500

2018 වර්ෂය සඳහා - රුපියල් මිලියන 100

2019 වර්ෂය සඳහා - රුපියල් මිලියන 75

2020 වර්ෂය සඳහා - අතුරු සම්මත අය වැය මඟින් ප්‍රතිපාදන වෙන් කර දී නැත.

වෙන් කරන ලද ප්‍රතිපාදනවලින් දැනට රුපියල් මිලියන 1,278.14ක පිරිවැයක් යටතේ ඉදිකිරීම් සිදු කර ඇත.

ඒ පිළිබඳ විස්තර පහත ඇමුණුමෙහි දැක්වේ.

Ministry of Home Affairs

**Progress of Constructing New Nila Sewana Buildings 2017/2018**

Date as at : 05.12.2018

| S. No | District | | Number of Buildings Approved | Started out of approved | Physical Progress: On- going: Number of Buildings | Physical Progress: On- going: Progress | Physical Progress: Completed | Financial Progress: Total Allocation Made (Rs. Mn) | Financial Progress: Expenditure (Rs. Mn) | Financial Progress: % | Number of Offices Opened |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| 1 | Colombo | | 17 | 16 | 2 | 70% | 14 | 40.00 | 31.53 | 78.83 | 13 |
| 2 | Gampaha | | 53 | 53 | 2 | | 51 | 100.00 | 93.87 | 93.87 | 28 |
| 3 | Kalutara | | 41 | 40 | - | - | 40 | 80.00 | 78.46 | 98.08 | 1 |
| 4 | Kandy | | 70 | 70 | - | - | 70 | 130.00 | 128.72 | 99.01 | 23 |
| 5 | Matale | | 25 | 24 | - | - | 24 | 40.00 | 39.92 | 99.80 | 1 |
| 6 | Nuwaraeliya | | 20 | 20 | - | - | 20 | 36.60 | 36.60 | 100.00 | - |
| 7 | Galle | 2017 | 140 | 112 | 23 | | 89 | 238.00 | 94.12 | 39.55 | 53 |
| | | 2018 | 21 | 21 | 8 | | - | 42.00 | | 13.00 | |
| 8 | Matara | | 29 | 29 | - | - | 29 | 57.80 | 55.65 | 96.28 | - |
| 9 | Hambantota | | 20 | 20 | - | - | 20 | 40.00 | 39.94 | 99.85 | - |
| 10 | Jaffna | | 20 | 20 | - | - | 20 | 40.00 | 40.00 | 100.00 | - |
| 11 | Mannar | | 9 | 9 | - | - | 9 | 18.00 | 17.90 | 99.42 | - |
| 12 | Vavuniya | | 5 | 5 | - | - | 5 | 8.00 | 7.90 | 98.75 | - |
| 13 | Mullaitivu | | 8 | 8 | - | - | 8 | 16.00 | 15.80 | 98.76 | - |
| 14 | Kilinochchi | | 4 | 4 | - | - | 4 | 8.00 | 7.99 | 99.90 | - |
| 15 | Baticaloa | | 13 | 13 | - | - | 13 | 20.00 | 19.42 | 97.10 | - |
| 16 | Ampara | | 22 | 22 | - | - | 22 | 44.00 | 43.75 | 99.43 | - |
| 17 | Trincomalee | | 10 | 10 | - | - | 10 | 17.50 | 17.49 | 99.94 | 2 |
| 18 | Kurunegala | 2017 | 69 | 69 | - | - | 69 | 140.00 | 127.10 | 90.79 | 46 |
| | | 2018 | 3 | 3 | 2 | 80% | 1 | | | | |
| 19 | Putlam | | 24 | 24 | - | - | 24 | 46.50 | 45.92 | 98.75 | - |
| 20 | Anuradhapura | | 27 | 27 | - | - | 27 | 52.00 | 51.58 | 99.19 | 5 |
| 21 | Polonnaruwa | | 25 | 25 | - | - | 25 | 50.00 | 50.18 | 100.35 | 15 |
| 22 | Badulla | | 20 | 19 | - | - | 19 | 44.00 | 39.43 | 89.61 | 8 |
| 23 | Monaragala | | 17 | 17 | - | - | 17 | 34.00 | 33.71 | 99.15 | - |
| 24 | Ratnapura | | 30 | 30 | - | - | 30 | 60.00 | 59.61 | 99.36 | 2 |
| 25 | Kegalle | | 24 | 23 | 1 | 60% | 22 | 46.85 | 46.84 | 99.98 | 2 |
| | Total | | 766 | 733 | 38 | | 682 | 1449.25 | 1223.43 | 84.42 | 199 |

[ගරු ලසන්ත අලගියවන්න මහතා]

Ministry of Home Affairs

**Progress of Constructing New Nila Sewana Buildings in 2019**

Date as at-:20.12.2019

| S. No | District | Number of Buildings Approved | Started out of approved | Physical Progress | | Financial Progress | | |
|---|---|---|---|---|---|---|---|---|
| | | | | On- going Number of Buildings | Completed | Total Allocation Made (Rs. Mn) | Expenditure (Rs. Mn) | % |
| 1 | Colombo | 1 | 1 | 1 | - | 2.00 | 1.00 | 50.00 |
| 2 | Gampaha | 8 | 8 | 3 | 5 | 17.00 | 7.29 | 42.88 |
| 3 | Kalutara | - | - | - | - | - | - | - |
| 4 | Kandy | - | - | - | - | - | - | - |
| 5 | Matale | - | - | - | - | - | - | - |
| 6 | Nuwaraeliya | - | - | - | - | - | - | - |
| 7 | Galle | 22 | 10 | 10 | 0 | 50.00 | 0.00 | 0.00 |
| 8 | Matara | - | - | - | - | - | - | - |
| 9 | Hambantota | - | - | - | - | - | - | - |
| 10 | Jaffna | - | - | - | - | - | - | - |
| 11 | Mannar | | | | | | | #DIV/0! |
| 12 | Vavuniya | - | - | - | - | - | - | - |
| 13 | Mullaitivu | - | - | - | - | - | - | - |
| 14 | Kilinochchi | - | - | - | - | - | - | - |
| 15 | Baticaloa | - | - | - | - | - | - | - |
| 16 | Ampara | 22 | - | - | 22 | 46.71 | 46.42 | 99.38 |
| 17 | Trincomalee | - | - | - | - | - | - | - |
| 18 | Kurunegala | - | - | - | - | - | - | - |
| 19 | Putlam | - | - | - | - | - | - | - |
| 20 | Anuradhapura | 3 | - | 3 | - | 3.00 | 0.00 | 0.00 |
| 21 | Polonnaruwa(Pibide | - | - | - | 146 | - | - | - |
| 22 | Badulla | - | - | - | - | - | - | - |
| 23 | Monaragala | - | - | - | - | - | - | - |
| 24 | Ratnapura | - | - | - | - | - | - | - |
| 25 | Kegalle | - | - | - | - | - | - | - |
| | Total | 56 | 19 | 17 | 173 | 118.71 | 54.71 | 46.09 |

(iii) නිල සෙවණ කාර්යාලයක් ඉදිකිරීම සඳහා මෙම ව්‍යාපෘතිය ආරම්භයේදී ඇස්තමේන්තුගත මුදල රුපියල් මිලියන 2කි. නමුත්, වෙළඳ පොළ මිල උච්චාවචනය සැලකිල්ලට ගනිමින් 2020 වර්ෂය සඳහා නිල සෙවණ කාර්යාලයක් ඉදිකිරීමට යන පිරිවැය යාවත්කාලීන කරමින් පවතී.

(iv) දිවයින පුරා ඇති ග්‍රාම නිලධාරි වසම් තුළ නිල සෙවණ කාර්යාල ඉදිකර අවසන් කිරීම ප්‍රතිපාදන ලැබීමේ ප්‍රමාණය අනුව තීරණය වේ. එබැවින් ඉදිරි වර්ෂවලදී ප්‍රතිපාදන ලැබීම මත එය වෙනස් විය හැකි බැවින්, නිශ්චිත ලෙස අවසන් වන දිනය සඳහන් කළ නොහැකිය.

(ආ) අදාළ නොවේ.

**ගරු හේෂා විතානගේ මහතා**
(மாண்புமிகு ஹேசா விதானகே)
(The Hon. Hesha Withanage)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර ලබාදීම පිළිබඳව ගරු රාජ්‍ය අමාත්‍යතුමාට මා ස්තුතිවන්ත වෙනවා. මම මේ ප්‍රශ්නය යොමු කරලා ගොඩක් කල් වෙනවා. කෙසේ වෙතත්, වර්තමාන ආණ්ඩුවෙන් එම ප්‍රශ්නයට පිළිතුරක් ලැබුණා. මේ රටේ ග්‍රාම නිලධාරින්ට, ක්ෂේත්‍රයේ රාජකාරි කරන අනිකුත් නිලධාරින්ට ජනතාවට සේවය කිරීම සඳහා එක් ස්ථානයක් -නිල සෙවණක්- ලබා දීම හොඳ වැඩසටහනක්. හැබැයි, ඒක යථාර්ථයක් බවට පත් වෙන්න ඕනෑ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මගේ පළමුවැනි අතුරු ප්‍රශ්නය මෙයයි. මේක, මේ රටේ තිබෙන ලොකු ප්‍රශ්නයක්. අදාළ විෂය භාරව පත්වෙන ඇමතිවරයාගේ දිස්ත්‍රික්කයේ නම් නිල සෙවණ කාර්යාල ටික බිහි වෙනවා. සමහර දිස්ත්‍රික්කවල නිල සෙවණ කාර්යාල දෙකක්වත් හැදෙන්නේ නැහැ. මේ රටේ තිබෙන ග්‍රාම නිලධාරි වසම් 14,000 තුළ එකවර මෙම කාර්යාල ඉදි කරන්න නොහැකි නම්, හැම දිස්ත්‍රික්කයටම සමානව බෙදී යන විධියට මේ වැඩසටහන ක්‍රියාත්මක කරන්න බැරි ඇයි? නිල සෙවණ කාර්යාල ඉදි කරනකොට, ඒ ක්ෂේත්‍රයට අදාළව පත් වෙන ඇමතිවරයාගේ දිස්ත්‍රික්කයේ ග්‍රාම නිලධාරිවරුන්ට සහ අනෙකුත් ක්ෂේත්‍ර නිලධාරින්ට විතරද ඒ වාසනාව තිබෙන්නේ? එහෙම නොකර, මේ සඳහා මධ්‍යස්ථ, සාධාරණ ක්‍රමවේදයක් හදන්න.

මෙය අපේ ආණ්ඩුවට යොමු කරන්න තිබුණු ප්‍රශ්නයක්. වර්තමාන ආණ්ඩුවේ ඇමතිවරයාගෙන් මම අද මේ ගැන අහනවා. මේ පහසුකම ඒ අදාළ නිලධාරින් හැම කෙනාටම දෙන්න ඕනෑ. අනුරාධපුරය වැනි දිස්ත්‍රික්කවල ග්‍රාම නිලධාරිවරයාගේ සල්ලිවලින් ගෙවල්වල කාමර කුලියට අරගෙන තමයි රාජකාරි කටයුතු කරගෙන යන්නේ. අපි නියෝජනය කරන දිස්ත්‍රික්කවලත් මේ ප්‍රශ්නය තිබෙනවා. මෙය ජාතික වැඩසටහනක්. එම නිසා මම ඉල්ලීමක් කරනවා. අදාළ නිලධාරින් හැමදෙනාටම පොදුවේ මේ පහසුකම ලබා දීම සම්බන්ධයෙන් ආණ්ඩුව අඩු ගණනේ අදහසක්වත් ප්‍රකාශ කර තිබෙනවාද කියා මා දැන ගන්න කැමැතියි.

**ගරු ලසන්ත අලගියවන්න මහතා**
(மாண்புமிகு லசந்த அலகியவன்ன)
(The Hon. Lasantha Alagiyawanna)

ගරු මන්ත්‍රීතුමනි, මෙය ඉතා ඵලදායි වැඩසටහනක්. ග්‍රාම නිලධාරි වසම තුළ ප්‍රධාන නිලධාරින් හතරදෙනෙක් ඉන්නවා. මේ නිලධාරින් හතරදෙනා ස්ථාන හතරක ඉන්නේ. කෙනෙකුට අඩු ආදායම් සහතිකයක් ගන්න අවශ්‍ය වුණාම, ඉස්සර වෙලා සමෘද්ධි නිලධාරියා ළඟට යන්න ඕනෑ. එම නිලධාරියා ඔහුට සමෘද්ධි සහනාධාරය නැහැ කියලා දෙන ලිපිය අරගෙන, ඊළඟට එය සහතික කර ගන්න ග්‍රාම නිලධාරි ළඟට යන්න ඕනෑ. එම නිසා, සංකල්පයක් විධියට මේ වැඩසටහන ඉතාම වැදගත්. 2010 වසරේ සිට මේ වැඩසටහන ක්‍රියාත්මක කරගෙන ආවා. පසුගිය අවුරුදු හතර තුළත් මේ වැඩසටහන ක්‍රියාත්මක වුණා. ඔබතුමා මතු කරන ප්‍රශ්නය ඇත්ත. කෙසේ හෝ වර්තමානයේදී සෑම ග්‍රාම නිලධාරි වසමකටම නිල සෙවණ කාර්යාලයක් ප්‍රායෝගිකව ලබා දෙන්න පුළුවන්කමක් නැහැ. ඒකට හේතුවමේකයි. කොළඹ නගරය ගත්තොත්, දැන් කොළඹ නගරයේ අපට ඉඩ හොයා ගැනීම පිළිබඳ ප්‍රශ්නයක් තිබෙනවා. ඒ අනුව සෑම නගරයකම, සෑම ආසනයකම ග්‍රාම නිලධාරි වසම්වල මේ කාර්යය කරන්න පුළුවන්කමක් ලැබෙන්නේ නැහැ. නමුත් ග්‍රාම නිලධාරි වසම් සියයට 80ක් පමණ සාධාරණ ලෙස බෙදී යන ආකාරයට මේ ව්‍යාපෘතිය ඉදිරියේදී අනිවාර්යයෙන්ම ක්‍රියාත්මක කරනවා.

**ගරු හේෂා විතානගේ මහතා**
(மாண்புமிகு ஹேசா விதானகே)
(The Hon. Hesha Withanage)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මගේ දෙවැනි අතුරු ප්‍රශ්නය මෙයයි.

ආණ්ඩුව වෙනස් වෙලා මේ වනකොට මාස දෙකක් ගෙවිලා තිබෙනවා. මගේ මැතිවරණ කොට්ඨාසයට අදාළ ප්‍රශ්නයක් විධියට මා අපේ රාජ්‍ය අමාත්‍යවරයාගෙන් මේ කාරණය අහනවා. ඔබතුමා ඒකට උත්තරයක් ලබා දෙන්න. මේ වනකොට ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටු පැවැත්වීම සිද්ධ වන්නේ නැහැ. මා නියෝජනය කරන මැතිවරණ කොට්ඨාසයේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස තුනක් තිබෙනවා. ආසන සංවිධායකවරයෙකුත් නොවන, ඇමතිවරයෙකුත් නොවන, මේ ආණ්ඩුවේ කිසිම තනතුරක් දරන්නේ නැති කෙනෙකුට නාමික වශයෙන් ආසන සංවිධායකවරයා කියලා කියනවා. අපි දන්නා තරමින් එහෙම පත්වීමක් ලබා දීලා නැහැ. ප්‍රාදේශීය ලේකම්වරු හය කරගෙන, ග්‍රාම නිලධාරි මහත්වරු ඇතුළු නිලධාරින් එකතු කරගෙන, දැන් සම්බන්ධීකරණ කමිටු පවත්වනවා.

මම පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙක්. මට ඒ කමිටු සඳහා සහභාගි වීමට කිසිම ආරාධනාවක් ලැබිලා නැහැ. මා ඒ ගැන දන්නේ නැහැ. රජයේ හයිය අරගෙන මේ කටයුතු කරගෙන යනවා. එලෙස කටයුතු කිරීම කොච්චර සාධාරණද? අපි අවුරුදු හතර හමාරක් මේ රටේ ජනතාවට යහ පාලනය තුළ විනිවිදභාවයකින් වැඩ කිරීම සඳහා හොඳ පූර්වාදර්ශයන් ලබා දුන්නා. ඒ විනිවිදභාවය අද වනකොට පැත්තකට ගිහිල්ලා තිබෙනවා. අද ග්‍රාම නිලධාරි කාර්යාලය එකියා අයදුම්පත් එකතු කරන තැනක් බවට පත් වෙලා තිබෙනවා. ග්‍රාම නිලධාරි කාර්යාලයේ වාඩිවෙලා දේශපාලනඥයන්ට එහෙම කරන්න පුළුවන්ද? දැන් මේ නිල සෙවණ කාර්යාල දේශපාලන කාර්යාල බවට පත් වෙලා තිබෙනවා. ගරු අග්‍රාමාත්‍යතුමාත් මේ ගරු සභාවේ ඉන්න වෙලාවේ රාජ්‍ය ඇමතිතුමා මේ ප්‍රශ්නයට පිළිතුරක් ලබා දෙන්න කියා මා ඉල්ලා සිටිනවා. මේ තත්ත්වය නැති කරන්න ඕනෑ. මේක නරක පූර්වාදර්ශයක්. මේ වෙනුවෙන් අවශ්‍ය පියවර ගන්න ඉක්මනින් -කඩිනමින්- ක්‍රියාත්මක වෙන්න කියලා මා ඉල්ලීමක් කරනවා.

**ගරු ලසන්ත අලගියවන්න මහතා**
(மாண்புமிகு லசந்த அலகியவன்ன)
(The Hon. Lasantha Alagiyawanna)
මේ වන විට විධිමත් පරිදි සෑම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයකටම ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුවල සභාපතිවරුන් පත් කරලයි තිබෙන්නේ. එම නිසා ඒ පිළිබඳව ප්‍රායෝගිකව ගැටලුවක් ඇති වෙන්නේ නැහැ. පසුගිය රජයේ මාත් හිටියා. එම රජයේදී අපිත් සම්බන්ධීකරණ කමිටුවලට ආසන සංවිධායකවරුන් පත් කළා. නමුත් වර්තමානයේදී පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන් පමණයි සභාපතිවරු විධියට පත් කර තිබෙන්නේ. ඒක ඉතාම හොඳ ප්‍රවණතාවක්.

**ගරු හේෂා විතානගේ මහතා**
(மாண்புமிகு ஹேசா விதானகே)
(The Hon. Hesha Withanage)
ඇමතිතුමනි, අපට කැඳවීමක් නොකර සාමාජිකයන් පත් කළාය කියන්න බැහැ නේ.

**ගරු ලසන්ත අලගියවන්න මහතා**
(மாண்புமிகு லசந்த அலகியவன்ன)
(The Hon. Lasantha Alagiyawanna)
නැහැ. ප්‍රාදේශීය ලේකම්වරයා තමයි එම සම්බන්ධීකරණ කමිටුවේ සියලු ආරාධනා පත්‍ර සකස් කරන්නේ. අපි ඒ පිළිබඳව දැනුම් දීමක් කරන්නම්.

## යෝජිත මහබෙරියතැන්න ගුවන් තොටුපොළ: අපේක්ෂිත පිරිවැය
## உத்தேச மஹபேரியதென்ன விமான நிலையம்: மதிப்பிடப்பட்ட செலவு
## PROPOSED AIRPORT AT MAHABERIYATENNA: ESTIMATED COST

4/2020

**4. ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)
සංචාරක සහ ගුවන් සේවා අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය -(1) :

(අ) (i) මහනුවර දිස්ත්‍රික්කයේ, දිගන, මහබෙරියතැන්න ප්‍රදේශයේ ගුවන් තොටුපොළක් ඉදිකිරීමට පසුගිය රජය සමයේ කටයුතු කර තිබේද;

(ii) එසේ නම්, ඒ සඳහා වැය කිරීමට සැලසුම් කර තිබූ මුළු මුදල කොපමණද;

(iii) මෙම ව්‍යාපෘතිය සඳහා පවරාගෙන ඇති ඉඩම් ප්‍රමාණය අක්කර කොපමණද;

(iv) මේ වනවිට ඉදිකිරීම් කටයුතු සඳහා සහ ඉඩම් පවරා ගැනීම සඳහා වැය කර ඇති මුදල කොපමණද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) මෙම ව්‍යාපෘතිය ඉදිරියට ක්‍රියාත්මක කරන්නේද;

(ii) එසේ නම්, ඒ සඳහා වැය කිරීමට අපේක්ෂිත මුදල කොපමණද;

(iii) වැඩ අවසන් කිරීමට සැලසුම් කර ඇති දිනය කවරේද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

சுற்றுலா மற்றும் விமானச் சேவைகள் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) கண்டி மாவட்டத்தில் திகன, மஹபேரியதென்ன பிரதேசத்தில் விமான நிலையமொன்றை அமைப்பதற்கு கடந்த அரசாங்கத்தின் காலத்தில் நடவடிக்கை மேற்கொள்ளப்பட்டுள்ளதா என்பதையும்;

(ii) ஆமெனில், அதற்கு செலவிடுவதற்கு திட்டமிடப்பட்டிருந்த மொத்த பணத்தொகை யாதென்பதையும்;

(iii) இக் கருத்திட்டத்திற்கு எத்தனை ஏக்கர் காணி சுவீகரிக்கப்பட்டுள்ளது என்பதையும்;

(iv) இற்றைவரை நிர்மாணப் பணிகளுக்காக காணிகளைச் சுவீகரித்துக் கொள்ள செலவு செய்யப்பட்டுள்ள பணத்தொகை எவ்வளவு என்பதையும்;

அவர் குறிப்பிடுவாரா?

(ஆ) (i) இக்கருத்திட்டம் எதிர்வரும் காலத்தில் நடைமுறைப்படுத்தப்படுமா என்பதையும்;

(ii) ஆமெனில், அதற்கு செலவிடுவதற்கு எதிர்பார்க்கப்படுகின்ற பணத்தொகை யாதென்பதையும்;

(iii) பணிகளை நிறைவு செய்வதற்கு திட்டமிடப்பட்டுள்ள திகதி யாதென்பதையும்;

அவர் குறிப்பிடுவாரா?

(இ) இன்றேல், ஏன்?

asked the Minister of Tourism and Civil Aviation:

(a) Will he state-

(i) whether steps have been taken during the period of previous Government to construct an airport in Mahaberiyatenna, Digana in Kandy District;

(ii) if so, the amount of money expected to be spent on that;

(iii) the number of acres of land acquired for that project; and

(iv) the amount of money spent for construction work and land acquisition, as of today?

[ගරු බුද්ධික පතිරණ මහතා]

(b) Will he also state-
 (i) whether this project will be continued;
 (ii) if so, the amount of money expected to be spent on that; and
 (iii) the date of completion according to the schedule?

(c) If not, why?

**ගරු ප්‍රසන්න රණතුංග මහතා (කාර්මික අපනයන සහ ආයෝජන ප්‍රවර්ධන අමාත්‍ය සහ සංචාරක සහ ගුවන් සේවා අමාත්‍යතුමා)**
(மாண்புமிகு பிரசன்ன ரணதுங்க - கைத்தொழில் ஏற்றுமதி மற்றும் முதலீட்டு மேம்பாடு அமைச்சரும் சுற்றுலா மற்றும் விமானச்
சேவைகள் அமைச்சரும்)
(The Hon. Prasanna Ranatunga - Minister of Industrial Export and Investment Promotion and Minister of Tourism and Civil Aviation)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා එම ප්‍රශ්නයට පිළිතුර ලබා දෙනවා.

(අ) (i) සිවිල් ගුවන් සේවා අධිකාරිය සතු දත්ත අනුව ශ්‍රී ලංකා ගුවන් හමුදාවේ Y 12 ගුවන් යානයක් හැසිරවීමේ අවශ්‍යතාවට ගැළපෙන ආකාරයට මාර්ග සංවර්ධන අධිකාරිය විසින් ගුවන් තොටුපොළ සැලැස්ම සකසා එහි මූලික ඉදිකිරීම් කටයුතු 2013 වර්ෂයේ ආරම්භ කර ඇත. නැවත 2016 අය වැය යෝජනාවකට අනුව දිගන ගුවන් තොටුපොළ සිවිල් ගුවන් තොටුපොළක් ලෙස සංවර්ධනය කිරීමේ යෝජනාවත් සමඟ ඒ සඳහා අවශ්‍ය අනුමැතිය ලබා ගැනීමට ගරු ප්‍රවාහන හා සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමා ඉදිරිපත් කළ අමාත්‍ය මණ්ඩල සංදේශයකට අනුව, 2018/ අමප/1560/808/041 යටතේ අගෝස්තු 15, 2018 දින ගත් අමාත්‍ය මණ්ඩල තීරණයකට අනුව ශක්‍යතා අධ්‍යයනයක් සිදු කිරීමට තීරණය කර ඇත.

 (ii) මේ වන විට මූලික ශක්‍යතා අධ්‍යයනය සිදු කරමින් පවතින බැවින් මුදල් ප්‍රතිපාදන වෙන් කර නොමැත.

 (iii) ඉඩම් අත්කර ගැනීමේ පනතේ (460 වන පරිච්ඡේදයේ) 38 (අ) අතුරු විධානය යටතේ ගරු ඉඩම් අමාත්‍යතුමා විසින් 2014.12.22 දින අංක 1894/9 දරන විශේෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද 2014 අංක 389 දරන ආඥාවේ පළ කරන ලද දැන්වීමක් මඟින් එම ගුවන් තොටුපොළ සඳහා හඳුනාගෙන තිබූ ඉඩම්වල භුක්තිය භාර ගන්නා ලෙසට KDS/MDB/4/2/1/228 යන 2015.02.06 දාතමින් යුතු ලිපියක් මඟින් මැද දුම්බර ප්‍රාදේශීය ලේකම් විසින් මහාමාර්ග, උසස් අධ්‍යාපන හා ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යාංශ ලේකම් වෙත දන්වා ඇත. ඒ අනුව මේ සඳහා පවරාගෙන ඇති ඉඩම් ප්‍රමාණය හෙක්ටයාර 18.92ක් වුවත් මාර්ග සංවර්ධන අධිකාරියට මේ වන තෙක් පවරා නැත.

 (iv) අත්පත් කර ගැනීමට ඇස්තමේන්තුගත මුදල රුපියල් මිලියන 63.5ක් ලෙස 2018 අප්‍රේල් 22 දින ලේකම්, මහාමාර්ග, වරාය හා නාවික අමාත්‍යාංශය මඟින් ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යාංශයට දැනුම් දී තිබේ. මෙම අත්පත් කර ගැනීමේදී අදාළ ඉඩම් හිමියන්ට එම මුදල් ලැබුණේද යන්න සඳහනක් නොමැත.

(ආ) (i) විධිමත් ශක්‍යතා අධ්‍යයනයකින් පසුව ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම තීරණය වනු ඇත.

 (ii) ඒ සඳහා වියදම් වන මුළු මුදල විධිමත් ශක්‍යතා අධ්‍යයනයකින් පසුව නිගමනය වනු ඇත.

 (iii) ව්‍යාපෘතිය අවසන් කිරීමට ගතවන කාල වකවානු ඉහත (i) පිළිතුර මත රඳා පවතී.

(ඇ) අදාළ නොවේ.

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)

සංචාරක සහ ගුවන් සේවා අමාත්‍යතුමනි, පිළිතුරු ලබා දීම සම්බන්ධයෙන් මා ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා. දැන් මේ පිළිතුර අනුව හෙක්ටයාර 18කට තරමක් වැඩි ප්‍රමාණයක් රුපියල් මිලියන 63.5ක වන්දි මුදලක් ලබා දීමෙන් පවරා ගැනීමක් සිදු වෙලා තිබෙනවාය කියලා සඳහන් වෙලා තිබෙනවා. හැබැයි ඒ වන්දි මුදල අදාළ ඉඩම් හිමියන්ට ලැබුණාද, නැද්ද කියන එක පිළිබඳවත් records තබා ගැනීමක් සිදු වෙලා නැහැ. ප්‍රධාන අමාත්‍යවරයකු වශයෙන් කටයුතු කළ නිසා ඔබතුමාත් දන්නවා, සාමාන්‍යයෙන් යම් කිසි ඉඩමක් පවරා ගන්න ඕනෑ ශක්‍යතා අධ්‍යයනයක් කරලා, ඒ ඔක්කෝම කරලා බව. නමුත්, සූට් එකට ගැළපෙන්න මිනිය කැපුවා වාගේ වැඩක් මේක. මිනියට ගැළපෙන්න සූට් එක මහනවා වාගේ වැඩක් නොවෙයි මේ කරලා තිබෙන්නේ. කොහොම වුණත්, ශක්‍යතා අධ්‍යයනය පටන් ගන්න කලින් ඉඩම් පවරාගෙනත් ඉවරයි. එතකොට දැන් මේ ව්‍යාපෘතිය නිසා වැය කළ රුපියල් මිලියන 63.5 තවම පුද්ගලයන් අතට ගියේ නැත්නම්, රජය සතුව තිබෙන්න ඕනෑ. ඒ පිළිබඳව ඔබතුමා සොයා බලනවාද? ඒ වාගේම ශක්‍යතා අධ්‍යයනයෙන් පසුව මේ කටයුත්ත වඩා විධිමත්ව සිදු කරන්න. මොකද, යම් කිසි ගුවන් තොටුපොළක් මහනුවර ආශ්‍රිතව තිබීමේ වැදගත්කමක් තිබෙනවා. දිගන, මහබෙරියතැන්න ප්‍රදේශය ක්‍රීඩාව පැත්තෙන් ගත්තොත් ඉතා වැදගත්. සංචාරක කර්මාන්තය පැත්තෙන් ගත්තත් හරි වැදගත්. මහනුවර ඓතිහාසික පුරවරයක් වශයෙන් ගෙන ඒ පැත්තෙන් බැලුවත් වැදගත්. එම නිසා යම් කිසි මට්ටමක හෝ සාමාන්‍ය ගුවන් තොටුපොළක් තිබීම වැදගත් කියන සාධකය සලකා මේ සම්බන්ධයෙන් දිගු කාලීන වැඩ පිළිවෙළකට අමාත්‍යාංශය ප්‍රවිෂ්ට වෙනවාද, නැත්නම් මේ සැලැස්ම අත හැරලා දමනවාද?

**ගරු ප්‍රසන්න රණතුංග මහතා**
(மாண்புமிகு பிரசன்ன ரணதுங்க)
(The Hon. Prasanna Ranatunga)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, "(ආ)" කොටසේ ප්‍රශ්නවලට පිළිතුරු ලබා දුන්නා. මේ ගුවන් තොටුපොළ ප්‍රතිපත්තිමය වශයෙන් රජය පිළිගෙන තිබෙන නිසා ඒ වැඩ පිළිවෙළ දිගට කරගෙන යන්න පුළුවන්. මේ වනතුරු එය නවත්වන්න යෝජනා වී නැහැ.

ඉඩමක් පවරා ගැනීමේදී අදාළ අයට ගෙවීම සඳහා ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අදාළව බැංකුවක මුදල් තැන්පත් කරනවා. ඒවා වෙනත් අයකු ගත්තාය කියලා අපට කොහෙන්වත් වාර්තා වෙලා නැහැ. ඒ අමාත්‍යාංශයෙන් එවකට අවිධිමත් ලෙස මේ කටයුත්ත සිදු වී තිබෙනවාය කියන එක පැහැදිලිව තිබෙනවා. ඒ නිසා ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ පිළිබඳව ඉදිරියේදී සොයා බලා අවශ්‍ය කටයුතු කරනවා.

**ගරු බුද්ධික පතිරණ මහතා**
(மாண்புமிகு புத்திக பதிரண)
(The Hon. Buddhika Pathirana)

මගේ දෙවන අතුරු ප්‍රශ්නය.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, 2019 අප්‍රේල් 21 සිද්ධියෙන් පස්සේ ඩ්‍රෝන කැමරා මාධ්‍ය ආයතනවලට සහ මාධ්‍යයට වැදගත්, ස්වයං රැකියාවක් විධියට ඡායාරූප ශිල්පයේ යෙදෙන අයටත්

වැදගත්. ඒ වාගේම ඩ්‍රෝන කැමරා ආශ්‍රිතව වෙනම ස්වයං රැකියා ක්ෂේත්‍රයක් ඇති වෙලා තිබෙනවා. ඒ සම්බන්ධයෙන් යම් යම් සීමා කිරීම් සිද්ධ වුණා. වර්තමාන රජය බලයට පත් වීමෙන් පස්සේ ඒ ඩ්‍රෝන කැමරා සඳහා දාලා තිබුණු යම් යම් නීති රීති තරමක් දුරට ලිහිල් කර තිබෙන අතරේම, පෞද්ගලික හෙලිකොප්ටර් සමාගම්වල හෙලිකොප්ටර් යානාත් කොළඹ නගරය සහ ඒ අවට ගොඩ බස්සවන්නට අවස්ථාව ලබා දෙනවාය කියන මාධ්‍ය වාර්තා තිබුණා. එහෙම ගොඩ බස්සවපු ඡායාරූපත් මාධ්‍යයේ පළ වෙලා තිබුණා. මම හිතන්නේ සංචාරක ව්‍යාපාරය පිළිබඳව විශ්වාසය තබන රටක් විධියට අපේ රටට මේ කාරණා දෙකම වැදගත් වනවා. එක පැත්තකින්, ස්වයං රැකියා විධියට ඩ්‍රෝන කැමරා භාවිතය. අනෙක් පැත්තෙන් සැහැල්ලු ගුවන් යානා සහ හෙලිකොප්ටර් යානා කොළඹ නගරය සහ ඒ අවට ගොඩ බැස්සවීම. ඒ වාගේම, ජාතික ආරක්ෂාව පිළිබඳව විවිධ තර්ජන එල්ල වූ රටක් විධියට ආරක්ෂාව කියන එකත් වැදගත්. මේ කාරණා දෙකම අපි සමබර කරගන්න වුවමනායි. පළමුවත්, දෙවනුවත්, තෙවනුවත් ආරක්ෂාව කියන කාරණය ප්‍රමුඛතාවයේ තබා ගන්නා ගමන්ම, අනෙක් පැත්තෙන් ඩ්‍රෝන කැමරා භාවිතය ඉතා වැදගත් වනවා, සංචාරක ව්‍යාපාරයට සහ ඩ්‍රෝන කැමරා ආශ්‍රිතව රැකියා කරන අයට, මාධ්‍යය ඇතුළු සෑම ක්ෂේත්‍රයටම. මේ සම්බන්ධයෙන් මෙතෙක් ක්‍රියාත්මක වූ ප්‍රවේශයෙන් එහාට ගිහිල්ලා, වර්තමානයට ගැළපෙන පොදු වැඩපිළිවෙළක් සකස් කරන්න ඔබතුමාගේ අමාත්‍යාංශය මැදිහත්වීමක් කරන්න අපේක්ෂා කරනවාද?

**ගරු ප්‍රසන්න රණතුංග මහතා**
(மாண்புமிகு பிரசன்ன ரணதுங்க)
(The Hon. Prasanna Ranatunga)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එතුමා පැවසූ විධියට පසුගිය රජය ඩ්‍රෝන කැමරා හා හෙලිකොප්ටර් යානා පාවිච්චි කිරීම පිළිබඳව යම් රෙගුලාසි පනවා ඒවා අත්හිටුවන්න කටයුතු කළා. ඒක ඇත්ත. මේ රජය බලයට පත් වුණාට පස්සේ විශේෂයෙන්ම සංචාරක ව්‍යාපාරය හා මේ ඩ්‍රෝන කැමරා පිළිබඳව විධිමත් වැඩපිළිවෙළකට ගිහිල්ලා තිබෙනවා. මොකද, ඒවායින් යැපෙන්නන් බොහෝ දෙනෙක් ඉන්න නිසා. විවාහ උත්සවවලදී - weddingsවලදී - පින්තූර ගන්නා ඡායාරූප ශිල්පීන් මේ රෙගුලාසි නිසා විශාල අපහසුතාවලට පත් වුණා. මේ පිළිබඳව දැනුවත් කළාට පසුව වර්තමාන ජනාධිපතිතුමා මැදිහත් වෙලා ආරක්ෂක ලේකම්තුමාට උපදෙස් දීලා ඒ පිළිබඳව විධිමත් වැඩපිළිවෙළකට ගිහිල්ලා තිබෙනවා. ඒ අනුව ඒ පිළිබඳ වාර්තාවක් ලබාගෙන ඒ රෙගුලාසි ඉවත් කරන්න, තිබුණු ඒ නීති සම්බාධක ඉවත් කරන්නට කටයුතු කරලා තිබෙනවා. ඒ නිසා මේ වෙනකොට ගුවන් සේවා රෙගුලාසි අනුව හෙලිකොප්ටර් යානා හා ඩ්‍රෝන යාත්‍රා පාවිච්චි කරන්න පුළුවන් තත්ත්වයක් ඇති වෙලා තිබෙනවා. ඒ නිසා තමයි අපට කොළඹ හා ආසන්න තැන්වලට හෙලිකොප්ටර් යානා ගොඩබාන්න පුළුවන් වුණේ. පසුගිය සති කිහිපය තුළ සංචාරක ව්‍යාපාරයට සම්බන්ධ විශාල පිරිසක් නැගෙනහිර පළාතේ සංචාරක කටයුතු සඳහා පාවිච්චි කළේ හෙලිකොප්ටර් යානා. මම හිතන හැටියට සංචාරක ව්‍යාපාරය පැත්තෙන් ගත්තාම මේ රෙගුලාසි ඉවත් කිරීම අපට පහසුවක් වුණා. ඉදිරියටත් ආරක්ෂක අමාත්‍යාංශය සම්බන්ධ කරගෙන ඒ වැඩපිළිවෙළ වර්තමානයට ගැළපෙන පරිදි යාවත්කාලීන කිරීමක් සිදුවිය යුතුයි කියන එක අපිත් විශ්වාස කරනවා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

ප්‍රශ්න අංක 05, ගරු චමින්ද විජේසිරි මහතා.

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඇමතිතුමා අනතුරකට ලක් වුණාය කියනවා. නමුත් මා එතුමාගෙන් ප්‍රශ්නය අසනවා.

## කැළි කසළ කළමනාකරණය පිළිබඳ අධ්‍යයන චාරිකා: විස්තර

## கழிவு முகாமைத்துவம் பற்றிய கல்விச் சுற்றுலாக்கள்: விபரம்

## STUDY TOURS ON WASTE MANAGEMENT: DETAILS

44/2020

**5. ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)

පරිසර සහ වනජීවී සම්පත් අමාත්‍යතුමාගෙන් ඇසූ ප්‍රශ්නය - (1):

(අ) (i) කැළි කසළ සම්බන්ධව තීරණ ගන්නා, ඒ සම්බන්ධව කටයුතු කරන පරිසර හා වනජීවී සම්පත් අමාත්‍යාංශය යටතේ ඇති ආයතන කවරේද;

(ii) 2010 වසරේ සිට මේ දක්වා එම ආයතනවල නිලධාරින් කැළි කසළ සම්බන්ධව විදේශ අධ්‍යයන චාරිකාවල නිරත වී තිබේද;

(iii) එසේ නම්, එම නිලධාරින්ගේ නම්, තනතුරු හා විදේශ අධ්‍යයනවල විස්තර කවරේද;

(iv) එම එක් එක් අධ්‍යයන කටයුතු සඳහා වැය කරන ලද මුදල වෙන් වෙන් වශයෙන් කොපමණද;

(v) එකී අධ්‍යයන චාරිකාවලට සහභාගි වූ නිලධාරින්ගේ දැනුම අමාත්‍යාංශයේ කටයුතුවලට යොදාගත් ආකාරය කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නේද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

சுற்றாடல் மற்றும் வனசீவராசிகள் வளங்கள் அமைச்சரைக் கேட்ட வினா:

(அ) (i) கழிவுகள் தொடர்பான தீர்மானங்களை மேற்கொள்கின்ற, அது தொடர்பிலான நடவடிக்கைகளை மேற்கொள்கின்ற சுற்றாடல் மற்றும் வனசீவராசிகள் வளங்கள் அமைச்சின் கீழுள்ள நிறுவனங்கள் யாவை;

(ii) 2010 ஆம் ஆண்டு தொடக்கம் இற்றைவரை இந்நிறுவனங்களின் அலுவலர்கள் கழிவுகள் தொடர்பாக வெளிநாட்டு கற்கைப் பயணங்களை மேற்கொண்டுள்ளனரா;

(iii) ஆமெனில், அவ்வலுவலர்களின் பெயர்கள், பதவிகள் மற்றும் வெளிநாட்டுக் கற்கைகள் பற்றிய விபரங்கள் யாவை;

(iv) மேற்படி ஒவ்வொரு கற்கை நடவடிக் கைகளுக்கும் செலவிடப்பட்ட பணத் தொகை வெவ்வேறாக எவ்வளவு;

(v) குறிப்பிட்ட கற்கைப் பயணங்களில் கலந்து கொண்ட அலுவலர்களின் அறிவினை அமைச்சின் நடவடிக்களுக்காக பயன்படுத் தப்பட்ட முறை யாது;

என்பதை அவர் இச்சபைக்கு அறிவிப்பாரா?

(ஆ) இன்றேல், ஏன்?

[ගරු චමින්ද විජේසිරි මහතා]

asked the Minister of Environment and Wildlife Resources:

(a) Will he inform this House -

(i) the names of institutions that take decisions pertaining to garbage, handle matters pertaining to garbage and come under the purview of the Ministry of Environment and Wildlife Resources;

(ii) whether officers of these institutions have gone abroad on study tours related to the management of garbage from year 2010 up to now;

(iii) if so, the names and designations of such officers along with details of their study tours abroad;

(iv) separately, the amount of money spent on each of these educational activities; and

(v) the manner in which the knowledge gained by the officers who participated in the aforementioned study tours has been utilized for the purposes of the Ministry?

(b) If not, why?

**ගරු එස්.එම්. චන්ද්‍රසේන මහතා (පරිසර සහ වනජීවී සම්පත් අමාත්‍ය සහ ඉඩම් හා ඉඩම් සංවර්ධන අමාත්‍යතුමා)**
(மாண்புமிகு எஸ்.எம். சந்திரசேன - சுற்றாடல் மற்றும் வனசீவராசிகள் வளங்கள் அமைச்சரும் காணி மற்றும் காணி அபிவிருத்தி அமைச்சரும்)
(The Hon. S.M. Chandrasena - Minister of Environment and Wildlife Resources and Minister of Lands and Land Development)
ගරු මන්ත්‍රීතුමනි, මට නම් එහෙම කිසිම අනතුරක් නැහැ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම එම ප්‍රශ්නයට පිළිතුර ලබා දෙනවා.

(අ) (i)

1. මධ්‍යම පරිසර අධිකාරිය
2. සමුද්‍රීය පරිසර ආරක්ෂණ අධිකාරිය
3. වෙරළ සංරක්ෂණ සහ වෙරළ සම්පත් කළමනාකරණ දෙපාර්තමේන්තුව
4. ජාතික සත්වෝද්‍යාන දෙපාර්තමේන්තුව

(ii) ඔව්.

(iii) කැළි කසළ කළමනාකරණය සම්බන්ධව විදේශ අධ්‍යයන චාරිකාවල නිරත වූ පරිසර හා වනජීවී සම්පත් අමාත්‍යාංශය යටතේ ඇති ඉහත සඳහන් ආයතනවල නිලධාරින්ගේ විස්තර ඇමුණුම (01) ලෙස ඉදිරිපත් කරමි. (ඇමුණුම 01 **සභාගත*** කරමි.)

(iv) එම එක් එක් අධ්‍යයන කටයුතු සඳහා වැය කරන ලද මුදල වෙන් වෙන් වශයෙන් ඇමුණුම (01)හි සඳහන් කර ඇත.

(v) 1. විදේශ සංචාර අවසන් වීමෙන් පසු විදේශගතවූ සියලු නිලධාරින්ගෙන් සංචාරය පිළිබඳ වාර්තාවක් ලබාගෙන, එම වාර්තා අමාත්‍යාංශයට අදාළව ප්‍රතිපත්තිමය හා කළමනාකරණ තීරණ ගැනීමට හැකිවන පරිදි අමාත්‍යාංශයේ ජ්‍යෙෂ්ඨ කළමනාකරණයේ අවධානයට යොමු කරනු ලැබේ.

2. ඊට අමතරව විදේශ පුහුණු වැඩසටහන් සඳහා සහභාගි වූ නිලධාරින් කාණ්ඩ වශයෙන් වරින් වර කැඳවා ඔවුන් සහභාගි වූ පුහුණු වැඩමුළුවලදී ලබාගත් දැනුම හා අත්දැකීම් රාජකාරි කටයුතුවලදී භාවිත කරන ආකාරය පිළිබඳ සාකච්ඡාවට බඳුන් කෙරේ.

3. අපද්‍රව්‍ය කළමනාකරණය විෂයට සමගාමීව විදේශ සමුළු හා රැස්වීම් සඳහා සහභාගි වන නිලධාරින් නිරන්තරයෙන් ශ්‍රී ලංකාව හා එකඟතාවට පත්වී ඇති විදේශ සම්මුතිවලට අනුකූල වන පරිදි ශ්‍රී ලංකාව නියෝජනය කරමින් අදාළ නිර්දේශ ක්‍රියාත්මක කිරීමට තම දායකත්වය ලබා දීම සිදු කරයි.

4. කැළි කසළ කළමනාකරණයට අදාළව වගකිවයුතු ආයතන නියාමනය කිරීම හා එම ආයතනවලට අවශ්‍ය මාර්ගෝපදේශ හා මඟපෙන්වීම් ලබා දීමේ කටයුතු පිළිබඳව ක්‍රියාකාරකම්ද සිදු කරනු ලැබේ.

(ආ) පැන නොනඟී.

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
ගරු ඇමතිතුමනි, පිළිතුරු සැපයීම සම්බන්ධයෙන් ඔබතුමාට ස්තුතිවන්ත වනවා. මුහුණු පොතේ නම් තිබුණා, ඔබතුමා අනතුරකට ලක් වුණා කියලා. ඒකයි ඒ ගැන කනගාටුවෙන් ඇහුවේ. කෙසේ වෙතත් ඔබතුමා සුවදායීව සිටිනවා දැකීම පිළිබඳව සතුටුවනවා.

ගරු ඇමතිතුමනි, අපි අපේ රටේ සිදුවන වන සම්පත විනාශ කිරීම පිළිබඳව දැඩි ලෙස සාකච්ඡාවට භාජන කළ, කථා කළ කණ්ඩායමක්. පසුගිය කාලයේ විල්පත්තුව එළි කර විනාශ කළා. ඇත්තටම මේ වනකොට අපි බලාගෙන ඉන්නේත් විල්පත්තුව විනාශ කරපු කට්ටිය තමුන්නාන්සේලා විසින් කූඩුවට දමයි කියලායි.

ගරු ඇමතිතුමනි, ඇත්තටම මේ කැළි කසළ වන ලැහැබ්වලට දැමීම පිළිබඳව අපි දීර්ඝ ලෙස සාකච්ඡා කළත්, ඒවා දිනෙන් දින වැඩි වෙනවා. මම කලින් අසන ලද ප්‍රශ්නයේ අතුරු ප්‍රශ්නවලදීත් කථා කළේ මේ ගැනයි. පුහුණුවීම්වලට යනවා හැරෙන්නට, රජයේ මුදල් වියදම් කරනවා හැරෙන්නට එහි ප්‍රතිඵල ප්‍රායෝගිකව ලබා දෙන්නට අපි කොයිකාටත් නොහැකිවෙලා තිබෙනවා. ඔබතුමා ඉතා ජ්‍යෙෂ්ඨ ඇමතිවරයකු හැටියට දන්නවා, මේ කැළි කසළ වන ලැහැබ් තුළට දැමීම නිසා පරිසරය අපිරිසිදු වෙනවා වාගේම වන ජීවීන්ගේ ජීවිත විශාල ලෙස අහිමිවීමක් සිදු වෙන බව. ඒ තුළින් අපට ඒ සියලු සම්පත් අහිමිවෙන තත්ත්වයක් ඇතිවෙලා තිබෙනවා. ඔබතුමා අලුතින් පත් වූ ඇමතිවරයා හැටියට මේ කාරණා හඳුනාගෙන ඒවා නැවැත්වීම සඳහා ශක්තිමත් වැඩ පිළිවෙළක් යෝජනා කරලා තිබෙනවාද, ඒ මොනවාද කියලා සභාවට කියන්නට මෙය අවස්ථාවක් කර ගන්න.

---

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

**ගරු එස්.එම්. චන්ද්‍රසේන මහතා**
(மாண்புமிகு எஸ்.எம். சந்திரசேன)
(The Hon. S.M. Chandrasena)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පරිසර අමාත්‍යාංශයත්, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යාංශයත් ඒකාබද්ධ වැඩසටහන් කීපයක් ක්‍රියාත්මක කරනවා. විශේෂයෙන්ම පළාත් පාලන ආයතනවල විෂයයක් හැටියට තමයි කුණු කසළ ඉවත් කිරීම සිදු කෙරෙන්නේ. ඒ සඳහා මධ්‍යම පරිසර අධිකාරියෙන් යටිතල පහසුකම්, අවශ්‍ය උපකරණ ලබා දීම සහ මග පෙන්වීම ලබා දෙනවා. විශේෂයෙන්ම රටේ පරිසරය ආරක්ෂා කිරීමේදී ජනතාව බෙහෙවින් දැනුවත් වෙන්නට ඕනෑ. අපි දන්නා විධියට බොහෝ දුරට කුණු කසළ අවභාවිතය සිදුවෙන්නේ ජනතාව අතින්. එම නිසා අපි පාසල් දරුවන් සහ ස්වේච්ඡා සංවිධාන දැනුවත් කරමින් යනවා කුණු ඉවත් කිරීම සම්බන්ධව. අපි ගෙදර සිටම පරිසරය පිරිසිදු කිරීමේ කටයුත්ත ආරම්භ කරන්නට ඕනෑ, ගෙදර, ගම, නගරය ආදී වශයෙන්. ඒ සඳහා ජනතාවගේ දායකත්වය අවශ්‍ය වෙනවා. ඒ සඳහා පුහුණු වැඩසටහන් සහ අධ්‍යයන වැඩසටහන් කරන්නත් අපි ලෑස්ති කරලා තිබෙනවා. ඒ වාගේම කුණු කසළ වෙන් කිරීම සඳහා අවශ්‍ය උපකරණ ලබා දීම සහ දැනුවත් කිරීම අපි කරනවා.

කෙසේ වෙතත්, පරිසර සහ වනජීවී සම්පත් අමාත්‍යාංශය හැටියට අපි පළාත් පාලන ආයතනත් සම්බන්ධ කරගෙන මේ කටයුත්ත ඉතාම වගකීමෙන් යුක්තව කරන්නට සියලු කටයුතු සූදානම් කරලා තිබෙනවා,

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මගේ දෙවෙනි අතුරු ප්‍රශ්නය ගරු එස්.එම්. මරික්කාර් මන්ත්‍රීතුමා අහනවා.

**ගරු එස්.එම්. මරික්කාර් මහතා**
(மாண்புமிகு எஸ்.எம். மரிக்கார்)
(The Hon. S.M. Marikkar)
ගරු ඇමතිතුමනි, කිසියම් තැනක කසළ කළමනාකරණ මධ්‍යස්ථානයක් පවත්වාගෙන යනවා නම්, ඒ සඳහා මධ්‍යම පරිසර අධිකාරියේ අනුමැතිය අවශ්‍යයි. අපි දන්නවා, මීතොටමුල්ල කසළ කන්ද බලහත්කාරයෙන් පවත්වාගෙන ගියේ මධ්‍යම පරිසර අධිකාරියේ අනුමැතිය නැතිව බව. ඒ නිසා තමයි ජීවිත 32ක් අහිමි වන විධියේ ඛේදවාචකයක් සිදු වුණේ. දැන් රටේ විවිධ ස්ථානවල කැළි කසළ එකතු කරන ස්ථාන පවත්වාගෙන යනවා ප්‍රාදේශීය සභාවලින්, නගර සභාවලින් සහ මහා නගර සභාවලින්. මේවා විධිමත් නියාමනයකට ලක් කරලා, පවත්වාගෙන යන්න අනුමැතියක් දීම හෝ එහෙම නැත්නම් ඒවා වහලා දාන්න කටයුතු කිරීම අත්‍යවශ්‍යයි.

ගරු ඇමතිතුමනි, මා ඔබතුමාට මේ කාරණය මතක් කරන්න කැමැතියි. මීතොටමුල්ලේ ඉඳලා කිලෝමීටර් පහක්වත් නැති දුරකින්, කොටිකාවත්ත නගරයේ, කොටිකාවත්ත - මුල්ලේරියාව ප්‍රාදේශීය සභාව මඟින් කසළ කන්දක් පවත්වාගෙන යනවා. ඒ කසළ කන්දත් මීතොටමුල්ල කසළ කන්ද මට්ටමට එමින් පවතිනවා. එතැනට කොටිකාවත්ත - මුල්ලේරියාව ප්‍රාදේශීය සභාවේ කසළ දැම්මාට, කඩුවෙලින්, කෝට්ටෙන් සහ අරහෙන්, මෙහෙන් -හැම තැනින්ම- හොරෙන් කසළ ගෙනැල්ලා දානවා. මේ ගැන මධ්‍යම පරිසර අධිකාරියට කීප වතාවක් මම දැනුම් දීලා තිබෙනවා. නමුත්, ඒ සම්බන්ධව පියවරක් ගෙන නැහැ. අපේ ගරු ගාමිණී ලොකුගේ ඇමතිතුමාත් ගරු සභාවේ ඉන්න වෙලාවේ මම මතක් කරන්න ඕනෑ, මීතොටමුල්ල කසළ කන්ද කඩා වැටුණාම එතැන නාගරික උද්‍යානයක් හදන්න අපි කරගෙන ආ වැඩසටහන දැන් මන්දගාමී ස්වරූපයෙන් යන බව. ගරු ඇමතිතුමනි, ඔබතුමා ඒ ගැන සොයා බලන්න.

ගරු එස්.එම්. චන්ද්‍රසේන ඇමතිතුමනි, මම ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා, කොටිකාවත්ත නගරයේ කසළ ගොඩගැසීම එක්කෝ මධ්‍යම පරිසර අධිකාරියේ අනුමැතිය දීලා, එහි නියාමනය යටතේ පවත්වාගෙන යන්න ඉඩ දෙන්න. එහෙම නැත්නම්, ඒක නුසුදුසු නම් අයින් කරන්න කියලා. මොකද, ඒ නිසා මුළු නගරයම ගඳ ගහනවා. ඒකට හාමුදුරුවෝ විරුද්ධයි; ජනතාවත් විරුද්ධයි. ඒකට පියවරක් නොගෙන මධ්‍යම පරිසර අධිකාරිය කර අරිනවා.  ඔබතුමාට මේ පිළිබඳව සොයා බලන්න පුළුවන්ද?

**ගරු එස්.එම්. චන්ද්‍රසේන මහතා**
(மாண்புமிகு எஸ்.எம். சந்திரசேன)
(The Hon. S.M. Chandrasena)
විශේෂයෙන්ම නගරයකින් තව නගරයකට කුණු අරගෙන යන්න එපා කියන උපදෙස තමයි අතිගරු ගෝඨාභය රාජපක්ෂ ජනාධිපතිතුමා අපට දීලා තිබෙන්නේ. එය මේ රජයේ ප්‍රතිපත්තියක් වෙලා තිබෙනවා. නගරයක තිබෙන කුණු ඒ නගරයෙන්ම අවසන් කරන වැඩ පිළිවෙළකට අපි යනවා. ඒ සඳහා අවශ්‍ය යන්ත්‍රෝපකරණ සහ ඒ සියලු කටයුතු අපි සූදානම් කරමින් පවතිනවා. ඒ සඳහා අපට චීන රජයේ ආධාරත්, උපකාරත් ලැබෙනවා. ඔබතුමා කියපු දේට මධ්‍යම පරිසර අධිකාරියෙන් අනුමැතිය ලබා දෙන්න පුළුවන්. ඒ සඳහා අවශ්‍ය කටයුතු කරන්න පුළුවන් කියන එක මම ඔබතුමාට ප්‍රකාශ කරනවා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ප්‍රශ්න අංක 6 - 72/2020 - (1), ගරු හේෂා විතානගේ මහතා.

**ගරු හේෂා විතානගේ මහතා**
(மாண்புமிகு ஹேஷா விதானகே)
(The Hon. Hesha Withanage)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා එම ප්‍රශ්නය අහනවා.

**ගරු ජොන්ස්ටන් ප්‍රනාන්දු මහතා (මාර්ග සහ මහාමාර්ග අමාත්‍ය, වරාය හා නාවික කටයුතු අමාත්‍ය සහ ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා)**
(மாண்புமிகு ஜோன்ஸ்டன் பர்னாந்து - வீதி மற்றும் நெடுஞ்சாலைகள் அமைச்சரும் துறைமுகங்கள் மற்றும் கப்பற்றுறை அலுவல்கள் அமைச்சரும் அரசாங்கக் கட்சியின் முதற்கோலாசானும்)
(The Hon. Johnston Fernando - Minister of Roads and Highways, Minister of Ports and Shipping and Chief Government Whip)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගරු හේෂා විතානගේ මන්ත්‍රීතුමා රත්නපුර දිස්ත්‍රික්කයේ රැකියා වියුක්තිකයන් ගැනයි මෙම ප්‍රශ්නයෙන් අහලා තිබෙන්නේ. ඒ වාගේ ප්‍රශ්න ගණනාවක් තිබෙනවා. අග්‍රාමාත්‍යතුමා සහ මුදල්, ආර්ථික සහ ප්‍රතිපත්ති සංවර්ධන අමාත්‍යතුමා වෙනුවෙන් මම එම ප්‍රශ්නයට පිළිතුර දීම සඳහා මාසයක කාලයක් ඉල්ලා සිටිනවා.

*ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.*
*வினாவை மற்றொரு தினத்திற் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.*
*Question ordered to stand down.*

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 27(2) යටතේ ප්‍රශ්න. ගරු සජිත් ප්‍රේමදාස මැතිතුමා.

# පෞද්ගලිකව දැනුම් දීමෙන් ඇසූ ප්‍රශ්නය
## தனி அறிவித்தல் மூல வினா
## QUESTION BY PRIVATE NOTICE

## පරිසර සමතුලිතතාව පවත්වා ගැනීම
### சுற்றாடல் சமநிலையைப் பேணுதல்
### MAINTENANCE OF ECOLOGICAL BALANCE

**ගරු සජිත් ප්‍රේමදාස මහතා (විරුද්ධ පාර්ශ්වයේ නායකතුමා)**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ - எதிர்க்கட்சி முதல்வர்)
(The Hon. Sajith Premadasa - Leader of the Opposition)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පෙර නොවූ විරූ අන්දමින් පරිසරය පිළිබඳව දැඩි අවධානයක් යොමු කළ යුතු අවධියකට මානව වර්ගයා අවතීර්ණය වී ඇත.

තාක්ෂණයේ ශීඝ්‍ර දියුණුවත්, ජනගහනයේ වර්ධනයත් සමඟ පරිසරය සංරක්ෂණය කරගනිමින් නිසි සමතුලිතතාවක් පවත්වාගෙන යෑම සැබෑම අභියෝගයක් බවට පත්ව ඇත. සීමිත ස්වාභාවික සම්පත් අසීමිතව පරිහරණය නිසා අත් දැකීමට සිදුව ඇති ඉරණම ඉතා ඛේදජනකය. ඉදිරියේදී මෙම තත්ත්වය වඩ වඩාත් තීව්‍රවීමක් අපේක්ෂා කළ හැකිය.

මේ ගත වන මොහොතේ ද ඕස්ට්‍රේලියාව දැවෙමින් පවතී. ආක්ටික් ග්ලැසියර දිය වෙමින් සාගර ජල මට්ටම ඉහළ යමින් පවතී. වායු ගුණාත්මකභාවය පහළ යෑම, දීර්ඝ කාලීන නියං තත්ත්ව ඇතිවීම, අධික වැසි තත්ත්ව නිරන්තරයෙන් ඇතිවීම ආදි දීර්ඝ කාලීන දේශගුණික වෙනස්වීම්වල පූර්ව ලක්ෂණ අප රටේ ද නිරීක්ෂණය වෙමින් පවතී. පරිසරයේ සමතුලිතතාව පවත්වා ගෙන යෑම සඳහා වනාන්තර මෙන්ම වන ජීවීන් ද, ඔවුන්ගේ වාසස්ථාන ද ආරක්ෂා කිරීම කළ යුතුව පවතී.

මෙම කරුණු අනුව පැහැදිලි වන්නේ පරිසරයේ සමතුලිතතාව පවත්වා ගෙන යෑම කෙරෙහි රජයේ මෙන්ම මහ ජනතාවගේ දැඩි අවධානය යොමු විය යුතු බවයි. මෙම තත්ත්වය යටතේ පහත කරුණු සම්බන්ධයෙන් රජයේ පිළිතුරු හා පැහැදිලි කිරීම් බලාපොරොත්තු වෙමි.

1. 2019 වර්ෂයේ මිනිස් මරණ 120ක් පමණ ද, වන අලි මරණ 400ක් පමණ ද සිදුවීමට හේතු වූ, එමෙන්ම විශාල වශයෙන් භෝග වගාව මෙන්ම දේපළ හානි සිදුවීමට හේතු වූ අලි-මිනිස් ගැටුම වර්තමානයේ ඉතා බරපතළ සමාජ ආර්ථික ප්‍රශ්නයක් බවට පත්ව ඇත. මෙම අලි-මිනිස් ගැටුම කළමනාකරණය සඳහා රජය සතුව විධිමත් වැඩ පිළිවෙළක් තිබේද? එම වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කරනු ලබන කාල රාමුව පිළිබඳව මෙම ගරු සභාව දැනුවත් කරන්නේද? එසේම වඳුරන්, ඌරන් සහ මොනරුන් ආදි වන සතුන් හේතුවෙන් සිදු වන වගා හානි අවම කිරීමට යම් පියවරක් රජය විසින් ගනු ලැබ තිබේද? ඒ වාගේම දේපළ හානිවලට, නිවාස හානිවලට හා වගා හානිවලට ගන්නා වූ ක්‍රියා මාර්ග, එම වන්දි ලබා දෙන ක්‍රමවේද සහ වන්දි ප්‍රමාණය පිළිබඳවත් මේ ගරු සභාව දැනුවත් කරන්න කියන ඉල්ලීම මා ගරු ඇමතිතුමාගෙන් කරනවා.

2. පසුගිය සමයේ දිවයිනේ විවිධ ප්‍රදේශවලින් වාර්තා වූ වන අලි ඝාතනය කිරීමේ සිද්ධි පිළිබඳව රජය විසින් විධිමත් පරීක්ෂණයක් ආරම්භ කොට තිබේද? එසේ නම් එම විමර්ශනවල ප්‍රගතිය වාර්තා කරන්නේද?

   ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පසුගිය ජනාධිපතිවරණ සමයේත් එක අවස්ථාවක වන අලි රංචුවක මරණ හතක් සිදුවීම තුළ විවිධ පුද්ගලයන්, විවිධ කරුණු කාරණා කේන්ද්‍ර කරගෙන එම වන අලි ඝාතන සිදු වුණාය කියලා එක එක චෝදනාත් එල්ල කළා. ඒවා සම්බන්ධයෙන් විධිමත් විමර්ශනයක් කරලා, එම විමර්ශනයෙහි ප්‍රගතිය මේ උත්තරීතර සභාවට වාර්තා කරන්නේ ද කියන ප්‍රශ්නය මම එතුමාගෙන් අහන්නට කැමැතියි.

3. දැනට වඳ වී යෑමේ තර්ජනයට මුහුණ පා සිටින, *Panthera pardus kotiya* යන විද්‍යාත්මක නාමයෙන් හඳුන්වන ශ්‍රී ලංකා දිවියන්ගේ මුළු ගහණය 1,000ක් පමණ වන බවට දළ වශයෙන් විවිධ විශේෂඥයන් ගණන් බලා තිබෙනවා. නමුත්, නිශ්චිත වශයෙන් ජීවත්ව සිටින දිවියන් සංඛ්‍යාව පිළිබඳව නිවැරැදි ගණන් බැලීමක් සිදු වෙලා නැහැ. 2020 වර්ෂයේ පළමු දින 10 තුළදී දිවියන් මරා දැමීමේ සිද්ධි දෙකක් වාර්තා වුණා. 2019 දෙසැම්බර් මස 31 වෙනි දින උඩවලව ජාතික වනෝද්‍යානයට යාබද ස්ථානයකදී දිවියෙකු වෙඩි තබා මරා දමා, දත් ගලවා දමා, ඉදිරි පාද ද කපා තිබෙනු වාර්තා වුණා. මෙවැනි තත්ත්වයක් යටතේ සංවිධානාත්මක පිරිසක් විසින් සත්ව කොටස් වෙළෙඳාමක් සිදු කරමින් යන බවට සැක සංකා පහළ වෙලා තිබෙනවා. මේ තත්ත්වය වළක්වාලමින්, ශ්‍රී ලංකාවේ වනජීවී සම්පතක් වන දිවියා ආරක්ෂා කර ගැනීමට රජය විසින් ගන්නා වූ ක්‍රියා මාර්ග මොනවාද?

4. ශ්‍රී ලංකාවට ආවේණික බොහෝ සත්ව විශේෂ, බොහෝ කුඩා සත්ව විශේෂ වේ. ඔවුන් වඳ වී ගියහොත් සමස්ත ලෝකයෙන්ම එම සත්ව විශේෂ වඳ වී යෑමක් සිදු වනු ඇත. විශේෂයෙන්ම තෙත් කලාපය තුළ ශ්‍රී ලංකාවට ආවේණික සත්ත්ව විශේෂ බොහොමයක් හමු වෙලා තිබෙනවා. තෙත් කලාපය තුළ විශාල වශයෙන් වනාන්තර ඛණ්ඩනය වීමත්, වාසස්ථාන විනාශ වීමත් දක්නට ලැබෙන අතර, එම හේතුවෙන් ජෛව පද්ධතිය බිඳ වැටීමේ අවදානමක් ඉස්මතු වෙලා තිබෙනවා. මෙම තර්ජනය අවම කිරීම සඳහා දැනට ලංකාවේ තෙත් කලාපය තුළ තිබෙන තෙත් බිම් ආරක්ෂා කර ගත යුතුව තිබෙනවා. මේ තෙත් බිම් ආරක්ෂා කිරීම සඳහා රජය විසින් ගන්නා වූ ක්‍රියා මාර්ග මොනවාද?

5. තෙත් බිම් මෙන්ම ශ්‍රී ලංකාවේ සාගර කලාපය ද ජෛව විවිධත්වයෙන් අනූන, පාරිසරික වශයෙන් ඉතා වැදගත් කලාප වන අතර, සමුද්‍රීය අභයභූමි ප්‍රකාශයට පත් කොට, සමුද්‍ර සම්පත් සංරක්ෂණය කිරීම හා ආරක්ෂා කිරීම සඳහා කටයුතු කළ යුතුව පවතී. මේ සඳහා යම් ක්‍රියාකාරී සැලැස්මක් රජය සතුව පවතී ද?

6. ශ්‍රී ලංකාවේ වනජීවී සම්පත ආරක්ෂා කිරීම සඳහා වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව සුවිශාල කාර්යභාරයක් ඉටු කරනු ලබයි. නමුත් නිසි පරිදි එම දෙපාර්තමේන්තුවේ කටයුතු පවත්වා ගෙන යෑම සඳහා එම දෙපාර්තමේන්තුව තවදුරටත් ශක්තිමත් කළ යුතු වේ. ඒ සඳහා රජය විසින් ගනු ලබන ක්‍රියා මාර්ග මොනවාද? එමෙන්ම, රුපියල් 700ක දෛනික වැටුපට වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවට සේවයක් ලබා දෙන ස්වේච්ඡා නියාමකයන් 343 දෙනා වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවට ස්ථිර පදනමින් බඳවා ගැනීමට රජය කටයුතු කරන්නේද?

මා ගරු අමාත්‍යතුමාට අවසාන වශයෙන් සඳහන් කරන්න කැමතියි, 2014 වසරේදීත්, එවකට ගරු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමා චක්‍රලේඛයක් හරහා මේ වාගේ ස්වේච්ඡාවෙන් වැඩ කටයුතු කරපු වනජීවී නිලධාරින් ස්ථිර රාජ්‍ය සේවයට බඳවා ගත් බව. ගරු ඇමතිතුමනි, ඒ කටයුත්තම මේ නිලධාරින්තුමන්ලා වෙනුවෙනුත් ඉෂ්ට කරන්න කියලා මම බොහොම කරුණාවෙන් ඔබතුමන්ගෙන් ඉල්ලීමක් කරනවා. ඒ වාගේම, මම ඉදිරිපත් කරපු ප්‍රශ්නයට ඔබතුමාගෙන් පිළිතුරක් බලාපොරොත්තු වෙනවා. බොහොම ස්තුතියි.

**ගරු එස්.එම්. චන්ද්‍රසේන මහතා**
(மாண்புமிகு எஸ்.எம். சந்திரசேன)
(The Hon. S.M. Chandrasena)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එතුමා අසන ලද ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

1. ඔව්.

**වන අලි-මිනිස් ගැටුම වැඩි වීමට බලපා ඇති හේතු:**

වන අලි ගැවසෙන විසුම් ප්‍රදේශයවල ඉඩම්වලට වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තු රක්ෂිත ද, වන සංරක්ෂණ දෙපාර්තමේන්තු රක්ෂිත හා මහවැලි රක්ෂිත ද අයත් වන අතර මහවැලි හා වන සංරක්ෂණ රක්ෂිත තුළ ඉඩම් පරිහරණ රටාවේ ශීඝ්‍ර වෙනසක් සිදු වීම නිසා වන අලින්ට හිමි විය යුතු වාසභූමි අහිමි වීම මෙම ගැටලුවට මූලිකවම බලපා ඇත.

තවද, වන සංරක්ෂණ හා මහවැලි රක්ෂිත තුළ මහා පරිමාණයේ පශු සංවර්ධන ව්‍යාපෘති හා වාණිජ මට්ටමේ කෘෂි ව්‍යාපෘති ක්‍රියාත්මක වීම නිසා වන අලින්ගේ භාවිතයට ගැනීමට තිබූ තෘණ භූමි අහිමි වීමත්, වන අලින්ගේ ස්වාභාවික චර්යාවන්ට බාධා සිදුවීමත් හේතුවෙන් නිරන්තරයෙන් වන අලි ගම් වැදීම සිදුවී ඇත.

2019 වසරේ සිදුවී ඇති වන අලි මරණ සම්බන්ධයෙන් විශ්ලේෂණය කිරීමේදී අලි-මිනිස් ගැටුමට හේතු වූ කාරණය මුල් කර ගනිමින් සිදු වී ඇති මරණ සංඛ්‍යාව 205ක් වන අතර, ස්වාභාවික හා අලි-මිනිස් ගැටුමට අදාළ නොවන හේතු මත සිදු වී ඇති මරණ සංඛ්‍යාව 195ක් වශයෙන් විශ්ලේෂණය කළ හැක. 2019 සිදුවී ඇති මිනිස් මරණ සම්බන්ධයෙන් ගැඹුරින් විශ්ලේෂණය කිරීමේ දී මිනිස් මරණවලින් සියයට 75ක පමණ ප්‍රමාණයකට හේතුව මිනිසුන්ගේ පවතින නොසැලකිල්ල බව අනාවරණ විය. මෙම මරණවලට පාදක වූ කරුණු සලකා බැලීමේ දී වන අලින් ගැවසෙන ප්‍රදේශවල බීමතින් රාත්‍රී කාලයේ ගමන් කිරීම, කිසිදු ආරක්ෂක උපක්‍රමයක් නොමැතිව රාත්‍රී කාලයේ වන අලින් ගැවසෙන ප්‍රදේශවල ගමන් කිරීම ආදී කරුණු හේතු වී ඇත.

1.2 අලි - මිනිස් ගැටුම අවම කිරීම සඳහා දෙපාර්තමේන්තුව මඟින් පහත සඳහන් විධිමත් වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කිරීමට කටයුතු කර ඇත.

(i) මේ වන විටත් වන අලින් රක්ෂිත තුළට සීමා කිරීම පිණිස ඉදිකර ඇති කිලෝ මීටර් 4,400ක්වූ විදුලි වැට දිවා රාත්‍රී නඩත්තු කිරීම සඳහා සිවිල් ආරක්ෂක දෙපාර්තමේන්තුවේ සහයෝගය ලබා ගැනීම.

මේ යටතේ සෑම කිලෝ මීටර් එකක් සඳහා දිවා රාත්‍රී නඩත්තු වෙනුවෙන් එක් සිවිල් ආරක්ෂක භටයකු යෙදවීමටත්, එම භටයන් සඳහා යටිතල පහසුකම් වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව මඟින් සපයා දීමටත් කටයුතු කරමින් පවතී.

(ii) අලුතින් කිලෝමීටර් 1,243ක විදුලි වැටක් ඉදිකිරීමට සැලසුම් කර ඇති අතර දිස්ත්‍රික් ලේකම්, ප්‍රාදේශීය ලේකම්, ගොවි සංවිධාන දැනුවත් කොට විදුලි වැට ඉදිකිරීම සඳහා අදාළ මායිම සලකුණු කර ඇති අතර, ඉදිරියේ දී එම කිලෝමීටර් 1,243ක විදුලි වැට ඉදිකිරීමට කටයුතු කරනු ඇත.

(iii) දිස්ත්‍රික් මට්ටමේ අලි - මිනිස් ගැටුම අවම කිරීම සඳහා දිස්ත්‍රික් ලේකම්, ප්‍රාදේශීය ලේකම්, ග්‍රාම නිලධාරි මට්ටමින් කමිටු පිහිටුවා ක්‍රියාත්මක කිරීමට අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබී ඇත. ඒ සම්බන්ධයෙන් වනජීවී කලාප මට්ටමින් ක්‍රියා කිරීම සඳහා සියලු වනජීවී නිලධාරින් දැනුවත් කර ඇත.

(iv) වන අලින්ගෙන් වගාවලට සිදු කරන හානි අවම කිරීම සඳහා ගොවි ජනතාවට හා වන අලින් ගැවසෙන ප්‍රදේශවල ජීවත් වන ගැමි ජනතාවට ලබා දෙන අලි වෙඩි ප්‍රමාණය මේ වන විට ලක්ෂ අටක් පමණ වූ අතර 2020 වසරේ සිට එම ප්‍රමාණය ලක්ෂ 12 දක්වා වැඩි කර ඇත.

(v) වන අලින් ගැවසෙන බවට හඳුනාගෙන ඇති අවදානම් ග්‍රාම නිලධාරි වසම් ආශ්‍රිතව බිම් මට්ටමේ දැනුවත් කිරීමේ වැඩසටහන් හා අවදානම් තත්ත්වය අවම කිරීමට ගත හැකි වැඩ පිළිවෙළ එක් එක් ග්‍රාම නිලධාරි වසම් මට්ටමින් ග්‍රාම නිලධාරිවරුන්, සංවර්ධන නිලධාරින්, කෘෂිකර්ම පර්යේෂණ සහකාර නිලධාරින් හා ප්‍රාදේශීය දේශපාලන අධිකාරියේ සහභාගිත්වයෙන් ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතී. මේ යටතේ අවදානම් ප්‍රදේශවල මාර්ග දෙපස ශුද්ධ කිරීම, අඳුරු ස්ථානවල විදිපහන් සවි කිරීම, ගෙයින් ගෙට ගොස් වන අලින්ගෙන් ආරක්ෂා වීම ක්ෂණික පූර්ව ආරක්ෂක ක්‍රම සම්බන්ධයෙන් දැනුවත් කිරීම ආදිය සිදුකරනු ලැබේ.

(vi) වන අලින්ගෙන් සිදුවන හානි සම්බන්ධයෙන් දැනට ගෙවන වන්දි ප්‍රමාණය පහත පරිදි වන අතර, ඉදිරියේ දී එම ප්‍රමාණයද වැඩි කිරීමට අවශ්‍ය කටයුතු සිදුකරමින් පවතී.

| | | |
|---|---|---|
| ජීවිත හානි | - | රු. 500,000.00 |
| දේපළ හානි | - | රු. 100,000.00 |
| ශාරීරික හානි | - | රු. 75,000.00 |

මෙම වන්දි මුදල කැබිනට් පත්‍රිකාවක් ඉදිරිපත් කර වැඩි කර තිබෙනවා. ඒ අනුව, ජීවිත හානි සඳහා රුපියල් 1,000,000.00 දක්වාත්, දේපළ හානි සඳහා රුපියල් 500,000.00 දක්වාත්, ශාරීරික හානි සඳහා ලබාදෙන මුදල දෙගුණයක් දක්වාත් වැඩි කර තිබෙනවා.

මීට අමතරව කිඹුලන්, කුළු හරකුන් හා දිවියන් විසින් මිනිසුන්ට සිදුකරන හානි සඳහාද දෙපාර්තමේන්තුව මේ ආකාරයෙන් වන්දි ලබා දීමේ ක්‍රමවේදයක් ක්‍රියාත්මක කරන අතර, ඒ අනුව එම සතුන්ගෙන් සිදුවන ජීවිත හානි සඳහා රුපියල් 500,000.00ක්ද, ශාරීරික හානි සඳහා රුපියල් 75,000.00ක් වශයෙන්ද වන්දි ගෙවනු ලැබේ. මේ වන විට මීට අදාළ සියලු කටයුතු ක්‍රියාත්මකව පවතී.

1.3 දෙපාර්තමේන්තුව මඟින් රිලවුන්, ඌරන්, මොණරුන්ගෙන් සිදුවන හානි සඳහා වන්දි ගෙවීම් ක්‍රමවේදයන් දැනට ක්‍රියාත්මක නොවේ. නමුත් ගොවි රක්ෂණ මණ්ඩලය මඟින් මෙම හානි සම්බන්ධයෙන් රක්ෂණ ක්‍රමවේදයක් ක්‍රියාත්මක වීම සිදුකරනු ලබයි.

2. කැකිරාව ප්‍රදේශයේ වන අලින් හත්දෙනෙකු මිය යෑම සම්බන්ධයෙන් කැකිරාව මහේස්ත්‍රාත් අධිකරණයට නඩු අංක බී 1144/2019 යටතේ වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව විසින් කරුණු වාර්තා කර ඇත. තවද මෙම අධිකරණ කටයුත්ත යටතේ ගරු අධිකරණය විසින් රජයේ රස පරීක්ෂක දෙපාර්තමේන්තුව, පශු වෛද්‍ය පීඨය

[ගරු එස්.එම්. චන්ද්‍රසේන මහතා]

පේරාදෙණිය විශ්වවිද්‍යාලය, ගන්නෝරුව පශු පර්යේෂණ ආයතනය වෙතින් වාර්තා කැඳවා ඇත. එම වාර්තා අධිකරණය වෙත ලැබුණු බවට වාර්තා වී නැත. මීළඟ නඩු දිනය 2020.03.16 වේ. සැකකරුවන් අත්අඩංගුවට ගෙන නැති අතර, පොලිසිය විසින්ද තවදුරටත් පරීක්ෂණයන් පවත්වාගෙන යනු ලැබේ. වන අලි ඝාතන සම්බන්ධයෙන් අධිකරණවලට කරුණු වාර්තා කරනු ලබන අතර පශ්චාත් මරණ පරීක්ෂණ සිදු කිරීමෙන් පසු ඒ සම්බන්ධයෙන් අධිකරණ ක්‍රියාමාර්ග ගන්නා බව කාරුණිකව දන්වා සිටිමි.

3. ශ්‍රී ලංකා දිවියන්ගේ ගහණය සම්බන්ධයෙන් නිශ්චිතව සමීක්ෂණ කටයුතු සිදු කර නොමැති බව දන්වා සිටින අතර, 2019.12.31 වන දින උඩවලව ජාතික උද්‍යානයේ දිවියකු වෙඩි තබා ඝාතනය කිරීම සම්බන්ධයෙන් සැකකරුවන් තිදෙනෙකු අත්අඩංගුවට ගෙන වැල්ලවාය මහේස්ත්‍රාත් අධිකරණයට ඉදිරිපත් කර අධිකරණ ක්‍රියාමාර්ග ගෙන ඇත.

තවද, කෑගල්ල යටියන්තොට ප්‍රදේශයේ දී මද්දකට හසු වී 2020.01.03 වන දිනට ආසන්න දිනයක දී දිවියෙකු මිය යෑම පිළිබඳවද ගරු අධිකරණය වෙත වාර්තා කර ඉදිරි පරීක්ෂණ අඛණ්ඩව සිදු කරමින් පවතී.

4. වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව විසින් තෙත් බිම් සංරක්ෂණය සඳහා වූ සම්මුතිය වන රැම්සාර් සම්මුතිය - Ramsar Convention - 1990 වර්ෂයේ දී අත්සන් තබන ලදී. ඒ අනුව ශ්‍රී ලංකා රජය වෙනුවෙන් රැම්සාර් සම්මුතිය මෙරට තුළ ක්‍රියාත්මක කරනු ලබන රාජ්‍ය ආයතනය වන්නේ වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවයි.

ඒ අනුව වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව විසින් රැම්සාර් තෙත් බිම් 6ක් මේ වන විට ප්‍රකාශයට පත් කර ඇත.

මීට අමතරව කොළඹ අවට පවත්නා තෙත් බිම් මඟින් සිදුවන පාරිසරික සේවයේ ඇති වැදගත්කම සැලකිල්ලට ගෙන කොළඹ නගරය තෙත්බිම් නගරයක් - Ramsar Colombo Wetlands- ලෙස ප්‍රකාශයට පත් කර ඇත. ඒ අනුව කොළඹ මහ නගර සභා ප්‍රදේශයේ හා ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ නගර සභා ප්‍රදේශයේ ඇති තෙත් බිම් මෙලෙස කොළඹ නගර තෙත් කලාපය ලෙස ප්‍රකාශයට පත් කර ඇත. මෙයින් කොළඹ නගරයේ ඉදිරි සංවර්ධන ක්‍රියාකාරකම් සිදු කිරීමේදී නාගරික තෙත් බිම් නගරයක් ලෙස සැලකිල්ලට ගනිමින් පරිසරයට අහිතකර බලපෑම් සිදු නොවන අයුරින් ඉදිරි සැලසුම් ක්‍රියාත්මක කිරීමට යෝජිතය.

ඒ අනුව ඉදිරියේදී පහත පරිදි තෙත් බිම් සම්බන්ධයෙන් සිදු කිරීමට යෝජිත ක්‍රියාකාරකම් -

- ප්‍රකාශයට පත් කර ඇති රැම්සාර් රක්ෂිත ප්‍රදේශවලට අදාළව එහි රැම්සාර් තොරතුරු පත්‍රිකාව -RIS- යාවත්කාලීන කිරීම.
- ප්‍රකාශයට පත් කර ඇති වනජීවී රක්ෂිත රැම්සාර් තෙත් බිම් ලෙස ප්‍රකාශයට පත් කිරීම.
- මෙරට ඇති තෙත් බිම් සඳහා ජෛව විවිධත්ව සමීක්ෂණ සිදු කිරීම.
- මෙරට පවතින තෙත් බිම් රක්ෂිත ප්‍රදේශ ලෙස ප්‍රකාශයට පත් කිරීම. වනජීවී තෙත් බිම් සඳහා කළමනාකරණ සැලසුම් සකස් කිරීම සහ යාවත්කාලීන කිරීම
- රැම්සාර් කොළඹ, රැම්සාර් තෙත් බිම් වනජීවී රක්ෂිතයක් ලෙස ප්‍රකාශයට පත් කිරීම
- නව වනජීවී රක්ෂිත ප්‍රකාශයට පත් කිරීම
- කායන්කර්නි සමුද්‍රීය අභය භූමිය
- මහා රාවණා හා කුඩා රාවණා සමුද්‍රීය අභය භූමිය (2019.10.11 වන දින ප්‍රකාශයට පත් කර ඇත)
- යාපනය කලපුව ස්වභාවික රක්ෂිතය
- මුතුරාජවෙල අභය භූමියේ භූමි ප්‍රමාණය විශාල කර නැවත ප්‍රකාශයට පත් කිරීම
- මිරිස්ස සමුද්‍රීය අභය භූමිය
- දඹකොළපටුන හා කන්කසන්තුරේ ප්‍රදේශයෙහි කොරල් පරය සමුද්‍රීය රක්ෂිතයක් ලෙස ප්‍රකාශයට පත් කිරීම
- ලංකාපටුන ප්‍රදේශයෙහි ඇති කුඩා දූපත් සමුද්‍රීය රක්ෂිතයක් ලෙස ප්‍රකාශයට පත් කිරීම
- කල්පිටිය හා මන්නාරම දක්වා ඇති මුහුදු ඌරන් සංරක්ෂණ ප්‍රදේශ සමුද්‍රීය රක්ෂිතයක් ලෙස ප්‍රකාශයට පත් කිරීම
- අකුරල තෙත් බිම වනජීවී රක්ෂිතයක් ලෙස ප්‍රකාශයට පත් කිරීම.

5. ශ්‍රී ලංකාවේ සමුද්‍රීය සම්පත් සංරක්ෂණය සඳහා මේ වන විට වන සත්ව හා වෘක්ෂලතා ආරක්ෂක ආඥා පනත අනුව සමුද්‍රීය රක්ෂිත කලාප 29ක් ප්‍රකාශයට පත්කර ඇති අතර, සමුද්‍රීය කලාප 03ක් දැනට ප්‍රකාශයට පත් කිරීම සඳහා යෝජනා කර ඇත. මෙයට අමතරව 2016 වර්ෂයේ දී වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව යටතේ සමුද්‍රීය සම්පත් කළමනාකරණ ඒකකයක් ස්ථාපිත කර ඇත. එමෙන්ම, ශ්‍රී ලංකාවේ සමුද්‍රීය වනජීවී සම්පත් කළමනාකරණය සඳහා සම්බන්ධිත රජයේ සියලු පාර්ශ්ව ආයතනවල එකඟතාව පරිදි සමුද්‍ර සම්පත් කළමනාකරණ සිවු අවුරුදු (2018-2021 දක්වා) ක්‍රියාකාරී සැලැස්මක් සකස් කර ඇත.

මෙයට අමතරව, මන්නාරම් බොක්ක හා ඒ ආශ්‍රිත මුහුදු තීරයේ මුහුදු ඌරන් සහ මුහුදු තෘණ සංරක්ෂණ ව්‍යාපෘතියක් සිදු කර ඇති අතර, ඒ සම්බන්ධ කළමනාකරණ සැලැස්මක් සකසා ඇත.

එමෙන්ම, වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ මූලිකත්වය මත සමුද්‍ර සම්පත් සංරක්ෂණයට අදාළව සම්බන්ධිත පාර්ශ්ව ආයතනවලින් සමන්විත Marine Steering Committee එක පත් කර ඇත. එම කමිටුව දැනටමත් ක්‍රියාත්මකය.

තවද, වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව යටතේ සමුද්‍ර ක්ෂීරපායින් හා උරගයන් සංරක්ෂණයට අදාළ රෙගුලාසි නැවත සංශෝධනය කිරීමේ කටයුතු සිදු වෙමින් පවතී.

6. මෙම දෙපාර්තමේන්තුවේ පවතින වගකීම් හා කාර්යභාරය පිළිබඳව වගකිව යුතු අංශ දැනුවත් කළ අතර, ඒ හා සම්බන්ධව ලැබුණු උපදෙස් පරිදි මෙම දෙපාර්තමේන්තුවේ කාර්යභාරයේ අවශ්‍යතාව සලකා බලා පවතින කටයුතු කාර්යක්ෂමව සිදු කරනු වස්, අවශ්‍ය සේවක සංඛ්‍යාව වැඩි කර ගැනීම පිළිබඳ යෝජනා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කරන ලදී. එහිදී මේ වන විට සිටින කාර්ය මණ්ඩලයේ සංඛ්‍යාව වන 2,316ක ප්‍රමාණය සියලු ක්ෂේත්‍ර ආවරණය වන පරිදි නව තනතුරු ඇති කිරීම තුළින් හා පවතින

තනතුරු සංඛ්‍යාව වැඩි කිරීම තුළින් සමස්ථ කාර්ය මණ්ඩලය 3,732ක් දක්වා 1,416කින් වැඩි කිරීමට කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත අනුමැතියට යොමු කරන ලදී.

යෝජිත කාර්ය මණ්ඩල විස්තර මේ සමඟ අමුණා ඇත. ඇමුණුම **සභාගත*** කරමි.

එසේම, දීර්ඝ කාලයක් මුළුල්ලේ මෙම දෙපාර්තමේන්තුවේ දෛනික වැටුප් ලබමින් ස්වේච්ඡා මාර්ගෝපදේශකවරුන් ලෙස සේවය කරමින් සිටි 343දෙනෙකු රජයේ ස්ථිර සේවයට අනුයුක්ත කර ගැනීම සඳහා අදාළ සාධාරණීකරණය දක්වමින් අමාත්‍ය මණ්ඩල සංදේශයක් අමාත්‍ය මණ්ඩල කාර්යාලය වෙත යොමු කර ඇත.

එම නිලධාරි මණ්ඩලය අපි ඉදිරිපත් කර තිබෙනවා. ඒ වාගේම තමුන්නාන්සේ සම්පූර්ණ විස්තරයක් ඉල්ලුවා. ඒ සම්පූර්ණ විස්තරය මා ලබා දුන්නා. කැකිරාව, හබරණ ප්‍රදේශයේ හිටපු අලි ඝාතනය කර තිබෙනවා කියලා තමයි ආරංචිය තිබෙන්නේ. ඒ පිළිබඳව එක එක කට කථා තිබෙනවා. බිලි පූජා කළා කියලාත් කියනවා. අලි 7දෙනෙක් මරාදමා තිබෙනවා. ඒ පිළිබඳ රස පරීක්ෂකවරයා විසින් පරීක්ෂණයක් කරලා තිබෙනවා. නමුත්, තවම රස පරීක්ෂණ වාර්තාව ඇවිල්ලාත් නැහැ. මේ සිදුවීමට අදාළ සැකකරුවන් අල්ලා ගන්න තවමත් බැරි වෙලා තිබෙනවා. මම අපේ දෙපාර්තමේන්තුවේ නිලධාරින්ට උපදෙස් දුන්නා, පුළුවන් තරම් ඉක්මනින් මේ ගැන සොයන්න කියලා. මොකද, විශාල අලි ඝාතනයක් නේ මෙතැන සිද්ධ වුණේ. ඉතිහාසයේ වැඩිම සංඛ්‍යාව ලෙස වන අලි 7 දෙනෙක් එකතැනම ඝාතනය වුණා. ඒ පිළිබඳව ගම්වැසියන් කම්පාවට පත් වෙනවා. ඒ නිසා මේ වාර්තාව ඉක්මනින් ලබා දෙන්න කියලා මම දන්වා සිටියා. නමුත් ඒ කටයුතු මන්දගාමී තත්ත්වයකයි තිබෙන්නේ. තමුන්නාන්සේලාගේ ආණ්ඩුව කාලයේ තමයි ඒ සිද්ධිය වුණේ. පුළුවන් තරම් ඉක්මනින් ඒ පරීක්ෂණය කරලා, සත්‍ය වාර්තාව එළියට දෙන්න අපි බලාපොරොත්තු වෙනවා. ඒ සිද්ධිය ගැන එක එක කට කථා තිබෙනවා. නිවැරදි පරීක්ෂණයක් කරලා, ඒ අලි ඝාතන ගැන සියලු තොරතුරු ඉදිරියේදී ලබා දෙන්න අපි බලාපොරොත්තු වෙනවා.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)

ගරු ඇමතිතුමනි, 2014 වසරේත් මම ඔබතුමාගෙන් මේ සම්බන්ධයෙන් ඉල්ලීමක් කළා. ඒක තමයි, ස්වේච්ඡා සේවයේ නිරත වී සිටින අය, ඒ නිකුත් කර තිබෙන චක්‍රලේඛය අනුව ස්ථිර කරන්න කියන එක. මම හිතන විධියට, ඒ සඳහා අලුතින් කැබිනට් පත්‍රිකාවක් අවශ්‍ය වෙන්නේ නැහැ. ඒ චක්‍රලේඛයම උපයෝගී කරගෙන මේ 343 දෙනාගේ සේවා ස්ථිර කිරීම බොහොම ඉක්මනින්ම කරන්න පුළුවන්.

**ගරු එස්.එම්. චන්ද්‍රසේන මහතා**
(மாண்புமிகு எஸ்.எம். சந்திரசேன)
(The Hon. S.M. Chandrasena)

අපි ආණ්ඩුව අරගෙන තවම මාස දෙකක විතර කාලයක් නේ, වෙන්නේ. ඇත්තටම මේ දේවල් තමුන්නාන්සේලාටත් ඒ දවස්වල කරන්න තිබුණා. අපි ඒ කටයුත්ත අනිවාර්යයෙන්ම කරනවා.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මට ප්‍රශ්නයක් අහන්න පුළුවන්ද?

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Order, please! අතුරු ප්‍රශ්න අහන්න බැහැ, ගරු මන්ත්‍රීතුමනි. මේක ගරු විපක්ෂ නායකතුමා ස්ථාවර නියෝග 27(2) යටතේ ඉදිරිපත් කළ ප්‍රශ්නයක්. ඒ ගැන විවාදයක් කරන්න දෙන්න පුළුවන්කමක් නැහැ.

Then, Hon. Rajavarothiam Sampanthan, you have made a request to the Hon. Speaker that you would like to make a clarification in regard to the official residence and the official vehicle allocated to you. You can do it now.

## ගරු රාජවරෝදියම් සම්පන්දන් මහතාගේ පෞද්ගලික කරුණු පැහැදිලි කිරීම
## மாண்புமிகு ராஜவரோதயம் சம்பந்தனினது சொந்த விளக்கம்
## PERSONAL EXPLANATION BY HON. RAJAVAROTHIAM SAMPANTHAN

**ගරු රාජවරෝදියම් සම්පන්දන් මහතා**
(மாண்புமிகு ராஜவரோதயம் சம்பந்தன்)
(The Hon. Rajavarothiam Sampanthan)

Thank you, Hon. Deputy Speaker, for permitting me to make this Statement of urgent public importance pertaining to the Bungalow of the Leader of the Opposition and other matters related thereto.

You recognized me, Sir, as the Leader of the Opposition of the Sri Lankan Parliament in September, 2015. At that time, for over 20 years, as a Member of Parliament, I had been occupying the Summit Flats 2D, where I climbed and descended 60 to 70 steps every time I entered the flat or left it. Given my age - I am well past 80 - this was very inconvenient and difficult, but I put up with it.

I was given the Bungalow for the Leader of the Opposition only in September, 2017. two years after I became the Leader of the Opposition, and I was able to move into it only in September, 2017. While they were looking for a bungalow for me, the former President suggested to me that I rent out a bungalow. But, I did not want to do that on account of the exorbitant cost it would have entailed to the Public Exchequer. The other facilities provided to me as the Leader of the Opposition were attached to the bungalow and the staff. I did not request either the Hon. Speaker, the Hon. Karu Jayasuriya, or the Hon. Prime Minister, the Hon. Ranil Wickremesinghe, to permit me to continue to occupy the Opposition Leader's Bungalow. Whatever action they took, they did according to their own will. The other facilities that have continued were also in terms of that decision.

Following the October, 2018 Constitutional crisis, both the then Prime Minister, the Hon. Mahinda Rajapaksa, and the then Leader of the Opposition, the Hon. Ranil Wickremesinghe, exchanged positions, which happened at the same time. My removal as the Leader of the Opposition also occurred at the same time. The only

---
*** පුස්තකාලයේ තබා ඇත.**
* *நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
* *Placed in the Library.*

[ගරු රාජවරෝදියම් සම්පන්දන් මහතා]

other facility not referred to so far is the vehicle bearing number CAT 1094, a Benz motor car, which was handed over to me on 30th January, 2017. I sent that vehicle to the new Leader of the Opposition on 07th January, 2019. During the two years the vehicle was in my possession, it has done only 2,082 kilometres, showing how sparingly the vehicle was used.

Sir, I have been saddened by what has happened. This ugly situation should not continue. I raised this, Sir, as a matter of urgent public importance because various comments have been made by various persons including Hon. Members of Parliament and I wanted to put the two facts on record so that everybody will know what the true position is. Sir, I am thankful to you for permitting me to make this Statement.

Thank you.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

මීළඟට, ගරු තිලංග සුමතිපාල මැතිතුමා. ගරු රාජ්‍ය ඇමතිතුමනි, ඊයේ පාර්ලිමේන්තුවේ කළ ප්‍රකාශයක් සම්බන්ධයෙන් ඔබතුමාට පැහැදිලි කිරීමක් කරන්න අවශ්‍යයි කිව්වා. දැන් ඒ සඳහා අවස්ථාව.

## ගරු තිලංග සුමතිපාල මහතාගේ පෞද්ගලික කරුණු පැහැදිලි කිරීම
## மாண்புமிகு திலங்க சுமதிபாலவினது சொந்த விளக்கம்
## PERSONAL EXPLANATION BY HON. THILANGA SUMATHIPALA

**ගරු තිලංග සුමතිපාල මහතා (තාක්ෂණ හා නවෝත්පාදන රාජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு திலங்க சுமதிபால - தொழில்நுட்ப மற்றும் புத்தாக்க இராஜாங்க அமைச்சர்)
(The Hon. Thilanga Sumathipala - State Minister of Technology and Innovations)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඊයේ මම මේ ගරු සභාවේ නොසිටි වෙලාවක මගේ නම ප්‍රකාශ කර තිබුණා. මට විරුද්ධව ලංකාවේ හෝ ජාත්‍යන්තර වශයෙන් කිසිම චෝදනාවක්, කිසිම පරීක්ෂණයක් නැහැ කියලා තමයි මට කියන්න තිබෙන්නේ. විශේෂයෙන්, තරග පාවාදීම් සම්බන්ධව මගේ නම සඳහන් කිරීම ගැන මම කනගාටු වෙනවා. මම අවුරුදු 25කට වැඩි කාලයක් ලංකාවේ ක්‍රිකට් පාලක මණ්ඩලයටත්, ජාත්‍යන්තර ක්‍රිකට් සම්මේලනයටත් සම්බන්ධ වී සිට තිබෙනවා. තරග පාවාදීමක් සම්බන්ධයෙන් ලංකාවේ හෝ පිට රටක - ICC එකේ - කිසිම පරීක්ෂණයකදී, ශ්‍රී ලංකා ක්‍රිකට් ආයතනයේ කිසිම පරීක්ෂණයකදී මගේ නම ගැවිලා නැහැ.

තව කාරණයක් මම කියන්න ඕනෑ. ලංකාවෙන් ICC එකට ආරාධනා කරලා, අවුරුදු දෙකක් ලංකාවේ වැඩ කළා. ඒ කිසිම පරීක්ෂණයකට අපේ ක්‍රීඩකයන්, වර්තමාන ක්‍රීඩකයන් කිසිම කෙනෙක් සම්බන්ධ නැහැ; පරිපාලකයන් සම්බන්ධ නැහැ. ඒ නිසා, මේකෙන් වෙන්නේ අපේ රටේ කීර්ති නාමය පලුදු වෙන එකයි. තරග පාවාදීම්වලට මගේ කිසිම සම්බන්ධයක් නැහැ කියලා මම පැහැදිලිව කියනවා. මගේ නම පාවිච්චි කරලා, මේ විධියට මඩ ගහන එක ගැන මම කනගාටු වෙනවා. එලෙස ප්‍රකාශ කරන අයගෙන් මම ඉල්ලා සිටිනවා, ඒ සම්බන්ධයෙන් මොනවා හෝ කරුණු ඉදිරිපත් කිරීමට පුළුවන්කමක් තිබෙනවා නම්, ඒවා ඉදිරිපත් කරන්න කියලා. ඒවා ඉදිරිපත් කළ හැකි ආයතන තිබෙනවා. එම ආයතනවලට ඉදිරිපත් කරලා පරීක්ෂණ කරන්න. ඕනෑම කෙනෙක් සමග ගනුදෙනු කරන්න, නමුත් මා පටලවා ගන්න එපා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පාර්ලිමේන්තුව පාවිච්චි කරලා කාටවත් මේ විධියට මඩ ගහන්න අවස්ථාව දෙන්න එපා කියා මා ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා.

තවත් කරුණක් කියන්න මම ඔබතුමාගෙන් කෙටි වේලාවක් ඉල්ලා සිටිනවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

කොළඹ, නාලන්දා විද්‍යාලයේ සිටි කීර්තිමත් විදුහල්පතිවරයකු වූ ධර්මා ගුණසිංහ මැතිතුමා අද උදෑසන අභාවප්‍රාප්ත වුණා. නාලන්දා විද්‍යාලයට ගිය අපේ වර්තමාන අගමැතිතුමාත් එතුමා සමඟ සම්බන්ධයි. ඒ නිසායි මම මෙය සඳහන් කළේ. ධර්මා ගුණසිංහ මැතිතුමාගේ අභාවය පිළිබඳව නාලන්දා විද්‍යාලය වෙනුවෙන් අපේ කනගාටුව, ශෝකය ප්‍රකාශ කිරීමට මම මෙය අවස්ථාවක් කර ගන්නවා. ස්තුතියි.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

Hon. Deputy Speaker, with regard to the Statement the former Leader of the Opposition, the Hon. Sampanthan, made, I would like, on behalf of the Government, to make it clear that we have the highest respect for Hon. Sampanthan, and to any facilities that he has been enjoying as a result of the office that he held or otherwise, this Government is not interested in making any changes.

During the Presidency of the Hon. Mahinda Rajapaksa, the necessary security was provided to the Hon. Sampanthan and all the Members of Parliament from the Northern Province, which shows that we have not been politically biased in making any of these decisions. We will continue to adhere to that and any facilities that have been provided to former Ministers, Deputy Ministers or the former Leader of the Opposition as a result of the offices they held, would be decided in accordance with the normal procedure.

Thank you.

**ගරු රාජවරෝදියම් සම්පන්දන් මහතා**
(மாண்புமிகு ராஜவரோதயம் சம்பந்தன்)
(The Hon. Rajavarothiam Sampanthan)

I am thankful to the Hon. Minister and the Hon. Leader of the House for the statement he made. But, there were some statements made by some Government Members of Parliament in regard to this matter, which did not quite represent the truth and which caused me a great deal of pain. I kept quiet because I did not want to make an ugly controversy more public. But, I thought I should make a statement and put the facts on record so that everybody in the country will know the truth. I never asked for any favour. You gave me a house two years after I became the Leader of the Opposition. If the Hon. Mahinda Rajapaksa or the Hon. Ranil Wickremesinghe was the Leader of the Opposition, they would have got a house the next day or the next week, not two years later. Having done that to me and making me climb 80 steps for two more years, which I had done for 20 years earlier, your Members of Parliament were making unkind

remarks about the true state of facts. That is why, Sir, I made that Statement. I do not want to develop this controversy any further. I am thankful to the Hon. Minister for the very gentlemanly statement he made.

Thank you.

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ගරු සම්පන්දන් මැතිතුමාට මා යළිත් සඳහන් කරන්න කැමතියි, පාර්ලිමේන්තු මන්ත්‍රීවරු කුමන දේශපාලන මතයක් දැරුවත් අපි ගරු කරන බව. ඒ නිවාසය ලබාදීම පිළිබඳ අඩුපාඩුකම්, කාලය ගත වීම හෝ ප්‍රමාද වීම සිදු වී තිබෙන්නේ පසුගිය ආණ්ඩුවෙන්. ඒ ගැන අපට කිසිම දෙයක් කියන්න බැහැ. ඒ අනුව අපි කටයුතු කරනවා. දැනුත්, ඉදිරියටත් එතුමාට පමණක් නොවෙයි, even the former Leader of the TULF, Mr. V. Anandasangaree has been provided with facilities in Colombo though he is not in Parliament. I explained that and we, as the Government, will continue to respect the Leader of the TNA in Parliament. The President has very clearly invited all to join hands with him in solving the issues that our country is facing. So, once again, I reiterate that position.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Thank you. ප්‍රධාන වැඩකටයුතු ආරම්භයේදී යෝජනා පිළිබඳ දැනුම්දීම.

**ගරු කරුණාරත්න පරණවිතාන මහතා**
(மாண்புமிகு கருணாரத்ன பரணவிதான)
(The Hon. Karunarathna Paranawithana)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඊයේ ගරු කථානායකතුමා මේ පාර්ලිමේන්තුවට ප්‍රකාශ කළ මහජන වැදගත්කමක් සහිත

කාරණයක් සම්බන්ධයෙන් කෙටි අදහසක් ඉදිරිපත් කරන්න ඔබතුමා මට අවසර ලබා දෙනවාද?

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
හොඳයි.

**ගරු කරුණාරත්න පරණවිතාන මහතා**
(மாண்புமிகு கருணாரத்ன பரணவிதான)
(The Hon. Karunarathna Paranawithana)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, බැඳුම්කර සිද්ධියට අදාළ වෝහාරික විගණන වාර්තාව මන්ත්‍රීවරුන්ට ලබාදෙන්න සලස්වනවා කියලා ඊයේ කථානායකතුමා ප්‍රකාශ කළා. ඒ ගැන අපි එතුමාට ස්තුතිවන්ත වෙනවා. ඒ වාගේම එතුමා එම නිවේදනය කරනකොට තොරතුරු දැන ගැනීමේ පනත පිළිබඳවත් සඳහන් කරපු නිසා අපි ඔබතුමා හරහා එතුමාට දැනුම් දීලා ඉල්ලා සිටින්න කැමැතියි, මේ රටේ ජනතාව, ජන මාධ්‍ය ඇතුළු සියලුදෙනාටම ඉක්මනින්ම බලා ගත හැකි වන පරිදි ඒ විගණන වාර්තාව සම්පූර්ණයෙන්ම පාර්ලිමේන්තුවේ වෙබ් අඩවියේ පළ කරන්න කියලා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ඒ පිළිබඳව ගරු කථානායකතුමා අවශ්‍ය පියවර ගනීවි කියා මා විශ්වාස කරනවා.

**ගරු කංචන විජේසේකර මහතා (තේ කර්මාන්ත සංවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு கஞ்சன விஜேசேகர - தேயிலைக் கைத்தொழில் அபிவிருத்தி இராஜாங்க அமைச்சர்)
(The Hon. Kanchana Wijesekera - State Minister of Tea Industry Development)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මට point of Order එකක් ඉදිරිපත් කරන්න තිබෙනවා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
හොඳයි, ඉදිරිපත් කරන්න.

**ගරු කංචන විජේසේකර මහතා**
(மாண்புமிகு கஞ்சன விஜேசேகர)
(The Hon. Kanchana Wijesekera)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා හට කාලය ලබා දීම පිළිබඳව ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඊයේ මේ පාර්ලිමේන්තුවේ අපේත් නම් සඳහන් කරමින් හිටපු රාජ්‍ය ඇමති, රන්ජන් රාමනායක මහතා විසින් ප්‍රකාශයක් කළා. එතුමාගේ කථාවේදී එතුමා විවිධ පාර්ශ්වවලට චෝදනා එල්ල කළා වාගේම, එතුමා කිව්වා, ඒ හඬපට, සාක්ෂි ඇතුළු සියලු දේවල් සභාගත කරනවා කියලා. ඒ නිසා මම ඔබතුමාගෙන් දැන ගන්න කැමැතියි, මේ වන විටත් එවැනි දෙයක් සභාගත කර තිබෙනවාද, සාක්ෂි වශයෙන් මොනවා හෝ දීලා තිබෙනවාද කියලා. මොකද, එම ප්‍රකාශය නිසා පාර්ලිමේන්තුවේ සිටි සහ නොසිටි බොහෝදෙනෙකු අපහසුතාවට පත් වෙලා තිබෙනවා. ඒ නිසා එතුමා ළඟ එහෙම එකක් තිබෙනවා නම්, ඒක ඉදිරිපත් කරන්න කියන්න. චෝදනා සම්බන්ධයෙන්, වංචා සම්බන්ධයෙන් අපි ළඟ තිබුණු සාක්ෂි අපි ඉදිරිපත් කළා. අපි ඒවා චෝදනාවලට පමණක් සීමා කළේ නැහැ. බැඳුම්කර වංචාව පිළිබඳව අපි ළඟ තිබුණු සාක්ෂි අල්ලස් කොමිසමට අපි ලිඛිතව ලබා දීලා තිබෙනවා. ඒ නිසා එතුමා ළඟත් ඊයේ කියපු කරුණුවලට අදාළව යම්කිසි සාක්ෂියක් තිබෙනවා නම් ඉදිරිපත් කරන්න කියන්න. එතුමා සාක්ෂි නැතුව අද පාර්ලිමේන්තුවේ ඉන්න සියලුදෙනාට ඒ ප්‍රහාරය එල්ල කළේ මහ මැතිවරණයට ස්වාධීනව තරග කරලා ඡන්ද ලබා ගැනීමේ අරමුණින්ද කියන සැකය මට තිබෙනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ නිසා මේ පිළිබඳව ඔබතුමාගේ අවධානය යොමු කරන්න. එතුමා සභාගත කළාය කියන ඒවා තිබෙනවා නම්, ඒවා අපටත් පරිශීලනය කරන්න දෙන්න. නැත්නම් එතුමා කරපු ප්‍රකාශ තුළින් මේ රටට වැරදි මතයක් යන්න පුළුවන්. එතුමා මගේ නමත් සඳහන් කරලා, එක පැත්තකින් කිව්වා, බැඳුම්කර වංචාවේ හොරු අල්ලන්න උදවු කළා කියලා. එතුමා මට දුරකථනයෙන් කථා කරලා ඇහුවා, "හොරු අල්ලා ගත්ත විධිය මොකක්ද" කියලා. මම ඒකට උත්තර දුන්නා. ඒ හඬ පටයත් තිබෙනවා නම්, ඒකත් මාධ්‍යයට නිකුත් කරන්න කියලා මම ඔබතුමාගෙන් ඉල්ලනවා. එතකොට ඒ සංවාදයේදී මොකක්ද වුණේ කියලා මේ රටේ ජනතාවට දැන ගන්න පුළුවන්. එතුමා මට එක දුරකථන ඇමතුමක් දීලා තිබෙනවා. ඒ දුරකථන ඇමතුමේදී එතුමා අහපු ප්‍රශ්නයට මම උත්තරයක් දීලා තිබෙනවා. නමුත්, පාර්ලිමේන්තුවේ ඉන්න අනෙක් මන්ත්‍රීවරු, ඇමතිවරු, පාර්ලිමේන්තුවේ නැති පිරිස් ආදී විශාල පිරිසකගේ නම් පාවිච්චි කරලා එතුමා විශාල චෝදනා ප්‍රමාණයක් එල්ල කළා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපි පසුගිය කාලය පුරාම චෝදනාවක් එල්ල කළා නම්, ඒ චෝදනාව පිළිබඳව පැමිණිලි ලිඛිත සාක්ෂිත් එක්ක තමයි අල්ලස් කොමිසමට, අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට ලබා දුන්නේ. ඒ කාල වකවානුවේදී ඒවා සම්බන්ධයෙන් නීතිය ක්‍රියාත්මක නොවීම නිසා තමයි අද දිනයේත් හොරු බොහෝ දෙනෙකු ඒ රැකවරණය ලබාගෙන

[ගරු කංචන විජේසේකර මහතා]

කටයුතු කරන්නේ. එතුමා ඊයේ පැය භාගයක පමණ කාලයක් තුළ විශාල කථාවක් කළා. ඒ කථාවේදී කියපු දේවල් පිළිබඳ සාක්ෂි තිබෙනවා නම් එ්වා ඉදිරිපත් කරන්න කියලා අපි එතුමාගෙන් ඉල්ලීමක් කරනවා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
හොඳයි. බොහොම ස්තුතියි.

**ගරු රන්ජන් රාමනායක මහතා**
(மாண்புமிகு ரஞ்ஜன் ராமநாயக்க)
(The Hon. Ranjan Ramanayake)
Sir, I rise to a point of Order.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු මන්ත්‍රීතුමනි, මේ කරුණ විවාදයක් හැටියට ගෙන යන්න ඕනෑ නැහැ, ඊයේ දවසේ කථා කරපු නිසා.

**ගරු රන්ජන් රාමනායක මහතා**
(மாண்புமிகு ரஞ்ஜன் ராமநாயக்க)
(The Hon. Ranjan Ramanayake)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, 1,20,000ක් පමණ වන මගේ සංවාද පට තමයි දැනටත් හැම තැනම පාවිච්චි වන්නේ. ඒවා මගේ සංවාද පට. පොලීසිය විසින් hard disks 8ක්, laptop එකක්, අංක 0712781811, 077326917 දරන මගේ phones දෙක ඇතුළුව phones හතරකුත් ගත්තා. මා දැන් ඉන්නේ රිමාන්ඩ් බන්ධනාගාරගතවයි. මගේ සංයුක්ත පට එක්තරා බැංකුවක locker එකක තිබෙනවා. මට එළියට යන්න විධියක් නැහැ. මේ දවස්වල මගේ ලේකම් වටාත් මේ භයානක රාජපක්ෂ රෙජිමය කැරකෙනවා. ඒ ගොල්ලන් කොහේටද යන්නේ කියලා බලනවා; ඒ ගොල්ලන්ගේ ගෙවල්වලට යනවා. මට ඒවා backup කරලා record කර ගන්න විධියක් නැහැ. නමුත් ආණ්ඩුව හංගපු, ආණ්ඩුවට අවාසි වන හඬ පට තැටි කීපයක් අද දවස ඇතුළත අද 6.00ට කලින් භාර දෙනවා. ඒ වාගේම මගේ පූර්ණ සහයෝගය කොමිසමට ලබාදෙනවා. මා ළඟ මේ සියලු හඬ පට තිබෙනවා. දැනටත් මේ ආණ්ඩුව පාවිච්චි කරන්නේ මගේ හඬ පටමයි. මා වංචාවක් කරලා නැහැ. හඬ පට 1,20,000ක් පමණ තිබෙනවා. ඒ වාගේම සිංගප්පූරුවට ගිහින් තිබෙනවා, ඒවා backup කර ගන්න ඉඩ නැතුව. සිංගප්පූරුවට ගිහින් කර ගත්තා කියන්නේ, එච්චර ලොකු හඬ පට සංඛ්‍යාවක් තිබෙනවා කියන එකයි. මා හිතන හැටියට ඒ තාක්ෂණය මා ළඟ නැහැ. අපි ළඟ තිබෙන්නේ පොඩි laptops. මේ සංවාද පට ඇතුළු සියලු දේවල් මා ළඟ තිබෙනවා. අධිකරණ නියෝගයක් මත රිමාන්ඩ් බන්ධනාගාරයේයි මා ඉන්නේ. මා එළියේ සිටියා නම් මා දැන් මේ වැඩේ කරලා ගෙනැවිත් දෙනවා. නමුත් මා දැන් නැවතත් යන්නේ කූඩුව ඇතුළටයි. මේ සභාවේ සිටින මිත්‍රයන් රාශියක් රිමාන්ඩ් බන්ධනාගාරයේ ඉඳලා තිබෙනවා. රිමාන්ඩ් බන්ධනාගාරයේ සිටියදී මේවා ඔප්පු කරන්න අමාරුයි. මා එළියේ සිටියා නම් මේවා ඔප්පු කරනවා. අද ඒවා මගේ ලේකම්වරයාට භාර දීලා තිබෙනවා. දැන් ඒවායේ පටිගත කිරීම් සිදුවෙමින් පවතිනවා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ප්‍රධාන වැඩ කටයුතු ආරම්භයේදී යෝජනා.

**ගරු කංචන විජේසේකර මහතා**
(மாண்புமிகு கஞ்சன விஜேசேகர)
(The Hon. Kanchana Wijesekera)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, -

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු කංචන විජේසේකර රාජ්‍ය ඇමතිතුමා, අවසාන වශයෙන් කියන්න.

**ගරු කංචන විජේසේකර මහතා**
(மாண்புமிகு கஞ்சன விஜேசேகர)
(The Hon. Kanchana Wijesekera)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා ඔබතුමාගෙන් ඉල්ලීමක් කරනවා, බැංකුවට ගිහින් ඒ පටිගත කර සඟවා තිබෙන, තැන්පත් කර තිබෙන හඬ පට ගෙන එන්න මෙතුමාට විශේෂ අවසරයක් හෝ දෙන්න කියලා. මොකද, ඒ විශේෂ පහසුකම ලබා දුන්නොත් තවත් කරුණු අනාවරණ කර ගන්න පුළුවන් වෙයි. ඒ වාගේම ගරු නියෝජ්‍ය කථානායකතුමනි, එතුමාගේ මුලික හඬ පටය පොලීසියෙන් ගත්තාට පස්සේ එතුමා සතියක පමණ කාලයක් නිදහසේයි සිටියේ. ඒ නිදහසේ සිටි කාලය තුළ එතුමාට බැංකුවට ගිහින් ඒවා ලබාගන්න බැරි වුණාද, ඒවා ලබා ගත්තේ නැත්තේ ඇයි කියලා සැකයකුත් තිබෙනවා.

**ගරු රන්ජන් රාමනායක මහතා**
(மாண்புமிகு ரஞ்ஜன் ராமநாயக்க)
(The Hon. Ranjan Ramanayake)
Sir, I rise to a point of Order.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
රන්ජන් රාමනායක මන්ත්‍රීතුමනි, ඔබතුමා දැන් අවසාන කරන්න.

**ගරු රන්ජන් රාමනායක මහතා**
(மாண்புமிகு ரஞ்ஜன் ராமநாயக்க)
(The Hon. Ranjan Ramanayake)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මට අධිකරණය මඟින් දවස් දෙකක් ඇප ලබා දුන්නොත් මේ සියලු දේවල් කරලා දෙන්නම්.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ප්‍රධාන වැඩ කටයුතු ආරම්භයේදී යෝජනා පිළිබඳ දැනුම්දීම.

## පාර්ලිමේන්තුවේ කටයුතු
### பாராளுமன்ற அலுவல்
### BUSINESS OF THE PARLIAMENT

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

> "න්‍යාය පත්‍රයේ ප්‍රධාන කටයුතුවල විෂයය අංක 15, 16 සහ 22 විෂයයන් පිළිබඳ වැඩ අද දින රැස්වීමේදී 27 දරන පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝගයෙහි විධිවිධානයන්ගෙන් නිදහස් විය යුතු ය."

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභාව
## பாராளுமன்ற அலுவல்கள் பற்றிய குழு
## COMMITTEE ON PARLIAMENTARY BUSINESS

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 115 හි විධිවිධානවල කුමක් සඳහන්ව තිබුණ ද, පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභාව, කථානායකවරයා සභාපතිවරයා වූ ද, නියෝජ්‍ය කථානායකවරයා, නියෝජ්‍ය කාරක සභා සභාපතිවරයා, පාර්ලිමේන්තුවේ සභානායකවරයා, විරුද්ධ පාර්ශ්වයේ නායකවරයා, ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකවරයා, විරුද්ධ පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකවරයා සහ තේරීම් කාරක සභාව විසින් නම් කරනු ලබන තවත් සාමාජික මන්ත්‍රීවරයන් විසිහතර දෙනෙකුගෙන් (24) සමන්විත විය යුතු ය."

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## උසස් නිලතල පිළිබඳ කාරක සභාව
## உயர் பதவிகள் பற்றிய குழு
## COMMITTEE ON HIGH POSTS

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 124(1) හි විධිවිධානවල සහ 2019 ජූලි 12 වැනි දින පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද යෝජනාවේ කුමක් සඳහන්ව තිබුණ ද, 2020 ජනවාරි 21 වැනි දින තේරීම් කාරක සභාව විසින් තීරණය කරන ලද පරිදි උසස් නිලතල පිළිබඳ කාරක සභාව, තේරීම් කාරක සභාව විසින් නම් කරනු ලබන පාර්ලිමේන්තු මන්ත්‍රීවරයන් විසිපස් දෙනෙකුගෙන් (25) සමන්විත විය යුතු ය."

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභාව: සාමාජිකයන් නම් කිරීම
## பாராளுமன்ற அலுவல்கள் பற்றிய குழு: உறுப்பினர்கள் நியமனம்
## COMMITTEE ON PARLIAMENTARY BUSINESS: NOMINATION OF MEMBERS

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග අංක 115 විධිවිධාන සහ අද දින පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද යෝජනා ප්‍රකාරව තේරීම් කාරක සභාව විසින් කථානායකවරයා සභාපතිවරයා වූ ද, නියෝජ්‍ය කථානායකවරයා, නියෝජ්‍ය කාරක සභා සභාපතිවරයා, පාර්ලිමේන්තුවේ සභානායකවරයා, විරුද්ධ පාර්ශ්වයේ නායකවරයා, ආණ්ඩු පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකවරයා, විරුද්ධ පාර්ශ්වයේ ප්‍රධාන සංවිධායකවරයා සමඟ පාර්ලිමේන්තු කටයුතු පිළිබඳ කාරක සභාවේ සේවය කිරීම සඳහා මතු සඳහන් මන්ත්‍රීවරුන් නම් කරන ලද බව දන්වනු කැමැත්තෙමි.

ගරු චමල් රාජපක්ෂ මහතා
ගරු නිමල් සිරිපාල ද සිල්වා මහතා
ගරු මහින්ද අමරවීර මහතා
ගරු ආරුමුගන් තොණ්ඩමන් මහතා
ගරු ඩග්ලස් දේවානන්දා මහතා
ගරු ඩලස් අලහප්පෙරුම මහතා
ගරු විමල් වීරවංශ මහතා
ගරු ප්‍රසන්න රණතුංග මහතා
ගරු මහින්ද සමරසිංහ මහතා
ගරු ඩබ්ලිව්.ඩී.ජේ. සෙනෙවිරත්න මහතා
ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා
ගරු වාසුදේව නානායක්කාර මහතා
ගරු දයාසිරි ජයසේකර මහතා
ගරු තිලංග සුමතිපාල මහතා
ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මහතා
ගරු අනුර දිසානායක මහතා
ගරු රවුෆ් හකීම් මහතා
ගරු රවි කරුණානායක මහතා
ගරු රිසාඩ් බදියුදීන් මහතා
ගරු මනෝ ගනේසන් මහතා
ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල මහතා
ගරු අජිත් පී. පෙරේරා මහතා
ගරු එම්.ඒ. සුමන්තිරන් මහතා

## උසස් නිලතල පිළිබඳ කාරක සභාව: සාමාජිකයන් නම් කිරීම
## உயர் பதவிகள் பற்றிய குழு: உறுப்பினர்கள் நியமனம்
## COMMITTEE ON HIGH POSTS: NOMINATION OF MEMBERS

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 124(1)හි විධිවිධාන සහ 2019 ජූලි 12 වැනි දින පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද යෝජනාවෙහි කුමක් සඳහන්ව තිබුණ ද, 2020 ජනවාරි 22 වැනි දින පාර්ලිමේන්තුව විසින් සම්මත කරන ලද යෝජනාව ප්‍රකාරව උසස් නිලතල පිළිබඳ කාරක සභාවේ සේවය කිරීම සඳහා මතු සඳහන් මන්ත්‍රීවරුන්ද තේරීම් කාරක සභාව විසින් නම් කරන ලද බව දන්වනු කැමැත්තෙමි.

ගරු චමල් රාජපක්ෂ මහතා
ගරු ආරුමුගන් තොණ්ඩමන් මහතා
ගරු (ආචාර්ය) බන්දුල ගුණවර්ධන මහතා
ගරු (වෛද්‍ය) රමේෂ් පතිරණ මහතා

[ගරු නියෝජ්‍ය කථානායකතුමා]

ගරු අනුර ප්‍රියදර්ශන යාපා මහතා
ගරු කෙහෙළිය රඹුක්වැල්ල මහතා
ගරු විදුර වික්‍රමනායක මහතා
ගරු ෆයිසර් මුස්තාපා මහතා

යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත වැඩකටයුතු.

අග්‍රාමාත්‍යතුමා සහ මුදල්, ආර්ථික සහ ප්‍රතිපත්ති සංවර්ධන අමාත්‍ය, බුද්ධශාසන, සංස්කෘතික සහ ආගමික කටයුතු අමාත්‍ය සහ නාගරික සංවර්ධන, ජල සම්පාදන සහ නිවාස පහසුකම් අමාත්‍යතුමා.

## ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන පනත: නියෝග
## நிர்மாணத் தொழில் அபிவிருத்திச் சட்டம்: ஒழுங்குவிதிகள்
## CONSTRUCTION INDUSTRY DEVELOPMENT ACT: REGULATIONS

**ගරු දිනේෂ් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு தினேஷ் குணவர்தன)
(The Hon. Dinesh Gunawardena)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අග්‍රාමාත්‍යතුමා සහ මුදල්, ආර්ථික සහ ප්‍රතිපත්ති සංවර්ධන අමාත්‍ය, බුද්ධශාසන, සංස්කෘතික සහ ආගමික කටයුතු අමාත්‍ය සහ නාගරික සංවර්ධන, ජල සම්පාදන සහ නිවාස පහසුකම් අමාත්‍යතුමා වෙනුවෙන් මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"2014 අංක 33 දරන ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන පනතේ 52(2) වගන්තිය සමඟ කියවිය යුතු එකී පනතේ 58 වගන්තිය යටතේ තිරකවරයන් ලියාපදිංචි කිරීම සම්බන්ධයෙන් නිවාස, ඉදිකිරීම් සහ සංස්කෘතික කටයුතු අමාත්‍යවරයා විසින් සාදන ලදුව, 2019 මාර්තු 08 දිනැති අංක 2113/63 දරන අති විශේෂ

ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2019.08.06 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කළ යුතු ය."

*ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.*
*வினா எடுத்தியம்பப்பெற்றது.*
*Question proposed.*

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

ගරු ගාමිණී ලොකුගේ මැතිතුමනි, ඔබතුමා විවාදය ආරම්භ කරන්න.

[අ.භා. 2.29]

**ගරු ගාමිණී ලොකුගේ මහතා (නාගරික සංවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு காமினி லொக்குகே - நகர அபிவிருத்தி இராஜாங்க அமைச்சர்)
(The Hon. Gamini Lokuge - State Minister of Urban Development)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඉදිකිරීම් කර්මාන්තය තුළ මතු වූ විවිධ ගැටලු නිසා මෙම සංශෝධන ඉදිරිපත් කරනවා.

ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන පනත යටතේ නියෝග හැඳින්වීම. 2014 අංක 33 දරන ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන පනතේ 52(2) වගන්තිය යටතේ වූ මෙම නියෝග මඟින් තිරකවරයන් ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරිය සමඟ ලියා පදිංචි කිරීමේ පරිපාටිය සහ එම ලියා පදිංචිය අලුත් කිරීමේ පරිපාටිය නියම කරනු ලැබේ. මෙම ලියා පදිංචි වීම සඳහා අවශ්‍ය සුදුසුකම් හා පළපුරුද්ද මෙන්ම එලෙස අධිකාරිය සමඟ ලියා පදිංචි වීමේ කාර්ය පරිපාටිය දැක්වෙන අතර, විශේෂයෙන් මෙම කටයුත්ත කරන්න සිද්ධ වුණේ ගොඩනැඟිලි කර්මාන්තය තුළ තිබෙන විවිධ ගැටලු පිළිබඳවත් ඒවා නිරාකරණය කිරීම පිළිබඳවත් ක්‍රමවත් හා විධිමත් වැඩ පිළිවෙළක අවශ්‍යතාව මතු වූ නිසාය. නීත්‍යනුකූල වැඩ පිළිවෙළක් ආරම්භ කරන්න ඕනෑ නිසා මේ තිරකවරු පත් කිරීම සඳහා වැඩ පිළිවෙළක් සකස් කර තිබෙනවා. ඒ වැඩ පිළිවෙළ අනුව තමයි මේ නියෝග ඉදිරිපත් කළේ. ඒකට අධිකාරියක් පත් කරනවා. අධිකාරිය පත් කරන කොට ඒ සඳහා වුවමනා කරන නිලධාරීන් පත් කිරීම, ඒවාට අභියාචන ඉදිරිපත් කිරීම් පිළිබඳව, ඒවාට ඕනෑ කරන යෝජනා ඉදිරිපත් කිරීම පිළිබඳව හරියාකාර නීති රීති තිබුණේ නැහැ. අද ගොඩනැඟිලි කර්මාන්තය තමයි ලංකාවේ විශාලම කර්මාන්තය බවට පත් වෙලා තිබෙන්නේ. ගොඩනැඟිලි කර්මාන්තය තුළ යම්කිසි කර්මාන්තයක් පිළිබඳව ගිවිසුම් ගත වුණාම, කර්මාන්තයක් ආරම්භ කළාම, කොන්ත්‍රාත්තුවක් පිළිබඳව විවිධ ප්‍රශ්න, ගැටලු ඇති වුණාම ඒවා නිරාකරණය කිරීමට අවශ්‍ය නීතිමය ප්‍රතිපාදනය තිබිය යුතුයි. මේ නියෝග තුළින් ඒ පිළිබඳ අවශ්‍ය ප්‍රතිපාදන සකස් කර තිබෙන්නේ ඒ නිසායි. ඒ සඳහා පත් වන අධිකාරියේ නිලධාරීන්ට කොයි වාගේ අධ්‍යාපනයක් තිබිය යුතුද, කුමන ආකාරයේ සුදුසුකමක් තිබිය යුතුද, ඒ අය කුමන ආකාරයෙන් කටයුතු කළ යුතුද යන්න පිළිබඳව තීරණය කිරීමට මෙන්ම ඒ අධිකාරිය පත් වුණාට පස්සේ ඒ අධිකාරිය තුළින් කරන කාර්යභාරය, කටයුතු පිළිබඳවත් නීත්‍යනුකූල පියවර ගන්න ඕනෑ නිසා තමයි මේ නියෝග ඉදිරිපත් කර තිබෙන්නේ. ඒ විතරක් නොවෙයි. මේ ගැන බොහොම ගැඹුරින් කල්පනා කරලා මේ කර්මාන්තය තුළ පවතින ගැටලුවලට දෙපාර්ශ්වයටම විසඳුමක් ලබා ගන්න පුළුවන් වැඩ පිළිවෙළක් හැටියට තමයි අද දින මේ නියෝග ඉදිරිපත් කර තිබෙන්නේ. ඒ නිසා අද දින ඉදිරිපත් කරන නියෝග පාර්ලිමේන්තුව තුළදී සම්මත කර දෙන ලෙස ඉල්ලා සිටිමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

මීළඟට, ගරු එස්.එම්. මරික්කාර් මැතිතුමා. ඔබතුමාට විනාඩි 10ක කාලයක් තිබෙනවා.

[අ.භා. 2.32]

**ගරු එස්.එම්. මරික්කාර් මහතා**
(மாண்புமிகு எஸ்.எம். மரிக்கார்)
(The Hon. S.M. Marikkar)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, විෂයයට අදාළව මගේ කථාව ආරම්භ කරන්නට කලින් මේ කාරණය කියනවා.

විශේෂයෙන් රන්ජන් රාමනායක මැතිතුමා ඊයේ පාර්ලිමේන්තුවේදී කළ කථාවත් එක්ක සමාජය තුළ මතයක් යනවා එතුමා පාර්ලිමේන්තුවේ හිටපු 225දෙනාගේම සළු පිළි උනා දැම්මා කියලා. එතුමා කිව්වා, මේ පාර්ලිමේන්තුවේ වැලි පර්මිට් තියෙන 75ක් ඉන්නවා කියලා. ඒ අතරින් කෙනෙක් නොවීම පිළිබඳව මා සතුටුයි. ඒ වාගේම බාර් පර්මිට් තියෙන 100ක් ඉන්නවා කියලා එතුමා කිව්වා. ඒ කෙනෙක් නොවීම පිළිබඳවත් මා සතුටුයි. ඒ වාගේම එතනෝල් ගෙනෙන හතරදෙනෙක් ඉන්නවා කියලා ප්‍රකාශ කර තියෙනවා. ඒ කෙනෙක් නොවීම පිළිබඳවත් මා සතුටුයි. ඒ වාගේම කුඩු

ගෙනෙන දෙන්නෙකුයි, race-by-race දමන එක්කෙනෙකුයි පාර්ලිමේන්තුවේ ඉන්නවා කියලා එතුමා කිව්වා. එහෙම නොවීම පිළිබඳවත් මා සතුටු වෙනවා. ඒ නිසා විකල්ප හොයන්න ඕනෑ නැහැ. ආදර්ශ පාර්ලිමේන්තුව ඇතුළේම, මේ 225 ඇතුළේම ඉන්නවා කියන එක මා ඉතා පැහැදිලිව සතුටින් කියන්න කැමැතියි. රන්ජන් රාමනායක මැතිතුමා සඳහන් කරපු ඒවායේ හඬපට ඔක්කෝම සභාගත කරලා නැහැ. ඒ කියන ඒවා ඔප්පු කරන්න පුළුවන් වෙන්නත් ඕනෑ. ඒ නිසා එතුමාගේ ප්‍රකාශය හරහා එතුමා පමණක් නිදහස් වෙලා අනික් සියලුදෙනා වැරදිකරුවන් වනවා නම්, ඒකට එකඟ වෙන්න අපට බැහැ. හේතුව, අපි ඒ නිරවද්‍යතාව පෙන්වලා තිබෙන නිසා. අපේ අත් දෙකේම ඇඟිලි දහයම, නියපොතු දහයම පිරිසිදුයි කියලා ක්‍රියාවෙන්ම ඔප්පු කර පෙන්වා තිබෙනවා. නමුත් එතුමා ඒ තර්කය ගෙන ආ එක ගැන මා සතුටු වෙනවා. මොකද, ඒ නිසා අපටත් අවස්ථාවක් ලැබුණා, පාර්ලිමේන්තුවට ආදර්ශයක් දීලා තිබෙන බව කියන්නට. මම ඒ පිළිබඳව ඊට වඩා දීර්ඝව කථා කරන්න යන්නේ නැහැ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, විශේෂයෙන් අද ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන පනත යටතේ නියෝග ගෙනෙන්නට කටයුතු කිරීම පිළිබඳව ගරු ගාමිණී ලොකුගේ රාජ්‍ය ඇමතිතුමාට මා ස්තුතිවන්ත වෙනවා. විශේෂයෙන්ම පසුගිය අවුරුදු දහයක, පහළොවක කාලය තුළ අපේ රටේ සංවර්ධන වැඩකටයුතුවලදී, විශේෂයෙන්ම ගොඩනැගිලි ඉදි කිරීමේ සහ මහාමාර්ග ඉදි කිරීමේ කාර්යයේදී චීන ආක්‍රමණයකට නතු වෙච්ච රාජ්‍යයක් බවට ශ්‍රී ලංකාව පත්වෙලා තිබුණා. අද රජයේ ඉදි කිරීම් සඳහා පමණක් නොවෙයි, පෞද්ගලික අංශයේ ඉදි කිරීම් සඳහාත් චීන සමාගම් ලංකාවට ඇවිල්ලා සෘජුව ඊට සම්බන්ධ වෙලා, අපේ රටේ මුදල් ඒ අය සෘජුව ගෙන යනවා. මේ ගොල්ලන් එක්ක තරගකාරිත්වයක් දෙන්න අපේ දේශීය ව්‍යවසායකයන්ට අමාරු වෙලා තිබෙනවා. හේතුව, ඔවුන් චීන රටෙන් සියයට 1ක වාගේ ඉතා අඩු පොලියට ණය අරගෙන ඇවිල්ලා මෙහේ ඒ වැඩකටයුතු කරලා ලාභ උපයාගෙන චීනයට ගියාම, චීන ආණ්ඩුවෙන් ඔවුන්ට සියයට 15ක donation එකක් ලබා දෙන නිසා. ඒ නිසා මේ හරහා අද ප්‍රධාන පෙළේ සමාගම් 10ක් පමණ සම්පූර්ණයෙන්ම වසා දමා තිබෙනවා. ඒ වාගේම ඉදිකිරීම් ක්ෂේත්‍රයට සම්බන්ධ සාමාන්‍ය පොඩි සමාගම් 200ක් පමණත් වසා දමා තිබෙනවා. අද එවැනි තත්ත්වයක් ඇති වෙලා තිබෙන්නේ ඔවුන්ට චීන සමාගම් සමග තරග කරන්න බැරි හින්දායි.

අනෙක් පැත්තෙන් අද ශ්‍රීලාංකික සේවකයන් ගණනාවකගේ රැකියා අහිමි වෙලා තිබෙනවා. මේ එන චීන සමාගම්වලින් ඔවුන්ට ETF එක ගෙවන්නේ නැහැ; EPF එක ගෙවන්නේ නැහැ.

ඒ එක්කම අපට තවත් ප්‍රශ්නයක් පැන නැඟී තිබෙනවා, මේ රටේ සල්ලි ටික අරගෙන මේ ගොල්ලන් චීනයට ඒ සල්ලි ගෙනිච්චේ කොහොමද කියලා. ඒකෙන් මුදල් විශුද්ධිකරණයක් වෙනවා කියන එක තමයි මගේ හැඟීම. උදාහරණයක් විධියට රුපියල් ලක්ෂ 5ක AC machine එකක් තිබෙනවා නම් ඒකට Rs. 2 millionවල purchase order එකක් දාලා, ඒ Rs. 2 million මුදල යවලා රුපියල් ලක්ෂ පහේ machine එක මෙහාට ගෙනෙනවා. එතකොට රජයට එන්න ඕනෑ, වැට් එක එන්නේත් නැහැ, අනිකුත් බදු ටික එන්නේත් නැහැ. මේ හරහා රාජ්‍ය ආදායම අහිමි වෙලා තිබෙනවා; දේශීය ව්‍යවසායකයා නැතිවෙලා තිබෙනවා. ඒ වාගේම අපේ රටේ වැඩ කරන කම්කරුවාගේ රැකියා අහිමිවන තත්ත්වයකුත් නිර්මාණය වෙලා තිබෙනවා. විශේෂයෙන්ම මේ හරහා පසුගිය කාලයේ දේශීය සමාගම් මොන වාගේ අමාරු තත්ත්වයන්ටද මුහුණ දුන්නේ කියලා අපි දැක්කා.

ඒ සමඟම තවත් කූට ව්‍යාපාරයක් මෙහි වෙනවා, ඇමතිතුමනි. මේකත් හොයා බලන්න. සමහර සමාගම් ලංකාවේ නියෝජිතයකු පත් කර ගන්නවා. එහෙම නියෝජිතයකු පත් කර ගෙන සියයට 5ක් ඔවුන්ට දීලා සම්පූර්ණ වැඩ කොටසම ඒ ගොල්ලන් කරනවා. මේක තනිකර මුළාවක්. මේ සමාගම් ලියාපදිංචියේදී එහෙම නැත්නම් හවුල් ව්‍යාපාර ආරම්භ කිරීමේදී ප්‍රාග්ධන හැකියාව මොකක්ද, ඒ ප්‍රාග්ධනය ආවේ කොහෙන්ද, ඒ ගොල්ලන්ගේ manpower capacity එක මොකක්ද, ඒ ගොල්ලන්ගේ experience එක මොකක්ද කියලා ලියාපදිංචියට පෙරම බලන්න ඕනෑ. ඒක අනිවාර්ය කරන්න ඕනෑ. එහෙම නැතිව මේ දේ තහනම් කළාය කියලා සම්පූර්ණයෙන්ම මේ කටයුත්ත නතර වෙන්නේ නැහැ. ඒ නිසා මම ඔබතුමාගෙන් ඉල්ලීමක් කරනවා, ඒකත් මේ නියෝගවලට අනුගත කරන්න කියලා.

**ගරු ගාමිණී ලොකුගේ මහතා**
(மாண்புமிகு காமினி லொக்குகே)
(The Hon. Gamini Lokuge)

මේ කොයි එකක්වත් පනතින් තහනම් කිරීමක් කරන්නේ නැහැ. පනතේ තිබෙන්නේ කොන්ත්‍රාත් සමාගම් සමඟ ප්‍රශ්නයක් ආවොත් ඒක නියාමනය කිරීමක්; ඒ පිළිබඳව විසඳුමක් ලබා දීමක්; ඒ පිළිබඳව arbitration එකක් පත් කිරීම.

**ගරු එස්.එම්. මරික්කාර් මහතා**
(மாண்புமிகு எஸ்.எம். மரிக்கார்)
(The Hon. S.M. Marikkar)

හරි, ගැටලුවක් නැහැ, බොහොම හොඳයි. ඒ නියාමනය කිරීමේදී මේ සමාගම් ලංකාවේ හවුල් ව්‍යාපාර ආරම්භ කරන කොට ලංකාවේ ආණ්ඩුවටත්, ඒ වාගේම ලංකාවේ සමාගම්වලටත්, ලංකාවේ පුරවැසියන්ටත් නිසියාකාර ක්‍රමවේදයකට අනුව මේ ප්‍රතිලාභ ලැබෙනවාද කියන එක සොයා බලන්න. එහෙම නැත්නම් සමහර අය ඉන්නවා, සියයට 5 දීලා ඒ ගොල්ලන්ම ඒ කාර්ය කර ගෙන යන.

**ගරු ගාමිණී ලොකුගේ මහතා**
(மாண்புமிகு காமினி லொக்குகே)
(The Hon. Gamini Lokuge)

මෙතැන ප්‍රශ්නයක් තිබෙනවා. සාමාන්‍යයෙන් ගිවිසුමක් අත්සන් කරන කොට ඒ ගිවිසුම අත්සන් කරන මොහොතේදීම තීන්දු කරනවා, මේ ගනුදෙනුව, එහෙම නැත්නම් මේ contract එක විදේශ මුදල්වලින් sign කරනවාද, රුපියල්වලින් sign කරනවාද කියලා. එතකොට ඒ ගිවිසුම ඩොලර්වලින් අත්සන් කළොත් ඒක ගණනය කරන්නේ US Dollar exchange rate එකට; රුපියල්වලින් අත්සන් කළොත් රුපියල්වලටයි ඒක ගණනය කරන්නේ. ඒක බොහොම පැහැදිලියි. මහා පරිමාණයේ ඕනෑම ගොඩනැගිලි කොන්ත්‍රාත් එකක් අත්සන් කරන කොට මුලින්ම ඒකේ සඳහන් වෙනවා, මේ විදේශ සමාගමත් එක්ක අපි ගනුදෙනු කරන්නේ එහෙම නැත්නම් ගිවිසුම් අත්සන් කරන්නේ විදේශ මුදල්වලින් බව, එහෙම නැත්නම් අපි ඒ ගනුදෙනුව කරන්නේ රුපියල්වලින් බව. ඒක බොහොම පැහැදිලියි. මේ පනතින් බලාපොරොත්තු වන්නේ ගිවිසුමක් අත්සන් කරලා ඒ ගිවිසුම ක්‍රියාත්මක වනකොට යම් කිසි සට්ටනයක් ඇති වුණොත්, ප්‍රශ්නයක් ඇති වුණොත් ඒක නියාමනය කරන්නේ කොහොමද කියලායි. ඒකට ඕනෑ කරන නීතිරීති තමයි මේ නියෝග තුළින් සම්පූර්ණ කරලා තිබෙන්නේ.

**ගරු එස්.එම්. මරික්කාර් මහතා**
(மாண்புமிகு எஸ்.எம். மரிக்கார்)
(The Hon. S.M. Marikkar)

බොහොම හොඳයි, ඇමතිතුමනි. මේ නියාමනය පිළිබඳව මම සම්පූර්ණයෙන්ම සතුටුවනවා සහ එකඟවනවා. ඒ නියාමනයට අදාළව තවත් එකතු කරන්න පුළුවන් කරුණු කාරණා කීපයක් තමයි මම සඳහන් කරන්නේ. මගේ මේ සඳහන් කිරීමේ තිබෙන හොඳ දේවල් තිබෙනවා නම්, ඔබතුමන්ලා ගන්න කියන එකයි මම යෝජනා කරන්නේ. මේ රටේ සිටින මහජන නියෝජිතයන් හැටියට අපේ ප්‍රමුඛතාව හිමිවන්නේ මේ රටේ ව්‍යවසායකයන්ට, මේ රජයට ලැබිය යුතු මුදල් ලැබීමට සැලැස්වීම සහ මේ රටේ

[ගරු එස්.එම්. මරික්කාර් මහතා]

පුරවැසියන්ගේ රැකියාවල සුරක්ෂිතභාවය සහ ඔවුන්ට ලැබිය යුතු වරප්‍රසාද ටික ආරක්ෂා කර දීමයි. මම යෝජනා කරන කරුණුවල අන්තර්ගතය සහ බලාපොරොත්තුව වෙන්නේත් එයයි. එහෙම නැතිව මේවා පිළිබඳව විවේචනය කිරීමක් නොවෙයි. මොකද, ඒ හොඳ දේ අපි ඉතා පැහැදිලිව කියලා තිබෙනවා.

**ගරු වාසුදේව නානායක්කාර මහතා (ජල සම්පාදන පහසුකම් රාජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு வாசுதேவ நாணாயக்கார - நீர்வழங்கல் வசதிகள் இராஜாங்க அமைச்சர்)
(The Hon. Vasudeva Nanayakkara - State Minister of Water Supply Facilities)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමා චීන සමාගම් විතරක් උදාහරණයට ගත්තේ ඇයි?

**ගරු එස්.එම්. මරික්කාර් මහතා**
(மாண்புமிகு எஸ்.எம். மரிக்கார்)
(The Hon. S.M. Marikkar)
මම චීන සමාගම් කියන එක මූලිකව කිව්වේ මට චීනයත් එක්ක පෞද්ගලික ප්‍රශ්නයක් තිබෙන නිසා නොවෙයි. නමුත්, ලංකාවේ ඉදිකිරීම් ක්ෂේත්‍රයේ විදේශ සමාගම්වල ආක්‍රමණයෙන් සියයට 90කට වැඩියෙන් තිබෙන්නේ චීන සමාගම්වලින්. මේ නීතිරීති චීන සමාගම්වලට විතරක් දමන්න කියලා මම කියන්නේ නැහැ. ඕනෑම විදේශ රටක සමාගම් ලංකාවේ ව්‍යාපාර කිරීමේදී සහ ලංකාවේ ඉදිකිරීම් ක්ෂේත්‍රයට අදාළව කටයුතු කිරීමේදී මේ කියන නියාමනය එකතු කරන්න කියලා මම ඉල්ලා සිටිනවා.

ගරු ඇමතිතුමනි, ඒ එක්කම දැන් ඔබතුමා කිව්වා, ඩොලර්වලින් අත්සන් කරන ගිවිසුම් ඩොලර්වලට අනුව බලපානවා, Sri Lankan Rupeesවලින් අත්සන් කළොත් රුපියල්වලට අනුව බලපානවා කියලා. ඒක හරි. ඒක හොඳයි. හැබැයි, මම ඔබතුමාට එක උදාහරණයක් දෙන්නම්.

ලංකාවේ එක පෞද්ගලික සමාගමක්, -ඒ සමාගමේ නම කියන්නට මම කැමැති නැහැ- රුපියල් බිලියන 18ක කොන්ත්‍රාත්තුවක් දුන්නා, චීන සමාගමකට. ඒ සමාගම රුපියල් බිලියන 18ටම අදාළ කොන්ත්‍රාත්තුව අරගෙන, චීනයෙන් සේවකයන් ගෙනැල්ලා, ඒ සේවකයෝ හරහා වැඩ කරලා ඒ සල්ලි ටික ඒ රටට ගෙනිච්චා. ගරු ඇමතිතුමනි, ඒ සමාගමේ ව්‍යාපාරවලින් සියයට 90ක් තිබෙන්නේ ලංකාවේ. ඒ සමාගමේ බඩු මිලදී ගන්නේ මේ රටේ පුරවැසියන්. අපේ රටෙන් හම්බ කළ ලාභයෙන් තමයි ඒ අය ආයෝජනය කරන්නේ. ඒ ආයෝජනය සම්පූර්ණයෙන්ම විදේශ රටකට ගිහිල්ලා තිබෙන්නේ. මේවා නියාමනය කරන්න පුළුවන් ආකාරයට, මේවා පාලනය කරන්නට පුළුවන් ආකාරයට රාජ්‍ය ආයතනවලට පමණක් නොවෙයි පෞද්ගලික අංශයටත් බලපාන පරිදි නීති හදන්නට පුළුවන් නම් වඩාත් හොඳයි කියන එකයි මගේ අදහස.

කොළඹ - මහනුවර අධිවේගී මාර්ගයේ දෙවන පියවර සම්පූර්ණයෙන්ම ශ්‍රී ලාංකීය සමාගම් 10ක් හෝ 12ක් එකතුවෙලා තමයි කළේ. ඒ අය වැඩේ නියමෙටම කරලා තිබෙනවා. මේ නියාමනය ගෙන එනවා වාගේම අපේ ව්‍යවසායකයන් දිරි ගන්වන්නට අඩු පොලී ණය ලබා දීම, තවදුරටත් සහන ලබා දීම් සහ ඔවුන් දිරිගන්වන වැඩ පිළිවෙළක් තිබෙන්නට ඕනෑ.

අපි රැකියා විරහිතභාවය ගැන කථා කරනවා. රැකියා නැති විශාල පිරිසක් අද ඉන්නවා. වර්තමානය වන විට උපාධි අරගෙන රැකියා නැති විශාල පිරිසක් ඉන්නවා. ඒ වාගේම සාමාන්‍ය පෙළ සහ අට වසර පමණක් සමත්වෙලා රැකියා විරහිතව විශාල ශ්‍රී ලාංකිකයන් පිරිසක් ඉන්නවා. ලංකාවේ සංවර්ධනය වෙනුවෙන් කරන ඉදි කිරීම් ක්ෂේත්‍රයේ ඉහළ පෙළේ තනතුරුවලට, engineering වාගේ technical ක්ෂේත්‍රයේ තනතුරුවලට උගත් බුද්ධිමත් අය විදේශ රටවලින් ගෙන ඒම ප්‍රශ්නයක් නැහැ. හැබැයි, කවර සමාගමක් ආවත් සාමාන්‍ය රැකියාවලට ශ්‍රී ලාංකික පුරවැසියන් යොදා ගත යුතුයි කියන කොන්දේසියක් මේ නියෝගවලට එකතු කරන්නට පුළුවන් නම් තවත් ඵලදායි වෙනවා කියන එකයි මගේ අදහස.

මම දීර්ඝ ලෙස කථා කරන්නට බලාපොරොත්තු වෙන්නේ නැහැ. ගරු ඇමතිතුමනි, දැන් මම තමුන්නාන්සේගෙන් ඉල්ලීමක් කරනවා. මාර්ග සංවර්ධන අධිකාරියේ ඉදි කිරීම් වැඩ කටයුතු කරන ව්‍යාපෘති ගණනාවක් තිබෙනවා. ඒ අමාත්‍යාංශයේ සිටි අධීක්ෂණ මන්ත්‍රීවරයකු වශයෙන් මම පෞද්ගලිකවම දන්නවා, ඒ ව්‍යාපෘතිවල චීන සමාගම්වල සාමාන්‍ය සේවකයන් විශාල ප්‍රමාණයක් සිටිනවා කියලා. අපේ ලංකාවේ මිනිසුන්ට මේ අවස්ථාව දෙන්න. ඒවාට අදාළ නීති සංශෝධනය කරන්න අපි සහයෝගය ලබා දෙන්නම්. එතකොට දේශීය කර්මාන්තකරුවා නැඟී සිටිනවා, ඒ වාගේම අපේ පුරවැසියන්ට රැකියා අවස්ථා ලැබෙනවා, රජයටත් ආදායමක් ලැබෙනවා. ඉදිරි කාලයේදී මේ වැඩ කටයුතු ටිකත් නිවැරදි කරන්න කියා මම ඉල්ලා සිටිනවා. ඒක අධිවේගී මාර්ගය වෙන්න පුළුවන්, ගොඩනැඟිලි ඉදි කිරීම් වෙන්න පුළුවන්, නාගරික උද්‍යාන වෙන්න පුළුවන්, පාලම් හදන ඒවා වෙන්න පුළුවන්. මෙකී නොකී ඕනෑම ආකාරයක සංවර්ධන වැඩ කටයුත්තක් වෙන්න පුළුවන්. ඒවායේ ප්‍රමුඛතාව සහ ඒවායේ වාසිය - benefit එක - ශ්‍රී ලංකා රජයටත්, ශ්‍රී ලාංකික සමාගම්වලටත්, ශ්‍රී ලාංකික පුරවැසියන්ටත් ලබා දීමට අවශ්‍ය මූලික පියවර ගෙන, ඒවායින් රිංගන්නට බැරි වෙන විධියට නීති ගෙන එන ලෙස ගරු ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිමින් මගේ කථාව අවසන් කරනවා. බොහොම ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
මීළඟට, ගරු ලසන්ත අලගියවන්න මැතිතුමා. ඔබතුමාට විනාඩි 12ක කාලයක් තිබෙනවා.

[අ.භා. 2.43]

**ගරු ලසන්ත අලගියවන්න මහතා (රාජ්‍ය කළමනාකරණ හා ගිණුම් කටයුතු රාජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு லசந்த அலகியவன்ன - அரச முகாமைத்துவ மற்றும் கணக்கீட்டு அலுவல்கள் இராஜாங்க அமைச்சர்)
(The Hon. Lasantha Alagiyawanna - State Minister of Public Management and Accounting)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපේ රටට ඉතාම වැදගත් නියෝග කීපයක් පිළිබඳවයි අද මේ විවාදය පැවැත්වෙන්නේ. අපේ ජාතික ආර්ථිකයට ඉදි කිරීම් ක්ෂේත්‍රයෙන් සියයට 8ක දායකත්වයක් ලබා දෙනවා. ඕනෑම රටක වර්තමානයේ ඇතිවෙන ශීඝ්‍ර සංවර්ධනයට ඉදි කිරීම් ක්ෂේත්‍රය අත්‍යවශ්‍ය සාධයක්, අත්‍යවශ්‍ය කරුණක්. ඒ අනුව මේ ක්ෂේත්‍රය වෙනුවෙන් විවිධ ආකාරයේ ආයතන සහ නීති අපේ රටේ ස්ථාපිත කරලා, මේ පාර්ලිමේන්තුවේ ඒවා ගැන සාකච්ඡා කරලා තිබෙනවා. විශේෂයෙන්ම 70 දශකයේ රජයේ කර්මාන්තශාලාව විධිමත් ලෙස ඇති කළා. ඉන් පසුව 80 දශකයේ ICTAD ආයතනය මේ රටේ ස්ථාපිත කළා.

ICTAD ආයතනය ඇති කළ පනත වර්තමානයේ -2014 අවුරුද්ද වන විට- විශේෂයෙන්ම ඉදි කිරීම් සම්බන්ධව පුළුල් බලතල සහිත පනතක් බවට පරිවර්තනය කළා. 2014 වසරේ කළ ඒ පරිවර්තනයට අදාළ කරුණු ඇතුළත් කරලා ඉදිරිපත් කරපු පනතට අනුව නියෝග 26ක් ඉදිරිපත් කළ යුතුව තිබෙනවා. මේ වන විට ඒ නියෝග 12ක කටයුතු අවසාන කරලා තිබෙනවා. නියෝග 9ක් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරලා තිබෙනවා. එයින්

නියෝග 3ක් පමණයි අද ඉදිරිපත් කරලා තිබෙන්නේ. මේ ක්ෂේත්‍රයේ විවිධ කටයුතු සම්බන්ධයෙන් කරුණු ඇතුළත් තවත් නියෝග 14ක් ඉදිරිපත් විය යුතුව තිබෙනවා.

විශේෂයෙන්ම ICTAD ආයතනය තුළින් සිදු වුණේ, කොන්ත්‍රාත්කරුවන් සහ දේපළ සංවර්ධනය කරන්නන් ලියා පදිංචි කිරීම සහ ඒවා සම්බන්ධව යම්කිසි grading කිරීමකුයි. ඒ ක්‍රියාවලිය කිරීමට නිසි බලයක් කුමන ආකාරයකටවත් තිබුණේ නැහැ. නමුත්, අපේ රටේ ජාතික ආර්ථිකයට සියයට 8ක දායකත්වයක් ලබා දෙන ක්ෂේත්‍රයක් වන මේ ක්ෂේත්‍රයේ පවතින ගැටලු නිරාකරණය කිරීම සෑම රජයකම ප්‍රධානතම වග කීමක්, යුතුකමක් බවට පත් වෙලා තිබෙනවා. අපේ රටේ ඉදිකිරීම් ක්ෂේත්‍රයට තිබුණු රජයේ දායකත්වය අද වන විට ක්‍රමක්‍රමයෙන් අඩු වුණා. අපි ඒක පිළිගන්න ඕනෑ. අද එය දැවැන්ත ප්‍රශ්නයක්, අභියෝගයක් බවට පත් වෙලා තිබෙනවා. එම නිසා ජනාධිපතිතුමා විශේෂයෙන්ම ප්‍රතිපත්තිමය තීන්දු ගණනාවක් ගත්තා, මෙම ක්ෂේත්‍රයේ අභිවෘද්ධිය වෙනුවෙන්. ඉන් එකක් තමයි, රජයේ කොන්ත්‍රාත් දේශීය කර්මාන්තකරුවන්ට ලබා දීම. එය ඉතා වැදගත් දෙයක් විධියටයි අප දකින්නේ.

අපේ රටේ විවිධ ව්‍යාපෘති ක්‍රියාත්මක වන බව අපි දන්නවා. ඒවා සඳහා විදේශ ණය ගන්නවා. ඒ පිළිබඳ විශාල ප්‍රශ්න තිබෙනවා. ඒ ණය ලබා ගැනීමේදී අපට සිද්ධ වනවා ඒ රටවල විවිධ කොන්දේසිවලට එකඟ වෙලා කටයුතු කරන්න. ඒ ලබා ගන්නා ණය මුදලින් යම් ප්‍රමාණයක් අස්වාභාවික විධියට උපදේශන සේවා සඳහා අප ගෙවිය යුතුයි. ඒ වාගේම, ඒ රටවල් කියන ආයතනවලට ම ඒ ඉදි කිරීම් කොන්ත්‍රාත්තු ලබා දිය යුතුයි. ඒ අය කියන නිෂ්පාදන ඒ රටවලින් ලබාගත යුතුයි. අපි ඩොලර් මිලියන 2ක් ණය ගත්තොත්, අවසානයේ ඩොලර් මිලියන දශම 8ක විතර වත්කමක් තමයි අපේ රටේ ඉතිරි වෙන්නේ. එය රටක් විධියට අපි මුහුණ දෙන දැවැන්ත ප්‍රශ්නයක්. අපි ඒ සඳහා පැහැදිලි, ස්ථිරසාර විසඳුම් සෙවිය යුතුව තිබෙනවා. මෙම පසු බිම යටතේ තමයි අද වන විට රජය ප්‍රතිපත්තිමය වශයෙන් තීරණයක් ගෙන තිබෙන්නේ. රජයේ ඉදිකිරීම්වලදී දේශීය කර්මාන්තකරුවන්ට, දේශීය ඉදිකිරීම්කරුවන්ට ප්‍රමුඛතාව ලබා දීමට ගෙන තිබෙන තීන්දුව නිසා ඉදිරියේදී මේ රටේ ඉදිකිරීම් ක්ෂේත්‍රයේ දැවැන්ත විප්ලවයක් ඇති වන බව අප සඳහන් කරන්න ඕනෑ. ඒ අනුව, දැනට තිබෙන සියයට 8ක දායකත්වය මේ වැඩ පිළිවෙළ නිසා ඉදිරියේදී අනිවාර්යෙන්ම තව තවත් වැඩි වනවා කියන එක බොහොම පැහැදිලිව අප සඳහන් කරන්න ඕනෑ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඉදිකිරීම් කර්මාන්තයේ නියැළී සිටින කොන්ත්‍රාත්කරුවන් අද විවිධ ප්‍රශ්නවලට මුහුණ පානවා. ඒ අය රජය හෝ පෞද්ගලික අංශය සමඟ විවිධ ගිවිසුම් අත්සන් කරනවා. ඒ ගිවිසුම් ප්‍රකාරවම බොහෝ අවස්ථාවල කටයුතු සිද්ධ වෙන්නේ නැහැ. ගිවිසුම් ප්‍රකාරව කටයුතු සිදු නොවීම නිසා දැවැන්ත ප්‍රශ්නවලට කොන්ත්‍රාත්කරුවනුත් අනිවාර්යයෙන්ම මුහුණ දීලා තිබෙනවා. එකක් තමයි, නියමිත දිනවලට සල්ලි හම්බ නොවීම. ඒක ගිවිසුම් අත්සන් කළ අමාත්‍යාංශවල, ආයතනවල ප්‍රශ්නයක් නොවෙයි. ඒ ගැනත් සඳහන් කරන්න ඕනෑ. නමුත් ඒක ප්‍රශ්නයක්. අද ගෙන එන නියෝගවලින් කොන්ත්‍රාත්කරුවන්ගේ පාර්ශ්වයට සහනයක් ලැබෙනවා. අනෙක් අතට, එම ගිවිසුම් ප්‍රකාරව කටයුතු කිරීමේදී කොන්ත්‍රාත්කරුවන් සුළු පිරිසක් ගුණාත්මක වශයෙන් එම කටයුතු ඉටු නොකරපු අවස්ථාත් තිබෙනවා. ඒ නිසා රජයේ සහ පෞද්ගලික ආයතන විශාල අපහසුතාවලට ලක් වූ අවස්ථා තිබෙනවා. අද ඉදිරිපත් කර තිබෙන නියෝග තුළින් ඉදිකිරීම් කර්මාන්තයේ නියැළී සිටින කොන්ත්‍රාත්කරුවන් සුරක්ෂිත කරනවා. ඒ වාගේම ඉදිකිරීම් කර්මාන්තයේ නියැළී සිටින කොන්ත්‍රාත්කරුවන්ගේ සේවය ලබා ගන්නා අයත් සුරක්ෂිත වීමට අද ගෙනෙන මෙම නියෝග අනිවාර්යයෙන්ම රුකුලක් වෙනවා.

දැනට මේ සම්බන්ධව කටයුතු කරන ආයතනයක් නැහැ. දැනට සිද්ධ වෙන්නේ, ගිවිසුම් ප්‍රකාරව කටයුතු සිද්ධ වුණේ නැත්නම් උසාවියට යන එකයි. අපේ රටේ තිබෙන තත්ත්වය අනුව අධිකරණමය ක්‍රියා මාර්ග සඳහා විශාල මුදලක් -පිරිවැයක්- වැය වනවා. ඒක, එක ගැටලුවක්. අනෙක් පැත්තෙන්, ඒ සඳහා දිගු කාලයක් ගත වෙනවා. මේක ඉදිකිරීම් කර්මාන්තයට උචිත දෙයක් නොවෙයි. අද ගෙනැවිත් තිබෙන මේ නියෝග නිසා යම් කෙනෙකුට අධිකරණයට යෑමට තහනමක් පනවන්නේ නැහැ. නමුත්, අද ගෙනැවිත් තිබෙන මේ නියෝග මඟින් ඉදිකිරීම් කර්මාන්තයේ නියැළී සිටින කොන්ත්‍රාත්කරුවන්ටත්, එම කොන්ත්‍රාත්කරුවන්ගේ සේවය ලබා ගන්නා අයටත් අවශ්‍ය කරන අලුත් අධිකාරියක්, ආයතනයක් ස්ථාපිත වෙනවා. එම ආයතනයට බේරුම්කරුවකු විධියට කටයුතු කිරීම සඳහා අවශ්‍ය කරන නීතිමය ප්‍රතිපාදන මෙම නියෝග තුළින් අනිවාර්යයෙන්ම ලැබෙනවා. ඒ සඳහා මුදලක් වැය වෙන්නේ නැහැ. ඒ සඳහා වැඩි කාලයක් යන්නේ නැහැ. මේක ඉදිකිරීම් කර්මාන්තයේ නියැළී සිටින කොන්ත්‍රාත්කරුවන්ට මෙන්ම ඔවුන්ගේ සේවය ලබා ගන්නා අයටත් විශාල රුකුලක් කියන එකයි මේ අවස්ථාවේදී විශේෂයෙන්ම සඳහන් කරන්නට තිබෙන්නේ.

අද අපේ රටේ සමහර ප්‍රදේශවල භාගෙට නැවතුණු දැවැන්ත ඉදිකිරීම් තිබෙනවා. මේවාට මුදල් ප්‍රතිපාදන ලැබී නැහැ. ඒ, එකක්. මේවායේ ඉදිකිරීම් කටයුතු කරගෙන යනකොට, මම මුලින් කියපු ආකාරයට ගිවිසුම් ප්‍රකාරව කටයුතු සිදු නොවීම නිසා යම් යම් ප්‍රශ්න අධිකරණමය කටයුතු දක්වා ගිහින් තිබෙනවා. එය තවත් එකක්. ඒ නිසා කොන්ත්‍රාත්කරුවාට කටයුතු කරන්නත් බැහැ, එසේ අධිකරණමය කටයුත්තක් තිබෙන නිසා එම කොන්ත්‍රාත්තුව ලබා දුන් අයටත් මැදිහත් වෙන්න පුළුවන්කමක් නැහැ. ප්‍රායෝගිකව, මෙවැනි තත්ත්ව ඉදිකිරීම් කර්මාන්තයක කොහෙත්ම තිබිය යුතු දේවල් නොවෙයි. එම නිසා තමයි එම කටයුතු ප්‍රායෝගිකව නියාමනය කිරීම සඳහා අවශ්‍ය ආයතනයක් ස්ථාපිත කරලා ඒ සඳහා අවශ්‍ය කරන තත්ත්වය ලබා දීමට විශේෂයෙන්ම කටයුතු කර තිබෙන්නේ.

යම් කෙනෙක් ඉදිකිරීම් කටයුත්තකට, ව්‍යාපෘතියකට සම්බන්ධ වෙන්න ගියාම, ඒ සඳහා ආයතන ගණනාවකින් අවසර ලබා ගැනීම පිළිබඳ ප්‍රශ්නය ද තිබෙනවා. ඒ කටයුතු සරල කිරීම සඳහා දැවැන්ත කාර්යභාරයක් ඉටු කළ යුතුව තිබෙනවා. අද ඉදිකිරීම් ක්ෂේත්‍රයේ පවතින එක ප්‍රධානතම ප්‍රශ්නයක් තමයි ඉදිකිරීම් සඳහා ප්‍රතිපාදන තිබුණත්, අවශ්‍යතාව තිබුණත්, ඉඩම් තිබුණත් ඒ සඳහා අවසර ලබා ගැනීමේ ක්‍රියාවලිය විශාල ප්‍රශ්නයක් බවට පත් වෙලා තිබීම.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු රාජ්‍ය ඇමතිතුමනි, ඔබතුමාට තව විනාඩි දෙකක කාලයක් තිබෙනවා.

**ගරු ලසන්ත අලගියවන්න මහතා**
(மாண்புமிகு லசந்த அலகியவன்ன)
(The Hon. Lasantha Alagiyawanna)
අතිගරු ජනාධිපතිතුමා ඒ පිළිබඳව අවස්ථා කිහිපයකදීම මැදිහත් වුණා; කතා කළා. ඒ වාගේම, එතුමා ඒ සඳහා අවශ්‍ය උපදෙස් ලබා දී තිබෙනවා. රාජ්‍ය අමාත්‍යාංශය විධියට අපේ අමාත්‍යාංශයටත් මේ පිළිබඳව යම් වගකීමක් පැවරී තිබෙනවා. අපේ රටේ තිබෙන මුදල් රෙගුලාසි සහ ආයතන සංග්‍රහය සංශෝධනය කිරීමත් එක ප්‍රධාන වගකීමක් විධියට අපට පැවරී තිබෙනවා. මේවා කාලෝචිතව සංශෝධනය විය යුතුයි, සරල විය යුතුයි. බොහෝ ආයතනවලින් අනුමැතිය ලබා ගැනීමේ දී ප්‍රායෝගිකව පරිසරයට හානියක් නොවන පරිදි, සමාජමය වශයෙන් හානියක් නොවන පරිදි, තවත් අක්‍රමිකතා ඇති නොවන

[ගරු ලසන්ත අලගියවන්න මහතා]

පරිදි මේ කටයුතු සරල විය යුතුයි. එම නිසා නිවාස පහසුකම් අමාත්‍යාංශයට සම්බන්ධ නිලධාරීන් එම ආයතනවල තිබෙන මේ ගැටලු සඳහා ප්‍රායෝගිකව විසඳුම් ලබා දෙනවා වාගේම, ආයතන ගණනාවකින් අවසර ලබා ගැනීම පිළිබඳවත් කටයුතු කළ යුතුයි.

අවුරුදු ගණනාවක් සෑම ආණ්ඩුවක්ම මේ පිළිබඳව කථා කළා. නමුත් විසඳුම් ලබා ගන්න පුළුවන්කමක් ලැබුණේ නැහැ. එන්න එන්නම අලුතින් නීති ගෙනෙනවා. නීති ගෙනාවාට පස්සේ ප්‍රශ්නය තවත් සංකීර්ණ වෙනවා. මේක දැවැන්ත ප්‍රශ්නයක් බවට පත් වෙලා තිබෙනවා. එම නිසා මේ අමාත්‍යාංශය සහ ඒ අදාළ ආයතන මෙවැනි කරුණු සම්බන්ධයෙනුත් අවධානය යොමු කරයි කියලා විශේෂයෙන්ම බලාපොරොත්තු වෙනවා. ඒ වාගේම, අනෙක් පැත්තෙන් කොන්ත්‍රාත්කරුවන් ඉන්නවා, මේ හරහා සේවය ලබන අය ඉන්නවා. මේවායේ නියැළී සිටින වෘත්තිකයන්ගේ ආරක්ෂාව පිළිබඳවත් සලකා බැලිය යුතුයි. මේසන් බාස්උන්නැහේලා වෙන්න පුළුවන්, ඒ වාගේම වඩු වැඩ කරන ශිල්පීන් වෙන්න පුළුවන්, බොහෝ දෙනෙක් මේ ක්ෂේත්‍රය තුළ නියැළී සිටිනවා. ඒ අයට දෛනිකව යම් මුදල් ප්‍රමාණයක් ලැබෙනවා, ඒක ඇත්ත. නමුත් මේ අයගේ සුරක්ෂිතභාවය සහ ආරක්ෂාව පිළිබඳව ප්‍රශ්නයක් තිබෙනවා. ඒ අයට වැඩ කරන්න පුළුවන් නම්, ආදායම් තිබෙනවා. නමුත් මේ ක්ෂේත්‍රයේ නියැළී සිටින අය වැඩ කරන්න ගියාම විවිධ සෞඛ්‍ය ප්‍රශ්නවලට මේ අයට මුහුණපාන්න සිද්ධ වෙන බව අපි දන්නවා. එම නිසා, කොන්ත්‍රාත්කරුවන්ගේ සහ ඒ සේවය ලබා ගන්නා අයගේ ප්‍රශ්න, ගැටලු පිළිබඳවත් සොයා බැලිය යුතුයි. මෙවැනි අය මේ ක්ෂේත්‍රය තුළ නියැළී නොසිටියොත් මේ ක්ෂේත්‍රය ගෙන යන්න පුළුවන්කමක් නැහැ. ආයෝජනය කරන්න කොපමණ සල්ලි තිබුණත්, යන්ත්‍ර-සූත්‍ර තිබුණත්, මේ ක්ෂේත්‍රයට මිනිස් බලය අවශ්‍යයි; මානව සම්පත අවශ්‍යයි. එම නිසා මේ මානව සම්පතේ ආරක්ෂාව, සුරක්ෂිතභාවය, සෞඛ්‍යය පැත්තෙන් ඒ අය මුහුණපාන ප්‍රශ්න පිළිබඳවත් පැහැදිලි ස්ථිරසාර විසඳුම්වල අවශ්‍යතාවක් අනිවාර්යයෙන්ම තිබෙනවා. අද මේ ක්ෂේත්‍රයේ නියැළී සිටින අය විශාල ප්‍රශ්න රාශියකට මුහුණපා තිබෙනවා. මම ඒ සියලුදෙනා වෙනුවෙන් මේ ඉල්ලීම කරනවා. මේ ක්ෂේත්‍රය තුළ සිටින මේ පාර්ශ්ව පිළිබඳව අවධානය යොමු කරනවා වාගේම, මේ ක්ෂේත්‍රයේ නියැළී සිටින අයගේ ප්‍රශ්න වෙනුවෙනුත් මැදිහත් වෙලා, ඒ සම්බන්ධව අවශ්‍ය නීතිරීති ගෙනැල්ලා, ඒ අයගේ ආරක්ෂාව වෙනුවෙන් කටයුතු කිරීමත් අනිවාර්යයෙන්ම සිදු කළ යුතු දෙයක් විධියට තමයි විශේෂයෙන්ම මම දකින්නේ. ඒ වාගේම,-

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ඔබතුමාගේ කථාව දැන් අවසන් කරන්න.

**ගරු ලසන්ත අලගියවන්න මහතා**
(மாண்புமிகு லசந்த அலகியவன்ன)
(The Hon. Lasantha Alagiyawanna)
මට තව විනාඩි දෙකක් දෙන්න, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

ගරු විමල් වීරවංශ අමාත්‍යතුමා මේ අමාත්‍යාංශයේ අමාත්‍යවරයා විධියට කටයුතු කළ කාලයේ මාත් නියෝජ්‍ය අමාත්‍යවරයා විධියට කටයුතු කළා. අපි ඉදිකිරීම් ක්ෂේත්‍රයේ සියලු සේවා එක් වහලක් යටතේ ලබා දීම වෙනුවෙන් පැලියගොඩ ප්‍රදේශයේ C-City නමින් ව්‍යාපෘතියක් ආරම්භ කළා. පසුගිය කාලයේ ඒක අඛණ්ඩව ක්‍රියාත්මක වුණේ නැහැ. අද අපේ රටේ මේ පිළිබඳ විශාල අවශ්‍යතාවක් තිබෙනවා.

යම් කෙනෙකුට ගෙයක් හදාගන්න ඕනෑ වුණොත්, අද විවිධ තැන්වලට යන්න සිද්ධ වෙනවා. එම නිසා ප්‍රථම වතාවට තමයි පැලියගොඩ ප්‍රදේශයේ ආරම්භ කළ එම ව්‍යාපෘතිය පිළිබඳව සංකල්පය හඳුන්වා දුන්නේ. එම ව්‍යාපෘතියේ ඉදිකිරීම් කටයුතු පවා නිමවෙලා තිබෙනවා. ඉදිකිරීම් ක්ෂේත්‍රයට අදාළ සියලු භාණ්ඩ හා සේවා- -නක්ෂත්‍ර සේවා පවා- එකම ස්ථානයකදී ලබා ගැනීම සඳහා තමයි මේ සංකල්පය හඳුන්වා දුන්නේ. නමුත්, අද ඒ කටයුතු ඇනහිට තිබෙනවා. ඒ නිසා එම ව්‍යාපෘතිය නැවත ආරම්භ කරන්නය කියන ඉල්ලීම කරමින්, රටක් විධියට ඉතාම වටිනා කාර්යභාරයක් ඉටු කිරීම පිළිබඳව විෂය භාර අමාත්‍යවරයා විධියට ගරු අග්‍රාමාත්‍යතුමාටත්, රාජ්‍ය අමාත්‍යතුමාටත්, අමාත්‍යාංශයේ ලේකම්තුමා ඇතුළු සියලු දෙනාටත් ස්තුතිවන්ත වෙමින් මා නිහඬ වනවා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
The next speaker is the Hon. I. Charles Nirmalanathan. You have 19 minutes.

[பி.ப. 3.00]

**ගරු ඉ. චාල්ස් නිර්මලනාදන් මහතා**
(மாண்புமிகு இ. சாள்ஸ் நிர்மலநாதன்)
(The Hon. I. Charles Nirmalanathan)
கௌரவ பிரதிச் சபாநாயகர் அவர்களே, நிர்மாணத் தொழில் அபிவிருத்திச் சட்டத்தின் கீழான ஒழுங்குவிதிகள் இச்சபையில் முன்மொழியப்பட்டிருக்கின்றன. இந்த விவாதத்தில் கலந்து கொண்டு பேசுவதற்கு என்னையும் அனுமதித்தமைக்கு நன்றியைத் தெரிவித்துக்கொள்கின்றேன்.

கௌரவ பிரதிச் சபாநாயகர் அவர்களே, இரண்டு தினங்களுக்கு முன்னர் கௌரவ அமைச்சர் விமல் வீரவங்ச அவர்கள் மன்னாருக்கு வந்திருந்தார். அங்கு அவர் ஒரு தும்புத் தொழிற்சாலையினுடைய பெயர்ப்பலகையைத் திரைநீக்கம் செய்துவைத்தார். அப்பெயர்ப்பலகையில் முதலில் தமிழிலும் இரண்டாவதாகச் சிங்களத்திலும் மூன்றாவதாக ஆங்கிலத்திலும் எழுதப்பட்டிருந்தது. அதில் முதலில் சிங்கள மொழி இடம்பெற வேண்டும், இரண்டாவதாகவே தமிழ் மொழி இடம்பெற வேண்டும் என்று அவர் கருத்துச் சொல்லி, அவ்வாறாக அந்தப் பெயர்ப் பலகை மாற்றப்பட்டிருக்கின்றது. அதனை அவ்வாறு மாற்றியது மட்டுமல்லாமல், கௌரவ அமைச்சர் விமல் வீரவங்ச அவர்கள் இன்னுமொரு கருத்தையும் கூறியிருக்கிறார். அதாவது, வடக்கு, கிழக்காக இருந்தாலும் சரி, அங்கும் குறித்த விடயங்களில் முதலில் சிங்கள மொழிதான் இடம்பெற வேண்டும் என்றும், இலங்கை சிங்கள, பௌத்த நாடு என்றும் கூறியிருந்தார். அவருடைய கருத்தை நான் கண்டிக்கின்றேன். குறித்த மக்களுடைய வாக்குகளைப் பெறுவதற்காகவே அவர் இவ்வாறான கருத்துக்களை வழமையாகச் சொல்லிக் கொண்டிக்கின்றார்.

கௌரவ பிரதிச் சபாநாயகர் அவர்களே, கௌரவ அமைச்சர் விமல் வீரவங்ச அவர்களுடைய கருத்துத் தொடர்பாக இந்த நாட்டினுடைய மேன்மைதங்கிய ஜனாதிபதி கோட்டாபய ராஜபக்ஷ அவர்களும் பிரதமர் மஹிந்த ராஜபக்ஷ அவர்களும் என்ன நிலைப்பாட்டைக் கொண்டிருக்கின் றார்கள்? என்பதை நான் இந்தச் சபையினூடாகக் கேட்க விரும்புகின்றேன். கௌரவ அமைச்சர் விமல் வீரவங்ச அவர்களுடைய கருத்துத் தொடர்பான அவர்களுடைய நிலைப்பாடு என்ன என்பதை இந்த நாட்டு மக்களுக்கு குறிப்பாக வடக்கு, கிழக்கில் இருக்கின்ற தமிழ் மக்களுக்கு அவர்கள் தெளிவுபடுத்த வேண்டும். ஏனென்று சொன்னால்,

கௌரவ அமைச்சர் விமல் வீரவங்சவினது செயற்பாடானது எங்களுடைய பிரதேச மக்கள் மனங்களில் மிகவும் வேதனையை உண்டுபண்ணி இருக்கின்றது. அதேநேரத்தில், விமல் வீரவங்ச அவர்களுடைய கருத்தைக் கேட்ட பிற்பாடும், இந்த அரசாங்கத்தில் தொடர்ந்தும் இருப்பதற்கு வெட்கமில்லையா? என்று தமிழ் அமைச்சர்களிடமும் மற்றும் குறித்த தமிழ்ப் பாராளுமன்ற உறுப்பினர்களிடமும் நான் கேட்க விரும்புகின்றேன். இப்படிப்பட்ட ஒரு செயற் பாட்டாளரை, இப்படிப்பட்ட ஓர் அமைச்சரைத் தங்களால் கட்டுப்படுத்த முடியவில்லை என்றால், ஏன் நீங்கள் அந்த அரசாங்கத்தில் வெட்கமில்லாமல் இருக்கின்றீர்கள் என்றும் நான் அவர்களிடம் கேட்க விரும்புகின்றேன்.

இன்று நிர்மாணத் தொழில் அபிவிருத்திச் சட்டத்தின் கீழான ஒழுங்குவிதிகள் முன்மொழியப்பட்டுள்ளன. கடந்த வருடம் - 2019ஆம் ஆண்டு அரசாங்கத்தினால் முன்மொழியப் பட்டு, மாவட்டச் செயலகங்களினால், பிரதேச செயலகங் களினால், மாவட்டங்களிலிருக்கின்ற அரச திணைக் களங்களினால் நடைமுறைப்படுத்தப்பட்ட வேலைத் திட்டங்களை மேற்கொண்ட பல ஒப்பந்தக்காரர்களுக்கு மட்டுமல்ல, குறித்த கிராம மட்ட அமைப்புக்களுக்கும் இன்றுவரை உரிய வேலைகளுக்கான பணம் கிடைக்க வில்லை.

தொழிற்துறைச் சட்டம் தொடர்பான ஒழுங்குவிதிகளை அமுல்படுத்துவதற்காக இந்தப் பாராளுமன்றத்தில் முன்மொழிவு செய்யப்பட்டிருக்கின்ற அதேநேரம், நீண்ட நாட்களாகியும் தங்களுக்குரிய பணம் கிடைக்காததால், ஒப்பந்த வேலைகளை, அபிவிருத்தி வேலைகளை, அரசாங்கத்தினுடைய திட்டங்களை நடைமுறைப்படுத்திய கிராம மட்ட அமைப்புக்களைச் சேர்ந்தவர்களும் ஒப்பந்தக்காரர்கள் பலரும் பாரிய கடன்களைப் பெற்ற நிலையில், என்ன செய்வதென்று தெரியாத ஒரு சூழ்நிலையில் இருக்கின்றார்கள். ஆகவே, தொழிற்றுறை தொடர்பான அமைச்சும் நிதி அமைச்சும் இணைந்து அவர்களுக்குரிய அந்தப் பணத்தைப் பெற்றுக்கொடுக்க வேண்டும். எல்லா மாவட்டச் செயலகங்களிலும் building handover amount இருக்கின்றமை இங்கு குறிப்பிடத்தக்கது.

இந்த அரசாங்கம் முன்னைய அரசாங்கத்தைக் குறை கூறுவதையோ அல்லது முன்னைய அரசாங்கம் இந்த அரசாங்கத்தைக் குறை கூறுவதையோ பற்றி நான் இங்கு கேட்க விரும்பவில்லை. இவை அரசாங்கத்தினால் நடைமுறைப்படுத்தப்பட்ட வேலைகள். அந்த வகையில் பல குளங்கள் அபிவிருத்தி செய்யப்பட்டிருக்கின்றன, பல வீதிகள் அபிவிருத்தி செய்யப்பட்டிருக்கின்றன, பல பொது அமைப்புக் களுக்குரிய கட்டிட நிர்மாண வேலைகள் நடைபெற்றிருக் கின்றன. இரண்டு மில்லியன் ரூபாய்க்குரிய வேலைகளுக்கான ஒப்பந்தத்தைத் தங்களுடைய அமைப்பினூடாகப் பெற்ற கிராம மட்டப் பொது அமைப்புக்கள் கடைகளில் கடன் பெற்றுத்தான் குறித்த ஒப்பந்த வேலைகளைச் செய்திருக்கின்றன. இன்று அந்தப் பொது அமைப்புக்களிலிருக்கின்ற தலைவர், செயலாளர் போன்றோர் அல்லது ஒப்பந்தக்காரர்கள் பாரிய சுமையை எதிர்நோக்கியிருக்கின்றார்கள். கௌரவ பிரதிச் சபாநாயகர் அவர்களே, கடன் வாங்கிய கடைக்காரர்களிடம் அவர்கள் ஏச்சு வாங்குவது, அவர்களைக் கண்டால் ஒளிப்பது, வங்கிகளுக்குச் சென்று தங்களுடைய நகைகளை அடகு வைத்துக் கிடைத்த சொற்ப பணத்தை அந்தக் கடைகளுக்குச் செலுத்துவது போன்ற சூழ்நிலைதான் இன்று எங்களுடைய பிரதேசங்களிலுள்ள சகல மாவட்டங்களிலும் காணப்படு கின்றது. ஆகவே, இந்த விடயம் தொடர்பாக அரசாங்கம் உடனடியாகக் கவனமெடுக்க வேண்டும்.

குறிப்பாக, நாட்டினுடைய பிரதமர் நிதி அமைச்சராக இருக்கின்றார். இந்த நிதியமைச்சினூடாகச் சகல மாவட்ட அரச திணைக்களங்களுக்கும் ஏற்கெனவே நடந்து முடிந்த வேலைகளுக்குரிய பணத்தினைச் செலுத்த வேண்டும் என்று இந்த நேரத்தில் நான் கேட்டுக் கொள்கின்றேன். இந்த அரசாங்கம் பதவிக்கு வந்தபோது, ஒப்பந்தங்கள் செய்யப்பட்டு மேற்கொள்ளப்படவிருந்த அனைத்து வேலைகளையும் நிறுத்தியது. அதுவும் மக்களுக்குப் பல பிரச்சினைகளைக் கொண்டு வந்திருக்கின்றது. இருந்தாலும், சம்பந்தப்பட்ட ஒப்பந்தக்காரர்கள் வேலைகளை ஆரம்பிக்கவில்லை. ஆனால், தற்போது வேலைகளைச் செய்து முடித்தவர்கள் என்ன செய்வதென்று தெரியாத ஒரு நிலையிலிருக்கின்றார்கள். ஆகவே, இந்த நாட்டினுடைய பிரதமர் அவர்கள் அதற்குரிய நடவடிக்கையை எடுக்கவேண்டும் என்று இந்த நேரத்தில் கேட்டுக்கொள்ள விரும்புகின்றேன்.

கௌரவ பிரதிச் சபாநாயகர் அவர்களே, அதேபோன்று விவசாயிகளும் தற்போது பாரிய ஒரு பிரச்சினையை எதிர்நோக்கியிருக்கின்றார்கள். அதாவது, குறிப்பிட்ட காலத்திற்கு முதல் வெள்ளத்தினால் பல ஏக்கர் கணக்கான நெல் வயல்கள் அழிந்தன மற்றும் ஒருவிதமான பூச்சியின்மூலம் அந்த விவசாயிகளுக்குப் பாரிய நட்டம் ஏற்பட்டது. உதாரணமாக, 40 மூடை தானியம் விளைகின்ற ஓர் ஏக்கர் காணியில் 18 - 20 மூடைகளை உற்பத்தி செய்த பிற்பாடு அவற்றைச் சந்தைப்படுத்துவதற்கு முடியாத ஒரு சூழ்நிலையிருக்கின்றது. நெல் களஞ்சியசாலைகள் நியாயமான விலையைக் கொடுத்து நெல்லைக் கொள்வனவு செய்வதற்கு இன்னும் நடவடிக்கை எடுக்கவில்லை. நான் ஒரு வாரத்திற்கு முன்னர் கௌரவ அமைச்சர் சமல் ராஜபக்ஷ அவர்களுக்கு, "எங்களுடைய பிரதேசத்தில் விவசாயிகள் மிகவும் கஷ்டத்தை எதிர்நோக்கிக் கொண்டிருக்கிறார்கள். எனவே, அவர்களுக்கு நஷ்டம் ஏற்படாத வகையில் நிர்ணய விலைகொடுத்து நெல்லைக் கொள்வனவு செய்வதற்குரிய நடவடிக்கையை எடுக்க வேண்டும்" என்று கடிதமொன்றை எழுதி அனுப்பியிருந்தேன். ஆகவே, அந்த நடவடிக்கை தொடர்பாக அரசாங்கம் கூடிய கவனம் எடுக்க வேண்டும். ஏனென்றால், விவசாயிகள் ஏற்கெனவே பலவிதமான துன்பங்களுக்கு மத்தியிலும் செலவுகளுக்கு மத்தியிலும், குறிப்பிட்டளவு நெல்லை மாத்திரம்தான் உற்பத்தி செய்ய முடிந்தபோதிலும், தற்பொழுது அதையும் விற்பனை செய்ய முடியாத சூழ்நிலை இருக்கின்றது. ஆகவே, இந்த விவசாயிகளின் நெல்லை விரைவாகக் கொள்வனவு செய்யக்கூடிய வகையில் PMB நிறுவனமானது உடனடியாகச் செயற்பட வேண்டும் என்றும் அதற்குரிய நிதியை நிதி அமைச்சு உடனடியாக வழங்க வேண்டும் என்றும் நான் இந்த நேரத்தில் கேட்டுக்கொள்ள விரும்புகிறேன்.

கௌரவ பிரதிச் சபாநாயகர் அவர்களே, இன்று இங்கு பலவிதமான குற்றச்சாட்டுகள் முன்வைக்கப்படுகின்றன. எதிர்வரும் பாராளுமன்றத் தேர்தலில் எப்படி தமது கட்சிக்கு அதிக ஆசனங்களைப் பெற்றுக்கொடுக்கலாம் என்ற நோக்கத்திற்காக, இந்த அரசாங்கத்தை முன்னைய அரசாங்கமும் முன்னைய அரசாங்கத்தை இந்த அரசாங்கமும் குறை கூறிச் செயற்பட்டுக் கொண்டிருக்கிறார்களே ஒழிய, மக்களுடைய நன்மை கருதி எந்த முடிவுகளையும் எடுப்பதாகத் தெரியவில்லை. இன்று மக்கள் நலன் சார்ந்த அரசாங்கத்தி னுடைய பல வேலைத்திட்டங்கள் தடைப்பட்டிருக்கின்றன. எனவே, இத்தகைய கருத்துக்களையும் நடவடிக்கைகளையும் விடுத்து, முதலில் மக்களுடைய நன்மை கருதி நடவடிக்கை எடுக்க வேண்டும். எங்களுடைய பிரதேசத்திலும் வெளியிலும் NHDA நிறுவனத்தினால் வழங்கப்பட்ட வீடுகளுக்கான பணம்

[ගරු ඉ. චාල්ස් නිර්මලනාදන් මහතා]

கொடுக்கப்படவில்லை. 750,000/- ரூபாய் பெறுமதியான வீடுகளுக்கு 90,000/- ரூபாய், 100,000/- ரூபாய், 150,000/- ரூபாய் மாத்திரமே வழங்கப்பட்டிருக்கின்றது. 4 - 5 மாதங்களாகியும் மிகுதிப் பணம் இன்னும் வழங்கப்படாமல் இருக்கின்றது. வெள்ளம் காரணமாக கடந்த இரண்டு மாதங்களாக மக்கள் தங்களுடைய வீடுகளுக்குள் இருக்க முடியாமல் வெளியில் அந்தரித்த நிலைமையையும், உறவினர்களின் வீடுகளிலும் தற்காலிகமாக இருந்த நிலைமையையும் நான் நேரடியாகப் பார்த்தேன். அமைச்சர் அவர்களே, நீங்கள் அரசாங்கத்தின் முக்கிய அமைச்சராக இருக்கின்றீர்கள். ஆனால், நீங்கள் இது தொடர்பில் எந்தவிதமான கருத்துக்களையும் கூறுவதில்லை. உங்களுக்குள் முரண்பட்டுக்கொண்டிருக்கின்ற விடயங்களைப் பற்றிக் கதைத்துக் கொண்டிருக்கின்றீர்களே ஒழிய, மக்கள் எந்த விதமான பிரச்சினைகளை எதிர்நோக்குகின்றார்கள். அவர்களுக்கு எவ்வாறான தீர்வைப் பெற்றுக்கொடுக்க வேண்டுமென்ற மக்கள் நலன் சார்ந்த நல்ல விடயங்களைப் பற்றிப் பேசுவதில்லை. எனவே, நல்ல விடயங்களை அமுல்படுத்துவதில் அனைத்துப் பாராளுமன்ற உறுப்பினர்களும் கட்சி பேதமில்லாமல் செயற்பட வேண்டுமென்று நான் இந்த நேரத்தில் கேட்டுக்கொள்ள விரும்புகின்றேன்.

கௌரவ பிரதிச் சபாநாயகர் அவர்களே, கடந்த ஒரு சில தினங்களுக்கு முன்னர் ஐ.நா.வின் இலங்கைக்கான நிரந்தர வதிவிடப் பிரதிநிதியை மேதகு ஜனாதிபதி அவர்கள் சந்தித்திருக்கின்றார் என்ற செய்தி ஜனாதிபதியினுடைய உத்தியோகபூர்வ ஊடக அறிக்கையில் தெரிவிக்கப்பட்டது. அந்தச் செய்தியில், யுத்தத்தின்போது காணாமல் ஆக்கப்பட்ட அனைவரும் இறந்துவிட்டார்கள் என்ற ஓர் உறுதிப்பாட்டை மேதகு ஜனாதிபதி அவர்கள் ஐ.நா. பிரதிநிதியிடம் தெரிவித்ததாகக் குறிப்பிடப்பட்டிருந்தது. மேன்மைதங்கிய ஜனாதிபதி அவர்களிடம் நான் கேட்க விரும்புவது, யுத்தத்தில் காணாமல் ஆக்கப்பட்டவர்களுக்கு அப்பால், வவுனியா மெனிக்பாமில் இடம்பெயர்ந்த மக்களுக்காக முகாம் அமைக்கப்பட்டு தங்கவைக்கப்பட்டபோது ஓமந்தை இராணுவச் சோதனைச்சாவடியில் இலங்கை இராணுவம், "தமிழீழ விடுதலைப் புலிகளுக்கு ஏதேனும் ஒரு வகையில் உதவி செய்தவர்கள் இருந்தால் எங்களிடம் வந்து சரணடையுங்கள்" என்று ஒலிபெருக்கிமூலம் அறிவித்தது. அப்பொழுது அங்கிருந்தது இருந்தது இலங்கை இராணுவமா? அல்லது வேறு நாட்டு இராணுவமா? என்பது அப்பாலுள்ள விடயம். ஆனால், அங்கிருந்த இராணுவம் தமிழீழ விடுதலைப் புலிகளுக்கு உதவி செய்தவர்கள் யாராக இருந்தாலும் வந்து surrender பண்ணும்படி அறிவித்தது. அப்பொழுது அங்கு தாய்மார் குடும்பமாக வந்து தங்களது பிள்ளைகளைத் தாங்களாகவே ஒப்டைத்தார்கள். சிறிது காலம் விடுதலைப் புலிகள் இயக்கத்தில் ஏதோவொரு வகையில் பங்காற்றினார்கள், ஏதோவொரு வகையில் சம்பளத்திற்கு அவர்களுக்கு உதவி புரிந்தார்கள் என்ற வகையில் மனைவி, பிள்ளைகளுடன் சேர்ந்து வந்து ஓமந்தைச் சோதனைச் சாவடியில் சம்பந்தப்பட்டவர்களைக் கையளித்தார்கள். அவ்வாறு கையளிக்கப்பட்டவர்கள் எங்கே? என்றுதான் வலுக் கட்டாயமாகக் காணாமல் ஆக்கப்பட்ட உறவுகளுடைய பெற்றோர்கள் அல்லது மனைவிமார் அல்லது பிள்ளைகள் கேட்கிறார்கள்.

இன்று மேதகு ஜனாதிபதி அவர்கள் கூறுகின்றார், யுத்தத்தின்போது காணாமலாக்கப்பட்டவர்கள் இறந்துவிட்டார்கள் என்று. யுத்தத்தின்போது காணாமல் ஆக்கப்பட்டவர்கள் இறந்துவிட்டார்கள் என்பது வேறு விடயம். நான் ஜனாதிபதி அவர்களிடம் கேட்க விரும்புவது என்னவென்றால், நேரடியாக ஓமந்தைச் சோதனைச்சாவடியில் ஒப்படைக்கப்பட்டவர்கள் எங்கே? அவர்களை நீங்கள் என்ன செய்தீர்கள்? என்பதுதான். தற்போதைய பிரதமராக இருக்கலாம், முன்னாள் பிரதமராக இருக்கலாம், முன்னாள் ஜனாதிபதிகளாக இருக்கலாம், அவர்கள் எல்லோரையும்விட, யுத்தத்தை வழிநடத்திய பாதுகாப்புச் செயலாளர் என்ற வகையில் தற்போதிருக்கின்ற ஜனாதிபதி அவர்களுக்கு நன்கு தெரியும், அவர்களுக்கு என்ன நடந்ததென்பது. ஏனென்றால், அவர் நேரடியாக மாவட்டந்தோறும் இருக்கின்ற இராணுவப் புலனாய்வுப் பிரிவினர், இராணுவத் தளபதிகளுடன் நேரடியாகத் தொடர்பு வைத்திருந்தவர். முன்னாள் பாதுகாப்புச் செயலாளர்தான் இன்று இந்த நாட்டினுடைய ஜனாதிபதியாக இருக்கின்றார். ஓமந்தைச் சோதனைச்சாவடியில் குடும்பங்களால் ஒப்படைக்கப்பட்டவர்களுக்கு என்ன நடந்தது? அவர்களை என்ன செய்தார்கள்? என்பது அவருக்கு மட்டுந்தான் தெரியும். வேறு யாருக்கும் தெரியாது. அவர் ஐ.நா. பிரதிநிதியிடம் கூறியதாக ஜனாதிபதியுடைய ஊடகப் பிரிவினால்தான் குறித்த செய்தி வெளியிடப்பட்டிருக்கின்றது.

எங்களுடைய நாட்டினுடைய ஜனாதிபதி அவர்கள் குறித்த விடயம் தொடர்பில் நன்கு அறிந்து, இங்கிருக்கின்ற சகல இன மக்களையும் இன, மத, மொழி வேறுபாடின்றி வழிநடத்தக்கூடிய ஒருவராகச் செயற்பட வேண்டும். அதைவிடுத்து, பாராளுமன்றத் தேர்தலில் அவர்கள் வெல்ல வேண்டுமென்ற நோக்கத்திற்காகத் தமிழ் மக்களை இறுக்கி, நசுக்கி, அதன்மூலம் சிங்கள மக்கள் மத்தியில் ஆதரவைப் பெற்று, அந்த ஆதரவின்மூலம் ஆட்சியமைக்க முடியுமென்ற சிந்தனையை அவர்கள் அகற்ற வேண்டும். ஜனநாயக வழியில் அவர்கள் மக்களிடம் ஆணை கேட்க வேண்டும். இந்த நாட்டிலிருக்கின்ற இனங்களுக்கிடையிலான பிரச்சினைக்கு ஒரு நிரந்தரத் தீர்வு எட்டாவிட்டால், நாட்டினுடைய பொருளாதாரத்தை உயர்த்துவதற்கு நீங்கள் எந்தவிதமான பொருளாதாரத் திட்டத்தைக் கொண்டுவந்தாலும், இந்த நாட்டில் யார் ஜனாதிபதியாக வந்தாலும், எந்தக் கொள்கைகளை வகுத்தாலும், ஒருபோதும் இந்த நாடு முன்னேறாது என்பதை நான் இந்தச் சபையிலே தெட்டத்தெளிவாகக் கூறிக்கொள்ள விரும்புகின்றேன். எங்களுடைய நாடு முன்னேற வேண்டும் என்பதில் எங்களுக்கும் அவா உண்டு. நாங்களும் அதனை விரும்புகின்றோம். இலங்கை முன்னேற வேண்டும், இலங்கையில் இருக்கின்ற சகல மக்களும் செழிப்பாக வாழ வேண்டும். ஆனால், இந்த நாட்டில் நீண்டகாலமாக இருக்கின்ற இனப்பிரச்சினை தீர்க்கப்பட வேண்டும். சிங்கள மக்களை ஆள வேண்டுமென்றோ அல்லது பௌத்த மதத்தை ஆள வேண்டுமென்றோ அல்லது இந்த இரண்டு விடயங்களையும் நாங்கள் கட்டுப்படுத்த வேண்டுமென்றோ நாங்கள் கேட்கவில்லை. எங்களுடைய பிரதேசத்தில் மக்களால் அங்கீகரிக்கப்பட்ட மக்கள் பிரதிநிதிகள் மக்களின் தேவைகளைப் பூர்த்தி செய்யக்கூடிய வகையில் முடிவுகளை எடுக்கக்கூடிய அதிகாரத்தைத்தான் நாங்கள் கேட்கின்றோமேயொழிய, சிங்கள மக்களை ஆள வேண்டும், பௌத்த மதத்தை ஆளவேண்டுமென்று எந்தச் சந்தர்ப்பத்திலும் எங்களில் யாரும் கேட்டதில்லை.

கௌரவ பிரதிச் சபாநாயகர் அவர்களே, இறுதியாக நான் ஒரு விடயத்தை உங்களுக்கு ஞாபகப்படுத்த விரும்புகின்றேன். "பௌத்த மதத்தையோ சிங்கள மக்களையோ ஆள வேண்டுமென்று எந்தக் காலத்திலும் நாங்கள் நினைத்ததில்லை, அவர்கள் அழிய வேண்டுமென்றும் நாங்கள் நினைத்ததில்லை. எங்களுடைய மக்களை நாங்கள் ஆளவேண்டுமென்றுதான் போராடுகின்றோம்" என்று தமிழீழ விடுதலைப் புலிகள்

இயக்கத்தின் அரசியல்துறைப் பொறுப்பாளர் அண்ணன் தமிழ்ச்செல்வன் ஒரு சந்தர்ப்பத்தில் தெளிவாகக் கூறியிருந்தார். அந்த நேரத்தில் அவர் இவ்வாறான ஒரு பதிவையே வைத்திருந்தார். அந்த video இப்பொழுதும் என்னிடம் இருக்கின்றது. இந்த நிலைப்பாட்டில்தான் எங்களுடைய மக்களும் இருக்கிறார்கள். ஆகவே, எந்தச் சந்தர்ப்பத்திலும் எங்களுடைய மக்களை வஞ்சிக்கவோ அடக்க நினைக்கவோ கூடாது. அப்படிச் செய்தால், அது இலங்கையின் எதிர்காலப் பொருளாதாரத்துக்குப் பாரிய அழிவை ஏற்படுத்துமென்று கூறி, வாய்ப்புக்கு நன்றி தெரிவித்து, முடிக்கின்றேன். நன்றி.

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඊයේ කථානායකතුමා කිව්වා සියලු මන්ත්‍රීවරුන්ට දැන ගන්න වෝහාරික විගණන වාර්තාව සභාගත කරනවා කියලා. අපට ඊයේ එය ලැබුණේ නැහැ. අද දවසේ අපි පාර්ලිමේන්තුවේ පුස්තකාලයට ගියාම එතැනින් කිව්වා තවම එතැනට ඇවිල්ලා නැහැ කියලා. දැන් අපට ඒ CD තැටියක් ලබා දුන්නා. ඒ ගැන අපි ස්තුතිවන්ත වෙනවා. නමුත් සම්පූර්ණ වාර්තාව මේකේ නැහැ ලු. ඇමුණුම් මේකට ඇතුළත් කරලා නැහැ ලු. ඇමුණුම් ලබා දෙනවාද, නැද්ද කියන එක පිළිබඳව මහ බැංකුවට නීතිපතිවරයාගෙන් නැවත විමසන්න ඕනෑ ලු. නමුත් වාර්තාව කිව්වාම, සියලු ඇමුණුම් සහිත වාර්තාවක් විය යුතුයි. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා, මේ පිළිබඳව සොයා බලා පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට සම්පූර්ණ වාර්තාව ලබා දෙන්න කියලා. බොහොම ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

ගරු කථානායකතුමා මේ පිළිබඳව ඊයේ පැහැදිලි තීන්දුවක් දුන්නා. ඒ නිසා එතුමාගේ අවධානයට යොමු කරලා අවශ්‍ය කටයුතු කරන්න අවශ්‍ය ක්‍රියාමාර්ගය අපි ගන්නම්.

**ගරු කරුණාරත්න පරණවිතාන මහතා**
(மாண்புமிகு கருணாரத்ன பரணவிதான)
(The Hon. Karunarathna Paranawithana)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම මේ කාරණාව සම්බන්ධයෙන් සභාව ආරම්භයේදීත් අදහසක් මතු කළා. අපට දැන් මේ වාර්තාවේ විද්‍යුත් copy එකක් ලැබිලා තිබෙනවා. ලැබිලා තිබෙන ආරංචියට අනුව ඇමුණුම් කිහිපයක් මේකට ඇතුළත් කරලා නැහැ. මේ වාගේ ප්‍රශ්න මේ වාගේ වාර්තා එන කොට මතු වෙනවා. අපට පෙනෙන ආකාරයට මහ බැංකුවට අවශ්‍ය වෙලා තිබෙනවා, මොකක් හෝ සඟවන්නට. සමහර වාර්තා දෙන්නේ නැත්තේ ජාතික ආර්ථිකයට බලපාන කරුණු ආදිය නිරාවරණය කරන්නේ නැහැ කියලා. තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනතේ 5වන වගන්තිය යටතේ යම් යම් සීමා දාලා තිබුණත් මහජන වැදගත්කමක් සහිත සෑම කරුණක් සම්බන්ධයෙන් ජනතාවට අවසානයේදී තොරතුරු ලබා දිය යුතුයි. ඒ කාරණය තමයි මම මුලදීත් මතු කළේ. මේ කාරණය සම්බන්ධයෙන් මේ පාර්ලිමේන්තුවේ ඊයේ ජනතා විමුක්ති පෙරමුණේ මන්ත්‍රීවරයෙක් විවාදයකුත් ඉල්ලුවා. අනුර දිසානායක මන්ත්‍රීතුමා ප්‍රශ්නය මතු කරපු වෙලාවේ ඒ විවාදය ලබා දෙනවා කියලා කථානායකතුමා ප්‍රකාශ කළා. එම නිසා අපි මේ සභාවෙන් ඉල්ලා සිටින්නේ බැඳුම්කර වෝහාරික විගණන වාර්තාව පිළිබඳව නුදුරේදීම මේ පාර්ලිමේන්තුවේ විවාදයක් පවත්වන්න කටයුතු කරන්න කියලායි. ඒ සඳහා සියලු මන්ත්‍රීවරුන්ට ඒ අත්‍යවශ්‍ය තොරතුරු සියල්ලම ලබා දෙන්න කටයුතු කරන්න කියලා අපි ඉල්ලා සිටිනවා. ඒ විතරක් නොවෙයි. දැන් මේ විද්‍යුත් copy එකක් ලැබිලා තිබෙන නිසා මේවා ඔක්කෝම පාර්ලිමේන්තුවේ වෙබ් අඩවියේ පළ කරන්න කියලාත් අප ඉල්ලා සිටිනවා.

**ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා (විදුලිබල රාජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே - மின்சக்தி இராஜாங்க அமைச்சர்)
(The Hon. Mahindananda Aluthgamage - State Minister of Power)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි, බැඳුම්කර වෝහාරික විගණන වාර්තාව පිළිබඳව දිගින් දිගටම මේ පාර්ලිමේන්තුවේ කථා කරනවා. ඊයේ කථානායකතුමා මේ වාර්තාව ලබා දෙන්න කියලා කිව්වා. අපිත් කියන්නේ මේ පාර්ලිමේන්තුවේ 225ටම මේ වාර්තාව ලබා දෙන්න කියලායි. ඒ පිළිබඳව කිසි විරෝධයක් නැහැ. මේ වාර්තාවෙන් කාලක් දෙන්න, භාගයක් දෙන්න කියලා අපි කියන්නේ නැහැ. අපි කියන්නේ සියල්ල දෙන්න කියලායි. අපි එදාත් කිව්වේ, කෝප් කමිටුවේ සාමාජිකයන් ටික නම් කරලා මේ වාර්තාව කඩිනමින් එළියට දාන්න කියලායි. මේක කාටවත් නවත්වන්න ඕනෑ නැහැ. අපිත් කියන්නේ මේ වාර්තාව දෙන්න කියන එකයි. මේ වාර්තාව දැන් තිබෙන්නේ කථානායකතුමා ළඟ. වාර්තාවේ භාග දෙන්න එපා, ඔක්කෝම දෙන්න කියලා කථානායකතුමාට කියන්න. අපි කියන්නේ එච්චරයි.

**ගරු කංචන විජේසේකර මහතා**
(மாண்புமிகு கஞ்சன விஜேசேகர)
(The Hon. Kanchana Wijesekera)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මීට පෙරත් බැඳුම්කර වංචාව පිළිබඳව විමර්ශනය කරලා මේ සභාවට ඉදිරිපත් කරපු වාර්තාව පිළිබඳව මතයක් ගියා, සමහර කරුණු අත්හැරලා තමයි ඒ වාර්තාව ඉදිරිපත් කළේ කියලා. සමහර මන්ත්‍රීවරුන්ගේ මුදල් ගනුදෙනු පිළිබඳව, දුරකථන සංවාද පිළිබඳව කරුණු අත්හැරලා තමයි නිකුත් කළේ කියලා. එදාත් අපි ඉල්ලීමක් කළා, සම්පූර්ණ වාර්තාව ඉදිරිපත් කරන්න කියලා. මේ සම්බන්ධයෙන් ආණ්ඩුව පැත්තට ඇඟිල්ල දික් වෙන්න ඉඩ තිබෙනවා. ඒ නිසා අපි ඉල්ලීමක් කරනවා, විශේෂයෙන්ම ඒ කරුණු සියල්ලම අනාවරණ වෙන ඒ ලියවිල්ල සම්පූර්ණයෙන්ම ඉදිරිපත් කරන්න කියලා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඒ වාගේම, ඊයේ රන්ජන් රාමනායක මන්ත්‍රීතුමා එක කරුණක් මතු කළා, අර්ජුන ඇලෝසියස් එතුමාට දුරකථනයෙන් කථා කළා කියලා. නමුත් බැඳුම්කර සහ බරපතළ වංචා දූෂණ සෙවීමේ ජනාධිපති කොමිෂන් සභා වාර්තාවේ කොහේවත් සඳහන් වෙලා නැහැ, කෝප් කමිටුව නියෝජනය කරපු රන්ජන් රාමනායක මන්ත්‍රීතුමා සහ අර්ජුන ඇලෝසියස් අතර දුරකථන සංවාදයක් තිබුණාය කියලා. එතුමා කියනවා, අර්ජුන ඇලෝසියස් එක්ක දුරකථන සංවාදයක් තිබුණා කියලා. නමුත් ඒ වාර්තාවේ එතුමාගේ නම සඳහන් වෙලා නැහැ. දුරකථන සංවාද 10, 15, 20 තිබුණු මන්ත්‍රීවරුන්ගේ නම් සඳහන් වෙලා තිබුණා. අඩු තරමින් ඒ විමර්ශනයවත් හරියට කළාද කියන සැකය දැන් නැවතත් අපට තිබෙනවා. ඒ නිසා මම ඔබතුමාගේ අවධානය යොමු කරනවා, එතුමා මේ සභාව නොමඟ යවන්න කටයුතු කරනවාද කියන එක පිළිබඳ කරුණු අනාවරණ කර ගන්න කියලා.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, දැන් මන්ත්‍රීවරු දෙපොළක් කිව්වා ඒගොල්ලන්ට මේ වාර්තාව ලැබිලා තිබෙනවා කියලා. නමුත් අපට ලැබිලා නැහැ. ඒ විතරක් නොවෙයි. දැන් ලබා දීලා තිබෙන තොරතුරුවල යම් විධියේ අඩුපාඩුවක් තිබුණොත්, කරුණාකර කථානායකතුමාගෙන් අහන්න ඇයි එහි යම් කරුණු අඩුවෙලා තිබෙන්නේ කියලා. ඒ විතරක් නොවෙයි. මේ වාර්තාව ඉදිරිපත් කරන්න කියලා අපි කිව්වා. මෙහි copies 5ක් තිබෙනවා. Library එකේ තිබෙනවා කියලා අපට කිව්වා. නමුත් Library එකේත් නැහැ.

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)
නැහැ, දැන් තිබෙනවා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
පොඩි පමාවක් වෙලා තිබෙනවා.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
මම මේ සභාවට එන්න ඉස්සරවෙලා ඇහුවාම,-[බාධා කිරීමක්] නැහැ, එනවා. "එනවා", "තිබෙනවා" කියන එක වෙනස් නේ.

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)
ඒක එනතෙක් අපි ගිහිල්ලා වාඩිවෙලා හිටියා.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
දැන් ඔය CD එකක්නේ දීලා තිබෙන්නේ.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
කරුණාකරලා, මම ඒක පැහැදිලි කරලා දෙන්නද?

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
Hard copy එක Library එකේ තිබෙනවා කිව්වා. ඉතින් hard copy එක-,

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Not the hard copy, soft copy. මේ ගැන දිගින් දිගට වාද කරන්න අවශ්‍යතාවක් නැහැ.

**ගරු ලක්ෂ්මන් සෙනෙවිරත්න මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் செனெவிரத்ன)
(The Hon. Lakshman Senewiratne)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි,-

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු ලක්ෂ්මන් සෙනෙවිරත්න මැතිතුමා. සමාවෙන්න, ගරු රවි කරුණානායක මහතාගේ කථාව ඉවර නැහැ.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ඒ සම්බන්ධයෙන් 2002 සිට 2015 දක්වා වාර්තා 5ක් තිබෙන්න ඕනෑ. ඒ සම්බන්ධයෙන් අපට සම්පූර්ණ report එක ඕනෑ. ඒ පිටපතක් පාර්ලිමේන්තුවේ තිබෙනවා. තව එකක් මහ බැංකුවේ තිබෙනවා. ඒ වාගේ copies 5ක් තිබෙනවා. එහි hard copy එක Parliament Library එකේ තිබෙනවා කිව්වා. නමුත් ඒක ලැබිලා නැහැ. ඒකත් එක්ක තමයි සංසන්දනය කරන්න පුළුවන්. කරුණාකරලා ඔබතුමා වගකීම භාරගන්න. හැබැයි, බැරි වෙලාවත් මේ තිබෙන CD එකේ ඒ සම්පූර්ණ තොරතුරු ටික නැත්නම් ඒ ගැන පරීක්ෂණයක් කරන්න ඕනෑ, ඇයි ඒ තොරතුරු අඩුවෙලා තිබෙන්නේ කියලා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
මීළඟට ගරු ලක්ෂ්මන් සෙනෙවිරත්න මැතිතුමා. [බාධා කිරීමක්]

**ගරු ලක්ෂ්මන් සෙනෙවිරත්න මහතා**
(மாண்புமிகு லக்ஷ்மன் செனெவிரத்ன)
(The Hon. Lakshman Senewiratne)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, COPE එකේ සාමාජිකයකු හැටියට මාත් ඉල්ලීමක් කරන්න ඕනෑ. මම දැක්කා, අපේ මහින්දානන්ද අලුත්ගමගේ රාජ්‍ය ඇමතිතුමා කරපු යෝජනාව. 2005 ඉඳලා 2014 වෙනකම් අඩුවක් නැතිව ඒ වාර්තාව පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන්න. [බාධා කිරීමක්] ඒකත් ඕනෑ. ඊට ඉස්සරවෙලාත් ඕනෑ. COPE එකට forensic audit report එක ගැන යෝජනාව ඉදිරිපත් කළේ අපි. ඒ නිසා අපි දන්නවා, අපි ඉදිරිපත් කළේ මොකක්ද කියලා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
මේ පිළිබඳව ඊයේ ගරු කථානායකතුමා-,

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි,-

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ඔව්, ගරු අනුර දිසානායක මැතිතුමා. අවසාන කාරණය, ඔබතුමාගෙන් පසුව මේ කාරණය ගැන ආයෙත් කථා කරන්න අවශ්‍යතාවක් නැහැ. මම ඒකට උත්තර දෙන්නම්.

**ගරු අනුර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர திஸாநாயக்க)
(The Hon. Anura Dissanayake)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, දැන් මේ වාර්තාවත් ටිකක් දුෂ්කර ලෙස තමයි ලබාගන්න සිද්ධ වුණේ. ගරු කථානායකතුමා ඊයේ ප්‍රකාශ කළා, එම වාර්තාව පුස්තකාලයේ තිබෙන බව; එය අපට පරිහරණය කරන්න පුළුවන් බව. නමුත්, තවමත් එය පුස්තකාලයට නිසි පරිදි ලැබී නැති බව තමයි දැනගන්නට තිබෙන්නේ. ඊළඟට ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මෙහි එක් පිටපතක් නිශ්චිත වශයෙන්ම COPE එකට ඉදිරිපත් කරලා තිබෙනවානේ. අඩු තරමින් එම වාර්තාව ආරක්ෂා සහිතව පුස්තකාලයේ තබන්න. මන්ත්‍රීවරුන්ට අදාළ වන පරිදි CD එකක් හරහා හෝ මේ තොරතුරු ලබාදෙන්න. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පෙබරවාරි මාසයේ පාර්ලිමේන්තු රැස්වීම් තිබෙන්නේ දින 6යි. අපි හැම දාමත් ඉල්ලුවේ මේ වාර්තාව ලබාගැනීම පිළිබඳ විවාදය නම්, අඩුම තරමින් මේ වාර්තාව ගැන මේ පාර්ලිමේන්තුවේ විවාද කරන්නවත් ලැබෙන්නේ නැහැ. ඊයේත් මම දිගින් දිගටම ඉල්ලා සිටියා, ඊයේ දිනයේදීවත් මන්ත්‍රීවරු අතර මේ වාර්තාව ලබාදෙන්න කටයුතු කරලා, හෙට සහ අනිද්දා දෙදින තුළ මේ පිළිබඳව පාර්ලිමේන්තු විවාදයක් පැවැත්විය යුතුය කියලා. ඒ නිසා පක්ෂ නායක රැස්වීමක් කැඳවන්න කියා මම යෝජනා කළා. නමුත්, අද මේ වනතෙක් පක්ෂ නායක රැස්වීමක් කැඳවන බව අපට දැනුම්දීලා නැහැ. අපේ සූදානම තිබුණේ හෙට සහ අනිද්දා ඒ සම්බන්ධව විවාදයක් පවත්වන්නයි. දැන් ඒක කෙරෙන්නේත් නැහැ. ඒ නිසා ගරු

නියෝජ්‍ය කථානායකතුමනි, ඉක්මනින්ම පක්ෂ නායක රැස්වීමක් කැඳවා, මේ වාර්තාවට කරන්නේ කුමක්ද, එය පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට ලබාදෙන ආකාරය කුමක්ද, ඒ සඳහා විවාදයක් පවත්වන්නේ කෙසේද, සාමාන්‍ය දෛනිකව රැස්වීම් පවත්වන දිනවලට අමතරව වෙනත් දිනයක් අපට ලබාගත හැකිද ආදී සියල්ල ගැන අපි කථා කරන්නට ඕනෑ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපේ රටේ මහජනයාගේ දේපළ අනිසි ලෙස විනාශ කිරීම පිළිබඳ සාකච්ඡාවේ ප්‍රධාන කරුණක් බවට පත්වී තිබුණේ මේ බැඳුම්කර ගනුදෙනුවයි. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අවසානයේ ඉතා හොඳින් ඒත්තු යමින් තිබෙනවා මේ ගනුදෙනු සිද්ධ වී තිබෙන්නේ අන් කවරක් හරහාවත් නොවෙයි, සේවක අර්ථසාධක අරමුදල හරහා බව. ඒ නිසා මහ බැංකුවට සිදු වූ පාඩුවක් හෝ භාණ්ඩාගාරයට සිදු වූ පාඩුවක් නොවෙයි මෙතැන තිබෙන්නේ. සේවක අර්ථසාධක අරමුදලින් තමයි මේ සියලු සූදු කෙළලා තිබෙන්නේ. සේවක අර්ථසාධක අරමුදල කියන්නේ මේ රටේ පෞද්ගලික අංශයේ වැඩ කළ සේවක සේවිකාවන්ට අයිති මුදල්. මේ මුදල් තමයි තමන්ට අවශ්‍ය ආකාරයට මේ සූදු පිටියේ යොදවලා අනිසි ලාභ ලැබීමට අනිසි ලෙස මුදල් උපයාගැනීම සඳහා කටයුතු කර තිබෙන්නේ. ඒ නිසා ඒ ජනතාවගේ අයිතිවාසිකම් වෙනුවෙන් අපි හරියට පෙනී සිටිනවා නම් මේ පිළිබඳව විවාදය ඉක්මනින්ම ලබාදිය යුතුයි. ඒ නිසා මම ඔබතුමාට යෝජනා කරනවා ඉක්මනින් පක්ෂ නායක රැස්වීමක් කැඳවන ලෙසට. මම ඊයේ ඉඳන් මේ කරුණ කියන්නේ.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
හොඳයි ගරු මන්ත්‍රීතුමා, ඔබතුමා මට ගරු කථානායකතුමා දැනුවත් කරන්න කියපු නිසා මා එතුමා දැනුවත් කරන්නම්. මේ ප්‍රශ්නය එතැනින් එහාට සාකච්ඡා කරන්න අවශ්‍ය නැහැ.

මූලික වශයෙන් මේ CD පට සියල්ල ගැන ගරු කථානායකතුමා ඊයේ එතුමාගේ අදහස ඉදිරිපත් කළා. එතුමා පැහැදිලිවම කිව්වා, පාර්ලිමේන්තුවේ ගරු මන්ත්‍රීතුමන්ලාගේ පරිහරණයට සම්පූර්ණ වාර්තාව ලබා දෙන්න අවශ්‍ය වැඩ පිළිවෙළ එතුමා හදනවා කියලා. ඒකට අවශ්‍ය වැඩ පිළිවෙළ හදලා තමයි තිබෙන්නේ. පුස්තකාලයට ලැබෙන තොරතුරු ප්‍රමාණය පිළිබඳව පමාවක් තිබෙනවා. නමුත් ඒක නිවැරදි කරනවා. ඒ සම්බන්ධව මා ගරු කථානායකතුමා දැනුවත් කරනවා. ඊට අමතරව, සිකුරාදා පක්ෂ නායක රැස්වීමක් කැඳවනවා. මේ වෙනුවෙන් සාකච්ඡාවක් සඳහා පෙබරවාරි මාසයේ පළමුවැනි සතියේ පාර්ලිමේන්තුවේ දින දෙකක් වෙන් කරන්න ගරු කථානායකතුමා අදහස් කර තිබෙනවාය කිව්වා. [බාධා කිරීමක්]

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, නව ආරක්ෂක හමුදා මූලස්ථාන ගොඩනැගිලි සංකීර්ණය ඉදි කරන අවස්ථාවේ ඒ කටයුතු සම්බන්ධයෙන් එතැන ප්‍රශ්නයක් ඇති වී තිබුණා. ඒ අවස්ථාවේදී, තිරුකුමාර් නඩේශන් මැතිතුමා Right to Information Act එක යටතේ තොරතුරු ඉල්ලුවාම, නීතිපති දෙපාර්තමේන්තුව දෙන්න බැහැ කිව්වා. නමුත්, නැවත දෙන්න පුළුවන් කියලා ඒ තොරතුරු සම්පූර්ණයෙන්ම දුන්නා. ඒ තොරතුරු දුන්නාම රටේ ආරක්ෂාවට ප්‍රශ්නයක් ඇති වෙනවා කියලා තිබුණා. ඒ තොරතුරු වෙනත් තැනකට ගියොත් ප්‍රශ්නයක් ඇති වෙයි කියලා තිබුණා. ඒ පිළිබඳවත් නොතකා, තොරතුරු දැන ගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනත යටතේ ඒ තොරතුරු ලබා දුන්නා. ඒ විධියට, ගරු අනුර දිසානායක මන්ත්‍රීතුමා කිව්වා වාගේ COPE එකට ලබා දුන් භාණ්ඩාගාර බැඳුම්කර නිකුතුව පිළිබඳ වෝහාරික විගණන වාර්තාව මේ මොහොතේම පුස්තකාලයට ඉදිරිපත් කරන්න.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
මා කියපු විධියට අවශ්‍ය කටයුතු සිදු වෙනවා. මීට අවශ්‍ය පිළිතුර මා දැන් ඔබතුමාට දුන්නා.

**ගරු රවි කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
තිරුකුමාර් නඩේශන් Right to Information Act එක යටතේ තොරතුරු ලබා ගත් ක්‍රමය මේ සඳහා පාවිච්චි කරන්න. මම මේ අවස්ථාවේදී එම ලේඛන **සභාගත*** කරනවා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
මේ සම්පූර්ණ වාර්තාව ඉදිරිපත් කරන්න කියලා ගරු කථානායකතුමාත් නියෝගයක් දීලා තිබෙනවා.

ගරු ටී.බී. ඒකනායක මැතිතුමනි, ඔබතුමාට විනාඩි 12ක කාලයක් තිබෙනවා.

ඊට පෙර ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා මූලාසනයට පැමිණෙනවා ඇත.

*අනතුරුව ගරු නියෝජ්‍ය කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වුයෙන්,* **නියෝජ්‍ය කාරක සභාපතිතුමා [ගරු සෙල්වම් අඩෛක්කලනාදන් මහතා]** *මූලාසනාරූඪ විය.*

*அதன்பிறகு, மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் [மாண்புமிகு செல்வம் அடைக்கலநாதன்] தலைமை வகித்தார்கள்.*

*Whereupon* THE HON. DEPUTY SPEAKER *left the Chair, and* DEPUTY CHAIRMAN OF COMMITTEES [THE HON. SELVAM ADAIKKALANATHAN] *took the Chair.*

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
Hon. T.B. Ekanayake, you may commence your speech now.

[අ.භා.3.30]

**ගරු ටී.බී. ඒකනායක මහතා**
(மாண்புமிகு ரி. பி. ஏக்கநாயக்க)
(The Hon. T.B. Ekanayake)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, අද 2014 අංක 33 දරන ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන පනතේ නියෝග තුනක් විවාදයට ගැනෙනවා. එකී පනතේ 52(2) වගන්තිය සමඟ කියවිය යුතු, 2019 මාර්තු 08 දිනැති අංක 2113/63 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2019.08.06 දින ඉදිරිපත් කරන ලද නියෝග අනුමත කරන්න තිබෙනවා. ඉදි කිරීම් සම්බන්ධව පවතින ආරවුල් විසඳීම යටතේ තීරකවරුන් ලියාපදිංචි කිරීම සම්බන්ධවත්, 2019.03.28 වන දින දිනැති අංක 2116/47 දරන අති විශේෂ ගැසට් නිවේදනය මඟින් ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන පනතේ 53(2) සහ 54(1)(අ) වගන්ති සමඟ කියවිය යුතු එකී පනතේ 58 වගන්තිය යටතේ අභියාචනා කාර්ය පටිපාටිය සම්බන්ධවත්, 2019.03.28 දිනැති අංක 2116/48 දරන අති විශේෂ

---

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

[ගරු ටී.බී. ඒකනායක මහතා]

ගැසට් පත්‍රයේ ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන පනතේ 55 (2) වගන්තිය සමඟ කියවිය යුතු ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන පනත යටතේ තොරතුරු ලේකම් කාර්යාලය සම්බන්ධවත් වන නියෝග අද සාකච්ඡා කරනු ලබනවා. මෙම ගැසට් නිවේදන අනුව නියෝග ක්‍රියාත්මක වීමට නියමිතයි.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, පසුගිය කාලයේ ඉදිකිරීම් ක්ෂේත්‍රයේ විවිධ නෛතික තත්ත්ව පිළිබඳව, නියෝග ක්‍රියාත්මක කිරීම පිළිබඳව සැලකිල්ලට ගනිමින් කටයුතු කරන මේ අවස්ථාවේ ඉතා වැදගත් කරුණු රාශියක් සම්බන්ධ වෙලා තිබෙනවා කියලා මා හිතනවා. ඒ කරුණු අතර, නිවේදන සහ අධිකාරි යනුවෙන් සඳහන් කරන කර්මාන්තශාලා අධිකාරි, ලියාපදිංචි අංකය සහිත අභියාචනා ගොනු කිරීම ඇතුළු කාරණා තිබෙනවා. ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන පනත යටතේ පිහිටුවන ලද ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරියත්, ඒ වාගේම යම් යම් තවත් තීරණ රාශියක් මෙයට සම්බන්ධ වෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ශ්‍රී ලංකාවේ ඉදිකිරීම් විදේශීය කොන්ත්‍රාත්කරුවන් නොමැතිව දේශීය කොන්ත්‍රාත්කරුවන්ට ලබාදීම් පිළිබඳ අතිගරු ජනාධිපතිතුමාත්, ගරු අග්‍රාමාත්‍යතුමාත් පසුගිය කාලය පුරාම කරලා තිබෙන විවිධ ප්‍රකාශ, ඉදිරිපත් කිරීම්, කැබිනට් මණ්ඩලය දැනුවත් කිරීම් ආදී කාරණා ඉදිකිරීම් ක්ෂේත්‍රය ගැන කියද්දී ඉතාම වැදගත් වෙනවා. විදේශීය කොන්ත්‍රාත් සමාගම් ලියා පදිංචි කිරීමේදී විවිධ ව්‍යාජ බැංකු තොරතුරු ඉදිරිපත් කරලා, ව්‍යාජ බැංකු වාර්තා ඉදිරිපත් කරලා, විවිධ උපක්‍රම පාවිච්චි කරමින් කොන්ත්‍රාත් ලබා ගෙන, ඒ කොන්ත්‍රාත් එකට කලින් ලබා ගන්නා වූ මූලික මුදල ලබා ගෙන ඔවුන් අතුරුදහන් වෙච්ච සිද්ධි ගණනාවක් තිබෙනවා. ඒ පිළිබඳව ශ්‍රී ලංකා මහ බැංකුවත්, ඊට අදාළ අධිකාරිය හා අමාත්‍යාංශත් මේ කාරණය පිළිබඳ කටයුතු කරයි කියලා මම හිතනවා. හිටපු අග්‍රාමාත්‍ය ගරු රනිල් වික්‍රමසිංහ මැතිතුමා පසුගිය කාලයේ ජන හමු ගණනාවකදීම කිව්වා, රටටම අවශ්‍ය වොක්ස්වැගන් කර්මාන්තශාලාවක් කුලියාපිටියේ ඉදි කරනවා කියලා. ඒ කර්මාන්තශාලාවේ ඉඩම රජයේ ඉඩමක් නොවෙයි. ඒ ඉඩම බුදල් බදු පනත යටතේ මහා භාරකාර දෙපාර්තමේන්තුවට පවරලා, කුලියාපිටිය රෝහලේ යම් යම් නඩත්තු කිරීම් සඳහා සුබසාධන ක්‍රියාවලියක් විධියට, පින්කමක් විධියට, කුසලයක් විධියට ඒ ආදායම ලබා ගැනීමට ඒ පරම්පරාවෙන් ලබා දුන්න ඉඩමක්. නමුත් ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඔවුන්ගෙන් කිසිම විමසීමක් නොකොට හිතුවක්කාර ලෙස ඒ පොල්ගස් සියල්ලම කපලා, අද එතැන වෙනත් ගොඩනැඟිලි කිහිපයක් ඉදි කරගෙන යනවා. අද ඒ පළාතේ ජනතාව වොක්ස්වැගන් හන්දිය කියලා ඒ හන්දියට නම දාලා තිබෙනවා. වොක්ස්වැගන් සමාගමත් ප්‍රකාශ කළා, "අපේ කිසිම කර්මාන්තශාලාවක්, අපේ කිසිම වැඩ පිළිවෙළක් ලංකාවේ ඉදි වෙන්නේ නැහැ. ඒ නිසා අපේ නම පාවිච්චි කරන්න එපා" කියලා. ඒ වාගේම ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, ඒ කර්මාන්තය සඳහා ලබා ගත්තා වූ ඉඩමේ අයිතිකරුවන් අධිකරණයට ගිහිල්ලා තිබෙනවා. මේ පාර්ලිමේන්තුවේ උපදේශක කමිටු තිබෙනවා, අමාත්‍යාංශවල කමිටු තිබෙනවා. එවැනි කිසිදු කමිටුවකින් විධිමත්ව මේවා අනුමත නොවීම තවත් කාරණයක් වෙලා තිබෙනවා. ඒ වාගේම කුලියාපිටියේ, බිංගිරිය ප්‍රදේශයේ කර්මාන්තපුරයක් ආරම්භ කරනවා කියලා රජයේ ඉඩම් අක්කර ගණනාවක තිබුණ පොල් ගස් කපා දාලා තිබෙනවා. මම හිතන හැටියට ලක්ෂ ගණනක පොල් ගස්වල මුල් ගලවලා විනාශ කර දාලා තිබෙනවා. නමුත්, හදලා තිබෙන කර්මාන්තශාලාවක් නැහැ. මේ වාගේ අපරාධ සිදුවෙන්නේ සැලැස්මක්, වැඩ පිළිවෙළක් නොමැති නිසායි. මේ වාගේ දේවල් අනවශ්‍ය පරිදි දේශපාලන වාසි ලබා ගැනීම සඳහා කරන ඉදිකිරීම්. මේ නියෝග වැදගත් වෙන්නේ ඒ නිසායි. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, රජයේ දේපළ අවභාවිත කරලා තිබෙනවා. ජාතික නිෂ්පාදනයට ඇතුළත් වන වයඹ පළාතේ පොල් ත්‍රිකෝණයට අතිවිශාල වටිනාකමක් තිබෙනවා. මේ පොල් වතු විනාශ කරලා ක්‍රියාත්මක කරන වැඩ පිළිවෙළ පිළිබඳ අපි විශේෂයෙන්ම අවධානය යොමු කරන්න ඕනෑ. විශේෂයෙන් මේ මොහොතේ මේ කාරණයට අදාළව දෙමළ ජාතික සන්ධානය නියෝජනය කරන ඉ. චාල්ස් නිර්මලනාදන් මන්ත්‍රීතුමා ප්‍රකාශ කළා, "යුද්ධය තිබෙන මොහොතේදී අතුරුදහන් වුණු අය සියලු දෙනාම මිය ගියා" කියලා අගමැති මාධ්‍ය අංශයෙන් ප්‍රකාශයක් කළාය කියලා. ඒක සම්පූර්ණයෙන්ම වැරදි ප්‍රකාශයක්.

**ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා**
(மாண்புமிகு நலின் பண்டார ஜயமஹ)
(The Hon. Nalin Bandara Jayamaha)
Sir, I rise to a point of Order.

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
Hon. Member, what is your point of Order?

**ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා**
(மாண்புமிகு நலின் பண்டார ஜயமஹ)
(The Hon. Nalin Bandara Jayamaha)
ගරු මන්ත්‍රීතුමා, පොල් ගස් ලක්ෂ ගණනක් කපලා තිබෙනවා කියලා ඔබතුමා බිංගිරියේ කර්මාන්තපුරය ගැන වැරදි ප්‍රකාශයක් කළා. යටිතල පහසුකම් වෙනුවෙන් පොල් ගස් 500 ගණනක් කැපුවා. දැනට කර්මාන්තශාලාවක් ඉදිවෙනවා. ඒ වාගේම ඇමෙරිකානු ඩොලර් මිලියන 64ක කර්මාන්තශාලා 6කට ගිවිසුම් අත්සන් කරලා තිබෙනවා. ඔබතුමා වැරදි ප්‍රකාශ කරන්න එපා. ඔබතුමා කුරුණෑගල දිස්ත්‍රික්කය නියෝජනය කරන මන්ත්‍රීවරයෙක්නේ. මම Dining Room එකේ ඉඳලා මෙතැනට දුවගෙන ආවා. ඒ නිසායි මට පොඩ්ඩක් හති. ඔබතුමා ඒ ප්‍රකාශව නිවැරදි කළොත් හොඳයි. ඒක ඉතාම සාර්ථක ව්‍යාපෘතියක්. ඉදිරියේදී රැකියා ලක්ෂ ගණනක් බිහි වෙනවා. දැනට අපි අක්කර 450කට ආසන්න ප්‍රමාණයක් අත් පත් කරගෙන තිබෙනවා. දැනට පොල් ගස් 500 ගණනයි කපලා තිබෙන්නේ. එම නිසා ඒක වැරැදි ප්‍රකාශයක්. ඔබතුමා ඒක නිවැරදි කරන්න. එහෙම නැත්නම් ඔබතුමා මාත් එක්ක ඇවිල්ලා ඒක බලන්න. දැනට එම ව්‍යාපෘතිය යම් විධියකට අඩ පණ වෙලා තිබෙනවා. ඒ ව්‍යාපෘතිය ඉක්මනින් ආරම්භ කළොත් හොඳයි.

**ගරු ටී.බී. ඒකනායක මහතා**
(மாண்புமிகு ரி. பி. ஏக்கநாயக்க)
(The Hon. T.B. Ekanayake)
හති ඇරලා කථා කරන්න මන්ත්‍රීතුමනි. අපි ළඟදී ඒ ප්‍රදේශයට ගියා. ඒ ප්‍රදේශයේ ජනතාව අපට කියපු කාරණා තමයි අපි කියන්නේ. අපි ඒ ප්‍රදේශයේ ජනතාව හමු වුණාම ඒ ගොල්ලෝ මේ ගැන කථා කළා. ඇත්තෙන්ම හරියට කරනවා නම් ඒ කාර්යය ඉතාම හොඳයි. ඔබතුමා ඒ ප්‍රදේශයේ කෙනකු විධියට, එම ප්‍රදේශයේ ජනතාවට රැකී රක්ෂා ලැබෙන විධියට, ඒ ප්‍රදේශයේ කර්මාන්ත නිර්මාණය කරලා, ඒ කාර්යය ක්‍රියාත්මක කිරීම ඉතාම හොඳයි. මම කියන්නේ මේකයි. මේ පනතට අනුව මේ වාගේ සැලසුමක් නැති වැඩසටහන් ක්‍රියාත්මක කිරීමේදී මුදල් ප්‍රතිපාදන තිබෙනවාද, ඒ සඳහා වන ඉලක්කය මොකක්ද, රැකී රක්ෂා කොපමණ ලැබෙනවාද, ක්‍රියාත්මක කරන වැඩසටහන් මොනවාද කියන එක පැහැදිලිව සනාථ විය යුතුයි. පසුගිය රජය යටතේ රට පුරා ක්‍රියාත්මක වූ මේ වගේ වැඩසටහන් රාශියක් තිබුණා.

විශේෂයෙන් මම කථා කරමින් සිටියේ ගරු චාල්ස් නිර්මලනාදන් මන්ත්‍රීතුමාගේ ප්‍රකාශය පිළිබඳවයි. මේ රට නිදහස් කිරීමේ ජාතික අරගලයේදී විශේෂයෙන් බොහෝ ජනතාව අපට භාර වෙන්න ආවා. නමුත් එල්ටීටීඊ සංවිධානයට සම්බන්ධ නායකයන් ඔවුන්ට භාර වෙන්න ඉඩ දුන්නේ නැහැ. ඔවුන්ට

කලින් භාර වෙන්න අවස්ථාව දුන්නා නම් මේ තරම් විනාශයක් වෙන්නේ නැහැ. ඔවුන් කොටු කරගෙන, දූපත්වල තබාගෙන කටයුතු කරපු නිසා තමයි විශාල ප්‍රශ්නයකට මුහුණ දුන්නේ. ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, මේ තත්ත්වය පිළිබඳව වැරැදි තොරතුරු අන්තර්ජාතික වශයෙන් ප්‍රසිද්ධ වුණාම ඒක, ආණ්ඩුවට පමණක් නොවෙයි, එහෙම නැත්නම් වෙනත් කාටවත් නොවෙයි, රටට හොඳ නැහැ. ඒ නිසා අපි කරන සෑම ප්‍රකාශයක්ම ඉතාම වග කීමෙන් කළ යුතුයි. මොකද, ඒ රට නිදහස් කිරීමේ ජාතික ව්‍යාපාරය ආරම්භ කරලා අවසන් වුණාම, ත්‍රිවිධ හමුදාව, පොලීසිය, ග්‍රාමාරක්ෂක සේනාංකය -ඒ හැමදෙනාම- ඉතාම ශක්තිමත්ව ඒ කාර්යය කළාට පස්සේ, ඉතාම හොඳ කළමනාකරණයකින් යුතුව මේ රටේ ත්‍රස්තවාදය අවසන් කිරීම පිළිබඳව අපි ලෝකයේ විශාල ප්‍රශංසාවකට භාජන වුණා. ඒ සම්බන්ධයෙන් උපදෙස් ගන්න, ප්‍රශ්න තිබෙන ලෝකයේ රටවල් විශාල ප්‍රමාණයකින් ලංකාවට ආවා; ප්‍රශ්න තිබෙන සංවිධාන ආවා. ඒ සම්බන්ධයෙන් අපි ලබාගත් ප්‍රායෝගික ඥානය පිළිබඳව, උපක්‍රමික ඥානය පිළිබඳව, විශේෂයෙන්ම ගරිල්ලා ස්වභාවය පිළිබඳය යම් යම් තොරතුරු ලෝකයේ බොහෝ අය අපෙන් ලබා ගත්තා. එක්සත් ජාතීන්ගේ සංවිධානය සාම හමුදා යොදා ගැනීමේදීත් අපේ අයට ප්‍රමුඛත්වය දුන්නේ, ඒ වාගේ දක්ෂ හමුදා සේනාංක, නාවික සේනාංක, ගුවන් සේනාංක අප සතුව තිබෙන නිසායි.

මේ වාගේ තත්ත්ව පිළිබඳව අපි කථා කරගෙන ගියේ සැලසුම් ගාස්තු පිළිබඳව සහ ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන පනත යටතේ නියෝග පිළිබඳවයි. මේ රටේ ඉදිකිරීම් ක්ෂේත්‍රය අය CIDA සමාගමේ ලියාපදිංචි කළාම, ඒ ඉදිකිරීම් ගැන පසු විපරම් කිරීම පිළිබඳවත් අපි කල්පනා කරන්නට ඕනෑ. පසුගිය දවසක එම ආයතනයේ ප්‍රධාන ශාලාවක රැස්වීමක් තිබුණා. ඔවුන්ගේ ඉදිකිරීම් ප්‍රමාණය "A" ශ්‍රේණිය, "B" ශ්‍රේණිය, ආදි විවිධ ශ්‍රේණි විධියට වර්ග කර තිබෙනවා. ඔවුන්ගේ ඉදිකිරීම්වල තත්ත්ව වාර්තාවක් ඒ පළාත්වලින් ලබාගෙන, ඔවුන් ඒ ක්ෂේත්‍රය තුළ ඉතාම මැනවින් ඒ කාර්යය ක්‍රියාත්මක කර තිබෙනවා. අපි දන්නවා, සමහර ඉදිකිරීම්වලදී පාවිච්චි කරන දැව සඳහා අමු ලී පාවිච්චි කරලා තිබෙනවා කියලා. සමහර විට බුරුත හෝ තේක්ක ලී කියලා දිවුල් ලී දමනවා. ඒ පාටින්ම ඩයි එක ගාලා, එහෙම නැත්නම් වෙනත් වර්ණ සංයෝජනය කරලා හදනවා. ඒ හදපු රජයේ ගොඩනැඟිලි කඩා වැටුණු අවස්ථා අපි දැක්කා. එම නිසා ජාතික ඉදිකිරීම් ආයතනය - CIDA - මේ පිළිබඳව පසු විපරම් ක්‍රියාවලියක් සිදු කිරීම ඉතා මැනවින් සිදු කළ යුතුයි. ඒ සඳහා විධිමත් වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කළ යුතුයි.

මේ පනත යටතේ ගෙනෙන විවිධ නියෝග ක්‍රියාත්මක කළාම, ගරු අග්‍රාමාත්‍යතුමා විෂය භාර අමාත්‍යතුමා විධියට ඒ පිළිබඳ යම් වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කිරීම කළ යුතුයි. එය ඉතාම වැදගත්. ඒ නිසා විශේෂයෙන්ම අපි කථා කරපු ඒ ඉදිකිරීම් ක්ෂේත්‍රය මැනවින් සැලසුම් සහගතව, රාජ්‍ය දේපළ අවභාවිත නොකොට ඉතා වැදගත් විධියට ක්‍රියාත්මක කරමින් කටයුතු කිරීම සුදුසුයි කියන එක ප්‍රකාශ කරනවා. බොහොම ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
மாண்புமிகு றிஸாட் பதியுதீன் அவர்கள்!

[பி.ப. 3.44]

**ගරු රිසාඩ් බදියුදීන් මහතා**
(மாண்புமிகு றிஸாட் பதியுதீன்)
(The Hon. Rishad Bathiudeen)
*பிஸ்மில்லாஹிர் றஹ்மானிர் றஹீம்.*

கௌரவ குழுக்களின் பிரதித் தவிசாளர் அவர்களே, இன்றைய தினம் பாராளுமன்றத்தில் முன்வைக்கப்பட்டுள்ள நிர்மாணத் தொழில் அபிவிருத்திச் சட்டத்தின்கீழான ஒழுங்குவிதிகள் உண்மையிலே நடைமுறைப்படுத்தப்பட வேண்டியவை என்பதை நாங்கள் ஏற்றுக்கொள்கின்றோம். இந்த அரசாங்கம் ஆட்சிக்கு வந்தபிறகு, கடந்த அரசாங்க காலத்திலே குறித்த செயற்றிட்டங்களுக்கான ஒப்பந்த வேலைகளைச் செய்த எந்தவோர் ஒப்பந்தக்காரர்களுக்கும் கொடுப்பனவு வழங்காமல் இழுத்தடிப்புச் செய்வதனூடாக இந்த industryஇல் இருக்கின்றவர்கள் வீழ்ந்து போயிருக்கின்றார்கள் என்று நான் நினைக்கின்றேன். கடந்த அரசாங்கக் காலத்திலே ஒப்பந்த வேலைகளைச் செய்தார்கள் என்பதற்காக இந்த அரசாங்கம் ஏராளமான contractors களைப் பழிவாங்குகின்றது என்றுதான் எனக்குத் தென்படுகின்றது. அவ்வாறில்லாமல், அவர்களுக்கான கொடுப்பனவுகளை வழங்க நடவடிக்கை எடுக்கவேண்டுமென்று நாங்கள் வேண்டுகோள் விடுக்கின்றோம்.

வவுனியாவிலே பம்பைமடுப் பகுதியிலே வாழ்கின்ற மக்கள் நீண்டகாலமாக எதிர்நோக்கிய குப்பைப் பிரச்சினைக்கான தீர்வை வழங்குவதாக 4 மாதங்களுக்கு முன்னர் வவுனியாப் பிரதேச சபையும் நகர சபையும் அரசாங்க அதிபரும் மேலதிக அரசாங்க அதிபரும் பிரதேச செயலாளரும் ஒத்துக்கொண்டு, அந்தக் குப்பைகளை இன்னோரிடத்தில் கொட்டுவதற்கு ஒழுங்குசெய்வதாகச் சொல்லியிருந்தும், இதுவரை குறித்த நடவடிக்கை மேற்கொள்ளப்படாமையால், அந்த மக்கள் இன்று அங்கு வாழ முடியாமல் பாதையிலே நின்று தங்களுக்குத் தீர்வுகேட்டு ஆர்ப்பாட்டம் செய்கின்ற ஒரு துர்ப்பாக்கிய நிலை ஏற்பட்டிருக்கின்றது. அந்த மக்களுக்கு நியாயம் கிடைக்க வேண்டும். எனவே, இது சம்பந்தமாக ஓர் அவசர நடவடிக்கையை மேற்கொண்டு வேறோரிடத்திற்கு இந்தக் குப்பை கூழங்களைக் கொண்டு போய் போடுவதற்கான ஏற்பாடுகளைச் செய்யுமாறு விடயத்துக்குப் பொறுப்பான அமைச்சர் ஜனக பண்டார தென்னகோன் அவர்களிடம் நான் வேண்டுகோள் விடுக்கின்றேன்.

அந்த மக்கள் அங்கு புதிதாகக் குடியேறியவர்கள் என்று அங்கிருக்கின்ற பிரதேச சபைத் தவிசாளர் சொன்னதாக நாங்கள் அறிகின்றோம். அது ஒரு மடமையான செயல். அந்த மக்கள் 20-30 வருடங்களுக்கு முன்னர் குறித்த இடத்திலிருந்து வெளியேற்றப்பட்டவர்கள். அவர்கள் மீளக் குடியேற வருகின்றபோது அங்கு வேறு மக்கள் குடியேறியிருந்ததனால்தான் அவர்கள் குறித்த பகுதியிலே குடியேற வேண்டிய நிர்ப்பந்தம் ஏற்பட்டது. அங்கு அவர்கள் சட்ட ரீதியாகக் குடியேற்றப்பட்டவர்கள். எனவே, அவர்களுடைய குடியேற்றத்திற்கு எந்தவித பங்கமும் ஏற்படாமல் செயற்படவேண்டும். அந்த இடத்தில் பெரிய campus ஒன்றிருக்கின்றது. இன்று இந்த நிலைமையினால் அங்கு மாணவர்கள் படிக்கமுடியாத துர்ப்பாக்கிய நிலை ஏற்பட்டிருக்கின்றது. எனவே, அவசரமாக இந்தப் பிரச்சினைக்கான தீர்வை வழங்கவேண்டுமென்று நான் வேண்டுகோள் விடுக்கின்றேன்.

இன்று அவசர அவசரமாக வவுனியா மாவட்ட அரசாங்க அதிபர் இடமாற்றப்பட்டுள்ளதாக நாங்கள் அறிகின்றோம். 30 வருடங்களுக்கு முன்னர் மன்னாரிலே ஓர் இஸ்லாமியர் அரசாங்க அதிபராக இருந்தார். அவர் பயங்கரவாதிகளால் சுட்டுக்கொல்லப்பட்டார். அதன்பிறகு, கடந்த இரண்டு வருடங்களுக்கு முன்னர் ஓர் இஸ்லாமியர் வவுனியா மாவட்ட அரசாங்க அதிபராக நியமிக்கப்பட்டார். இவரை இடமாற்றம் செய்கின்ற செயற்பாட்டை அரசாங்கம் ஒரு பெரிய சாதனையாகச் செய்திருப்பதாக நாங்கள் அறிகிறோம். ஏன், இவ்வாறு செய்கின்றீர்கள்? என்று நாங்கள் அவர்களிடம்

[ගරු රිසාඩ් බදියුදීන් මහතා]

கேட்கிறோம். இந்த நாட்டிலே முஸ்லிம் சமூகம் கிட்டத்தட்ட 10 வீதம் வாழ்கின்றனர். இச்சமூகத்தில் SLAS Class I, Special Grade ஆகிய தரங்களில் 20க்கும் மேற்பட்டவர்கள் இருக்கின்றார்கள். அம்பாறையிலே பெரும்பான்மையாக முஸ்லிம்கள் வாழ்கிறார்கள்; திருகோணமலையிலே பெரும்பான்மையாக வாழ்கிறார்கள். 10 சதவீதம் என்று பார்த்தால், முஸ்லிம்கள் 03 பேர் குறித்த பதவியில் நியமிக்கப்படவேண்டும். ஆகக் குறைந்தது அம்பாறை, திருகோணமலையிலாவது இஸ்லாமியர்கள் அரசாங்க அதிபர்களாக நியமிக்கப்பட வேண்டும். இந்த நிலையில் ஏன், வவுனியா அரசாங்க அதிபர் அவசர அவசரமாக இடமாற்றம் செய்யப்பட்டார் என்று எங்களுக்குத் தெரியாது. இந்த அரசாங்கம் இவ்வாறு இன ரீதியாகச் செயற்படுவதை நிறுத்தவேண்டும் என்று நாங்கள் வேண்டுகோள் விடுக்கின்றோம். இந்த நாட்டிலே குறித்த தகுதியுடைய எல்லோருக்கும் இவ்வாறான பெரிய பதவி வகிப்பதற்குச் சந்தர்ப்பம் வழங்கப்படவேண்டும். இது பல்லின மக்கள் வாழ்கின்ற நாடு என்று வெளிநாடுகளிலே பெருமையாகப் பேசிவிட்டு, இந்த நாட்டிலே இவ்வாறான பழிவாங்கல்களைச் செய்வது நியாயமாகத் தெரியவில்லை.

இன்று இங்கு முன்வைக்கப்பட்டுள்ள ஒழுங்குவிதிகள் வரவேற்கத்தக்கவையாக இருக்கின்றன. இருந்தபோதிலும், கடந்த அரசாங்க காலத்தில் மேற்கொள்ளப்பட்ட "கம்பெறளிய" மற்றும் ஏனைய வேலைத்திட்டங்களை மேற்கொண்ட ஒப்பந்தக்காரர்களுக்கு இன்னும் குறித்த வேலைக்கான பணம் கொடுக்கப்படாமல் இருக்கின்றது. இதனால், அவர்கள் எல்லோரும் மிகவும் கஷ்டமான நிலையிலே இருக்கின்றார்கள். சிலர் சாக வேண்டிய நிலைக்குத் தள்ளப்பட்டிருக்கிறார்கள். தற்போதைய சனாதிபதி அவர்கள் கடந்த தேர்தலில் 69 இலட்சம் மக்களுடைய வாக்குகளைப் பெற்றுப் பதவிக்கு வந்தவுடனேயே, நாங்கள் அவர்களிடம் இந்த அரசாங்கத்தை ஒப்படைத்தோம். அவர்கள் அரசாங்கத்தைப் பொறுப்பேற்று இன்று இரண்டு மாதங்களுக்கு மேலாகின்றன. இந்த நிலையில் இந்த ஒப்பந்தக்காரர்களுக்கான கொடுப்பனவுகளை வழங்கி, அவர்களுடைய பிரச்சினைகளைத் தீர்த்து வைக்க வேண்டும் என்று கேட்டுக்கொள்கின்றேன்.

வவுனியா அரசாங்க அதிபர் ஓர் இஸ்லாமியராக இருந்ததனால்தான், அவருக்கு இடமாற்றம் வழங்கியிருக்கின்றார்கள். அவர் ஒரு தவறும் செய்யவில்லை. மூன்று இனங்களும் ஒற்றுமையாக வாழுகின்ற ஒரு மாவட்டம் வவுனியா மாவட்டம். அப்படி இருக்கையில், அந்த அரசாங்க அதிபர் ஏன் இடமாற்றம் செய்யப்பட்டார் என்பது பற்றிச் சம்பந்தப்பட்டவர்கள் தெரியப்படுத்த வேண்டும். ஓர் இஸ்லாமியர் என்பதற்காகத்தான் அவர் இடமாற்றம் செய்யப்பட்டாரா? என்பது பற்றி தெளிவுபடுத்த வேண்டும் என்று மீண்டும் கேட்டு, விடைபெறுகின்றேன். நன்றி.

[අ.භා.3.48]

**ගරු සුමේධා ජී. ජයසේන මහත්මිය**
(மாண்புமிகு (திருமதி) சுமேதா ஜீ. ஜயசேன)
(The Hon. (Mrs.) Sumedha G. Jayasena)

ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි, 2014 අංක 33 දරන ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන පනත යටතේ නියෝග තුනක් ඉදිරිපත් කර ඇති මේ වෙලාවේ ඒ පිළිබඳ කරුණු කිහිපයක් ඉදිරිපත් කිරීමට අවස්ථාව ලැබීම ගැන මම පළමුවෙන්ම සන්තෝෂ වෙනවා. එම පනත සෑදීමේ පරමාර්ථ වශයෙන්, ශ්‍රී ලංකා ඉදිකිරීම් කර්මාන්තයේ සංවර්ධනය සඳහා විධිවිධාන සැලැස්වීම, ඉදිකිරීම් කර්මාන්තයේ කටයුතු නියාමනය කිරීම, ලියා පදිංචි කිරීම, විධිමත් කිරීම, ප්‍රමිතිකරණය කිරීම ආදිය දැක්වීමට පුළුවන්.

මෙම නියෝග ඉදිරිපත් කිරීම ඉතාම යෝග්‍ය බව මම විශේෂයෙන් සඳහන් කරන්නට කැමතියි. හඳුනාගත් ඉදිකිරීම් වැඩ යන්නට, රුපියල් මිලියන 10 හෝ අමාත්‍යවරයා විසින් කලින් කලට නියම කරනු ලැබිය හැකි ඊට වඩා යම් වැඩි වටිනාකමකින් යුක්ත වන්නා වූ සියලු ගොඩනැඟිලි, නිර්මිත හෝ මහජනයාගේ පාවිච්චිය සඳහා වන යම් ගොඩනැඟිල්ලක් හෝ නිර්මිතයක් හෝ බිම් සැකසුමක් ආදිය ඇතුළත් වෙනවා.

තීරකවරයන් ලියා පදිංචිය හා විනිශ්චය කිරීම සිදු නොවීමෙන් වන අවාසි රාශියක් ද මෙතෙක් කල් පැවතුණා. ඒ අය එම නීති රීති අනුව හරියාකාරව ක්‍රියා කරලා නැති නිසා ඉදිකිරීම් කර්මාන්තය විශාල හානිදායක තත්ත්වයකට පත් වුණු අවස්ථා අපට දකින්නට ලැබිලා තිබෙනවා. එම නිසා තීරකවරුන් ලියා පදිංචිය අත්‍යවශ්‍ය කාරණයක් වෙනවා. එමඟින් වැඩි වාසි රාශියක් සැලසෙනවා. එපමණක් නොවෙයි. කර්මාන්තයේ ප්‍රමිතිය සහ පැවැත්ම ආදි හැම දෙයකටම එය හේතු වෙනවා. මෙහිදී අනිවාර්යයෙන්ම අදාළ නිර්ණායක අනුව නිලධාරින් ක්‍රියාත්මක කරවීම ඉතාම සුදුසුයි.

මා මුලින් සඳහන් කළා වාගේම මේ අවස්ථාවේදීත් සඳහන් කරන්න කැමැතියි, ඉදිකිරීම් ක්ෂේත්‍රයට පුළුල් දැනුමක් ඇති වෘත්තිකයන් ලියා පදිංචි කරවීම මේ නියෝග මඟින් විශේෂයෙන් සිදු වන බව. අඩු දැනුම ඇති අය, සුදුසුකම්වලින් අඩු අය මේ ක්ෂේත්‍රවලට පත් කිරීම නිසා ඉදිකිරීම් ක්ෂේත්‍රය තුළ විශාල හානිදායක තත්ත්ව ඇති වී තිබෙනවා. මේ නිසාම ඉදිකිරීම් කටයුතු බොහෝ දුරට ඇන හිට තිබෙනවා. උදාහරණයක් හැටියට මොණරාගල දිස්ත්‍රිත්කය ගත්තොත්, පසුගිය කාල වකවානුව තුළ එම දිස්ත්‍රික්කයේ ඉදිකිරීම් කටයුතු රාශියක් අඩ පණ වෙලා තිබෙනවා. හැබැයි, ඒවාට බලපෑ හේතු රාශියක්ම තිබෙනවා. ඒ සඳහා බලපෑවේ එම ව්‍යාපෘතිවල ඉංජිනේරුවන්ගේ සහ තාක්ෂණ දැනුම ලබා දෙන අයගේ වගකීම ඉටු නොවීම නොවෙයි. ඉදිකිරීම් කටයුතු ක්‍රියාත්මක කරන අවස්ථාවල රජයේ මුදල් ප්‍රතිපාදන කලට වේලාවට නොලැබෙන නිසා අපහසුතා ඇති වෙලා තිබෙනවා. කොන්ත්‍රාත්කරුවන් ඉදිකිරීම් කටයුතු සඳහා අවශ්‍ය වන අමුද්‍රව්‍ය ලබා ගන්නේ යම් යම් ආයතනවලට, ව්‍යාපාරික ස්ථානවලට, සෑම තැනකටම ණය වෙලායි. ඔවුන් පොලියටත් මුදල් ලබාගෙන ඉදිකිරීම් කටයුතු කරනවා. මේ නිසා ඉදිකිරීම් ක්ෂේත්‍රයේ කටයුතු කරන ඒ අය ලොකු අපහසුතාවලට ලක් වෙලා ඉන්නවා. අපේ දිස්ත්‍රික්කය තුළ ක්ෂේත්‍ර කීපයකම ඉදි කිරීම්වලට අදාළ මුදල් තවමත් ගෙවලා නැහැ. එසේ මුදල් නොගෙවීම නිසා කොන්ත්‍රාත්කරුවන් සහ ඉදිකිරීම් ක්ෂේත්‍රය තුළ වැඩ කටයුතු කිරීමට භාර ගන්නා අය මින් ඉදිරියට එම කටයුතු භාර නොගන්නා තත්ත්වයක් ඇති වෙලා තිබෙනවා. ඒ අයට අවශ්‍ය පරිදි, කලට වේලාවට සැලසුමට අනුව මුදල් ප්‍රතිපාදන නොලැබීම ගැටලුවක්. තාක්ෂණික දැනුම නම් ලබා දෙන ක්‍රමයක් දැනටත් තිබෙනවා. ඒ ක්‍රමය තවත් විධිමත් කිරීම ඉතාම වැදගත්. මේ කර්මාන්ත කරගෙන යන අතරතුර ඇති වන වෙනස්වීම්, බිඳ වැටීම්, නතරවීම් ආදි දේවල් එමඟින් නැවැත්වීමට පුළුවන්කම ලැබෙනවා.

ඉදිකිරීම් කර්මාන්තයේ ජාතික දත්ත මූලාශ්‍රයක් පවත්වාගෙන යෑමේ වාසි රාශියක් තිබෙනවා. ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරිය මඟින් තොරතුරු කාර්යාලයක් පවත්වාගෙන යෑමත්, නියමිත පරිදි කාර්ය පටිපාටිය හා කාර්ය සාධක ප්‍රමිති අනුව ඉදිකිරීම් කර්මාන්තය සම්බන්ධව තොරතුරු රැස් කිරීමත් ඉතාම වැදගත් වෙනවා. මේ නියෝග තුළින් විධිමත් හා විශ්වසනීය තොරතුරු රැස් කිරීමට අධිකාරියට හැකියාව ලැබෙනවා. මේ

සම්බන්ධ තොරතුරු එකම ස්ථානයක රැස් කිරීමටත්, අවශ්‍ය වන විට එකම ස්ථානයකින් තොරතුරු ලබා ගැනීමටත් හැකියාව ලැබෙනවා. ඉදිකිරීම් ක්ෂේත්‍රයේ කටයුතු විධිමත්ව ක්‍රියාත්මක කිරීම සඳහා අවශ්‍ය විධිවිධාන සැලැස්වීම ඉතාම හොඳයි. මා මුලින් සඳහන් කළා වාගේ කොන්ත්‍රාත්කරුවනුත් ඒ ආකාරයෙන්ම ප්‍රමිතියට අනුව සුදුසුකම් තිබෙන අය ලියා පදිංචි කරලා හරියාකාරව මේ වැඩසටහන් ක්‍රියාත්මක කරනවා නම්, ඉදිකිරීම් කටයුතු සිදු කරනවා නම් තමයි ඒවා බෙහෙවින් සාර්ථක වන්නේ.

අපේ ආණ්ඩුව පැවැති, ගරු මහින්ද රාජපක්ෂ මැතිතුමා ජනාධිපතිවරයා වශයෙන් සිටි කාලයේ මොනරාගල බස් නැවතුම් පොළ හදන්නත්, ආදාහනාගාර හදන්නත්, ප්‍රාදේශීය සභා ගොඩනැඟිලි හදන්නත්, වෙනත් විවිධ ව්‍යාපෘති සඳහාත් අපි මොනරාගල දිස්ත්‍රික්කයට මුදල් ප්‍රතිපාදන විශාල වශයෙන් වෙන් කර දුන්නා. ඉදිකිරීම් කටයුතු කිරීමේදී, කොන්ත්‍රාත්කරුවන්, ඉල්ලුම්කරුවන් සොයා ගැනීමේදී නියමිත සුදුසුකම් තිබෙන, අදාළ දිස්ත්‍රික්කයේ අය ඉල්ලුම් කර තිබෙනවා නම් ඒ අයට ප්‍රමුඛත්වය දිය යුතුය කියාත් මා මේ අවස්ථාවේදී යෝජනා කරන්න කැමැතියි. එවැන්නක් යෝජනා කරන්න හේතුව උදාහරණයක් මඟින් කියන්න මා කැමැතියි. ඒ කාලයේ මොනරාගල බස් නැවතුම් පොළ සංවර්ධනයට සහ බස් නැවතුම් පොළේ කාර්යාල ඉදි කිරීමට අපි රුපියල් ලක්ෂ 600ක පමණ මුදලක් වෙන් කර දුන්නා. ඒ මුදල් වෙන් කර දුන්නත්, ඇත්තටම ඒ මුදලින් හරි ප්‍රතිඵලයක් ලබා ගන්න පුළුවන්කම ලැබුණේ නැහැ. ඉදි කිරීම් නිසි පරිදි සිදු නොවන බවට මට ලැබුණු තොරතුරු අනුව මම බොහෝ අවස්ථාවල ඒ ඒ ස්ථානවලට ගිහින් පරීක්ෂා කර බැලුවා. සමහර අවස්ථාවලදී පරණ කොන්ක්‍රීට් එකක් කඩපු කැලි ගෙනැල්ලා ඒවා මිශ්‍ර කරලා කොන්ක්‍රීට් දමා තිබුණා. ඒ විතරක් නොවෙයි. බිමට වැලි විතරක් අතුරා සිමෙන්ති දාලා තිබුණා. එක් ස්ථානයක සිමෙන්ති දාගෙන යන අතරතුර එසේ කරනු දුටු කීප දෙනෙක් ඇවිල්ලා මට ඒ බව කිව්වා. මම ඒ ස්ථානයට ගිහිල්ලා පරීක්ෂා කර බැලුවා. මට ඉදිකිරීම් ක්ෂේත්‍රය පිළිබඳ මනා දැනුමක් නැති වුණත්, වැලි උඩින් යන්තම් සිමෙන්ති පොඩ්ඩක් බිමට දාගෙන යන ආකාරය අපි දැක්කා. අපි ඒ වෙලාවේම දිස්ත්‍රික් ලේකම්තුමියත්, ඊට සම්බන්ධ වූ ඉංජිනේරු මහත්වරුත් ගෙන්වා ඒ වාගේ තැන් කීපයක් පෙන්නුවා.

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
ගරු මන්ත්‍රීතුමියට තවත් විනාඩි දෙකක් තිබෙනවා.

**ගරු සුමේධා ජී. ජයසේන මහත්මිය**
(மாண்புமிகு (திருமதி) சுமேதா ஜீ. ஜயசேன)
(The Hon. (Mrs.) Sumedha G. Jayasena)
ඇත්තටම ඒ කොන්ත්‍රාත්තුව ලබාගෙන තිබුණේ බොහොම ඈත දිස්ත්‍රික්කයක එවකට පාර්ලිමේන්තුව නියෝජනය කරපු මන්ත්‍රීවරයෙක්. මා ඒ මන්ත්‍රීවරයාට එවෙලේම දුරකථනයෙන් කථා කළා. කථා කරලා, "ඔබතුමා ඉදි කිරීම් වැඩ කටයුතු කරන ආකාරය ඉතාම දුර්වලයි. ඒ නිසා අපි මේ වැඩ දැනට තාවකාලිකව නවත්වනවා. ඔබතුමා ඇවිල්ලා අපත් සමඟ සාකච්ඡා කරලා ඉදිරියේදී මේ කටයුත්ත නිසි ප්‍රමිතියකට කරන්න." කියන ඉල්ලීම කළා. අදාළ ඉංජිනේරු මහත්වරුත් ගෙන්වලා ඒ ස්ථාන පෙන්වලා අපි ඒ වැඩසටහන ඒ අවස්ථාවේ නතර කළා. ඊට පසුව අධීක්ෂණයක් යටතේ නැවතත් එය කරන්න පුළුවන්කම ලැබුණා. එය අධීක්ෂණය කරන්න කවුරුවත් හිටියේ නැහැ. මා හිතන විධියට දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ නිලධාරින්ට තමයි එය බාර දීලා තිබුණේ. ඒ අය හරියට, කලට වේලාවට ඒ ස්ථානවලට ගියේත් නැහැ. ඒ නිසාම එම සේවකයන් හිතුවක්කාර විධියට ඒ වැඩ කරලා ගියා. ඒ විධියට ඒ වැඩ කරලා ගියාම ටික කාලයක් යනකොට ඒ ඉදි කිරීම් කඩා වැටෙනවා. නොයෙක් විධියේ අක්‍රමිකතා සිදු වුණු නිසා, ක්‍රමවත් නොවූ නිසා, විධිමත් නොවූ නිසා ඒ ඉදිකිරීම්වලට පැවැත්මක් නැහැ. එම ඉදිකිරීම් ඒ ආකාරයට කඩා වැටෙන කොට ඒවා ප්‍රතිසංස්කරණය කරන්න හෝ ශක්තිමත් ඉදි කිරීම් ලෙස පවත්වාගෙන යන්න හෝ අපට බැරි වෙනවා. ඒවාට යොදවන්නේ රජයේ මුදල්; මහ ජනතාවගේ මුදල්. නිසි ප්‍රමිතියට අනුව, අදාළ කොට්ඨාසවල කොන්ත්‍රාත්කරුවන් ලියා පදිංචි කරලා රජයේ මුදල්, මහ ජනතාවගේ මුදල් නිසි පරිදි යෙදවීම ඉතාම වැදගත් කියන කාරණය මා මේ අවස්ථාවේ විශේෂයෙන්ම මතක් කරන්න කැමැතියි.

මේ නියෝග විශේෂයෙන්ම ඉදිකිරීම් ක්ෂේත්‍රයේ සංවර්ධනය සඳහා ඉතාම වැදගත් වෙනවා. මේ ආකාරයට මෙම නියෝග ඉදිරිපත් කිරීමේ කටයුත්ත ඉතාම හොඳයි. ඒ නියෝග අනුව හරියාකාරව ක්‍රියා කිරීමත්, පසු විපරමත් අනිවාර්යයෙන් විය යුතුයි. එම පසු විපරම තුළින් මීට වඩා හොඳ ශක්තිමත් ඉදිකිරීම් කරන්න පුළුවන්.

වග කිව යුතු නිලධාරින් මේ පනවා තිබෙන නියෝගවලට අනුව, ලියා පදිංචි කිරීම සහ ප්‍රමිතියට අනුවම කටයුතු කළොත් මේ ඉදිකිරීම් ක්ෂේත්‍රය මීට වඩා හොඳ තත්ත්වයකට පත් කරගන්න පුළුවන්කම ලැබෙයි කියා මා හිතනවා.

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
ගරු මන්ත්‍රීතුමියට ලැබී ඇති කාලය අවසානයි.

**ගරු සුමේධා ජී. ජයසේන මහත්මිය**
(மாண்புமிகு (திருமதி) சுமேதா ஜீ. ஜயசேன)
(The Hon. (Mrs.) Sumedha G. Jayasena)
හොඳයි, මා අවසන් කරන්නම්.
මෙම විවාදයේ දී වචන කීපයක් හෝ කථා කරන්නට අවස්ථාව ලැබීම ගැන සතුටු වනවා වාගේම, තවත් එක කාරණයක් මට කියන්නට තිබෙනවා. මොනරාගල දිස්ත්‍රික්කයේ ජනතා වතු සංවර්ධන මණ්ඩලයට අයත් වත්තක් තිබුණා, "කුමාර වත්ත" කියලා. මේ වත්තෙන් තමයි අපි බොහෝ අවස්ථාවල රජයේ යම් යම් ඉදිකිරීම්වලට ඉඩකඩම් ලබා ගත්තේ. මුඩු බිමක් සහිත ඉඩමක් තමයි අපි ගත්තේ. පසුගිය රජය කාලයේ හිටපු සභාපතිතුමන්ලා, සාමාන්‍යාධිකාරිතුමන්ලා එකතුවෙලා මොනරාගල දිස්ත්‍රික්කයේ තිබුණු ඒ වත්ත කොටස් කරලා මේ වනකොට විකුණා අවසානයි. මොනරාගල දිස්ත්‍රික්කය තුළ මේ වනකොට අලුතින් ඉදිකිරීම් කරන්න අවශ්‍ය ඉඩකඩම් නැති තත්ත්වයක් තිබෙනවා. ඒ විධියට ඉඩකඩම් විනාශ කරන එකත් ඉතාම අසාධාරණ තත්ත්වයක් බව මා මතක් කරන්න කැමැතියි. තිබුණු පරිසරය විනාශ කරලා, ලොකු හානියක් දිස්ත්‍රික්කයටම සිදු කරලා තිබෙනවා. ගරු වැවිලි කර්මාන්ත අමාත්‍යතුමාගේ අවධානයට මේ කාරණය මා යොමු කරලා තිබෙනවා. සභාපතිවරයකු පත් කළාට පසුව එතුමා ඒ සම්බන්ධයෙන් කටයුතු කරන බව ප්‍රකාශ කරලා තිබෙනවා. ඒ සඳහාත් විධිමත් පියවරක් ගන්න කියා ගරු අමාත්‍යතුමාට යෝජනා කරමින් මා නිහඬ වනවා.

**ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairman of Committees)
Next, the Hon. Vijitha Herath. Before he starts, will an Hon. Member propose the Hon. Hesha Withanage to the Chair?

**ගරු ආනන්ද අලුත්ගමගේ මහතා**
(மாண்புமிகு ஆனந்த அலுத்கமகே)
(The Hon. Ananda Aluthgamage)
ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමනි. "ගරු හේෂා විතානගේ මන්ත්‍රීතුමා දැන් මූලාසනය ගත යුතුය"යි මා යෝජනා කරනවා.

**ගරු සුමේධා ජී. ජයසේන මහත්මිය**
(மாண்புமிகு (திருமதி) சுமேதா ஜீ. ஜயசேன)
(The Hon. (Mrs.) Sumedha G. Jayasena)

*විසින් ස්ථිර කරන ලදී.*
*ஆமோதித்தார்.*
*Seconded.*

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***අනතුරුව ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමා මූලාසනයෙන් ඉවත් වුයෙන්, ගරු හේෂා විතානගේ මහතා මූලාසනාරූඪ විය.***
*அதன் பிறகு, மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு ஹேசா விதானகே அவர்கள் தலைமை வகித்தார்கள்.*
*Whereupon THE HON. DEPUTY CHAIRMAN OF COMMITTEES left the Chair, and THE HON. HESHA WITHANAGE took the Chair.*

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු විජිත හේරත් මන්ත්‍රීතුමා කථා කරන්න.

[අ.භා. 4.00]

**ගරු විජිත හේරත් මහතා**
(மாண்புமிகு விஜித ஹேரத்)
(The Hon. Vijitha Herath)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, දැන් ආණ්ඩුව බලයට පත් වෙලා මාස දෙකකටත් වැඩි කාලයක් වනවා. පසුගිය කාලය පුරාවට රටේ බරපතළ ලෙස සංවාදයට ලක් වුණේ රටේ ජනතාවගේ ආරක්ෂාව පිළිබඳවයි. මහජන ආරක්ෂාවත්, රටේ ජාතික ආරක්ෂාවත් පිළිබඳ ප්‍රශ්නය පසුගිය කාලය පුරාවට ප්‍රධානතම -මුඛ්‍යතම- ප්‍රශ්නය බවට පත් වුණා. නමුත් ආණ්ඩුව බලයට පත් වුණා; කැබිනට් මණ්ඩලයක් ප්‍රකාශයට පත් කළා. නමුත් මේ වන තෙක් රටේ ආරක්ෂාව පිළිබඳ අමාත්‍යවරයෙක් නැහැ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. කැබිනට් ආරක්ෂක අමාත්‍යවරයෙක් තවම ප්‍රකාශයට පත් කරලා නැහැ. [බාධා කිරීමක්] ඒක අගමැතිතුමාට පවරා තිබෙනවාද? සුමේධා ජී. ජයසේන මන්ත්‍රීතුමියට "මයික්" එක දෙන්න.

**ගරු සුමේධා ජී. ජයසේන මහත්මිය**
(மாண்புமிகு (திருமதி) சுமேதா ஜீ. ஜயசேன)
(The Hon. (Mrs.) Sumedha G. Jayasena)
ආරක්ෂක ඇමතිකම ගරු අග්‍රාමාත්‍යතුමාට පවරා තිබෙනවා.

**ගරු විජිත හේරත් මහතා**
(மாண்புமிகு விஜித ஹேரத்)
(The Hon. Vijitha Herath)
එතකොට, කැබිනට් ආරක්ෂක අමාත්‍යවරයා වෙන්නේ ගරු අග්‍රාමාත්‍ය මහින්ද රාජපක්ෂ මැතිතුමාද?

**ගරු සුමේධා ජී. ජයසේන මහත්මිය**
(மாண்புமிகு (திருமதி) சுமேதா ஜீ. ஜயசேன)
(The Hon. (Mrs.) Sumedha G. Jayasena)
ඔව්. එතුමාට තවත් අමාත්‍යාංශ කීපයක් එක්ක ආරක්ෂක ඇමතිකම පවරා තිබෙනවා.

**ගරු විජිත හේරත් මහතා**
(மாண்புமிகு விஜித ஹேரத்)
(The Hon. Vijitha Herath)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒක ආණ්ඩුවේ නිල ප්‍රකාශයක්ද? ඒක හරිද කියලා මා දැනගන්න කැමතියි. කැබිනට් ආරක්ෂක අමාත්‍යවරයා මහින්ද රාජපක්ෂ මහතාද? ඔබතුමිය කියන විධියට එහෙම නේද? ප්‍රශ්නය මේකයි. මේක තමයි රටේ විහිළුකාර තත්ත්වය. එතුමිය තවම දන්නේ නැහැ, ආරක්ෂක අමාත්‍යවරයා කවුද කියලා. අමාත්‍ය මණ්ඩලය දිවුරුම් දෙන දවසේ මහින්ද රාජපක්ෂ මහත්මයාට ආරක්ෂක අමාත්‍ය ධුරය තිබෙනවාය කියලා ප්‍රකාශයට පත් කළ බව අපි දැක්කා. නමුත් මේ වන තෙක් අපි දන්නා විධියට නම් ආරක්ෂක අමාත්‍ය ධුරය මහින්ද රාජපක්ෂ අගමැතිතුමාට තිබෙනවාය කියලා ගැසට් කරලා නැහැ. ආරක්ෂක රාජ්‍ය අමාත්‍ය ධුරය චමල් රාජපක්ෂ මැතිතුමාට දීලා තිබෙනවාය කියා ගැසට් කරලා තිබෙනවා. ඒ නිසා ආරක්ෂක ඇමතිවරයෙක් නැහැ. මේක බරපතළ තත්ත්වයක්. ඒ නිසා වහාම ආණ්ඩුව කියන්න ඕනෑ, මේ රටේ ආරක්ෂක ඇමතිවරයා කවුද කියලා. මොකද, දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයට අනුව ආරක්ෂක අමාත්‍ය ධුරය ජනාධිපතිවරයා භාරයේ තියා ගන්න බැහැ. ඒක සම්පූර්ණ ව්‍යවස්ථා විරෝධියි; නීති විරෝධියි. ඒ නිසා රටේ ආරක්ෂාව පිළිබඳව රටට වග කියන කැබිනට් ඇමතිවරයා කවුද කියන එක ප්‍රකාශ කළ යුතුයි.

ආරක්ෂක අමාත්‍යාංශ ලේකම්වරයෙක් ඉන්නවා. කැබිනට් අමාත්‍ය ධුරයක් නැතිව ආරක්ෂක අමාත්‍යාංශයට ලේකම්වරයෙක් පත් වෙන්නේ කොහොමද? ඒක වෙන්න බැරි දෙයක්. මහින්ද රාජපක්ෂ අගමැතිවරයාට ආරක්ෂක අමාත්‍ය ධුරය දීලා නැත්තේ ඇයි? මහින්ද රාජපක්ෂ මැතිතුමා ජනාධිපතිවරයා විධියට යුද්ධය පැවති කාලයේ අවුරුදු 10ක් තිස්සේ ආරක්ෂක අමාත්‍ය ධුරයේ වගකීම දැරුවා. දැන් මේ ආරක්ෂක අමාත්‍ය ධුරය එතුමාට නොදී ඉන්නේ ඇයි? මොකක් හෝ ප්‍රශ්නයක්ද, අයියලා මල්ලිලා අතර සැකයක්ද? එහෙම දෙන්න බැරි මොකක් හෝ ප්‍රශ්නයක් තිබෙනවා නම් රටට හා ජනතාවට කියන්න. යුද්ධය පැවති කාලයේ දී මහින්ද රාජපක්ෂ අයියාට ආරක්ෂක අමාත්‍ය ධුරය දීලා තිබුණා. ඒ වකවානුවේ මහින්ද රාජපක්ෂ මහත්මයාගේ මල්ලී තමයි ආරක්ෂක ලේකම්වරයා. දැන් ජනාධිපතිවරයා විසින් ආරක්ෂක අමාත්‍යවරයා ලෙස මහින්ද රාජපක්ෂ මහත්මයා පත් කරලා නැහැ. දැනට එම කැබිනට් අමාත්‍ය ධුරය හිස්ව තිබෙන්නේ. කැබිනට් අමාත්‍ය ධුරය හිස්ව තිබියදී රාජ්‍ය ආරක්ෂක අමාත්‍යවරයකු විතරක් පත් කර තිබෙනවා. රාජ්‍ය ආරක්ෂක අමාත්‍යවරයා කැබිනට් මණ්ඩලයට වග කියන්නේ නැහැ. රටේ ප්‍රධාන ජාතික ප්‍රශ්නයක් වූ රටේ ආරක්ෂාව පිළිබඳ වග කියන පුද්ගලයා කවුද කියලා අනිවාර්යයෙන් ගැසට් කළ යුතුයි. ඒ කවුද කියලා කිව යුතුයි. එම ධුරය ජනාධිපතිවරයා භාරයේ තබාගෙන ඉන්නවා නම්, ජනාධිපතිවරයා භාරයේ තිබෙනවාය කියන එක ගැසට් කරන්න ඕනෑ. එහෙම ගැසට් නිවේදනයක් නැතුව, කැබිනට් ආරක්ෂක අමාත්‍යවරයකු නැතුව අමාත්‍ය මණ්ඩලයක් පවතින්න බැහැ. එතකොට රටේ ජාතික ආරක්ෂාවට වග කියන්නේ කවුද? රටේ සේනාධිනායකයා ජනාධිපතිවරයා බව ඇත්ත. හැබැයි, නිල වශයෙන් අමාත්‍ය මණ්ඩලය නම් කිරීමේ දී අනිවාර්යයෙන්ම කැබිනට් ආරක්ෂක අමාත්‍යවරයා කවුද කියන එක සඳහන් විය යුතුයි; එවැනි ධුරයක් ඇති කළ යුතුයි. එහෙම නැතුව ආරක්ෂක ලේකම්වරයකු පත් කරන්න බැහැ. සුමේධා ජී. ජයසේන මන්ත්‍රීතුමියනි, ඔබතුමිය දන්නේ නැත්නම් ආණ්ඩුවේ ඇමතිවරුන්ගෙන් අහන්න. හෙටම ගිහිල්ලා ජනාධිපතිතුමාගෙන් අහන්න, ආරක්ෂක ඇමතිවරයා කවුද කියලා. ඔබතුමිය දැන් මේ සභාවට කිව්වා, මහින්ද රාජපක්ෂ මහත්මයා තමයි ආරක්ෂක ඇමතිවරයා කියලා. ඒක පට්ටපල් බොරුවක්. ඒක වැරැදියි. තත්ත්වය ඒක නම්, රටේ ජනතාවගේ ආරක්ෂාව පිළිබඳ වගකීම භාර ගන්නේ කවුද? ඒ නිසා රජය පැත්තෙන් මේ පිළිබඳව පැහැදිලි ප්‍රකාශයක් කළ යුතුව තිබෙනවා. එම ගැසට් නිවේදනය නිකුත් කළ යුතුව තිබෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ දහනව වැනි සංශෝධනය අනුව ආරක්ෂක අමාත්‍ය ධුරය නිශ්චිත වශයෙන්ම කැබිනට් මණ්ඩලයේ අමාත්‍යවරයකුට පැවරිය යුතුයි කියන කරුණ මා අවධාරණය කරනවා. ඒ වගකීම පවරලා, ඊට අදාළ ගැසට් නිවේදනය නිකුත් කළ යුතුයි. මේ වනතුරු එවැනි ගැසට් නිවේදනයක් නිකුත් කර නැහැ. එහෙම නම් අපට සැකයක් තිබෙනවා, අයියාට මේ තනතුර

දෙන්න මල්ලි අකමැතිද, හයද, සැකද කියලා. ඒ සැකය මොකක්ද, ඒ භය මොකක්ද? ඒක දැන ගන්න අපි කැමැතියි. මේ දවස්වල එහෙම කසුකුසුවක් යනවා. ඒ කසුකුසුවේ ඇත්ත තත්ත්වය මොකක්ද කියලා අපි දැන ගන්න කැමැතියි. ඒ දෙදෙනා අතර එහෙම ප්‍රශ්නයක් තිබෙනවා නම්, වෙන කාට හරි ආරක්ෂක අමාත්‍ය ධුරය දිය යුතුයි. එහෙම නැත්නම්, ආරක්ෂක අමාත්‍ය ධුරය නොදී ඉන්න හේතුව මොකක්ද? අන්න ඒක අපි දැන ගන්න කැමැතියි. ඉතා බරපතළ, වග කිව යුතු අමාත්‍ය ධුරයක් තමයි රටේ කැබිනට් ආරක්ෂක අමාත්‍ය ධුරය. ඒ පිළිබඳව රජය මඟින් වහාම ප්‍රකාශයක් කළ යුතුයි කියන එක මා නැවත අවධාරණය කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද මේ සාකච්ඡාවට ගෙන තිබෙන්නේ ඉදිකිරීම් කර්මාන්තයේ සංවර්ධනයට අදාළ ගැසට් නිවේදන කිහිපයක්, නියෝග කිහිපයක් ගැනයි. ඔබතුමන්ලා මේ නියෝග ගෙනෙන්නේ ඉදිකිරීම් ක්ෂේත්‍රය සංවර්ධනය කරන්නයි. ඉදිකිරීම් ක්ෂේත්‍රය සංවර්ධනය කිරීමත්, විශේෂයෙන්ම දේශීය ඉදිකිරීම් කර්මාන්තය නඟාසිටුවීමත් තමයි මෙහි අභිලාශය වෙන්නේ. නමුත්, ඔබතුමන්ලා බලයට පැමිණි ගමන් කළේ මොකක්ද? ඔබතුමන්ලා මාස දෙකක් යන්න කලින් ලංකාවේ ප්‍රධානතම භූමියක් වූ ෂැන්ග්‍රි - ලා හෝටලයට පිටිපස්සේ තිබෙන අක්කර තුනක ඉඩම සිංගප්පූරුවේ Perennial Real Estate Holdings Limited කියන සමාගමට අවුරුදු 99කට බදු දෙන්න කැබිනට් මණ්ඩල අනුමැතිය දුන්නා. එදා ඔබතුමන්ලා විපක්ෂයේ සිටිද්දී කිව්වේ මොකක්ද? "රට විකුණන එකට විරුද්ධයි, ජාතික සම්පත් අවුරුදු 99කට කුණුකොල්ලයට බදු දෙන එකට අපි විරුද්ධයි" කියමින් දේශප්‍රේමීත්වයෙන් තමයි එදා ඔබතුමන්ලා කථා කළේ. එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුව හම්බන්තොට වරාය අවුරුදු 99කට බදු දෙන්න හදනකොට එදා ඔබතුමන්ලා කිව්වා, "එවැනි දේවල් කරන්න අපි ඉඩ තියන්නේ නැහැ" කියලා. නමුත් එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුව එදා මේ ඉඩම් අක්කර තුන සිංගප්පූරු සමාගමකට විකුණන්න ලෑස්ති වූ වෙලාවේ ඔබතුමන්ලා මාධ්‍ය සාකච්ඡා පවත්වමින් කිව්වේ මොකක්ද? නමුත් unsolicited system කියන principle එක යටතේ කිසිදු ටෙන්ඩර් කැඳවීමක් නැතුව, කිසිදු ටෙන්ඩර් දැන්වීමක් නැතුව කැබිනට් අමාත්‍යවරයාගේ පෞද්ගලික වුවමනාව මත තෝරා ගත් සමාගමකට - එක පුද්ගලයෙකුට -පමණක් තමුන්නාන්සේලා ඒ ඉඩම ලබා දුන්නා. එහෙම දෙන එක වැරදියි කියලා ඔබතුමන්ලා එදා කෑ ගැහුවා. එහෙම කෑ ගහලා, තමුන්නාන්සේලා බලයට ඇවිල්ලා මාසයක් යන්න හම්බ වුණේ නැහැ, එක්සත් ජාතික පක්ෂය අවුරුදු 99කට බදු දෙන්න හදපු කොම්පැනියටම තමයි තමුන්නාන්සේලා ලජ්ජා නැතුව ඒ ඉඩම බදු දුන්නේ. එදා එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුවේ මලික් සමරවික්‍රම ඇමතිවරයා ෂැන්ග්‍රි - ලා හෝටලයට එහා පැත්තේ තිබෙන එම ඉඩම ඒ Perennial Real Estate Holdings Limited කියන සිංගප්පූරු සමාගමට අවුරුදු 99කට බදු දෙන්න ලෑස්ති වුණා. ඔබතුමන්ලා කළේ මොකක්ද? ඔබතුමන්ලා ඒවා නවත්වනවා, ඒවා ආපස්සට හරවනවා කියලා බලයට ඇවිල්ලා, මාසයක් යන්න හම්බ වුණේ නැහැ, ඒ ඉඩම එම කොම්පැනියටම විකුණුවා. අඩුම ගණනේ එම ඉඩම වෙන කොම්පැනියකටවත්ත් දෙන්න තරම් සදාචාරයක් තබා ගත්තේ නැහැ. එහෙමවත් සදාචාරයක් තබා ගන්නේ නැතිව, කිසිදු ටෙන්ඩර් කැඳවීමක් නැතිව, කිසිදු විනිවිදභාවයක් නැතිව ඩොලර් මිලියන 43කට Perennial Real Estate Holdings Limited සමාගමටම ඒ ඉඩම අවුරුදු 99කට බදු දෙන්න කැබිනට් මණ්ඩලය තීන්දු කළා. මහින්ද රාජපක්ෂ අගමැතිවරයා ප්‍රසිද්ධියේ ප්‍රකාශයක් කළා, "එතැනට සිංගප්පූරු කොම්පැනි එනවා. නිවාස ඉදිකිරීමක් සිද්ධ වෙනවා. ගෙවල් 700ක් හදනවා. ඒ ගෙවල් 700හි ලංකාවේ මිනිසුන්ට ඉන්න පුළුවන්. ලංකාවේ මිනිසුන්ට ඒක අයිති වෙනවා" කියලා. ලංකාවේ මිනිසුන්ට ඒක අයිති වෙන්න බැහැ. සිංගප්පූරු කොම්පැනියක්, අවුරුදු 99කට ලංකාවේ භූමිය බදු ගත්තාට පස්සේ, ඒ බදු ගත්ත ඉඩමේ හදන building එක ලංකාවේ මිනිසකුට කොහොමද අයිති වෙන්නේ? ඒ ඉඩම ඒ අය සින්නක්කරව ගත්තේ නැහැ නේ. ජනතාව මුළා කරන්න නේ, මේ හදන්නේ. සිංගප්පූරු කොම්පැනිය ඒ ඉඩම සින්නක්කරව අරගෙන, ඊට පස්සේ ඒ ඉඩමේ හදන ගෙයක් ලංකාවේ කාට හෝ පුද්ගලයකුට සින්නක්කර විකුණන්න පුළුවන්. හැබැයි සිංගප්පූරු කොම්පැනියක් ඉඩම බදු ගත්තාට පස්සේ, ඒ බදු ගත්ත ඉඩමේ හදන building එකක් ලංකාවේ කෙනකුට සින්නක්කරව අයිති වෙන්නේ නැහැ. ඒක නිසා, ඔබතුමන්ලා ජනතාව රවටන්න හදන්න එපා. UNP ආණ්ඩුව කළේත් මේකම තමයි. හම්බන්තොට වරාය අවුරුදු 99කට චීනයට බදු දුන්නේත් මේ විධියටම තමයි. ඒකෙයි, මේකෙයි වෙනසක් නැහැ. අපට කියන්න ඒ වෙනස මොකක්ද කියලා? එකම වෙනස තමයි, ඒ මුදලේ පොඩි වෙනසක් තිබෙන එක. සමහර විට කොමිස් මුදලේ වෙනසක් ඇති. එදා දෙන්න හදපු කොමිස් මුදලට වඩා වැඩිපුර කොමිස් මුදලක් දැන් ගන්න ඇති. ඒ හැර වෙනත් වෙනසක් නැහැ. දෙකේම කොන්දේසි එකයි. ඒ දෙකේම තිබෙන්නේ අවුරුදු 99ක බදු පදනමයි. පර්චස් එකක වටිනාකම පොඩ්ඩක් වෙනස්වෙලා තිබෙනවා. නමුත්, මේ එකම කොම්පැනිය නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ ඉඩමේ නිවාස හදන්න සිංගප්පූරු කොම්පැනියකට දෙන්නේ ඇයි? ඔබතුමන්ලා කියනවා නේ, දේශීය ඉදිකිරීම් කර්මාන්තය නඟා සිටුවන්න ඕනෑ කියලා. දේශීය ඉදිකිරීම් කර්මාන්තය නඟා සිටුවන්න ඕනෑ නම්, මේ ඉදිකිරීම් කරන්න පුළුවන් ව්‍යාපාරිකයන් ලංකාවේ නැද්ද? ඉදිකිරීම් කර්මාන්ත සමාගම් නැද්ද? ඕනෑ තරම් තිබෙනවා. කොළඹ විතරක් නොවෙයි, අද ලංකාවේ විවිධ ප්‍රදේශවල, මෙවැනි තට්ටු නිවාස හදන අපේ ඉදිකිරීම් කර්මාන්තකරුවන් විශාල ප්‍රමාණයක් ඉන්නවා. ඒ ඉදිකිරීම් සමාගම්වලට මේ ඉදිකිරීම් දෙන්න තිබුණා නේ. ටෙන්ඩර් කැඳවන්න තිබුණා නේ. ටෙන්ඩර් කැඳෙව්වා නම් අඩුම ගණනේ දේශීය ඉදිකිරීම් ක්ෂේත්‍රයේ කර්මාන්තකරුවන් කිහිපදෙනෙක් මේ සඳහා ඉල්ලුම් කරනවා. එහෙම කළා නම් විකුණන්නේ නැතිව, බදු දෙන්නේ නැතිව වැඩිම ඉල්ලුමට ඉඩම දෙන්න තිබුණා. නමුත් ඔබතුමන්ලා කළේ මොකක්ද? දේශීය ඉදිකිරීම් සංවර්ධනය කරන්න කියලා බොරුවට නියෝග ගෙනැවිත්, සිංගප්පූරු කොම්පැනියට ඒ ඉඩම හොර රහසේ දෙන්න තීන්දු කළා.

ඔබතුමන්ලා එදා ෂැන්ග්‍රි-ලා හෝටලයට අයත් භූමිය සින්නක්කර විකුණලා, ඒකට අල්ලපු, පිටි පස්සේ ඉඩම අවුරුදු 99කට බදු දෙන්න පස්ස දොරෙන් කැබිනට් මණ්ඩලයේ අනුමැතිය ගත්තා. දැන් කොහොමද, දේශීය ඉදිකිරීම් ක්ෂේත්‍රය නඟා සිටුවන්නේ? ඉදිකිරීම් ක්ෂේත්‍රය සම්පූර්ණයෙන් සිංගප්පූරු කොම්පැනිවලට පවරා දීලා, මේ සභාවට දැන් බොරුවට නියෝග ගෙනාවාට වැඩක් නැහැ. ඔබතුමන්ලා බොරුවට නියෝග ගෙනැවිත්, දේශීය ඉදිකිරීම් කර්මාන්තය නඟා සිටුවන්න වත්මන් ආණ්ඩුව බරපතළ තීන්දු තීරණ ගන්නවාය, අණ පනත් ගෙනෙනවාය, ගැසට් නිවේදන නිකුත් කරනවාය කියලා පෙන්වන්න හදනවා. මේවා පට්ටපල් බොරු. මේකටද තුනෙන් දෙකේ බලය ඉල්ලන්නේ?

ඔබතුමන්ලා දැන් කියනවා, "අපට තුනෙන් දෙකේ බලයක් දෙන්න" කියලා. තුනෙන් දෙකේ බලයක් අවශ්‍ය වන්නේ මොකටද කියලා අපට පැහැදිලිව කියන්න. මේ රටේ ජනතාවට කියන්න, තුනෙන් දෙකේ බලය අවශ්‍ය වන්නේ මොකටද කියලා. තුනෙන් දෙකේ බලය අවශ්‍ය වන්නේ ජනතාවාදී දේවල් කරන්නද? ජනතාවාදී දේවල් කරන්න තුනෙන් දෙකේ බලය ඕනෑ නම්, හෙට සූදානම්, මේ පාර්ලිමේන්තුවේ තුනෙන් දෙකේ බලය දෙන්න. හැබැයි තමන්ගේ හිත මිතුරු දේශපාලන හෙංචයියලාට, තමන්ට උදවු කළ අයට ඕනෑ විධියට මෙහෙම කුණු කොල්ලයට අවුරුදු සිය ගණනකට ඉඩම් බදු දීම සඳහා තුනෙන් දෙකේ බලයක් දෙන්න මේ රටේ ජනතාව සූදානම් නැහැ. මොකද, ඒක රටට අහිතකරයි කියලා ජනතාව අත් දැකීමෙන් දන්නවා.

ජේ.ආර්. ජයවර්ධන මැතිතුමා හයෙන් පහේ බලයක් ගත්තා. හයෙන් පහේ බලය අරගෙන කරපු දේවල් පිළිබඳ ඉතිහාසය මේ රටේ මිනිස්සු දන්නවා. 2010දී මහින්ද රාජපක්ෂ හිටපු

[ගරු විජිත හේරත් මහතා]

ජනාධිපතිතුමාටත් ජනතාව තුනෙන් දෙකේ බලයක් දුන්නේ නැහැ; ජනවරමක් ලැබුණේ නැහැ. ඡන්දයෙන් තුනෙන් දෙකේ බලයක් ගන්න පුළුවන්කමක් ලැබුණේ නැහැ. නමුත් වරදාන, කප්පම්, ඇමති ධුර, පඬුරු පාක්කුඩම් දීලා තුනෙන් දෙකේ බලයක් හදා ගත්ත බව අපි දැක්කා. එහෙම තුනෙන් දෙකේ බලයක් හදාගෙනත් එදා දහඅටවන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ගෙනැවිත් මේ රටේ ප්‍රජාතන්ත්‍රවාදය, නිදහස අහිමි කළ හැටි මේ රටේ ජනතාවට හොඳට මතකයි. පසුව ආණ්ඩු පක්ෂයේ ඇමතිවරුන්ටම, මන්ත්‍රීවරුන්ටම ඒ ගැන ජාතියෙන් සමාව ගන්න සිද්ධ වුණා. එවැනි තුනෙන් දෙකේ බලයක් අවශ්‍ය වන්නේ ජාතික සම්පත් විකුණන්නයි. එහෙම නැත්නම් ජනතාවට කොළේ වහලා MCC ගිවිසුම නැවත අත්සන් කරන්නයි.

2007දී ACSA ගිවිසුම අත්සන් කළේ වෙන කවුරුවත් නොවෙයි, එදා ආරක්ෂක ලේකම්වරයා වශයෙන් සිටි ගෝඨාභය රාජපක්ෂ මැතිතුමායි. එදා ලංකාවේ හිටපු ඇමෙරිකානු තානාපතිවරයා වන රොබට් ඕ. බ්ලේක් මහතා එක්ක ඒ ගිවිසුම අත්සන් කිරීම නිසා අද අපි ආරක්ෂාව අතින් බරපතළ අනතුරකට මුහුණ දීලා තිබෙනවා. එවැනි තත්ත්වයක් යටතේ MCC ගිවිසුමත් අත්සන් කරන්න තමයි ඔබතුමන්ලා ඒකට මාස 4ක් කල් දමා ගත්තේ. එහෙම නැතිව, වෙන මොකකටවත් නොවෙයි.

එදා මැතිවරණ වේදිකාවේ මොකක්ද කිව්වේ? "MCC ගිවිසුම ගිවිසුම කුණු කූඩයට දමනවා, කුණු බක්කියට දමනවා" කිව්වා. ඊළඟට, "මේ ගිවිසුමේ ආයෙත් බලන්න දෙයක් තියා, කිසිම ගත යුත්තක් නැහැ. මේක රට බෙදන, රට පාවා දෙන ගිවිසුමක්. අපි මේ ගිවිසුම මුළුමනින්ම ප්‍රතික්ෂේප කරනවා" කියා උපවාස කළා. එහෙම කියපු තමුන්නාන්සේලා බලයට ඇවිල්ලා මාසයක් යන්න කලින්, "මේ ගිවිසුම අධ්‍යයනය කරන්න ඕනෑ කිව්වා; මේ ගිවිසුමේ සියයට 70ක් හොඳයි කිව්වා; මේ ගිවිසුමේ සියයට 70කටත් වඩා හොඳ දේවල් තිබෙනවා. ඒ ගැන බලන්න කමිටුවක් පත් කරනවා" කිව්වා. කුණු බක්කියට දමන්න කියපු ගිවිසුම අධ්‍යයනය කරන්නේ මොකටද? ඒකේ අධ්‍යයනය කරන්න දෙයක් නැහැ. එහෙම නම්, ගිවිසුම අධ්‍යයනය කරන්නේ නැතිවද එදා ඒකට විරුද්ධ වුණේ? එදා උපවාස කළේ, ඒක අධ්‍යයනය කරන්නේ නැතිවද? ඔබතුමන්ලාගේ බොරුව, වංචාව මාස දෙකක් යන්න කලින් මේ රටේ ජනතාවට හෙළිදරව් වෙලා ඉවරයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ෂැන්ග්‍රි-ලා හෝටලය පිටුපස තිබෙන කෝටි-ප්‍රකෝටි ගණනක් වටිනා අක්කර තුනක ඉඩම සිංගප්පූරු සමාගමකට අවුරුදු 99කට බදු දීම මේ රටේ ජාතික සම්පත් මේ රටේ ජනතාවට අහිමි කරන්න ගත්ත බරපතළ තීරණයක්. එම නිසා වහාම මේවා වෙනස් කරන්න ඕනෑ. අද මේ ව්‍යාපෘතිය කරන්න යන්නේ මොන කොන්දේසි යටතේද? විශේෂ ආර්ථික උපාය මාර්ගික ව්‍යාපෘතියක් යටතේද එය කරන්න යන්නේ? එහෙම නම්, එම ගිවිසුමේ තිබෙන අනෙකුත් කොන්දේසි මොනවාද? සිංගප්පූරු කොම්පැනියට දෙන්න යන බදු සහන මොනවාද? සිංගප්පූරු කොම්පැනියට අවුරුදු කීයකට බදු සහන දෙනවාද? මොකද, ඔබතුමන්ලා මීට කලින් විශේෂ ආර්ථික උපාය මාර්ගික ව්‍යාපෘති ක්‍රියාත්මක කළේ එහෙම තමයි. ඒ හැම ව්‍යාපෘතියකදීම ඒ කොම්පැනිවලට විශේෂ බදු සහන දුන්නා. දැන් මේ සිංගප්පූරු කොම්පැනියට දෙන විශේෂ බදු සහන මොනවාද? එම ගිවිසුම මොකක්ද? ඒවා දැන ගන්න මේ රටේ ජනතාව කැමැතියි. ඒකට කැබිනට් මණ්ඩලයේ ප්‍රතිපත්තිමය අනුමැතිය ගත්තා. නමුත් ගිවිසුම තවම හෙළිදරව් කළේ නැහැ. ගිවිසුම ගැන දැන ගන්න නම් ගිවිසුම බලන්න ඕනෑ. මේ රටේ ජනතාවට, මේ පාර්ලිමේන්තුවට ඒක දැක බලා ගන්න ඕනෑ. මොකද, මේ රටේ ජාතික සම්පත්වල අයිතිය ජනතාව සතුවයි තිබෙන්නේ. කැබිනට් මණ්ඩලයේ කාටවත් ඕනෑ විධියට එහෙම අවුරුදු ගණන්වලට ඒවා බදු දෙන්න පුළුවන්කමක් නැහැ; එහෙම නීත්‍යානුකූල බලයක් නැහැ.

ඉදිකිරීම් ක්ෂේත්‍රය නඟා සිටුවන්න ඕනෑ නම්, දේශීය ඉදිකිරීම් කර්මාන්තකරුවන් ඕනෑ තරම් ඉන්නවා. ඒ අයට හොඳ හැකියාවක් තිබෙනවා. ඒ අයට බදු සහන දෙන්න; තවත් ධෛර්යය දෙන්න. පුංචි පුංචි ඉදිකිරීම් කර්මාන්තකරුවන්, මහා පරිමාණ ඉදිකිරීම් කර්මාන්තකරුවන් අද ලංකාව තුළ ඕනෑ තරම් බිහි වෙමින් සිටිනවා. යටිතල පහසුකම් සැපයීමේ ව්‍යාපෘති වෙන්න පුළුවන්, ගොඩනැඟිලි ඉදිකිරීම් කටයුතු වෙන්න පුළුවන්, ඒ සඳහා වෙනත් රටවලින් ඇවිල්ලා බාල ප්‍රමිතියෙන් යුක්ත ඉදිකිරීම් කරන අයට වඩා, ඉදිකිරීම් ක්ෂේත්‍රයේ නිපුණ අත්දැකීම් තිබෙන කර්මාන්තකරුවන් අපේ රටේ ඉන්නවා. එම තරුණ ව්‍යවසායකයන්ගේ ඉල්ලීමක් තිබෙනවා, ඔවුන්ට මේ අවස්ථාව ලබා දෙන්න කියලා. එහෙම නොදී, ඔබතුමන්ලා කිසිදු ටෙන්ඩර් කැඳවීමක් නැතිව, කිසිදු විනිවිදභාවයක් නැතිව යූඑන්පී එක කරපු දේම කරනවා.

යූඑන්පී එකේ මලික් සමරවික්‍රම ඇමතිවරයා එදා Perennial Real Estate Holdings Limited එකට බදු දෙන්න හදපු ඉඩම ඒ විධියටම, ඒ කොම්පැනියටම තමුන්නාන්සේලා බදු දුන්නා. ඒක නිසා තමුන්නාන්සේලාගේත් ප්‍රතිපත්තියේ වෙනසක් නැහැ; දේශපාලනයේ වෙනසක් නැහැ. එකම දේ තමයි ඔබතුමන්ලා කරන්නේ. මේ තත්ත්වය වහාම වෙනස් කළ යුතු වෙනවා. ඒ ගිවිසුම මොකක්ද කියලා හෙළිදරව් කළ යුතුයි. ඒ ගිවිසුම හෙළිදරව් කරනවා වාගේම, ඒකත් එක්ක සම්බන්ධ වුණු රටේ ජාතික ආරක්ෂාව පිළිබඳ ප්‍රශ්නයේදී ඔබතුමන්ලා ආණ්ඩුවක් විධියට වහාම රටට ප්‍රකාශයක් කළ යුතුයි, කැබිනට් ආරක්ෂක අමාත්‍යවරයා කවුද කියලා. ගැසට් පත්‍රයකින් එය නිවේදනය කළ යුතුයි. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව උල්ලංඝනය කරලා කටයුතු කරන්න බැහැ. දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය අනුව ජනාධිපතිවරයාට ආරක්ෂක අමාත්‍ය ධුරය හෝ කිසිදු අමාත්‍ය ධුරයක වගකීමක් දරන්න අයිතියක්, හැකියාවක් නීත්‍යානුකූලව නැහැ. එම නිසා, ආරක්ෂක අමාත්‍යවරයා කවුද කියන එක රටට ප්‍රකාශ කළ යුතුයි. එහෙම නැතිව, ආරක්ෂක ලේකම්වරයෙක් ඉන්න බැහැ.

අනෙක් කාරණාව මේකයි. ආරක්ෂක අමාත්‍ය ධුරය මහින්ද රාජපක්ෂ අගමැතිවරයාට දුන්නා කියලා ප්‍රකාශ කළ එක ඇත්තද, එහෙම නොවෙයිද කියන එක හරියට කියන්න. සුමේධා ජී. ජයසේන මන්ත්‍රීතුමියත් තවම හිතාගෙන ඉන්නේ, ආරක්ෂක අමාත්‍ය ධුරය තිබෙන්නේ අගමැතිවරයා යටතේ කියලායි. නමුත් ඇත්ත ඒක නොවෙයි නම්, මහින්ද රාජපක්ෂ මහත්මයාට ආරක්ෂක අමාත්‍ය ධුරය දෙන්නේ නැත්තේ ඇයි, සැකයිද, බයයිද, වෙන මොකක් හෝ ප්‍රශ්නයක්ද කියලා අපි පැහැදිලිව දැන ගන්න කැමැතියි.

ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமை தாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

මීළඟට, ගරු ඉරාන් වික්‍රමරත්න මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි නවයක කාලයක් තිබෙනවා.

[අ.භා. 4.17]

**ගරු ඉරාන් වික්‍රමරත්න මහතා**
(மாண்புமிகு இரான் விக்கிரமரத்ன)
(The Hon. Eran Wickramaratne)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, "ස්විස් තානාපති කාර්යාල නිලධාරිනියගේ දුරකථන සංවාද උසාවියේදී දිග හැරේ" කියන සිරස්තලය යටතේ, අද "ලංකාදීප" පුවත් පතේ විස්තරයක් පළ වෙලා තිබෙනවා. මේ අපරාධ පරීක්ෂණ පැවැත්වෙනකොට, ඒක අලුත් පැත්තකට අදින්න වැයම් කරනවා වාගේ දෙයක් අපට

පෙනෙනවා. 2020 ජනවාරි 22 දින, "ඩේලි මිරර්" පුවත් පතේත් ඒ කාරණයම තිබෙනවා. It states, I quote:

> "The CID yesterday informed the Colombo Chief Magistrate's Court that an analysis of the phone recordings revealed that some people including former CID Director Shani Abeysekara and former Lake House Chairman Krishantha Cooray appeared to be involved in the alleged abduction incident of Swiss Embassy employee..."

The reason why I am bringing it up is this. We know that there has been an issue involving an employee of the Swiss Embassy. This was consequent to an article that appeared in "The New York Times" on the 27th of November, 2019, which stated that the officials in Colombo said that the abductors forced her to unlock her cellphone data, which contained information about Sri Lankans who have recently sought asylum in Switzerland and the names of Sri Lankans who have aided them as they fled the country because they feared for their safety. So, the Government of Sri Lanka immediately got concerned about it because naturally, if this situation is true, the Government bears some responsibility for it. Whatever the facts of the case are, it is very clear that the Swiss Embassy has not really contradicted this, that a cellphone was taken and data was taken from that phone. That is absolutely clear.

While that investigation goes on, the concern I am raising today is that there is an attempt to slowly shift the focus to other individuals and say that those individuals have been responsible. So, the focus of the investigation has shifted to the former Chairman of the Lake House, a professional journalist, Mr. Krishantha Cooray, the former Editor of the "Sunday Observer", Darisha Bastian, and others. Why are they shifting the focus to them? We can see that there is such an attempt. Mr. Cooray is a responsible journalist who has been working in this country for a long time. If you remember the Keith Noyahr incident, where he was attacked by some people and left on the streets - Mr. Noyahr was working for "The Nation" newspaper - it was Mr. Cooray who actually came forward and defended him. So, we can see that there is a certain hand behind these things to discredit professional people, and these newspaper articles referred to their having connections with this Swiss Embassy lady. Investigations will show that they have had no such connections. There had been phone calls, which are referred to in the articles, between Mr. Krishantha Cooray and Darisha Bastian, who was the Editor of the "Sunday Observer" and that is only natural; the Chairman of the Lake House speaking to the Editor of a newspaper of the Lake House is only natural and normal.

So, why are they doing this? Why is this Government using the media to corner and frighten people? In the last four and a half years of our Government, not a single journalist in this country left the country because of fear, not a single person, not a single journalist was harmed, not a single person was killed or murdered and not a single one went missing. That was the environment our Government created over the last period. But, just two months after this Government coming into office, there are people who have had to leave the country because they are not sure whether they will be fairly treated. They are professional people. You can imagine what is going to happen to the image of this country internationally if people are treated like this. For the flimsiest of excuses, they are being arrested. We saw Ministers of the previous Government such as the Hon. Patali Champika Ranawaka, the Hon. (Dr.) Rajitha Senaratne and recently, the Hon. Ranjan Ramanayake being arrested. I do not agree with the methods the Hon. Ranjan Ramanayake used. But, I would like to tell the State Minister of Defence of this country that after the Hon. Ranjan Ramanayake's speech in Parliament yesterday, his life has to be protected and the Government must take responsibility for the environment it is creating. Darisha Bastian herself is a professional journalist who has been working for "The New York Times" as its local correspondent and has been working in this country for a long time. So, professionals must be protected.

අපේ ජනාධිපති, ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා ඉදිරිපත් කළ "රට හදන සෞභාග්‍යයේ දැක්ම" ප්‍රතිපත්ති ප්‍රකාශනයේ 6වන පිටුවේ සඳහන් වෙනවා, "සියලු රාජ්‍ය ආයතන ප්‍රධානීන්, සංස්ථා සභාපතිවරුන් සහ අධ්‍යක්ෂ මණ්ඩල සාමාජිකයන් ලෙස නායකත්ව හැකියාවෙන් යුතු, විෂය පිළිබඳ මනා දැනුමක් ඇති, සුදුසුකම් හා අත්දැකීම්වලින් පරිපූර්ණ සහ ක්‍රියාශීලි පිරිසක් පත් කරන නව ක්‍රමවේදයක් හඳුන්වා දෙනු ලැබේ." යනුවෙන්. ඇත්තටම ඒ ප්‍රතිපත්තිය එක්ක මාත් එකඟයි. මොකද, ඒ ප්‍රතිපත්තියෙන් පැහැදිලිව කියනවා, වෘත්තීය මට්ටමේ අය පත් කරන්න ඕනෑ, ඒ අයට වග වීමක් තිබෙන්නට ඕනෑ වාගේම සබැඳියා ගැටුම්වලින් -අන්තර් ගැටුම්වලින්- ඒ අය නිදහස් වෙන්න ඕනෑ කියලා. මේ සඳහා රජය මොනවාද ඉස්සෙල්ලාම කළේ? කමිටුවක් පත් කළා. කමිටුවක් පත් කරලා කිව්වා, ඒ කමිටුවෙන් මේ පත්වීම් කරන්න ඕනෑය කියලා. ඒ කමිටුවට පත් කළ අය පිළිබඳව ගැටලුවක් -ප්‍රශ්නයක්- තිබෙනවා. ඒ සමහර අයට විරුද්ධව මේ රටේ ශ්‍රේෂ්ඨාධිකරණයෙන් තීරණ දීලා තිබෙනවා. ශ්‍රේෂ්ඨාධිකරණයෙන් තීරණ දීලා ඒ අය නම් කරලා තිබෙනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තව විනාඩි දෙකක කාලයක් තිබෙනවා.

**ගරු ඉරාන් වික්‍රමරත්න මහතා**
(மாண்புமிகு இரான் விக்கிரமரத்ன)
(The Hon. Eran Wickramaratne)

හොඳයි, මම විනාඩි දෙකෙන් අවසන් කරන්නම්.

මම මෙතැන මඩ ගහන්න ලෑස්ති නැහැ. නමුත්, මට එකක් කියන්න පුළුවන්. මම නිවැරදි ක්‍රමය හදන්නයි වෑයම් කරන්නේ. මගෙන් අහන්න ඕනෑ නැහැ, ඒ අයගේ නම් මොනවාද කියලා. මොකද, ඒවා ප්‍රසිද්ධයි. ඒවා උසාවි තීරණ. මම මේ කථා කරන්නේ ඔක්කෝම හඳුනන මිනිස්සු ගැනයි. හැබැයි, මේ පිළිබඳව නඩු කිව්වේ කවුද? වාසුදේව නානායක්කාර මන්ත්‍රීතුමා තමයි මේ කරුණු ශ්‍රේෂ්ඨාධිකරණයට ගෙන ගියේ. එතුමන්ලා තමයි ඒ අයගේ නම් කිව්වේ. සුදුසු නැති අය පත් කරනවා කියනවා කිව්වත් මේ විධියට ප්‍රශ්න විසඳන්න පුළුවන් වෙයි කියලා අපි බලාපොරොත්තු වෙන්නේ කොහොමද? මෙතැන විශාල ගැටලුවක් තිබෙනවා. වග වීම අවශ්‍යයි. ඒ වාගේම ඒ සබැඳියා, අන්තර් ක්‍රියා ගැටුම්වලින් මිදෙන්නට ඕනෑ. නමුත්, මේවා ඇත්තටම සිදු වෙනවා. දැනට පත් කර තිබෙන ඒවායේත් සිදු වෙනවා. වැඩිය කියන්න ඕනෑ නැහැ. පී.බී. ජයසුන්දර මහතා දැන් ජනාධිපති ලේකම්තුමා. මේවා ගැන හොයා බලන්න ඕනෑ. ඇත්තටම ජනාධිපතිතුමාට වෙනසක් ඇති කරන්න ඕනෑ නම්

[ගරු ඉරාන් වික්‍රමරත්න මහතා]

මේවා ගැන හොයා බලන්න ඕනෑ. හුඟක් වෙලාවට ජනාධිපතිතුමා මේ කරුණු දන්නේ නැහැ. අර ක්‍රිෂාන්ත කුරේ පිළිබඳ කරුණ ජනාධිපතිතුමා දන්නේ නැහැ. අනෙක් අයයි තීරණ අරගෙන තිබෙන්නේ, මේ අයට මඩ ගහන්න. මම හිතන විධියට මේ පත්වීම් ගැනත් ජනාධිපතිතුමා නිවැරදි කරුණු දන්නේ නැහැ. ජනාධිපතිතුමාට වැරදි කරුණු ගිහිල්ලා තිබෙනවා.

ඊළඟට, උපුල් ධර්මදාස මහත්මා Civil Aviation Authority එකට පත් කරලා තිබෙනවා. මෙතැන තිබෙන ප්‍රශ්නය මේකයි. මෙතැන තිබෙන්නේ නියාමක හා නියාමනය සම්බන්ධ ගැටලුවක්. ඔහුට ව්‍යාපාරයක් තිබෙනවා. එතකොට ඔහු නියාමනය වෙන්න ඕනෑ පුද්ගලයෙක්. එහෙම නම් එතුමා නියාමකයකු හැටියට පත් කරන්නේ කොහොමද කියන ප්‍රශ්නයයි මම අහන්නේ. ඊට අමතරව, නැන්දම්මලා, මාමලා තනතුරුවලට පත් කරලා තිබෙනවා. ඇත්තටම ඒ පුද්ගලයන්ට සුදුසුකම් තිබෙන්න පුළුවන්. නමුත්, මේ පත්වීම් දීම සුදුසු ද, නිසි ද, ඉංග්‍රීසියෙන් කියන විධියට are they fit and proper persons ද යන්න අපි හොයන්න ඕනෑ. අධ්‍යාපනය තිබෙනවාද, අත්දැකීම් තිබෙනවාද, සදාචාරය තිබෙනවාද කියලා බලන්න ඕනෑ. ඒ අය ඒ රැකියාවට ගැළපෙනවාද, ඒ රැකියාවට සුදුසුම පුද්ගලයාද කියන එකත් බලන්න ඕනෑ. සුදුසුකම් තිබෙන්න පුළුවන්. නමුත්, සුදුසුම පුද්ගලයා ඒ පුද්ගලයාද කියන එක බලන්න ඕනෑ. "අපි හැම තිස්සේම සුදුසුම පුද්ගලයන් පත් කරනවා" කියලා මේ රජය කියනවා නම්, මම රජයෙන් ඉල්ලීමක් කරනවා කරුණාකර, විවෘත වෙලා මේ පත්කිරීම්වලට කවුද පත් කළේ, මොනවාද ඒ අයට තිබුණු සුදුසුකම්, මොකක්ද අනුගමනය කළ ක්‍රියාපිළිවෙත කියලා සඳහන් කරන්න කියලා. ඒක සඳහන් කළේ නැත්නම් ගැටලුවක් -ප්‍රශ්නයක්- ඇති වෙනවා, සුදුසුකම් තිබෙන අය පත් කරලා නැහැ, කටින් කිව්වාට ඇත්තටම එහෙම දෙයක් සිදු වෙලා නැහැ කියලා. ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
මීළඟට, ගරු ඉන්දික අනුරුද්ධ හේරත් රාජ්‍ය ඇමතිතුමා. ඔබතුමාට විනාඩි 20ක කාලයක් තිබෙනවා.

[අ.භා. 4.27]

**ගරු ඉන්දික අනුරුද්ධ හේරත් මහතා (නිවාස රාජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு இந்திக அநுருத்த ஹேரத் - வீடமைப்பு இராஜாங்க அமைச்சர்)
(The Hon. Indika Anuruddha Herath - State Minister of Housing)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විශේෂයෙන්ම ඉරාන් වික්‍රමරත්න මන්ත්‍රීතුමා කථා කරමින් සුදුසුකම් ගැන කිව්වා. ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන පනත යටතේ නියෝග ගැන විවාද කරන මේ අවස්ථාවේ මා මේ කාරණය සඳහන් කරනවා. මේ ආණ්ඩුව විනිවිදභාවයකින් යුතුවයි කටයුතු කරන්නේ. මේ රජය හැකියාව, දක්ෂතාව තියෙන අය පත් කරන, නාස්තිය වළක්වන ඒ වාගේම, පසුගිය රජය කළා වූ සියලු අනර්ථ පාඩමක් කරගෙන බොහොම විනිවිදභාවයෙන් යුතුව කටයුතු කරන රජයක්. ඒ නිසා නැන්දලා, මාමලා පත් කළත් ඒ ගොල්ලන් තුළ තියෙන සුදුසුකම් අනුවයි පත් කරන්නේ. අපි එසේ පත් කළාය කියන්නේ නැහැ. ඒ ගොල්ලන්ගේ දීමනා, ඒ ගොල්ලන්ගේ පඩි නඩි, ඒ ගොල්ලන්ගේ පත්වීම් ගැන තමුන්නාන්සේලාට ඕනෑ තැනකින් කරුණු හොයා ගන්න පුළුවන්; සොයාගෙන පරීක්ෂා කරන්න පුළුවන්. ඒ නිසා නිකම් අභූත චෝදනා කරන්න එපා. මේක තමුන්ගේ පාක්ෂිකයන් ඇද වැටිලා ඉන්න වෙලාවක පාක්ෂිකයන් පිනවීම සඳහා කරන දෙයක් නම්, අපට ඒක ගැන ගැටලුවක් නැහැ. නමුත් පසුගිය වකවානුව පුරාවටම තමුන්නාන්සේලාගේ නායකයන්, ඇමතිවරුන් තමුන්ගේ කොන්ත්‍රාත්තුව, තමුන්ගේ වැඩපිළිවෙළ කර ගන්න පුළුවන් අය පත් කළා මිසක් සුදුස්සන් පත් කළේ නැහැ. තවමත් ඒ උදවිය මේ ආයතනවල කටයුතු කරනවා. ඒ උදවියට කිසිම සුදුසුකමක් නැහැ කියන එක අපට පෙනී ගිහිල්ලා තිබෙනවා. ඒ පත්වීම් තුළ ඇමතිවරයාට ඕනෑ විධියට කටයුතු කර තිබෙන බව අපි දැක්කා. ඒවා අපි නොවෙයි කියන්නේ.

ඉදිකිරීම් සංවර්ධන පනත ගැන කථා කරද්දී මා මේ කාරණයත් සඳහන් කරන්න කැමැතියි. හිටපු නිවාස, ඉදිකිරීම් ඇමතිවරයාට කිසිම දැක්මක් නැහැ; කිසිම වැඩපිළිවෙළක් නැහැ; කිසිම දර්ශනයක් නැහැ; මහා භාණ්ඩාගාරයේ සල්ලි ඉබාගාතේ වියදම් කරන්න, ඉබාගාතේ නාස්ති කරන්න විතරයි දන්නේ කියලා කියන ප්‍රකාශ ඔය හඬපට ඇතුළේම තමයි තිබුණේ. ඊයේ රන්ජන් රාමනායක මන්ත්‍රීතුමා ප්‍රකාශ කරලා කිව්වා, එතුමා කියපු සියලු දේ ඇත්තයි, නිකම් ම ඇත්ත නොවෙයි තිත්ත ඇත්තයි කියලා. හැබැයි, පසුගිය ආණ්ඩුව රන්ජන් රාමනායක මන්ත්‍රීතුමා වේදිකා ගණනේ අරගෙන ගියා. වේදිකා ගණනේ අරගෙන ගිහිල්ලා, වේදිකාවට නඟලා පනස් ලක්ෂයකට වැඩි ජනතාවකට මේ ආණ්ඩුවේ වැඩපිළිවෙළ ගැන සහ ගෝඨාභය මැතිතුමා ගැන චෝදනා කළා. එදා සජිත් ප්‍රේමදාස වර්ණනා කළා. සජිත් ප්‍රේමදාස වර්ණනා කරලා මේ රන්ජන් රාමනායක මන්ත්‍රීතුමා පනස් ලක්ෂයට වැඩි ජනතාවක් රැවැට්ටුවා. ඒක තමයි කළේ. රන්ජන් රාමනායක මන්ත්‍රීතුමා එදා ඇත්ත කිව්වා නම්, කිව්වේ තිත්ත ඇත්ත නම් කොහොමද කියන්නේ සජිත් ප්‍රේමදාස ජනාධිපති අපේක්ෂකයා වගකීමක් ගන්න පුළුවන්, දැක්මක් තියෙන, දර්ශනයක් තියෙන පුද්ගලයෙක් නොවෙයි කියලා? තමුන්නාන්සේලාගේ පක්ෂයේ කටයුතු කළේ ඔන්න ඔය වාගේ අය. ඒ නිසා අපි මේ වෙලාවේ කියනවා, අද රටේ ඉදිකිරීම් කර්මාන්තකරුවන්ට යම්කිසි සහනදායී කාලයක් නිර්මාණය වෙමින් තියෙනවාය කියන කාරණය. එදා අපි දැක්කා, තමුන්නාන්සේලාගේ ආණ්ඩුව තුළ ඉදිකිරීම් කර්මාන්තකරුවන් ව්‍යාපෘති පටන් ගත්ත හැටි. ව්‍යාපෘති දස දහස් ගණනක් රටේ පටන් ගන්න ලැස්ති කළා. හැබැයි, ව්‍යාපෘති දහයකට පහළොවකටවත් අය වැයෙන් මුදල් වෙන් කර ගත්තේ නැහැ. අන්න ඒ කාරණය උඩ අද වෙද්දී ඔය ඉදිකිරීම් කර්මාන්තයේ ඉන්න ව්‍යාපාරිකයන් අනාථ වෙලා තියෙනවා. ඒ ව්‍යාපාරිකයන්ට අද යන එන මං නැති වෙලා තියෙනවා. ප්‍රධාන කොන්ත්‍රාත්කරුවා විදේශීය සමාගමක් නම්, ඒ විදේශීය සමාගමට උප කොන්ත්‍රාත් කරපු ඒ උප කොන්ත්‍රාත්කරුවන්ට අද මේ ගැන විමසන්න තැනක්, ප්‍රශ්න කරන්න තැනක්, එහෙම නැත්නම් මේ සම්බන්ධව නීතිමය ක්‍රියාමාර්ගයක් ගන්න තැනක් නැති වෙලා තියෙනවා.

ඔබතුමන්ලා පසුගිය කාලවල මේ අණ පනත් හදාගෙන හිටියා. මේ ආණ්ඩුව අනාගතයේදී ඉදිකිරීම් ක්ෂේත්‍රයට අදාළව විශේෂයෙන් ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරියේ ශක්තිමත්භාවය වැඩිදියුණු කිරීමට මේ අණ පනත් යොදා ගනීවි. ඉදිකිරීම් කර්මාන්තයට ඇතුළත් වන ශ්‍රමිකයන් පුහුණු කිරීම, ඒ ශ්‍රමිකයන්ට වාගේම ඒ පාඨමාලා හදාරන අයට ඒ අවස්ථා ලබාදීම වැනි වැඩ කටයුතුවලදී මීට වඩා වැඩි පිරිසක් බඳවා ගැනීමටත්, ඒ ගොල්ලන්ගේ අවශ්‍යතා තේරුම් ගෙන ඒ පාඨමාලාවලට ඉදිරිපත් වන අයට මීට වඩා පුළුල් අවස්ථාවක් ලබා දීමටත් අපි කටයුතු කරනවා.

ඉදිකිරීම් කටයුතුවලදී උප කොන්ත්‍රාත්කරුවා සහ කොන්ත්‍රාත්කරුවා අතර තිබෙන සම්බන්ධතාව යම් කිසි විධියකින් බිඳුණාම, එහෙම නැත්නම් ඒ ඉදිකිරීම කර දෙන ආයතනය, ඒ ඉදිකිරීම් පහසුකම ලබා ගන්නා ආයතනය කියන ආයතන අතර යම් කිසි ගැටුමක් නිර්මාණය වුණාම බේරුම්කරුවකු විධියට ඊට මැදිහත් වෙලා ඒ කටයුතු කරන්න මේ නියෝග තුළින් හැකියාව ලැබෙනවා.

ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරිය තුළ දත්ත ගබඩාවක් ඇති කරලා ඒ දත්ත ගබඩාව තුළින් රටේ ඉදිකිරීම් ක්ෂේත්‍රයේ සිටින සාර්ථක කොන්ත්‍රාත්කරුවන් කවුද කියලා සොයා ගත හැකි වනවා. අද වෙද්දී අපි දකිනවා සමහර අමාත්‍යවරු, සමහර කැබිනට් අමාත්‍යවරු තමුන්ගේ දරුවන්ගේ නම් පාවිච්චි කරලා තමුන්ගේ දරුවන්ට නොයෙක් ඉදිකිරීම් සඳහා කොන්ත්‍රාත් ලබා දීලා තිබෙන බව. ඒ අනුව ඔවුන් නව ඉදිකිරීම් සමාගම් ඇති කරලා රටේ ප්‍රධාන පෙළේ ඉදිකිරීම් කර්මාන්ත අයිති කර ගෙන තිබෙනවා. ඒවා වුණේ විනිවිදභාවයකින් තොරවයි. එදා අපි දැක්කේ නැහැ, ටෙන්ඩර් දමනවා. එදා දේශීය කොන්ත්‍රාත්කරුවන්ට මේ ඉදිකිරීම් ලබා දෙනවාය කියා පෙන්වා ඒ මුවාවෙන් තමුන්ගේ - තමුන්ගේ අය අතර මේ ව්‍යාපෘති බෙදා ගෙන තිබෙනවා. ඒ තුළින් විශාල විධියට මූල්‍ය අක්‍රමිකතා සිදුවෙලා තිබෙනවා.

ෂැන්ග්‍රි-ලා හෝටලයේ පිටුපස ඉඩම ගැන අද ජනතා විමුක්ති පෙරමුණ කථා කරනවා. ෂැන්ග්‍රි-ලා හෝටලය පිටුපස තිබෙන ඉඩම සම්බන්ධයෙන් පසුගිය කාලයේ පැවැති ආණ්ඩුව කැබිනට් මණ්ඩලයට යෝජනා ඉදිරිපත් කරලා, ඒ ගැන සාකච්ඡා කරලා අනුමත කර ගෙනයි තිබුණේ. ඒ යෝජනා අනුව අපට තිබුණේ ඒක ඒ පුද්ගලයන්ට පිරිනමන්න විතරයි. ඒක පිරිනමන්නේ නැතිව ඔබතුමන්ලා කොමිස් ඉල්ල ඉල්ලා මේ කටයුත්ත කල් මැරුවා. එසේ කල් මර මර ඉන්න අතරතුර තමයි මේ සමාගම ආයෝජකයකු විධියට අපේ රටට ආවේ. අපේ රටට මේ සමාගම ආවාම, ඒ ආයෝජකයාට ඒ කටයුතුවලට පහසුකම් සැලසීමේ කටයුත්ත අපට කරන්න වෙනවා. ඒකේ සියයට 90ක වැඩ කටයුතු ඉවර කරලා තියෙද්දි අද මොකුත්ම දන්නේ නැති, මැරිලා ඉපදුණු කාණ්ඩයක් වාගේ ජනතා විමුක්ති පෙරමුණ කියනවා, අපි ෂැන්ග්‍රි-ලා එක පිටුපස ඉඩම වික්කා කියලා. අපිද විකිණුවේ? මොන කැබිනට් මණ්ඩලයෙන්ද ඒක අනුමත වුණේ? මොන අමාත්‍ය මණ්ඩලය ද ඒක තීන්දු කළේ? මොන කාල වකවානුවේද මේ ගනුදෙනු සාකච්ඡා කළේ? මේවා මොන විධියටද වුණේ කියලා බලන්න. අද අපට නොපෙනෙන දේ මෙන්න මේකයි. අපට මේ වෙනස පෙනෙන්නේ නැහැ. අද ජනතා විමුක්ති පෙරමුණත්,- [බාධා කිරීමක්]

**ගරු නිහාල් ගලප්පත්ති මහතා**
(மாண்புமிகு நிஹால் கலப்பத்தி)
(The Hon. Nihal Galappaththi)
තමුන්නාන්සේලා ඒ දේවල් අහන්න එපා. අසත්‍ය ප්‍රකාශ කරන්න එපා. තමුන්නාන්සේලා ලජ්ජා වෙන්න ඕනෑ.

**ගරු ඉන්දික අනුරුද්ධ හේරත් මහතා**
(மாண்புமிகு இந்திக அநுருத்த ஹேரத்)
(The Hon. Indika Anuruddha Herath)
නැහැ, දැන් ඒ විස්තර ගෙන්වා ගන්න. [බාධා කිරීමක්] අන්න, ඔබතුමාට උදව් කරනවා. දැන් මේ දෙකම එකයි. දැන් දෙකම එකයි. නැඟිටලා උදව් කරන්න. ජනතා විමුක්ති පෙරමුණයි, එක්සත් ජාතික පක්ෂයයි දෙකම එකයි. ගලප්පත්ති මන්ත්‍රීතුමනි, ඒකත් එක්කම වළපල්ලට යන්න එපා. පොඩ්ඩක් තේරුම් ගන්න. [බාධා කිරීමක්] අහගන්න. අර ආශු මාරසිංහ මන්ත්‍රීතුමා ඒ ගැන කිව්වා. මේක අහගන්න. එහෙම නැත්නම් මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එතුමා වාඩිකරවන්න.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු රාජ්‍ය ඇමතිතුමාට කථා කරන්න ඉඩ දෙන්න.

**ගරු ඉන්දික අනුරුද්ධ හේරත් මහතා**
(மாண்புமிகு இந்திக அநுருத்த ஹேரத்)
(The Hon. Indika Anuruddha Herath)
පාර්ලිමේන්තු අත්දැකීම් තිබෙන පුද්ගලයෙක් තමයි මේ. එහෙම නැති කෙනෙකු නම් කමක් නැහැ.

**ගරු නිහාල් ගලප්පත්ති මහතා**
(மாண்புமிகு நிஹால் கலப்பத்தி)
(The Hon. Nihal Galappaththi)
තමුන්නාන්සේ ඒක කියන්න ලජ්ජා වෙන්න ඕනෑ.

**ගරු ඉන්දික අනුරුද්ධ හේරත් මහතා**
(மாண்புமிகு இந்திக அநுருத்த ஹேரத்)
(The Hon. Indika Anuruddha Herath)
ආශු මාරසිංහ මන්ත්‍රීතුමා පැහැදිලිවම කිව්වා, තිබුණු "ඩීල්" එක මොකක්ද කියලා. අපි මේ ගැන කථා කළා කියලා, ඒකත් කිව්වේ අර "සලකුණ" කියන වැඩසටහනට ඇවිල්ලායි. ඔබතුමාට තේරුණාද? මොකක්ද මේ වෙලා තිබෙන්නේ? [බාධා කිරීමක්]

පොඩ්ඩක් ඉන්න. අහගෙන ඉන්න. ලජ්ජා නැතිකම ගැන කථා කරනවා නම් එතකොට බලන්න ඕනෑ ජේවීපී එක දිහායි. අපේ පැත්ත නොවෙයි. හරිද? මේ ගොල්ලන් මොනවාද කථා කළේ? "ජනාධිපති අපේක්ෂකයා විධියට සජිත් ප්‍රේමදාස ගේනවා නම්, අපි උදව් කරනවා" කිව්වා. ඒවා තමයි පසුගිය ටිකේ සාකච්ඡා වුණේ. ඒවා එළියට ආවා. පසුගිය දවස්වල හම්බන්තොට දිස්ත්‍රික්කයේ කරපු එක විනාශයක් ගැන හැන්සාඩ් වාර්තාවල තිබෙනවාද? ගරු මන්ත්‍රීතුමනි, සේවකයන් බඳවා ගත් එක ගැන ඔබතුමා කථා කරලා තිබෙනවාද? විශාල ව්‍යාපෘති විධියට කරපු, විශාල වශයෙන් සේවකයන් බඳවා ගත්, වාහන විශාල සංඛ්‍යාවක් දමා ගත් ඒවා ගැන ඔබතුමා කථා කරලා තිබෙනවාද? මේ නිවාස, ඉදිකිරීම් අමාත්‍යාංශය කළ ඒවා, ඉඩම් - කඩම් විකුණපුවා, ඒවාට කොමිස් ගත්ත ඒවා ගැන තමුන්නාන්සේලා කථා කරලා තිබෙනවාද? මහ ලොකුවට දැන් මෙතැන පම්පෝරි ගහන්න එනවා. තමුන්නාන්සේලාත් එකතුවෙලා මේවා කළේ; මේවා බෙදා ගත්තේ. [බාධා කිරීමක්] ඒ නිසා අහගෙන ඉන්න. [බාධා කිරීමක්] ඒක තමයි වෙලා තිබෙන්නේ. ජනතා විමුක්ති පෙරමුණයි - එක්සත් ජාතික පක්ෂයයි; නිහාල් ගලප්පත්ති මහත්තයයි - සජිත් ප්‍රේමදාසයි හම්බන්තොට බෙදාගෙන වැඩ කළේ. එහෙමයි වැඩ කළේ. ඒකයි අපි දැක්කේ. ඔබතුමා එතකොට කථා කළාද? [බාධා කිරීමක්] ඔබතුමන්ලාට රාජපක්ෂ තමයි ප්‍රශ්නය; ඒක තමයි අමාරුව.[බාධා කිරීමක්] මේ වෙද්දී JVP එක එක්සත් ජාතික පක්ෂයට සින්නවෙලා ඉවරයි. [බාධා කිරීමක්]අනුර කුමාර දිසානායක-[බාධා කිරීමක්]

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු නිහාල් ගලප්පත්ති මන්ත්‍රීතුමනි, විවාදයකට යන්න එපා. ගරු රාජ්‍ය ඇමතිතුමාට කථා කරන්න ඉඩ දෙන්න.

**ගරු ඉන්දික අනුරුද්ධ හේරත් මහතා**
(மாண்புமிகு இந்திக அநுருத்த ஹேரத்)
(The Hon. Indika Anuruddha Herath)
ඔබතුමන්ලාගේ සාමාජිකයන් හැට දහසක් මැරුවා. ඒවා ගැන කථා නැහැ, ඒවා ගැන හුරතල්. අද එනවා මෙතැන කථා කරන්න. තමුන්ගේ නායකයා අමු අමුවේ පුච්චලා දැම්මා. අද ඒවා ගැන කථා කරන්නේ නැහැ. දැන් මහ පුරාජේරු කියනවා. [බාධා කිරීමක්] අපි පැහැදිලිවම කියනවා. පසුගිය දවස්වල නිවාස අමාත්‍යාංශයට අයත් ගොඩනැඟිලි ද්‍රව්‍ය සංස්ථාවේ ඉඩම බැංකුවට තියලා රුපියල් ලක්ෂ 6,500ක් ගත්තා. ඔබතුමන්ලා ඒ ගැන කථා කළාද? ඩාර්ලි පාරේ ඉඩම තියලා සල්ලි අරගත්තා; ඉන්දියානු සමාගම්වලට විකුණුවා. ඔබතුමන්ලා ඒ ගැන කථා කළාද? නැහැ, කථා කරන්නට බැහැ. දැන් මේ සභාවේදී තමයි කථා කරන්නේ. අනේ මේ, බොරු බයිලා කියන්න එන්න එපා මේ සභාවේදී.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි පැහැදිලිවම කියනවා,-

**ගරු නිහාල් ගලප්පත්ති මහතා**
(மாண்புமிகு நிஹால் கலப்பத்தி)
(The Hon. Nihal Galappaththi)
පාළු ගෙයි වළං බිඳිනවා.

**ගරු ඉන්දික අනුරුද්ධ හේරත් මහතා**
**(மாண்புமிகு இந்திக அநுருத்த ஹேரத்)**
**(The Hon. Indika Anuruddha Herath)**

පාළු ගෙයි වළං බිඳින්න ඕනෑ නැහැ, එන්න කියන්න ඕනෑ කෙනෙකුට. [බාධා කිරීමක්] පාළු ගෙයි වළං බිඳින්නේ ඔබතුමන්ලායි.

මේ නියෝග අනුමත කිරීම සම්බන්ධයෙන් සාකච්ඡා කරන වෙලාවේ මම කියන්නට කැමැතියි, ඉදිරියේදී මේ ඉදි කිරීම් කර්මාන්තයට සම්බන්ධ කොන්ත්‍රාත්කරුවන්ට රට තුළ පුළුල් වෙන ඉදි කිරීම් ක්ෂේත්‍රය සම්බන්ධයෙන් ලොකු වගකීමක් තිබෙන බව. අපි දන්නවා, පසුගිය දවස්වල නිවාස අමාත්‍යාංශය යටතේ තිබෙන රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව, රාජ්‍ය සංවර්ධන හා නිර්මාණ නීතිගත සංස්ථාව, ගොඩනැඟිලි ද්‍රව්‍ය සංස්ථාව වාගේ ආයතන විශාල සංඛ්‍යාවක් කඩාගෙන වැටුණු බව. මේවායේ පඩි - නඩි ගෙවීමට මහා භාණ්ඩාගාරයෙන් මුදල් ලබා ගැනීමට පවා සිද්ධ වුණා. මේ පාර්ලිමේන්තුවට යෝජනා කරලා මේ වාගේ අණ පනත් ගෙනැල්ලා, මේ වාගේ තීන්දු - තීරණ අරගෙන මේ වාගේ ආයතන නැවත ශක්තිමත් කරන්නට පුළුවන් වාතාවරණයක්, වැඩ පිළිවෙළක් හදන්නට ඕනෑ. ඒවා හරියට ක්‍රියාත්මක කර ගන්නට ඕනෑ. දේශීය කර්මාන්තකරුවාට වාසි සැලසෙන විධියට ඒවා හරියාකාරයෙන් ක්‍රියාත්මක කර ගන්නට ඕනෑ. ඉදිරියේදී මේ ගෙනාපු නියෝග ක්‍රියාත්මක කිරීමට වැඩ පිළිවෙළක් තිබෙනවාය කියලා මම හිතනවා.

මේ තොරතුරු ලේකම් කාර්යාලය හරහා රටේ ඉදි කිරීම් කර්මාන්තයට සම්බන්ධ අංක එකේ ආයතන මොනවාද, ඒවායේ තිබෙන පහසුකම් මොනවාද, ඒ ගොල්ලන්ගේ හැකියා මොනවාද කියලා දැන ගැනීමේ හැකියාව තිබෙනවා. මම කලින් සඳහන් කළේ ඒකයි. තාවකාලිකව අටවා ගත්ත, තාවකාලිකව ලියාපදිංචි කර ගත්ත සමහර සමාගම් තිබෙනවා. අදාළ කොන්ත්‍රාත්තුව සම්පූර්ණ කිරීමට අවශ්‍ය පහසුකම් නැතිව කටයුතු කරන ව්‍යාජ වැඩ පිළිවෙළවල් තිබෙනවා. ඒ වෙලාවට උප කොන්ත්‍රාත්කරුවන් අසරණ වෙනවා; ප්‍රධාන කොන්ත්‍රාත්කරුවන් අසරණ වෙනවා. අන්න ඒ සියලුදෙනාට වගකීම් දරන්න පුළුවන් ක්‍රමවේදය ඇති වෙන්නේ මේ ආයතනය තුළ මේ තොරතුරු මධ්‍යස්ථානය ඉදි කිරීම හරහායි. එතකොට ඒ තොරතුරු ලේකම් කර්යාලයෙන් සියලු තොරතුරු ලබා ගැනීමේ හැකියාව තිබෙනවා.

පසුගිය ආණ්ඩුවට කොළඹ ඉඳලා මහනුවරට අධිවේගී මාර්ගය හදන්න අවුරුදු ගණනාවක් ගියා. ඒකත් අඹේපුස්සෙන් පටන් ගෙන කුරුණෑගලට යන තෙක් විතරයි. ඒ මාර්ගය ඉවරවෙන තැනත් වැඩ ඉවර නැහැ, පටන් ගන්න තැනත් වැඩ ඉවර නැහැ. මේ ව්‍යාපෘතිය තුළත් දේශීය කොන්ත්‍රාත්කරුවන්ට බොහොම පොඩි ප්‍රමාණයක් තමයි දීලා තිබෙන්නේ. ඒ දේශීය කොන්ත්‍රාත්කරුවන්ටත් මුදල් ගෙවීම් කර ගන්නට බැරි වුණු නිසා මේ වනවිට අතර මැද ඒ වැඩ නැවතිලා තිබෙනවා. අපි අඹේපුස්සේ ඉඳලා කඩවතටත්, කුරුණෑගල ඉඳලා ගලගෙදරට එහෙම නැත්නම් මහනුවරටත් ඒ වැඩ කටයුතු ආරම්භ කරන්නටත් අවශ්‍ය සියලු කටයුතු සූදානම් කරලා තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, නිවාස සංවර්ධන අධිකාරිය පසුගිය දවස්වල සියලු ඉදිකිරීම් දුන්නේ පෞද්ගලික සමාගම්වලට බව මම විශේෂයෙන්ම කියන්නට ඕනෑ. පෞද්ගලික සමාගම් ඒ කොන්ත්‍රාත් අරගෙන ක්‍රියාත්මක නොකර අද වෙද්දි අතර මඟ නවතා තිබෙනවා. එදා නිවාස අමාත්‍යවරයා විධියට මුදල් අවභාවිත කර තිබෙනවා; ඡන්ද ගැනීමේ අරමුණින් ගම්වල ඉන්න ඡන්දදායකයන්ට නිකම් මුදල් බෙදා දීලා තිබෙනවා. එම නිසා ඉදිකිරීම් ක්ෂේත්‍රයට අවශ්‍ය පහසුකම ලැබිලා නැහැ. අපි පැහැදිලිවම කියනවා, ඉදිරියේදී නිවාස පහසුකම් අමාත්‍යාංශයෙන් මහල් නිවාස ව්‍යාපෘති පටන් ගනිද්දි අපි කිසිදු මහල් නිවාස ව්‍යාපෘතියක් විදේශීය සමාගම්වලට ලබා දෙන්න කටයුතු කරන්නේ නැහැ කියලා. අපි ඒ සියලු ඉදිකිරීම් කටයුතු නිවාස අමාත්‍යාංශය යටතේ තිබෙන ශ්‍රී ලංකා රාජ්‍ය ඉංජිනේරු සංස්ථාව, ගොඩනැඟිලි දෙපාර්තමේන්තුව, ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරිය, ඒ වාගේම සහාධිපත්‍ය කළමනාකරණ අධිකාරිය වැනි ආයතනවලට ලබා දෙන්න කටයුතු කරනවා. ඒ තුළින් අපට හැකියාව ලැබෙනවා, නිවසක් නැති පුද්ගලයන්ට සර්ව සාධාරණ විධියට කඩිනමින් නිවසක් ලබා දෙන්න.

පසුගිය රජය ලක්ෂ ගණනක් ජනතාව නිවාස ණයවලින් හෙම්බත් කර තිබෙන බව අපි දැක්කා. අද වෙද්දි තරුණ තරුණියන් දහස් ගණනක් රැකියා විරහිතයන් බවට පත් කරලා තිබෙනවා. ඒ තරුණ තරුණියන්ට කොන්ත්‍රාත් පදනමින් රැකියා ලබා දීලා, 2015 ඉඳලා 2019 වන තෙක් මාස හයෙන් හයට කොන්ත්‍රාත් කාලය අලුත් කරමින් ඇවිල්ලා තිබෙනවා. මෙතැන ඉන්න සෑම මන්ත්‍රීවරයකුම නියෝජනය කරන දිස්ත්‍රික්කවල තරුණ තරුණියන් ඒ තත්ත්වයේ ඉන්නවා. අද ඒ තරුණ තරුණියන්ගේ කොන්ත්‍රාත් කාලය අලුත් කර ගන්න බැරිව ගිහින් තිබෙනවා. හිටපු අමාත්‍යවරයාගේ කාලයේම ඒ කොන්ත්‍රාත් කාලය අලුත් කරන්නේ නැතුවයි එතුමා ගිහින් තිබෙන්නේ. කොන්ත්‍රාත් කාලය අලුත් නොකිරීම තුළ අද වෙද්දි ඒ අයගේ රැකියාවේ අස්ථාවර භාවයක් ඇති වෙලා තිබෙනවා. හිටපු ඇමතිවරයා ජනාධිපති කොමිසමට පවා ගිහින් කියා තිබෙනවා, "මම කළ කාර්යයක් නොවෙයි, නිලධාරින් තමයි ඒ බඳවා ගැනීම් කළේ" කියලා. එහි වගකීම ඇමතිවරයා ගන්නේත් නැහැ; නිලධාරියා ගන්නේත් නැහැ. ඒ නිසා දහස් ගණනක් අද මහ පාරට වැටෙන තත්ත්වයට පත් වෙලා තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, කොහොම හෝ කොන්ත්‍රාත් කාලය අවුරුදු 2-3ක් ඉදිරියට කරගෙන යන්න පවරලා එතුමන්ලා එදා දුන්න පොරොන්දුවක් තමයි, සජිත් ප්‍රේමදාස 2020දී ජනාධිපති. එතකොට අනිවාර්යයෙන්ම මේගොල්ලන්ගේ පත්වීම් ස්ථිර කරනවාය කියන එක. ඒ වාගේ අසත්‍ය කියලා, අද තරුණ තරුණියන් ගණනාවක් අසහනයට පත් කරලා මහ පාරට ඇද දමා තිබෙනවා. වත්මන් විපක්ෂ නායකවරයා ඒ සියල්ල වෙනුවෙන් වග කියන්න ඕනෑ.

නිවාස පහසුකම් අමාත්‍යාංශය යටතේ තිබෙන සියලු ආයතනවලට දැන් වැඩ කරන්න පුළුවන් පසුබිම ලැබිලා තිබෙනවා. මම මුලින් කිව්වා වාගේ මේ ආයතනවල ප්‍රධානින් එදා යොදා ගත්තේ තම තමුන්ගේ පෝස්ටර් ව්‍යාපාර, ප්‍රචාරක ව්‍යාපාර, තම තමුන්ගේ ගජ මිතුරන්ගේ කොන්ත්‍රාත් වැඩ පිළිවෙළ කරන්න මිසක්, රට සංවර්ධනය කරන්න නොවෙයි. එහෙම කියද්දි මට වෙලාවකට හිතෙනවා රන්ජන් රාමනායක මන්ත්‍රීතුමා හිරුනිකාත් එක්ක කරපු කථාවල ඇත්තක් තිබෙනවා කියලා. ඒකේ තමයි කියවුණේ, "දැක්මක්, මෙහෙවරක්, වැඩ පිළිවෙළක් නැතුව මහා භාණ්ඩාගාරයේ සල්ලි ඉබාගාතේ වියදම් කරන මනුස්සයෙක් කොච්චර පයින් ඇවිද්දත්, සෙරප්පු ගෙවන තෙක් ඇවිද්දත් දැක්මක් නැහැ" කියලා. ඒ කියපු කාරණාවල සත්‍යයක් තිබෙනවා කියලා අපට පෙනී ගිහින් තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එතුමාගේ වැඩ පිළිවෙළ නිසා මේ රටේ ජනතාව අද ගැටලු ගණනාවකට මුහුණ දීලා තිබෙනවා. අද ඇතැම් මිනිසුන් ඉන්න තැනක් නැතුව, බාගෙට නිවාස හදාගෙන කර ගන්න දෙයක් නැතුව ඉන්නවා. ඉදිකිරීම් වෙනුවෙන් ආයෝජකයන් ආයෝජනය කළ මුදල්වල ප්‍රතිඵල ගන්න බැරුව ඉදිකිරීම් බාගෙට නවතා ඉන්නවා. ඒ වාගේම ඉදිකිරීම්වල ප්‍රමිතිය හොයා බලන්න ක්‍රමයක් නැතුව, වැඩ පිළිවෙළක් නැතිව තවත් කොටසක් ඉන්නවා. ඉදිකිරීම් කර්මාන්තයට අලුතින් ඇතුළු වෙන්න ඉන්න, ඉදිකිරීම් කර්මාන්තයේ නියැලී ඉන්න අය අද වෙද්දි කුමක්ද කරන්නේ කියන ප්‍රශ්නයට මුහුණ දීලා ඉන්නවා. රටේ මෙවැනි තත්ත්වයක් ඇති වෙලා තිබෙන්නේ වෙන දෙයක් නිසා නොවෙයි. පසුගිය

වකවානුව තුළ ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අධිකාරියේ නිසි වැඩ පිළිවෙළක් නොතිබුණු නිසායි.

අපි අද මේ ඉදිරිපත් කළ නියෝග තුනේ ප්‍රායෝගිකත්වය අනාගතයේදී සියලුදෙනාට දැකගත හැකි වෙයි. ඉදිකිරීම් කොන්ත්‍රාත්කරුවන්ට වගකීම පවරලා, ඒවා හරියාකාරව ඉදිරියට ගෙන යන්න පුළුවන් වැඩ පිළිවෙළක් අපි නිර්මාණය කරනවා. ඒ වැඩ පිළිවෙළ නිර්මාණය කර ගැනීමට මේ නියෝග තුන අපට ඉවහල් වනවා. අපි යම් නියෝගයක් හෝ යෝජනාවක් පාර්ලිමේන්තුවට ගෙනෙන්නේ වැඩ කරන්නයි. හැබැයි, පසුගිය ආණ්ඩුව - [බාධා කිරීමක්]

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු රාජ්‍ය අමාත්‍යතුමනි, ඔබතුමාට ලබා දී තිබෙන කාලය අවසානයි.

**ගරු ඉන්දික අනුරුද්ධ හේරත් මහතා**
(மாண்புமிகு இந்திக அநுருத்த ஹேரத்)
(The Hon. Indika Anuruddha Herath)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම කථාව අවසන් කරන්නම්.

පසුගිය ආණ්ඩුව හැම යෝජනාවක්ම, හැම සංශෝධනයක්ම ගෙනාවේ, හැම කටයුත්තක්ම කළේ පළිගැනීම් කරන්නයි. දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය, එක් පවුලකට, එක් පවුලක සිටින සාමාජිකයන්ට ගහන්න ගෙනාපු ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයක්.

වාහන ටික, යන්ත්‍රෝපකරණ ටික ගෙදර තබාගෙන, ඉදි කිරීම් වැඩ කටයුතු නවත්වා සිටින සියලුදෙනාට අපි ආරාධනා කරනවා, අද දින ඉදිරිපත් කර තිබෙන ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන පනත යටතේ වන නියෝග ක්‍රියාත්මක කරද්දී රටේ ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධනයට දායක වෙලා මේ රටේ සංවර්ධනය වෙනුවෙන් තමන්ගේ දායකත්වය දක්වන්න කියලා. බොහොම ස්තුතියි.

**ගරු කංචන විජේසේකර මහතා**
(மாண்புமிகு கஞ்சன விஜேசேகர)
(The Hon. Kanchana Wijesekera)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද අපේ ගරු හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමා විශේෂයෙන්ම බැඳුම්කර ගනුදෙනු සම්බන්ධ වෝහාරික විගණන වාර්තාව පිළිබඳව ප්‍රශ්නයක් මතු කළා. අන්තර්ගත විය යුතු සමහර කාරණා එයට ඇතුළත් වෙලා නැහැ කියා එතුමා කිව්වා. මම පාර්ලිමේන්තුවේ පුස්තකාලයට ගිහිල්ලා ඊට අදාළ CD එක ලබා ගත්තා. එහි තිබෙන ලිය කියවිලි පරීක්ෂා කර බලද්දී පෙනෙනවා, එතැන ලිය කියවිලි විශාල ප්‍රමාණයක් තිබෙන බව. ඒ එක්කම ඇමුණුම් විශාල ප්‍රමාණයක් ද තිබෙනවා. එම ඇමුණුම් ප්‍රමාණය ලබා දීලාත් නැහැ. ඒ වාගේම අවසාන පොතේ විශේෂයෙන්ම "Limitations" කියලා තිබෙන එකේ සඳහන් වන්නේ මොකක්ද? මා හිතන විධියට මෙම වාර්තාව සෑදීම සඳහා රුපියල් මිලියන 900ක් වාගේ මුදලක් වියදම් කරලා තිබෙනවා. නමුත්, එම ඉන්දියානු සමාගම සඳහන් කර තිබෙනවා, ඔවුන්ට මහ බැංකුවෙන් ලබා දීපු තොරතුරු තමයි පදනම් කරගෙන තිබෙන්නේ කියලා. දුරකථන සංවාද, ඊමේල් පණිවුඩ පිළිබඳව කිසිම දත්තයක් ඔවුන්ට ලබා දීලා නැහැ. ඒක maintain කරලාත් නැහැ. එම කාරණාත් ඉටු වෙලා නැත්නම්, මිලියන 900ක් වියදම් කරලා මේ වාගේ වාර්තාවක් හදා තිබෙන්නේ මොන පදනමින් ද කියලා අපි දන්නේ නැහැ.

මේ වාර්තාව ආණ්ඩුව පැත්තෙන් නොවෙයි නවත්වාගෙන ඉන්නේ. අපි විශේෂයෙන්ම ඉල්ලීමක් කරනවා. ඒ සම්පූර්ණ වාර්තාව ලබා දිය යුතුයි; ඇමුණුම් සියල්ල ලබා දිය යුතුයි කියලා. එම පොතේම සඳහන් කර තිබෙනවා, ඇමුණුම් නැතිව මෙම පොත පරිශීලනය කිරීම තුළින් වැරදි අවබෝධයක් ලැබෙන්න පුළුවන් කියලා. ඒ නිසා කාට හෝ වැරදි අවබෝධයක් ඇති වෙනවා නම්, මේ නිකුත් කර තිබෙන CD එක හරහා - [බාධා කිරීමක්]

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු රාජ්‍ය ඇමතිතුමනි, අපි ඔය කාරණයට මේ විවාදය අතරතුර කාලය වැය කරන එක අපරාධයක්. ඒ නිසා අපි ගරු කථානායකතුමා දැනුවත් කරලා අදාළ - [බාධා කිරීමක්]

**ගරු කංචන විජේසේකර මහතා**
(மாண்புமிகு கஞ்சன விஜேசேகர)
(The Hon. Kanchana Wijesekera)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම ඔබතුමාගෙන් ඉල්ලන්නේ, මෙම වාර්තාව ඉතාම කඩිනමින් අපට ලබා දෙන්න කටයුතු කරන්න කියලායි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
අනිවාර්යයෙන්ම.

**ගරු කංචන විජේසේකර මහතා**
(மாண்புமிகு கஞ்சன விஜேசேகர)
(The Hon. Kanchana Wijesekera)
එය කථානායකතුමාගේ අතේ තිබෙනවා නම්, එම කටයුත්ත කරන්න. අපටත් අවශ්‍යයි, ඉතා ඉක්මනින් මේ පිළිබඳ රටේ අවධානය යොමු කරවන්න. ඒ වාර්තාව හදපු අය සමහර විට ඒ ටික අත හැරලා ද දන්නේ නැහැ, එය හදා තිබෙන්නේ.

**ගරු මන්ත්‍රීවරයෙක්**
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
බඩු අහුවෙන නිසා. [බාධා කිරීමක්]

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගරු කංචන විජේසේකර රාජ්‍ය ඇමතිතුමා මගේ නම සඳහන් කළා. එතුමා කියපු කාරණාවේ යම්කිසි සත්‍යයක් තිබෙනවා. මම පුස්තකාලයට ගිහිල්ලා වාඩි වෙලා ඉඳලා CD එක ලබා ගත්තා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. එතැනදී ඔවුන් කිව්වා, මහ බැංකුවෙන් ලියුමක් එවා තිබෙනවා කියලා. ගරු රාජ්‍ය ඇමතිතුමනි, ඇමුණුම් ටික දෙන්න නම් නීතිපතිවරයාගේ අනුමැතිය අවශ්‍යයි කියලා එම ලියුමේ කියා තිබෙනවා කියලා ඔවුන් කිව්වා. එතැනයි ගැටලුව තිබෙන්නේ.

ගරු කථානායකතුමා කිව්වේ, ඒ සියලු ඒවා දෙන්න කියලායි. දැන් මම පළමුවැනි වාර්තාව කියවන ගමන් ඉන්නේ. ඒකේ "Executive Summary" එකේ තිබෙනවා, 2005 සිට 2015 වන කල් රජයට වෙලා තිබෙන පාඩුව රුපියල් මිලියන 10,470යි කියලා. මේ වෝහාරික විගණනයේ පළමුවැනි report එකේ විතරක් සඳහන්ව තිබෙනවා, රජයට රුපියල් මිලියන 10,470ක් පාඩු වෙලා තිබෙනවා කියලා. ඒ කියන්නේ, රුපියල් බිලියන දහයහමාරක්. මම දන්නේ නැහැ, annexesවල මොනවා තිබෙනවාද කියලා. ගරු රාජ්‍ය අමාත්‍යතුමනි, මම ඔබතුමාත් එක්ක එකඟ වෙනවා. සමහර විට මේ annexesවල තව දේවල් ඇති. මේක තේරුම් ගන්න නම්, annexes අවශ්‍යයි කියලා මාත් විශ්වාස කරනවා. මම මේ ගැන දීර්ඝව කථා කරන්න බලාපොරොත්තු වන්නේ නැහැ. ඒවා ලබා දෙනු ඇතැයි අපි බලාපොරොත්තු වෙනවා. [බාධා කිරීමක්]

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, කාලය පිළිබඳ ප්‍රශ්නයක් තිබෙනවා. විවාදයකට නොගොස් මේ කාරණය අවසන් කරමු.

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
Sir, I rise to a point of Order.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි දන්නවා නීතිපතිතුමා මේ වාර්තාව දෙන්න එපා කියපු බව. නමුත්, පාර්ලිමේන්තුවට තිබෙන බලතල අනුව, ගරු කථානායකතුමාට තිබෙන බලතල අනුව මේ වාර්තාව ලබා දුන්නා. මම හිතනවා, මේ ගැන ආයෙත් නීතිපතිවරයාගෙන් අහ අහා ඉන්න ඕනෑ නැහැ කියලා. මා දන්නා විධියට පාර්ලිමේන්තුවට තිබෙන වරප්‍රසාද හා බලතල අනුව එසේ ලැබී නැති දේ ඉතා ඉක්මනින් ලබා දෙන්න කටයුතු කිරීමේ හැකියාව දැනටත් ගරු කථානායකතුමාට තිබෙනවා. [බාධා කිරීමක්]

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු කංචන විජේසේකර රාජ්‍ය ඇමතිතුමනි, කාලය පිළිබඳ ප්‍රශ්නයක් තිබෙනවා. ඉතා ඉක්මනින් ඔබතුමාගේ කරුණු ඉදිරිපත් කිරීම අවසන් කරන්න.

**ගරු කංචන විජේසේකර මහතා**
(மாண்புமிகு கஞ்சன விஜேசேகர)
(The Hon. Kanchana Wijesekera)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ කාරණයේදී වැරදි අවබෝධයක් ඇති වෙන්න පුළුවන්, මේ ආණ්ඩුව සිතා මතා මේ කටයුත්ත නවත්වනවා කියලා. ආණ්ඩුවේ අපි -කිසිම පාර්ශ්වයක්- ඒ ඇමුණුම් ලබා දීම නවත්වන්න කියලාත් නැහැ, වාර්තාව දෙන්න එපා කියලාත් නැහැ. වාර්තා දෙකක් මේ පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර තිබෙනවා. පළමුවැනි වාර්තාව ඉදිරිපත් කළ වෙලාවේත්

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]*
*[Expunged on the order of the Chair.]*

පිටු කිහිපයක් හැංගුවා කියලා මතයක් තිබුණා. දැන් මේ වාර්තාව ඇතුළේ පිටු කිහිපයකුත් හංගාගෙන ද ඉන්නේ කියන සැකය තිබෙනවා. එම නිසා කථානායකතුමා මේ පිළිබඳව,- [බාධා කිරීමක්]

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු රාජ්‍ය ඇමතිතුමනි, මෙය වෙනම විවාදයකට යන්න ඕනෑ කාරණාවක්.

**ගරු කංචන විජේසේකර මහතා**
(மாண்புமிகு கஞ்சன விஜேசேகர)
(The Hon. Kanchana Wijesekera)
විවාදයක් නොවෙයි, ඔබතුමා දැනුවත් කිරීමයි කළේ.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
අපි මේ පිළිබඳව ගරු කථානායකතුමා දැනුවත් කරමු.

**ගරු කංචන විජේසේකර මහතා**
(மாண்புமிகு கஞ்சன விஜேசேகர)
(The Hon. Kanchana Wijesekera)
කොළේ වහලා කවුරු හරි එහෙම කරලා තිබෙනවා නම් ඒ පිළිබඳව සොයා බලන්න.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඒ පිළිබඳව අපි ගරු කථානායකතුමා දැනුවත් කරමු.

**ගරු මහින්දානන්ද අලුත්ගමගේ මහතා**
(மாண்புமிகு மஹிந்தானந்த அலுத்கமகே)
(The Hon. Mahindananda Aluthgamage)

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]*
*[Expunged on the order of the Chair.]*

කොළේ වහලා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
මීළඟට, ගරු අජිත් මාන්නප්පෙරුම මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි අටක කාලයක් තිබෙනවා.

[අ.භා. 4.53]

**ගරු අජිත් මාන්නප්පෙරුම මහතා**
(மாண்புமிகு அஜித் மான்னப்பெரும)
(The Hon. Ajith Mannapperuma)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට කාලය ලබා දීම ගැන ස්තුතිවන්ත වනවා.

මේ රජය, ඉදිකිරීම් ක්ෂේත්‍රයේ ආරාවුලක් වුණාම, තිරකවරයාගේ තනතුර ශක්තිමත් කිරීම සඳහා නියෝග තුනක් ඉදිරිපත් කරලා තිබෙනවා. ඒකේ වරදක් නැහැ, එහෙම ශක්තිමත් කරන එක හොඳයි. නමුත්, අපට ප්‍රශ්නයක් තිබෙනවා මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

ආණ්ඩුව මාරු වුණාට පස්සේ කොන්ත්‍රාත්කරුවන්ට මේ රජය සල්ලි ගෙවලා නැහැ. කොන්ත්‍රාත්කරුවන්ට විතරක් නොවෙයි, සල්ලි නොගෙවා ඉන්නේ. මගේ ගම්පහ දිස්ත්‍රික්කය තුළ "ගම් පෙරළිය" ව්‍යාපෘතිය යටතේ, තමන්ගේ ගෙවල්වල අඩු පාඩු හදාගන්න කියලා ගෙවල් 8,103ක් සඳහා මිනිසුන්ට නිකම් සල්ලි දුන්නා. ඒ සඳහා රුපියල් මිලියන 1,147ක මුදලක් අපි වෙන් කරලා තිබුණා. නමුත්, ජනාධිපතිවරණය ආවාට පස්සේ මැතිවරණ කොමිසමේ සභාපතිගේ නියෝගය පිට, ජනාධිපතිවරණය අවසන් වුණාට පස්සේ -නොවැම්බර් 16 වෙනිදාට පසුව- ගෙවල් 1,485කට ඒ සල්ලි දෙන්න කිව්වා. නමුත්, ජනාධිපතිවරණය අවසන් වුණාට පස්සේ මේ ගොල්ලෝ ඒ සල්ලි දෙන එකත් නවත්වලා, එය list එකෙන් සම්පූර්ණයෙන්ම කපා දැම්මා. රුපියල් ලක්ෂයක් දෙන්න, රුපියල් එක්ලක්ෂ

විසිපන්දහසක් දෙන්න, රුපියල් එක්ලක්ෂ පනස්දහසක් දෙන්න, රුපියල් ලක්ෂ තුනක් දෙන්න කියපු ගෙවල් 5,229ක් සඳහා දැනට රුපියල් පනස්දහස ගණනේ සල්ලි දීලා තිබෙනවා. නමුත්, ඉතිරි සල්ලි ටික දෙන්නේ නැතිව ඒ මිනිස්සු රස්තියාදු කරවනවා. දැන් ඒ මිනිස්සු ණය වෙලා, ගම්පහ දිස්ත්‍රික්කයේ පවුල්,- [බාධා කිරීමක්]

**ගරු මන්ත්‍රීවරයෙක්**
(மாண்புமிகு உறுப்பினர் ஒருவர்)
(An Hon. Member)
ඒ, යූඇන්පීකාරයන් ද?

**ගරු අජිත් මාන්නප්පෙරුම මහතා**
(மாண்புமிகு அஜித் மான்னப்பெரும)
(The Hon. Ajith Mannapperuma)
යූඇන්පී ද, ශ්‍රී ලංකා ද කියන එක වැඩක් නැහැ. අසරණ, දුප්පත් මිනිසුන්ට තමයි ගෙවල් හදාගන්න සල්ලි දීලා තියෙන්නේ. ඒ රාජ්‍ය නිලධාරින් සහතික කරපු අසරණ, දුප්පත් මිනිස්සු. තමුන්නාන්සේලා යූඇන්පී ද, ශ්‍රී ලංකා ද කියලා,- [බාධා කිරීමක්]

**ගරු ඉන්දික අනුරුද්ධ හේරත් මහතා**
(மாண்புமிகு இந்திக அநுருத்த ஹேரத்)
(The Hon. Indika Anuruddha Herath)
Sir, I rise to a point of Order.

**ගරු අජිත් මාන්නප්පෙරුම මහතා**
(மாண்புமிகு அஜித் மான்னப்பெரும)
(The Hon. Ajith Mannapperuma)
අපි දෙන්න ඕනෑ යූඑන්පීකාරයන්ටය, තමුන්නාන්සේලා දෙන්න ඕනෑ ශ්‍රී ලංකාකාරයන්ටය කියලා- [බාධා කිරීමක්]

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු ඉන්දික අනුරුද්ධ හේරත් රාජ්‍ය ඇමතිතුමනි, ඔබතුමාගේ point of Order එක මොකක්ද?

**ගරු අජිත් මාන්නප්පෙරුම මහතා**
(மாண்புமிகு அஜித் மான்னப்பெரும)
(The Hon. Ajith Mannapperuma)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ, මගේ වෙලාව.

**ගරු ඉන්දික අනුරුද්ධ හේරත් මහතා**
(மாண்புமிகு இந்திக அநுருத்த ஹேரத்)
(The Hon. Indika Anuruddha Herath)
නැහැ, නැහැ. ඔබතුමාට තිබෙන ප්‍රශ්නයට මට උත්තරයක් දෙන්න පුළුවන්. සල්ලි දෙන්නයි හදන්නේ.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
උත්තරයක් අන්තිමට දෙමු නේද, රාජ්‍ය ඇමතිතුමනි?

**ගරු ඉන්දික අනුරුද්ධ හේරත් මහතා**
(மாண்புமிகு இந்திக அநுருத்த ஹேரத்)
(The Hon. Indika Anuruddha Herath)
සල්ලි දෙන්නයි හදන්නේ.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
උත්තරයක් අන්තිමට දෙන්න, රාජ්‍ය ඇමතිතුමනි.

ගරු අජිත් මාන්නප්පෙරුම මන්ත්‍රීතුමා, කථා කරන්න.

**ගරු අජිත් මාන්නප්පෙරුම මහතා**
(மாண்புமிகு அஜித் மான்னப்பெரும)
(The Hon. Ajith Mannapperuma)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ මිනිසුන්ට රුපියල් මිලියන තිස්හයක් ගෙවන්න තියෙනවා. ඒ අහිංසක, දුප්පත් මිනිස්සු. ණය වෙලා කඩවලින් බඩු අරගෙන, ණය වෙලා hardware storesවලින් බඩු අරගෙන තියෙනවා. මුලින් රුපියල් පනස්දහසක් දුන්නාට පස්සේ ඉතිරි සල්ලි ටික හම්බ වෙයි කියලා බලාපොරොත්තු තියාගෙන ඒ අය ගෙවල් ටික හදලා තියෙනවා. ඒ දුප්පත්, අහිංසක මිනිස්සු ප්‍රාදේශීය ලේකම් කාර්යාල ගානේ රස්තියාදු කරවන්නේ නැතිව කරුණාකර ඒ අයගේ සල්ලි ටික දෙන්න. ඉදිකිරීම් ක්ෂේත්‍රය ගැන මහා ලොකුවට කථා කළාට, ගමේ ඉන්න දුප්පත් මිනිහා රවට්ටලා. හාඩ්වෙයාර්කාරයා ඒ මනුස්සයා ගාවට ඇවිල්ලා දොස් කියන තත්ත්වයක් අද ඇති වෙලා තියෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ විතරක් නොවෙයි. මෙතුමන්ලා ඉදිකිරීම් ක්ෂේත්‍රය ගැන, දේශීය දේ ගැන කථා කරනවා. මගේ ගම්පහ දිස්ත්‍රික්කය තුළ විදුලිය නැති ගෙවල් 1,158ක් තෝරලා අපි ඒ අයට විදුලිය ලබා ගැනීම සඳහා අවශ්‍ය ආධාර දුන්නා. නොවැම්බර් 16වන දා ජනාධිපතිවරණයෙන් පසුව නොවැම්බර්, දෙසැම්බර් අතරතුර කාලය තුළ ඒ මුදල් දෙන්නම් කියලා මැතිවරණ කොමිසමේ සභාපතිතුමා ඒක නැවැත්තුවා. ඔබතුමන්ලා ඒ නැවැත්වීම සදාකාලිකව නැවැත්තුවා; ඒ මිනිසුන්ගේ සල්ලි කප්පාදු කළා. එදා 815දෙනෙක් තෝරලා, තීරණය කරලා අවශ්‍ය මුදල් ටික ලබා දුන්නත්, අද වනකොට ගම්පහ දිස්ත්‍රික්කයේ විදුලිය නැති මිනිසුන්ට දෙන්න තියෙන රුපියල් අටලක්ෂ විසිහයදහසක් වැනි පොඩි මුදලක් දීලා නැතුව ඒ මිනිස්සු රස්තියාදු කරවනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එතුමන්ලා construction ගැන කතා කරනවා; දේශීය ව්‍යාපාරිකයා ගැන කථා කරනවා. "ගම් පෙරළිය" යටතේ අපි ව්‍යාපෘති 3,933ක් සඳහා රුපියල් මිලියන 2,313ක් වෙන් කළා. නමුත්, ජනාධිපතිවරණ කාලය තුළ කියලා ව්‍යාපෘති 841ක් කැපුවා, මැතිවරණ කොමිසමේ සභාපතිතුමා. හැබැයි, නොවැම්බර් 16 වැනිදායින් පස්සේ ඒ ව්‍යාපෘති ටික කරන්න කියලායි කිව්වේ. නමුත්, මේ රජය ආවාට පස්සේ ඒවා නැවැත්තුවා. කොහොම වුණත්, ව්‍යාපෘති 3,092ක් ක්‍රියාත්මක වෙලා තිබුණා. ඒ කරපු ව්‍යාපෘතිවලට ගෙවන්න රුපියල් මිලියන 566ක හිඟයක් තිබෙනවා. ගම්පහ දිස්ත්‍රික්කයේ පොඩි පොඩි පාරවල් හදපු ගමේ සුළු කොන්ත්‍රාත්කරුවන්ට රුපියල් මිලියන 566ක් දෙන්න තියෙනවා. ඒ සල්ලි හංගාගෙන, සල්ලි දෙන්නේ නැතුව ඒ මිනිස්සු රස්තියාදු කරවනවා. නමුත් මහා ලොකුවට දේශීය කොන්ත්‍රාත්කාරයා ගැන කථා කරනවා; දේශීය කොන්ත්‍රාත්කාරයා ශක්තිමත් කරනවා කියනවා. ගෙයක් හදා ගන්න සල්ලි නැති ගමේ අහිංසක මිනිසුන්ට ඒ ණය මුදලින් පොඩි ගණනයි දෙන්නේ. ඒකෙන් ගේ බාගෙට හදාගෙන, ඉතිරි ටික හදා ගන්න මුදල් නැතිව ඒ මිනිස්සු රස්තියාදු වෙනවා. මේ මිනිසුන් ගමේ හාඩ්වෙයා කඩයට ණය වෙලා, ගමේ හාඩ්වෙයාර් මුදලාලිගේ අඩමානේට්ටම්වලට යටත් වෙමින්, මුද්දර උඩ අත්සන් අරගෙන දෙනවාය කියපු මේ ණය මුදල ලැබෙයි කියන විශ්වාසයෙන් අද බලාගෙන ඉන්නවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මගේ දිස්ත්‍රික්කය තුළ පසුගිය 2018 වසර වෙන තෙක් පවුල් 2404කට බාගෙට ඉදි කරන ලද

[ගරු අජිත් මාන්නප්පෙරුම මහතා]

ගෙවල් හදා ගන්න ගරු සජිත් ප්‍රේමදාස මැතිතුමාගේ නිවාස හා ඉදිකිරීම් අමාත්‍යාංශයෙන් රුපියල් ලක්ෂය බැගින් මුදල් දුන්නා. 2019 වර්ෂයේ -ගිය වර්ෂයේ- පවුල් 944කට සහනදායි පොලියක් යටතේ ලක්ෂ දෙක ගණනේ ණය ලබා දෙන්න සියල්ල සූදානම් කරලා, ඒ සඳහා ගිවිසුම් අත්සන් කළා. ඒ අනුව පළමු අදියර යටතේ පවුල් 944කට රුපියල් 40,000 ගණනේ මුදල් ලබා දුන්නා. ඒ ඉතිරි මුදල් ටික ඔබතුමන්ලා දෙන්නේ නැහැ. අර මිනිස්සු ණය වෙලා. නිවාස හදා ගන්න ලැබෙනවාය කියන විශ්වාසය උඩ ඇපකාරයන් ඉදිරිපත් කරලා, ගිවිසුම් අත්සන් කරලා, ඒ සල්ලි ගන්න ගියාම ඒ මුදල් ටික ලබා දෙන්නේ නැහැ. රුපියල් මිලියන එකසිය පනස්එකක් ගැන කථා කරනවා. දේශීය කොන්ත්‍රාත්කරුවා ගැන කථා කරන්න ඉස්සෙල්ලා ගේ හදා ගන්න කියලා ණය මුදලෙන් බාගයක් ලබා දීපු ඒ අහිංසක මිනිසුන්ට ඉතිරි සල්ලි ටික ලබා දීමට ඔබතුමාට මොළය පෑදෙන්න ඕනෑ කියලා මම හිතනවා. නිවාස සංවර්ධන අධිකාරියෙන් දෙන ණය මුදල ලබා ගන්න ඒ අහිංසක මිනිස්සු දහ දුක් විඳගෙන ඇපකාරයන් සොයාගෙන ඇවිල්ලා ඇප අත්සන් කළා; ගිවිසුම් අත්සන් කළා. නමුත් නිවාස සංවර්ධන අධිකාරියෙන් අද ඒ අහිංසක මිනිස්සුන්ට ඉතිරි ණය මුදල ලබා ගන්නා අවස්ථාව නැති කරලා තිබෙනවා.

ඒ විතරක් නොවෙයි. තමුන්නාන්සේලා රටේ ජනතාවට බොරු කියලා තමයි ආණ්ඩු බලය ගත්තේ. අද රටේ එළවලු මිල වැඩි වෙලා තිබෙනවා. එළවලු කඩ ආරක්ෂා කර ගන්න security දාන්න වෙලා තිබෙනවා. රාජ්‍ය සේවකයන්ගේ,-

**ගරු ඉන්දික අනුරුද්ධ හේරත් මහතා**
(மாண்புமிகு இந்திக அநுருத்த ஹேரத்)
(The Hon. Indika Anuruddha Herath)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එතුමා මුදල් දෙන්නේ නැහැයි කියන එකයි කියන්නේ. නිවාස අමාත්‍යාංශයේ රාජ්‍ය අමාත්‍යවරයා විධියට මට ඒකට උත්තරයක් දෙන්න පුළුවන්.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඔබතුමා දැන් කථා කළා නේ. විනාඩි පහෙන් පහට අවස්ථාව දෙන්න ගියොත්,-

**ගරු ඉන්දික අනුරුද්ධ හේරත් මහතා**
(மாண்புமிகு இந்திக அநுருத்த ஹேரத்)
(The Hon. Indika Anuruddha Herath)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ කියන්නේ බොරු නේ. ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට උත්තරයක් දෙන්නද?

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු රාජ්‍ය අමාත්‍යතුමා, ඔබතුමා අවසානයේ දී උත්තරයක් දෙන්න. [බාධා කිරීමක්]

**ගරු ඉන්දික අනුරුද්ධ හේරත් මහතා**
(மாண்புமிகு இந்திக அநுருத்த ஹேரத்)
(The Hon. Indika Anuruddha Herath)
ඒ කියන්නේ ඔබතුමාට මුදල් එපා? ඒකයි කියන්නේ.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමා කථා කරන්න.

**ගරු අජිත් මාන්නප්පෙරුම මහතා**
(மாண்புமிகு அஜித் மான்னப்பெரும)
(The Hon. Ajith Mannapperuma)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, රාජ්‍ය සේවකයා අන්දලා බලය අරගෙන, අද රාජ්‍ය සේවකයාගේ දීමනා කප්පාදු කරලා තිබෙනවා; අත්තිකාරම් දීමනා කප්පාදු කරලා තිබෙනවා. ඔවුන්ගේ වැටුප් තල ඉහළ දැමීම අද නැති කරලා තිබෙනවා. ඒ විතරක් නොවෙයි, election duty ගිය රාජ්‍ය සේවකයන්ට ගෙවිය යුතු මුදල් අද වෙනතෙක් ගෙවලා නැහැ. රෑ නිදි මරාගෙන, දුක් විඳිමින් මැතිවරණ රාජකාරි කළ රාජ්‍ය සේවකයාට ලබා දිය යුතු දීමනා ලබා දීලා නැහැ. ස්වාමීන් වහන්සේලා රවට්ටාගෙන, අද උන්වහන්සේලා පාරට බහින තත්ත්වයට පත් කරලා තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ විතරක් නොවෙයි. තවම පාස්කු ප්‍රහාරය ගැට ගහගෙන ඉන්නවා. බැඳුම්කර වංචාවත් ගැටගහගෙන ව්‍යෝහාරික වාර්තාව පවා දෙන්නේ නැතිව ඉන්නවා. කථානායකතුමා මුල් කරගෙන තමයි අද ඔය ටිකවත් ලැබුණේ. මීට වඩා සමාජ අර්බුදයක් තිබෙනවා. එතුමන්ලා මේ සමාජ අර්බුදය වහන්නේ කොහෙන්ද? පායලී චම්පික රණවක මැතිතුමා සම්බන්ධයෙන් මීට අවුරුදු දෙකකට කලින් වූ සිද්ධියක් නැවත ගෙන එමින් එතුමා රිමාන්ඩ් කරගෙන සමාජ අර්බුදය වහන්න හදනවා. ඊළඟට ස්විස් තානාපති කාර්යාලයේ සේවිකාව සම්බන්ධ සිද්ධිය අරගෙන සමාජ අර්බුදය වහන්න හදනවා. ඊට පස්සේ රාජිත සේනාරත්න මැතිතුමා රිමාන්ඩ් කරගෙන සමාජ අර්බුදය වහනවා. දැන් වෙනකොට එතුමන්ලා කරන

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]*
*[Expunged on the order of the Chair.]*

රටේ ඉඩම් විකුණන ඒවා, අද රන්ජන් රාමනායක මන්ත්‍රීතුමාගේ හඬ පට ටික ඉස්සරහට දාලා වහගෙන යනවා. දැන් කථා කරනවා, ඉදිකිරීම් ක්ෂේත්‍රයේ තිබෙන අඩුපාඩු බෙරුම්කරණය කරන්න. කලුබෝවිල රෝහලේ තට්ටු 14ක ගොඩනැඟිල්ලක් හදන්න මේ අමාත්‍යාංශයෙන් සැලසුම් කළා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමා, දැන් කථාව අවසන් කරන්න.

**ගරු අජිත් මාන්නප්පෙරුම මහතා**
(மாண்புமிகு அஜித் மான்னப்பெரும)
(The Hon. Ajith Mannapperuma)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට තව විනාඩියක් දෙන්න.

සල්ලි ගෙවන්නේ නැති නිසා අද ඒ ගොඩනැඟිල්ල හදන එක block වෙලා තිබෙනවා. හොරණ රෝහලේ තට්ටු 6ක ගොඩනැඟිල්ල හදන එකත් අකර්මන්‍ය වෙලා තිබෙනවා. විභාග දෙපාර්තමේන්තුවේ තට්ටු 6 ගොඩනැඟිල්ල හදන එකට සල්ලි ගෙවලා නැහැ; ඒකත් අකර්මන්‍ය වෙලා තිබෙනවා. ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයේ Nurses' Training School එක හදන එකත් අකර්මන්‍ය වෙලා තිබෙනවා.

අවසාන වශයෙන් මේ කාරණයත් මා කියන්න ඕනෑ. අද ඔබතුමා සජිත් ප්‍රේමදාස මැතිතුමා විවේචනය කළා. එතුමාගේ "සැමට සෙවණ වැඩසටහන" යටතේ පවුල් එක්ලක්ෂ පනස්දහසකට නිවාස හදා ගැනීම සඳහා ලබා දුන් ණය මුදලේ ඉතිරි කොටස ලබා දෙන්නේ නැතිව block කරගෙන ඉන්නවා. ඇයි? සජිත් ප්‍රේමදාසගෙන් පළි ගන්නද, අහිංසක මිනිස්සුන්ගේ සල්ලි ටික දෙන්නේ නැත්තේ? පවුල් එක්ලක්ෂ පනස්දහසකට නිවාස එක්ලක්ෂ පනස්දාහක් සඳහා සල්ලි දෙන්නේ නැතිව ඉන්නවා. මතක තියා ගන්න, අපි සෙල්ලම් කළේ නැහැ. අපි

පසුගිය අවුරුදු හතර තුළ දුප්පත් මිනිස්සුන්ට ගෙවල් හදා ගන්න රුපියල් මිලියන 37,374ක් සල්ලි දුන්නා. තවත් ගෙවල් ලක්ෂ එකහමාරක් සඳහා භාගයක් මුදල් දීලා තිබෙනවා. ඒ, ඉතිරි සල්ලි ටිකත් ඔවුන්ට ලබා දෙන්න. ඊට පස්සේ තමයි බේරුම්කරණයට යන්න ඕනෑ. බේරුම්කරණයට යන්න කලින් ගමේ සිටින දුප්පත් අහිංසක මිනිස්සුන්ගේ, ගමේ සිටින දුප්පත් අහිංසක කොන්ත්‍රාත්කාරයන්ගේ සල්ලි ටික දීලා අවසන් කරන්න කියමින් මගේ කථාව අවසන් කරනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

මීළඟට, ගරු ආනන්ද අලුත්ගමගේ මැතිතුමා. ඔබතුමාට විනාඩි නවයක කාලයක් තිබෙනවා.

[අ.භා. 5.02]

**ගරු ආනන්ද අලුත්ගමගේ මහතා**
(மாண்புமிகு ஆனந்த அலுத்கமகே)
(The Hon. Ananda Aluthgamage)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ අවස්ථාවේ දී ඉතා වැදගත් කාරණාවක් පිළිබඳව, විශේෂයෙන්ම ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන පනත යටතේ ගෙනෙන නියෝග පිළිබඳව කරන මේ විවාදයට කරුණු දක්වන්න අවස්ථාව ලබා දීම ගැන ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා.

පසුගිය කාලපරිච්ඡේදය පුරා කරන ලද ඒ කටයුතු නිසා මේ රටේ ඉදිකිරීම් ක්ෂේත්‍රය තුළ කඩා වැටීම් විශාල ප්‍රමාණයක් ඇති වුණු බව අපි දන්නවා. එක්සත් ජාතික පක්ෂය නියෝජනය කරපු මන්ත්‍රීවරයකු හැටියට එය මා දන්නා කාරණයක්. මේ පත් වූ භාරකාර ආණ්ඩුවෙන් ඒ ඉදිකිරීම් සඳහා මුදල් ලබා නොදුන් බව මේ මන්ත්‍රීවරුන් පවසනවා. හැබැයි, ලබා දෙන්න භාණ්ඩාගාරයේ මුදල් තිබිය යුතුයි. කඩා වැටුණු භාණ්ඩාගාරයක් තමයි අද මේ රටේ තිබෙන්නේ. ඉදිකිරීම් සම්බන්ධව හිටපු ඇමතිවරයා හැටියට සජිත් ප්‍රේමදාස මැතිතුමා ඒ කාලය පුරාවට කළේ මිනිස්සු ණය කරවන එකයි. රාජ්‍ය සේවකයන් ණය කළා. අහිංසක මිනිස්සු ණයගැතියන් බවට පත් කළා. ඉදිකළ නිවාසයක් දෙන්න රාජ්‍ය සේවකයන් දෙදෙනෙක් ඇපයට බඳවා ගන්නවා. නිවස ගත් කෙනා එම වාරිකය නොගෙව්වොත්, ඇප වූ රාජ්‍ය සේවකයා ඒ වාරිකය ගෙවිය යුතුයි. ඒ නිසා තමයි අද මේ තත්ත්වයට පත් වෙලා තිබෙන්නේ.

මම දැකපු එක කාරණයක් කියන්න ඕනෑ. එක්සත් ජාතික පක්ෂය 2001 වසරේ සිට 2004 දක්වා ආණ්ඩු කළා. එදා ලැබුණු ජනවරම නියමිත කාලය අවසන් වෙන කල් තියා ගන්න එක්සත් ජාතික පක්ෂයට නොහැකි වුණා. ඒ, එක්සත් ජාතික පක්ෂය තුළ තිබෙන නොහැකියාව නිසා. ඊට පස්සේ 2015 සිට 2020 දක්වා එක්සත් ජාතික පක්ෂයට ආණ්ඩු බලය පවත්වාගෙන යන්න ජනවරමක් ලැබුණා. නමුත් මේ වෙන කොටත් පවත්වාගෙන යා යුතු එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුව කඩා හැලිලා. එක්සත් ජාතික පක්ෂය තමන්ගේ නොහැකියාව ප්‍රදර්ශනය කරමින්, දැන් භාරකාර ආණ්ඩුවකට මේ රට භාර දීලා තිබෙනවා. ඒ වාගේම අපි නොහිතපු ඡන්ද ප්‍රමාණයකින් එක්සත් ජාතික පක්ෂය පරාජයට පත් වෙලා තිබෙනවා. එක්සත් ජාතික පක්ෂයට සිදුවන මේ දේ අපි කල් ඇතුවම දැන සිටියා. එක්සත් ජාතික පක්ෂයේ මේ කඩා වැටීම, බෙදීම කෙළවර වෙන්නේ මහා විනාශයකින් කියලා අපි දැනගෙන සිටියා. අද කණ්ඩායම් තුනක් තිබෙනවා. කථානායකතුමාගේ පැත්තට එක කණ්ඩායමක්, සජිත් ප්‍රේමදාස මැතිතුමාගේ කණ්ඩායම තව එකක්, රනිල් වික්‍රමසිංහ මැතිතුමාගේ කණ්ඩායම තව එකක්. මීළඟට එන මහා මැතිවරණයේ දී එක්සත් ජාතික පක්ෂය ඉතිහාසයේ ලබන ලොකුම පරාජය ලබනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඊයේ මේ පාර්ලිමේන්තුවේ මන්ත්‍රීතුමියක් කථා කළ ආකාරය අපි දැක්කා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එම විවාදය පැවැත්වෙන අවස්ථාවේ දී මම කිව්වා, විවාදයට අදාළව කරුණු දක්වමු කියලා. මොකද මේ පාර්ලිමේන්තුවට මන්ත්‍රීවරුන් පත් කරලා තිබෙන්නේ මෙතැනට ඇවිල්ලා අසභ්‍ය දේ කියන්න නොවෙයි. මේ මහජන මුදල් වියදම් කරන්නේ පාර්ලිමේන්තුවේ අසභ්‍ය දේ කථා කරන්න නොවෙයි. කොහේ හෝ තිබෙන ගුබ්බෑයමකවත් නැති විධියට තමයි පාර්ලිමේන්තුවේ සමහර ගරු මන්ත්‍රීවරුන් හැසිරෙන්නේ. ඒ ගොල්ලන් ගත කරන ජීවිතයෙන්, මඩ ගොහොරුවෙන් ගොඩ එන්න මේ පාර්ලිමේන්තුවේ වරප්‍රසාද භුක්ති විඳින හැටි, වරප්‍රසාද ප්‍රයෝජනයට ගන්න හැටි අපි ඊයේ දැක්කා. මේ උත්තරීතර සභාවේ නොවෙයි කිසිම තැනක පාවිච්චි කරන්න බැරි වචන තමයි පාවිච්චි කළේ. විශේෂයෙන්ම දරුවන් ඉන්නා අම්මා කෙනෙකුට අහන්න බැරි, පාවිච්චි කරන්න බැරි වචන ගරු මන්ත්‍රීවරියක් මේ සභාවේ දී කථා කළා. අපට ඒ ගැන බොහොම කනගාටුයි.

අපේ ලොකු මහත් වූ ළමයි මේ වීඩියෝ පට බලනවා. මම මෙතැන නම නොකිව්වාට, මේ කාරණයට සම්බන්ධ මන්ත්‍රීතුමාට නම් ප්‍රශ්නයක් නැහැ. එතුමාට අම්මෙක් නැහැ; තාත්තෙක් නැහැ; දරුවෙක් නැහැ. ඒක නිසා එතුමාට මේකේ කිසිම ප්‍රශ්නයක් ඇත්තේ නැහැ. මේ හඬපට නිසා එතුමාට කිසි හානියක් ඇත්තේ නැහැ. එතුමා ගත් කාන්තාවක් ඇත්තේත් නැහැ, එතුමාට දරුවෙකුත් නැහැ. - එතුමාට තැන් තැන්වල දරුවෝ ඇති - මේකෙන් තමයි මේ රටේ විනාශය පටන් ගෙන තිබෙන්නේ. එතුමා පක්ෂයෙන් තාවකාලිකව ඉවත් කරන්න එක්සත් ජාතික පක්ෂය තීන්දුවක් ගෙන තිබෙනවා. පිරිමියෙකුට නාගත්තාම පිරිසිදු වෙන්න පුළුවන්. කාන්තාවකට - අම්මා කෙනෙකුට - එහෙම බැහැ. මේ සභාව තුළ අපි සාධාරණ ඉල්ලීමක් කළා. මා ඒ මන්ත්‍රීතුමියට බාධා කළේත් නැහැ, ඒ මන්ත්‍රීතුමාට බාධා කළේත් නැහැ.

අපි පාර්ලිමේන්තුවට ඇවිත් තිබෙන්නේ මහ ජනතාව වෙනුවෙන්. එම නිසා, ඔවුන්ගේ දුක, වේදනාව, කඳුළ නිවන්න යම් දෙයක් මේ තුළින් කරන්න පුළුවන්ද කියලා තමයි අපි බලන්න ඕනෑ. මම හිටපු ප්‍රාදේශීය සභා සභාපතිවරයෙක්; පළාත් සභාව දෙවරක් නියෝජනය කළ මහජන නියෝජිතයෙක්. පක්ෂය මාරු කරලා, එක්සත් ජාතික පක්ෂයෙන් පාර්ලිමේන්තුවට පැමිණි මන්ත්‍රීවරයකු හැටියට මට කියන්න තිබෙන්නේ එම සභා දෙක ඉතා ගෞරවනීයයි කියන එකයි. අද මේ උත්තරීතර පාර්ලිමේන්තුවේ වරප්‍රසාද භුක්ති විඳිමින්, ඒ වරප්‍රසාදවලට මුවා වෙලා, මේ කරන දේ ඉතාම භයානකයි; ඛේදනීයයි. ඉතාම

*[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]*
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]*
*[Expunged on the order of the Chair.]*

තමයි අම්මා කෙනෙක් ඊයේ මේ පාර්ලිමේන්තුවේදී කළේ.

*[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]*
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]*
*[Expunged on the order of the Chair.]*

දේශපාලනයක් තමයි මෙතැන තිබෙන්නේ.

*[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]*
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]*
*[Expunged on the order of the Chair.]*

සුදුසු නැති මේ වාගේ චරිත පාර්ලිමේන්තුවට එවපු මිනිසුන්ට තමයි මේ පාපකර්මයට කරගහන්න සිදු වන්නේ. මම තවමත් එක්සත් ජාතික පක්ෂයේ මන්ත්‍රීවරයෙක්. එම නිසා, පක්ෂයට මම

[ගරු ආනන්ද අලුත්ගමගේ මහතා]

යෝජනා කරනවා, මේ වාගේ

*[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]*
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]*
*[Expunged on the order of the Chair.]*

මිනිස්සු මේ සභාවට එවන්නේ නැතිව, මෙතැනින් චුත කරලා දමන්න කියලා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඔබතුමාට තව විනාඩි දෙකක කාලයක් තිබෙනවා.

**ගරු ආනන්ද අලුත්ගමගේ මහතා**
(மாண்புமிகு ஆனந்த அலுத்கமகே)
(The Hon. Ananda Aluthgamage)
හොඳයි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

මේ ගරු සභාවේ අද න්‍යාය පත්‍රයක් නැහැ. තමන්ගේ පෞද්ගලික න්‍යාය පත්‍රවලට තමයි අද මේ සභාව හැඩ ගැහිලා තිබෙන්නේ. මම ඒ ගැන බොහොම කනගාටු වෙනවා. මේ සභාවේ කථා කළ යුතු දේවල් තිබෙනවා; නොකිව යුතු දේවල් තිබෙනවා. ඒ වාගේම, පාවිච්චි කළ යුතු, නොකළ යුතු වචන තිබෙනවා. මේ පාර්ලිමේන්තු ඉතිහාසයේ ලජ්ජා සහගතම පාර්ලිමේන්තුව මේක කියා මම හිතනවා.

අම්මාට, තාත්තාට එක තැන ඉඳගෙන අහන්න බැරි කථා අද මේ උතුම් පාර්ලිමේන්තුවේ කරනවා. ඒ කථා කළේ අම්මා කෙනෙක්. දැන් හඬ පට 4ක් ඇවිල්ලා තිබෙනවා. නඩුකාර උත්තමයන් ගිහිල්ලා, "මම මේ වැරැද්ද කළා, මේ හඬ පට ඇත්ත" කියලා කටඋත්තර දෙනවා. තව කෙනෙක් කියනවා, මේවා සංස්කරණය කරලා තිබෙනවා ලු. සංස්කරණය කළා නම්, ඒවා පටිගත කළ මිනිහාටයි නඩුව දමන්න ඕනෑ. "ඇයි මගේ කථා පටිගත කළේ, ඇයි මේවා ප්‍රදර්ශනය කළේ?" කියලා අහන්න පුළුවන් නේ. කවුද මේවා කරලා තිබෙන්නේ? අපි 225 දෙනාම අනාථයන් හැටියට නේ මේ කථා කරන්නේ, පාර්ලිමේන්තුවේ. අපි බොහොම ගෞරවනීය දේශපාලනයක් කරලා පාර්ලිමේන්තුවට ඇවිල්ලා තිබෙන්නේ. අපි ගෞරවනීය විධියට දරුවෝ හදලා තිබෙනවා. අපි අම්මාට තාත්තාට බොහොම ගරු කරනවා. මේ පාර්ලිමේන්තුවේ බිරින්දෑවරු කිහිපදෙනෙක් සිටිනවා. සුමේධා ජයසේන මැතිනිය දිහා බලන්න. එතුමිය දීර්ඝ කාලයක් තිස්සේ මේ පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරියක විධියට බොහොම ගෞරවනීයව කටයුතු කරනවා. කොතැනදී දැක්කත් අපි එතුමියට ගරු කරනවා.

අපි කාන්තාවන්ට බොහොම ගරු කරනවා. අපි නැඟිටලායි ඒ ගෞරවනීය තත්ත්වය ඔවුන්ට දෙන්නේ. කාන්තාවක් විසින් කාන්තා පාර්ශ්වයේ ආත්මය විනාශ කරනකොට, නැඟිටලා ඒකට විරුද්ධ වෙන්න එක කාන්තාවක් පාර්ලිමේන්තුවේ හිටියේ නැහැ. ඒ ගැන මම ලජ්ජා වෙනවා. තමන්ගේ ළමයි ලොකු වුණාම මේ අම්මා කොහොමද මේ හඬ පට සම්බන්ධව දරුවන්ට උත්තර දෙන්නේ? දරුවන් බිහි කරලා, අද පියාට ඒ දරුවන් භාර දීලා. පියාට කිරි එරෙන්න කියලා මම දෙවියන් වහන්සේගෙන් ඉල්ලා සිටිනවා. මොකද අම්මා

*[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]*
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]*
*[Expunged on the order of the Chair.]*

දරුවෝ අනාථ කරලා තිබෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. දරුවන් හදන්න පියාට කිරි එරෙන්න කියා මම ප්‍රාර්ථනා කරනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
මීළඟට, ගරු නලින් බණ්ඩාර ජයමහ මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි අටක කාලයක් තිබෙනවා.

[අ.භා. 5.11]

**ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා**
(மாண்புமிகு நலின் பண்டார ஜயமஹ)
(The Hon. Nalin Bandara Jayamaha)
බොහොම ස්තුතියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. මට ගරු ආශු මාරසිංහ මැතිතුමාගේ කාලයෙනුත් විනාඩි කිහිපයක් ලැබුණා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඉදිකිරීම් ක්ෂේත්‍රය ගැන වචන කිහිපයක් කථා කරන්න අවස්ථාව ලැබීම ගැන මම සතුටු වෙනවා. දැන් අපි හැමදෙනාටම අප ගැන හඳුන්වලා දෙන්නයි සිදු වෙලා තිබෙන්නේ. ඒ වාගේ තත්ත්වයක් තමයි අද මේ පාර්ලිමේන්තුවේ තිබෙන්නේ. මොකද, වැලි පර්මිට් තිබෙන 75 දෙනෙක් අද මේ පාර්ලිමේන්තුවේ ඉන්නවා කියනවා; බාර් පර්මිට් තිබෙන 100 දෙනෙක් ඉන්නවා කියනවා; එතනෝල් ගෙන්වන 4 දෙනෙක් ඉන්නවා කියනවා; කුඩුකාරයෝ දෙදෙනෙක් ඉන්නවා කියනවා; රේස් බයි රේස්කාරයෝ එක්කෙනෙක් ඉන්නවා කියනවා. ඒ නිසා, අපි ගැන හඳුන්වලා දීලා තමයි කථාව පටන්ගන්න සිදු වෙලා තිබෙන්නේ.

විශේෂයෙන්ම, මේ ඉදිකිරීම් ක්ෂේත්‍රය ගැන කථා කිරීම මටත් අදාළ මාතෘකාවක්. මොකද, 2010 වසරේ දේශපාලනයට එන්න කලින් මටත් ඉදිකිරීම් සමාගමක් තිබුණා. ඒක ගරු දයා ගමගේ මැතිතුමාට තිබුණා වාගේ ලොකු ඉදිකිරීම් සමාගමක් නම් නොවෙයි. අවුරුදු 10ක් විතර ඉදිකිරීම් ක්ෂේත්‍රයේ නියැලිලා තමයි මම දේශපාලනයට ආවේ. ඒ වාගේම ඉදිකිරීම් ක්ෂේත්‍රයට එන්න කලින්, 1999 වසරේදී මම ගණිත ගුරුවරයකු වශයෙන් පත්වීමක් ලබලා, රජයේ පාසලක අවුරුදු දෙකක කාලයක් සේවය කර තිබෙනවා. මම වගකීමෙන් කියනවා, මට වැලි පර්මිට් නැති බව. ඊළඟට, මටවත්, මගේ හත්මුතු පරම්පරාවටවත් බාර් පර්මිට් තිබිලා නැහැ. ඒ වාගේම, අපි එතනෝල් ගෙන්වලාත් නැහැ; කුඩු ව්‍යාපාර කරලාත් නැහැ; race-by-race කරලාත් නැහැ. මේ ගරු සභාවේ කථා වුණු කිසිම ව්‍යාපාරයකට මම සම්බන්ධ වෙලා නැහැ. අද මේ පාර්ලිමේන්තුව දිහා ඒ වාගේ සැකයකින් තමයි ජනතාව බලන්නේ. ඒ නිසා තමයි, 2013 වසරේ ප්‍රථම වතාවට පාර්ලිමේන්තුවට පැමිණි වෙලාවේ මා ගැන හැඳින්වීමක් කළාට පසුව අද මා ගැන නැවත මතක් කර දුන්නේ.

ඉදිකිරීම් ක්ෂේත්‍රයේ කාලයක් නියැලුණු කෙනෙකු විධියට විශේෂයෙන්ම මම දන්නවා, එම ක්ෂේත්‍රයේ තිබෙන ගැටලු මොනවාද කියලා. ඉදිකිරීම් ක්ෂේත්‍රයේ සිටින කොන්ත්‍රාත්කරුවන්ගේ ගැටලු නිරාකරණය කරන්න, ඒවාට මැදිහත්වීම කරන්න, ඒ කාර්යභාරයට යම් ආයතනයක් යෙදවීම ගැන අපි සතුටු වෙනවා. ගොඩක් වෙලාවට, ඉදිකිරීම් ක්ෂේත්‍රයේ කොන්ත්‍රාත්කරුවාත්, උපදේශකයාත් අතර ගැටුම් ඇති වෙන හැටි අපි දකිනවා.

අපේ රජය කාලයේ, හලාවත මහ රෝහලේ ගොඩනැඟිලි දෙකක් හැදීමේ කටයුතු ආරම්භ කළා. මා නියෝජනය කරන බිංගිරිය ආසනයේත් විශාල පිරිසක් හලාවත මහ රෝහලට යනවා. නමුත් මේ අවස්ථාව වන විට හලාවත මහ රෝහලේ ඉදිකරමින් තිබූ ඒ ගොඩනැඟිලි දෙකෙහිම වැඩ කටයුතු නතර වෙලා තිබෙනවා. ඒකට හේතුව මොකක්ද කියලා මම සොයා බැලුවා. හලාවත මහ රෝහලේ කොන්ත්‍රාත්කරුවාත්, ඒ උපදේශක සමාගමත් අතර ඇති වූ මතභේදයක්, තාක්ෂණික ගැටලුවක් මුල්

කරගෙන තමයි අද ඒ වැඩ කටයුතු නතර වෙලා තිබෙන්නේ. කොන්ත්‍රාත් ක්ෂේත්‍රයේ මේ වාගේ ගැටලුවක් ඇති වුණාම, ඒවා නිරාකරණය කරන්න නිසි ආයතනයක් නැති බව අපි දන්නවා. ගොඩක් වෙලාවට arbitrationවලට යනවා. ඒවාට කාලයක් ගත වෙනවා. ඒවා සම්බන්ධයෙන් arbitrationවලට ගිහිල්ලා, විශාල වියදමක් දරලා, යම් කාලයක් ගත වෙලා තමයි ඒ කොන්ත්‍රාත්කරුවාගේ ගැටලුව නිරාකරණය වෙන්නේ. ඒ නිසා, රජය විසින් මේ වාගේ මැදිහත්කාර සමාගමක් ඇති කිරීම, කොන්ත්‍රාත් ක්ෂේත්‍රයේ ඉදිරි දියුණුවට වාගේම ගුණාත්මකභාවය වර්ධනයට හේතු වෙයි කියලා මම හිතනවා. මොකද, කොන්ත්‍රාත් ක්ෂේත්‍රය වැඩි වෙනවා කියන්නේ රටක දියුණුව වැඩි වෙනවා කියන එකයි.

පසුගිය කාලයේ විශාල ව්‍යාපෘති ගණනාවක් ආරම්භ කරන්න අපට පුළුවන් වුණා. විශේෂයෙන්ම අධිවේගී මාර්ග ගැන කථා කරනකොට, අපි පාලන බලය ගෙන ගිය අවුරුදු හතරහමාරක කාලය තුළ ඒ වෙනුවෙන් විශාල වැඩ කොටසක් කළා. ලංකා ඉතිහාසයේ ප්‍රථම වතාවට, දේශීය සමාගම් 13ක් අධිවේගී මාර්ග ප්‍රධාන කොන්ත්‍රාත්කරුවන් හැටියට පත් කරන්න අපට පුළුවන් වුණා. අධිවේගී මාර්ග කොන්ත්‍රාත් කරන්න පුළුවන්, ඒ සුදුසුකම් සපුරපු දේශීය සමාගම් 13ක් අද අපේ රටේ ඉන්නවා. ඔවුන්ට දේශීය සහ විදේශීය රටවල ටෙන්ඩර් සඳහා ඉදිරිපත් වෙන්න පුළුවන්. අපේ ආණ්ඩුව යටතේ තමයි ඔවුන්ට ඒ අවස්ථාව උදා කරන්න අවශ්‍ය වැඩ කටයුතු කළේ. අපි බලයට පත් වනතුරු අපේ රටේ හදපු අධිවේගී මාර්ගවල ප්‍රධාන කොන්ත්‍රාත්කරුවා විධියට වැඩ කළේ විදේශීය සමාගමක්. අපි පසුගිය අවුරුදු හතරහමාරේදී අපේ රටේ කොන්ත්‍රාත්කරුවන් 13 දෙනෙකු අධිවේගී මාර්ග ඉදිකරන්න පුළුවන් තත්ත්වයට ගෙනාවා. මම මේ ගැන කියන කොටම ගරු ලක්ෂ්මන් කිරිඇල්ල මැතිතුමා ගරු සභාවට එනවා. එතුමාගේ කාලයේදී තමයි මේ අධිවේගී මාර්ගවල කොන්ත්‍රාත් කටයුතු දේශීය සමාගම්වලට දෙන්න කටයුතු කළේ. ඒ ගෞරවය එතුමාටත්, අපේ ආණ්ඩුවටත් තිබෙනවා. ඒ නිසා අපි රටක් විධියට දියුණු වෙන්න නම්, අපේ කොන්ත්‍රාත් ක්ෂේත්‍රය තුළ ජාත්‍යන්තර මට්ටමේ ඉදිකිරීම් සමාගම් ඇති වෙන්න ඕනෑ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට අයත්ව තිබූ ඉදිකිරීම් සමාගම ජලවිදුලි බලාගාර ඉදිකිරීම් කටයුතු තමයි කළේ. අද අපේ රටේ සමාගම් උගන්ඩාවට ගිහිල්ලා ජලවිදුලි බලාගාර හදනවා. ඒ වාගේම අප්‍රිකානු රටවලත් ජල විදුලි බලාගාර හදනවා. එල්ටීඑල් සමාගම බංග්ලාදේශයේ විශාල ඉදිකිරීම්වලට අද මැදිහත්වෙලා තිබෙනවා. අද ජාත්‍යන්තර වශයෙන් ඉදිකිරීම් ක්ෂේත්‍රයට පිවිසුණු අපේ සමාගම් ගණනාවක් තිබෙනවා. කොන්ත්‍රාත් ක්ෂේත්‍රය දියුණු කරනවා කියන්නේ, දේශීය කොන්ත්‍රාත් විතරක් දියුණු කරන එක නොවෙයි. තරගකාරී මිල ගණන් මත පදනම් වෙලා විදේශීය කොන්ත්‍රාත්වලට ඇතුළු වෙන්න, මිල ගණන් ඉදිරිපත් කරලා තරග කරන්න අවස්ථාව ඔවුන්ට උදා කර දෙන්න ඕනෑ. එම නිසා තමයි කොන්ත්‍රාත් ක්ෂේත්‍රය දියුණු කරන්න ඕනෑ. එය මේ රටේ අපනයන ආදායම වැඩි කරන්න පුළුවන් ක්ෂේත්‍රයක් විධියට දියුණු කරන්න පුළුවන්. විශේෂයෙන්ම එය ඉලක්ක කරගෙන තමයි ජාත්‍යන්තර කොන්ත්‍රාත්කරුවන් නිර්මාණය කරන්න අවශ්‍ය වැඩ පිළිවෙළ නිර්මාණය කරන්න අවුරුදු හතරක, හතරහමාරක කාලය තුළ යම් සහයෝගයක් දෙන්න අපට පුළුවන් වුණේ. ඒ වාගේම, මේ ක්ෂේත්‍රයේ දියුණුවට තව බොහෝ දේවල් කරන්න වෙයි.

යම් යම් කාලවල බැංකුවලින් ලැබෙන සහයෝගය මදිකම නිසා, ඒ වාගේම පොලිය වැඩිවීම නිසා කොන්ත්‍රාත් සමාගම් ඇද වැටුණු අවස්ථා තිබෙනවා. එවැනි අපහසු අවස්ථාවල, CRIB එකට ගිය සමාගම්වලට යම් ශක්තියක් වශයෙන් යම් කාල වකවානුවක් දීලා ඔවුන්ට නැවත නැඟී සිටින්න පුළුවන් විධියට කටයුතු කිරීම වැදගත් කියලා රජයක් විධියට යෝජනා කරන්න පුළුවන්. දිගින් දිගටම අසාර්ථක වූ සමාගම් අපි ඕනෑ තරම් දැකලා තිබෙනවා. තමන්ගේ capacity එකට වඩා වැඩ අරගෙන අසාර්ථක වූ සමාගම් තිබෙනවා. මට ඒ සඳහා උදාහරණයක් කියන්න පුළුවන්. අපේ කුරුණෑගල දිස්ත්‍රික්කයේ ඒකාබද්ධ මාර්ග ව්‍යාපෘතිය - iRoad ව්‍යාපෘතිය - ගත්තොත්, ගල්ගමුව, යාපහුව, නිකවැරටිය වාගේ ආසනවල කොන්ත්‍රාත් භාරගත් සමාගම් එම කොන්ත්‍රාත් දාලා ගියා. ඔවුන්, ඔවුන්ගේ capacity එකට වඩා එහාට ගිහිල්ලා කොන්ත්‍රාත් අරගත්තා. ඒ නිසා රටේ ජනතාව අපහසුතාවට ලක් වූ අවස්ථාත් තිබෙනවා. ඒ සඳහා අපට නිසි විසඳුමක් සොයා ගන්න පුළුවන් වුණොත්, ඒ හැම ක්ෂේත්‍රයක් සඳහාම අවධානය යොමු කරන්න, හැම ගැටලුවක් ගැනම අවධානය යොමු කරන්න පුළුවන් වෙයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඊළඟට අපේ රටේ වර්තමාන තත්ත්වය ගැනත් කථා කරන්න ඕනෑ. අපි දන්නවා, ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා ජනාධිපති කරන්න මේ රටේ ලක්ෂ 69ක් දෙනා ඡන්දය දුන් බව. එතුමාට විරුද්ධව තවත් ලක්ෂ 56ක් ඡන්දය දුන්නා. හැබැයි, ඒ ලක්ෂ 69ත්, ලක්ෂ 56ත් අද බලාපොරොත්තු වෙනවා, ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා මැතිවරණ ව්‍යාපාරයේදී දුන් පොරොන්දු ඉෂ්ට කරයි කියලා. VAT එක අඩු කළා කිව්වාට, ඒ VAT එක අඩු කිරීමේ සහනය පහළ මධ්‍යම පාන්තිකයන්ට, දුප්පත් මිනිසුන්ට ලැබී තිබෙනවාද කියලා, බඩු මිල අඩුවෙලා තිබෙනවාද කියලා බලන්න. මිනිස්සු හිතුවා, VAT එක අඩු වෙද්දී බඩු මිල අඩුවෙයි කියලා. නමුත්, අද එහෙම වෙලා නැහැ. එම නිසා, VAT එකේ ප්‍රතිලාභය කොහේටද ගියේ කියන එක මේ ආණ්ඩුවෙන් හෙළි කළ යුතුයි කියලා අපි පැහැදිලිවම කියනවා. VAT එක අඩු කිරීම නිසා රටේ බදු ආදායමින් රුපියල් බිලියන 500කට ආසන්න ප්‍රමාණයක් අඩුවෙලා තිබෙනවා. ඒ බදු ආදායම තිබුණා නම්, ඒවා යෙදවෙන්නේ රටේ සංවර්ධනයට. අද සංවර්ධනයට සල්ලි නැහැ කියන එක අපි පැහැදිලිවම දන්නවා. අපි පටන් ගත් ව්‍යාපෘති ගණනාවක් මේ වන විට නතරවෙලා තිබෙනවා.

දැන් මම කනගාටු වෙනවා, මගේ දිස්ත්‍රික්කයේ පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු වන ගරු ටී.බී. ඒකනායක මැතිතුමා කළ ප්‍රකාශයක් ගැන. මම 2019 මාර්තු මාසයේ අක්කර 450කට ආසන්න භූමියක් තුළ ආරම්භ කළ බිංගිරිය අපනයන සැකසුම් කලාපයේ මාර්ග ඉදිකිරීම් වාගේ යටිතල පහසුකම් පටන් අරගෙන තිබුණා. ඒ වාගේම ජල නළ එළීම පටන් අරගෙන තිබුණා. විදුලිය ලබා දීමේ කටයුතුවලින් සියයට 90ක් අවසන් වෙලා තිබුණා. අද ඒ මාර්ග සංවර්ධන ව්‍යාපෘතිය නතරවෙලා තිබෙනවා. මම දන්නවා, සල්ලි නැතුව නොවෙයි ඒක නතර වෙලා තිබෙන්නේ කියලා. මොකද, අපි ඒ සඳහා අවශ්‍ය සල්ලි සියල්ලම වෙන් කරලා තිබුණේ. අද ඒ ව්‍යාපෘතිය ඉස්සරහට අරගෙන යන්න කෙනෙක් නැහැ. ඒවා ඉස්සරහට තල්ලු කරගෙන යන්න කෙනෙක් නැහැ. ඒවාට විරුද්ධව කථා කරන අය තමයි අද ඉන්නේ. ඒ අක්කර 450 තුළ පොල් ගස් ලක්ෂ ගණනක් කපලා තිබෙනවා කියලා එතුමා කිව්වා. ජාතික පශු සම්පත් සංවර්ධන මණ්ඩලයට අයත් අක්කර 450ක් තමයි අපි ගත්තේ. අද ඒ ඉඩම ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය සතුව තිබෙනවා. රජයේ තක්සේරුව ගෙවලා තමයි අපි ඒ ඉඩම ගත්තේ.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තව විනාඩි දෙකක කාලයක් තිබෙනවා.

**ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා**
(மாண்புமிகு நலின் பண்டார ஜயமஹ)
(The Hon. Nalin Bandara Jayamaha)
ගරු ආශු මාරසිංහ මන්ත්‍රීතුමාගේ කාලයත් මට ලබා දුන්නා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඔබතුමා ඒ කාලයත් අරගෙන තිබෙන්නේ.

**ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා**
(மாண்புமிகு நலின் பண்டார ஜயமஹ)
(The Hon. Nalin Bandara Jayamaha)
බිංගිරිය අපනයන සැකසුම් කලාපයේ අනාගතය පිළිබඳව කටයුතු කිරීම මේ රජයේ වග කීමක්. අපි සමාගම් 6ක් සමඟ ඇමෙරිකානු ඩොලර් මිලියන 64ක ගිවිසුම් අත්සන් කරලා තිබෙනවා. එක සමාගමක් දැනට ඒ භූමියේ ඉදිකිරීම් පටන් අරගෙන, මේ වන විට ඔවුන්ගේ වැඩවලින් සියයට 20ක්, 25ක් ඉවර කරලා තිබෙනවා. තව සමාගමක් පස් පරීක්ෂණ කටයුතු සිදු කරනවා. බිංගිරිය අපනයන සැකසුම් කලාපය කියන්නේ, එම ප්‍රදේශය තුළ රැකියා විශාල ප්‍රමාණයක් බිහි වන කර්මාන්ත පුරවරයක්. මාර්ග පද්ධතිය, විදුලිය, ජලය ලබා දෙන්න අවශ්‍ය කටයුතු අපි කරලා තිබෙනවා. එම ව්‍යාපෘතියේ පළමුවැනි අදියර ලෙස බිංගිරිය ජල ව්‍යාපෘතියෙන් දවසකට ජලය කියුබික් මීටර් 2,000ක් ලබා ගන්නවා. ඊට අමතරව හංගේරියානු ණය යෝජනා ක්‍රමය යටතේ මාඔය ව්‍යාපෘතියෙන් තවත් ජලය කියුබික් මීටර් 10,000ක් ලබා ගන්න අවශ්‍ය ජාත්‍යන්තර ටෙන්ඩර් කැඳවීම කරලා තිබෙනවා. ඒ සමහර කටයුතු පරක්කු වෙන නිසා ඒවා රටේ ජනතාවට පෙනෙන්න ඉදි කරන්න විධියක් නැහැ. හැබැයි, අවශ්‍ය කටයුතු සියල්ල කරලා තිබෙන්නේ. බිංගිරිය ප්‍රදේශයට විතරක් නොවෙයි, වයඹ පළාතට, කුරුණෑගල දිස්ත්‍රික්කයට, ඒ කලාපයටම තිබෙන, අවුරුදු 14කින් පසුව හැදුණු අපනයන කලාපය තමයි බිංගිරිය අපනයන කලාපය. අද ඒ ව්‍යාපෘතිය අකර්මණ්‍ය වෙලා තිබෙනවා. මම දන්නා විධියට එහි කටයුතු ඇණ හිටින්න විධියක් නැහැ. එය ඇණ හිටින විධියට කටයුතු කරන්න කාටවත් බැහැ. එයට විරුද්ධව කථා කරපු අයටත් ඒ කටයුතු ඉස්සරහට අරගෙන යන්න සිද්ධ වෙනවා. මොකද, ඒක සාර්ථක ව්‍යාපෘතියක් නිසා. මේක තමයි අවුරුදු ගණනාවකින් පස්සේ අපේ රටට හැදුණු අපනයන සැකසුම් කලාපය. නමුත් අද එය අකර්මණ්‍ය වෙලා තිබෙනවා. මම ඒ කාලයේ දවස ගානේ මේ නිලධාරින්ට කථා කළා. මොකද, මම නියෝජ්‍ය ඇමතිවරයා විධියට හිටපු කාලයේ ඒ පුටුවේ ඉඳගෙන මේ කටයුතු තල්ලු කරගෙන ගියා. එවකට සිටි ගරු අගමැතිතුමාගේ සහ ගරු මලික් සමරවික්‍රම ඇමතිතුමාගේ සහයෝගය මට ඒ වෙලාවේ ලැබුණා. අද මේ ව්‍යාපෘතිය ඉස්සරහට අරගෙන යන්න කෙනෙක් නැහැ. රජය බාර ගන්න කොට තිබුණු සාර්ථක ව්‍යාපෘති ඉස්සරහට අරගෙන යන්න ඕනෑ. පැලියගොඩ සිට එද්දී අධිවේගී මාර්ගයේ කුලුනු මතින් කොළඹ කොටුවට දිවෙන අධිවේගී මාර්ගයක් පටන් අරගෙන තිබෙන බව අපි දන්නවා. සමහරු අහනවා, මොනවාද කළේ කියලා. අපේ ගම්වල "ගම්පෙරළිය" වැඩසටහන යටතේ අපි කෝටි ගණනක වැඩ කළා. අද ඒවායේ ගෙවීම් කරන්න මේ රජයට බැරි වෙලා තිබෙනවා. අභිංසක ගොවි සංවිධාන, වැඩිහිටි සමිති තමයි මේවායේ කොන්ත්‍රාත් බාරව කටයුතු කළේ. ඒ වැඩිහිටි සමිති, ගොවි සංවිධාන අද ණයකරුවන් බවට පත්වෙලා තිබෙනවා. ඒ කොන්ත්‍රාත් කරපු මිනිසුන් අද ණයකරුවන් බවට පත්වෙලා තිබෙනවා. "ගම්පෙරළිය" වැඩසටහනින් සල්ලි විශාල ප්‍රමාණයක් ගමට ගෙන එන්න අපි කටයුතු කළා. අද ඒ මිනිසුන්ට සල්ලි ගෙවන්න විධියක් මේ රජයට නැහැ. මොකද, රජයේ බදු ආදායම් ඔබතුමන්ලා නැති කරගෙන තිබෙන නිසා. ඒ නිසා පැහැදිලිව අපි ගෝඨාභය රාජපක්ෂ මහත්මයාට කියනවා, මේ කරගෙන ආපු වැඩ ඉස්සරහට අරගෙන යන එක තමයි ඔබතුමන්ලාගේ යුතුකම කියලා. ඒ වාගේම ඔබතුමන්ලා දුන්නු පොරොන්දු ඉෂ්ට කිරීමත් ඔබතුමන්ලාගේ යුතුකමක්. ඔබතුමන්ලා ජනතාවට දෙනවා කිව්ව සහන කෝ?

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමා දැන් කථාව අවසන් කරන්න.

**ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා**
(மாண்புமிகு நலின் பண்டார ஜயமஹ)
(The Hon. Nalin Bandara Jayamaha)
මට විනාඩියක් දෙන්න, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

දැන් මට ආරංචියි 15,000කගේ විතර pension එක අහිමි කරන්න අවශ්‍ය තීන්දු තීරණ ඊයේ-පෙරේදා මේ රජය ගත්තා කියලා. මේ වාගේ කප්පාදුවක් තමයි අද සිද්ධ වෙන්නේ. අද වැටුප් කප්පාදු කරනවා, pension කප්පාදු කරනවා, සහන කප්පාදු කරනවා, මිනිස්සු රස්සාවෙන් එළියට දානවා. මේවාට නොවෙයි මිනිස්සු ගෝඨාභය රාජපක්ෂ මහත්මයාට ඡන්දය දුන්නේ. ඒ නිසා අපි පැහැදිලිවම කියනවා, මේ මාසය, දෙක ඇතුළත ශක්තිමත්ව ඉස්සරහට ඇවිල්ලා මේ මැතිවරණ ජයග්‍රහණය වෙනුවෙන් අවශ්‍ය කටයුතු අපි කරනවා කියලා. අපට 113 plus ඉලක්කයට යන්න පුළුවන් ශක්තිමත් වැඩ පිළිවෙළක් විපක්ෂයක් විධියට තිබෙනවා. අපිත් එක්ක විශාල පිරිසක් ඉන්නවා. අපිත් එක්ක අපේ පැත්තේ අය විතරක් නොවෙයි, අද මේ ආණ්ඩුවේ ඉන්න සමහරුත් අපිත් එක්ක කථා කරමින් ඉන්නවා, "මේ කට්ටියත් එක්ක යන වැඩ පිළිවෙළ හොඳ නැහැ, ඔබතුමන්ලාත් එක්ක එකතු වෙන්න සූදානම්." කියලා. වෘත්තිකයන්, සිවිල් සංවිධාන, ක්‍රීඩකයන්, ප්‍රසිද්ධ ව්‍යාපාරිකයන්, අපිත් එක්ක එකතු වෙන්න අවශ්‍ය කටයුතු කරන්න සූදානමින් ඉන්නවා. ඒ නිසා මම විශ්වාස කරනවා, වැටුණු තැනින් නැවතත් නැගිටලා 113 ඉක්මවා යන ඉලක්කයට මේ මාස දෙක ඇතුළත අපට යන්න පුළුවන් වෙයි කියලා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට කාලය ලබාදීම සම්බන්ධයෙන් ඔබතුමාට බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
මීළඟට, ගරු ජේ.සී. අලවතුවල මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 7ක කාලයක් තිබෙනවා.

ඊට පෙර කවුරුන් හෝ ගරු මන්ත්‍රීවරයෙක් ගරු ක. තුරෙයිරෙත්නසිංහම් මන්ත්‍රීතුමාගේ නම මූලාසනය සඳහා යෝජනා කරන ලෙස ඉල්ලා සිටිනවා.

**ගරු මහින්ද යාපා අබේවර්ධන මහතා (වාරිමාර්ග සහ ග්‍රාමීය සංවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு மஹிந்த யாப்பா அபேவர்தன - நீர்ப்பாசன மற்றும் கிராமிய அபிவிருத்தி இராஜாங்க அமைச்சர்)
(The Hon. Mahinda Yapa Abeywardena - State Minister of Irrigation and Rural Development)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, "ගරු ක. තුරෙයිරෙත්නසිංහම් මහතා දැන් මූලාසනය ගත යුතුය"යි මා යෝජනා කරනවා.

**ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා**
(மாண்புமிகு நலின் பண்டார ஜயமஹ)
(The Hon. Nalin Bandara Jayamaha)

***විසින් ස්ථිර කරන ලදී.***
*ஆமோதித்தார்.*
*Seconded.*

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***අනතුරුව ගරු හේෂා විතානගේ මහතා මූලාසනයෙන් ඉවත් වුයෙන්, ගරු ක. තුරෙයිරෙත්නසිංහම් මහතා මූලාසනාරූඪ විය.***

*அதன்பிறகு, மாண்புமிகு ஹேசா விதானகே அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு க. துரைரெட்ணசிங்கம் அவர்கள் தலைமை வகித்தார்கள்.*

*Whereupon* THE HON. HESHA WITHANAGE *left the Chair, and* THE HON. K. THURAIRETNASINGAM *took the Chair.*

[අ.භා. 525]

**ගරු ජේ.සී. අලවතුවල මහතා**
(மாண்புமிகு ஜே.சீ. அலவத்துவல)
(The Hon. J.C. Alawathuwala)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඉදිකිරීම් ක්ෂේත්‍රයට සම්බන්ධ මේ විවාදයේදී වැදගත් කරුණු ගණනාවක් ඉදිරිපත් කරන්න තිබෙනවා. වර්තමාන රජය බලයට පත් වෙලා දැන් මාස දෙකක් ඉක්ම ගොස් තිබෙනවා. පසුගිය රජය මගින් ඉදිකිරීම් ක්ෂේත්‍රයේ ක්‍රියාත්මක කරපු වැඩ ගණනාවකට මේ වන විට මුදල් ගෙවීම් කරලා නැහැ. දෙසැම්බර් මාසයේ 31වැනි දායින් අවසන් වුණු වැඩවලට තවම ගෙවීම් කරලා නැහැ. දැන් ජනවාරි මාසයේත් අගට ඇවිල්ලා තිබෙනවා. නමුත්, මේ රජය තවම අපොහොසත් වෙලා තිබෙනවා ඒවාට මුදල් ගෙවන්න.

"ගම්පෙරළිය" ව්‍යාපෘතිය කුරුණෑගල දිස්ත්‍රික්කය තුළ අප ක්‍රියාත්මක කළා. අපි යෝජනා අනුමත කරලා ව්‍යාපෘති 7,592ක වැඩ ආරම්භ කළා. සමහර ඒවා ශිවිසුම්ගත කරලා තිබුණා. එතැනින් ව්‍යාපෘති 6,782ක වැඩ නොවැම්බර් මාසය වෙනකොට අවසන් කරන්න පුළුවන් වෙලා තිබෙනවා. මොකද, නොවැම්බර් මාසයේ පැවැති ජනාධිපතිවරණය නිසා ආරම්භ නොකරපු සමහර ව්‍යාපෘති නතර කරන්න සිද්ධ වුණා. චක්‍රලේඛ මඟින් ඒවා නවත්වා තිබෙනවා. කුරුණෑගල දිස්ත්‍රික්කයේ පසුගිය නොවැම්බර් මාසයේ 16වැනි දාට ඉස්සෙල්ලා අවසන් කළ ව්‍යාපෘති 6,782කට ඒ වකවානුවේ ගෙවපු මුදල්වලට අමතරව ඉතාම සුළු ප්‍රමාණයක් තමයි ගෙවන්න තිබෙන්නේ. නමුත් වර්තමාන රජය අපොහොසත් වෙලා තිබෙනවා, මේ කොන්ත්‍රාත්කරුවන්, එහෙම නැත්නම් සමිති සමාගම් හරහා ක්‍රියාත්මක කරපු මේ වැඩවලට මේ මාස දෙක ඇතුළත මුදල් ගෙවන්න. මේක ඉතාම අවාසනාවන්ත තත්ත්වයක්. ඒ නිසා අපි මේ රජයට කියනවා, වැඩ අවසන් කරලා තිබෙන මේ ව්‍යාපෘතිවලට ඉතාම ඉක්මනින් ඒ ප්‍රතිපාදන, මුදල් ලබා දීමට අවශ්‍ය කටයුතු කරන්න කියලා. කුරුණෑගල දිස්ත්‍රික්කයේ විතරක් නොවෙයි, ලංකාව පුරාම තිබෙන දිස්ත්‍රික්ක 25 තුළම මේක තමයි තිබෙන තත්ත්වය. "ගම්පෙරළිය" ව්‍යාපෘති ලක්ෂයකට ආසන්න ප්‍රමාණයක් ක්‍රියාත්මක වුණා. ඒ වාගේම, පෞද්ගලිකව තමන්ගේ නිවාසය හදා ගන්න, වහලය සෙවිලි කර ගන්න ලබා දුන්නු ව්‍යාපෘතිත් මේ අතර තිබෙනවා. අද ඒ අය ණය වෙලා තිබෙනවා. තමන්ගේ බැරිකම නිසා, තමන්ගේ ආර්ථික තත්ත්වය නිසා තමයි නිවස සාදා ගැනීමට මේ ආධාරය ලබා දුන්නේ. එහෙම හදාගත්ත නිවසට රජයෙන් ලබා දෙනවාය කියපු මුදල ලබා දෙන්නේ නැති නිසා දැන් ඔවුන් ඉතා අපහසු තත්ත්වයකට පත් වී සිටිනවා. මේ තත්ත්වය පවතින්නේ කුරුණෑගල දිස්ත්‍රික්කයේ විතරක් නොවෙයි. ලංකාව පුරාම මේ තත්ත්වය උදා වෙලා තිබෙනවා. "ගම්පෙරළිය" වැඩසටහනේ ක්‍රියාත්මක ව්‍යාපෘති වාගේම පෞද්ගලිකව නිවාස හදාගත් අයටත් ඒ තත්ත්වය ඇති වෙලා තිබෙනවා. ඒ නිසා සාර්ථකව වැඩ නිම වුණු සියලු ව්‍යාපෘතිවලට අදාළ මුදල් දිස්ත්‍රික් ලේකම්තුමන්ලාට යවලා, ප්‍රාදේශීය ලේකම්ලා හරහා ඉතාම ඉක්මනින් ගෙවීමට කටයුතු කරන්න කියා අපි රජයට මතක් කරන්න කැමතියි.

ඊට අමතරව ආර්ථික කටයුතු අමාත්‍යාංශය හරහා ක්‍රියාත්මක වූ ව්‍යාපෘතිත් තිබෙනවා. උදාහරණයක් වශයෙන් කිව්වොත්, මම කුරුණෑගල දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවේ සභාපතිවරයා හැටියට සිටි කාලයේ කුරුණෑගල දිස්ත්‍රික්කය තුළ ව්‍යාපෘති ක්‍රියාත්මක වුණා. මේ වන විට වැඩ අවසන් කර ඇති "ගම්පෙරළිය" ව්‍යාපෘතිවලට සහ අනෙකුත් ව්‍යාපෘතිවලට රුපියල් බිලියන දෙකකට ආසන්න මුදලක් ගෙවීමට තිබෙනවා. ඒ කියන්නේ රුපියල් මිලියන 1,984ක් වැනි විශාල මුදලක් කුරුණෑගල දිස්ත්‍රික්කයේ විතරක් ගෙවන්න තිබෙනවා. කුරුණෑගල කියන්නේ විශාල දිස්ත්‍රික්කයක්. මම හිතන විධියට අනෙකුත් දිස්ත්‍රික්කවලත් වැඩ අවසන් වූ සංවර්ධන ව්‍යාපෘති වෙනුවෙන් මෙවැනි විශාල මුදලක් ගෙවීමට තිබෙනවා. මේ නිසා අද ඉදිකිරීම් ක්ෂේත්‍රයේ විශාල කඩා වැටීමක් ඇති වීගෙන යනවා.

මීරිගම - කුරුණෑගල අධිවේගී මාර්ගය පිළිබඳවත් සඳහන් කරන්න ඕනෑ. එම අධිවේගී මාර්ගයේ වැඩ කටයුතු ඉතා ඉක්මනින් අවසන් වෙමින් යනවා. ඒ පිළිබඳව අපේ කිරිඇල්ල මැතිතුමාට අපි ස්තුතිවන්ත වෙනවා. එතුමාගේ කාලයේයි ඒ ව්‍යාපෘතිය ආරම්භ කළේ. දේශීය කොන්ත්‍රාත්කරුවන් දහහතර දෙනෙකුට තමයි මේ අධිවේගී මාර්ගයේ කොන්ත්‍රාත්තුව ලබා දීලා තිබුණේ. මේ දේශීය සමාගම්, විදේශීය සමාගම්වලටත් වඩා හොඳ තත්ත්වයෙන් අපි බලාපොරොත්තු වුණාටත් වඩා ඉක්මනින් සහ සාර්ථකව මෙම මාර්ගයේ වැඩ කටයුතු ක්‍රියාත්මක කරගෙන යනවා. ඒ පිළිබඳව අපි සතුට ප්‍රකාශ කරනවා. ඒ වාගේම මෙය දේශීය කොන්ත්‍රාත්කරුවන්ට විශාල අත්දැකීමක්. මේ අය මීට කලින් කොන්ත්‍රාත් අරගෙන මේ වැඩ කරපු අය. අද වන විට මෙම කොන්ත්‍රාත්කරුවන් මෙම ව්‍යාපෘතිය තුළින් විශාල අත්දැකීමක් ලබාගෙන, දකුණු ආසියානු කලාපය තුළ මෙවැනි විශාල කොන්ත්‍රාත් ක්‍රියාත්මක කිරීම සඳහා සුදුසුකම් ලබා තිබෙනවා. ඒකත් අපි මේ අවස්ථාවේ සතුටින් මතක් කරන්නට ඕනෑ.

පසුගිය කාලය තුළත්, වර්තමානයේත් ඉදිකිරීම් ක්ෂේත්‍රය ඉතාම අවාසනාවන්ත තත්ත්වයකට ඇවිත් තිබෙනවා. මොකද, වැඩ නිම කරලා විශාල කාලයක් ගත වී තිබුණත්, ඒ අයට ගෙවීම් කරලා නැහැ. කුඩා කොන්ත්‍රාත්කරුවන් සහ සමිති සමාගම් විසින් විමධ්‍යගත අරමුදල්වලින් සිදු කරන ලද සමහර ඉදිකිරීම්වලට තවම ගෙවීම් කරලා නැහැ. ඒ වාගේම "ගම්පෙරළිය" ව්‍යාපෘතිය යටතේ රුපියල් ලක්ෂ 10 ව්‍යාපෘති, රුපියල් ලක්ෂ 5 ව්‍යාපෘති ක්‍රියාත්මක වුණා. විහාරස්ථාන, මාර්ග, වැව් අමුණු ආශ්‍රිතව ක්‍රියාත්මක වූ ඉතා කුඩා ව්‍යාපෘතිවලටත් මුදල් නොගෙවීම නිසා ඒ සමිති සමාගම් සහ කොන්ත්‍රාත්කරුවන් දැඩි අපහසු තත්ත්වයකට පත් වී සිටින බව මේ වේලාවේ මතක් කරන්නට ඕනෑ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ තත්ත්වය තුළ අද වන විට ඉදිකිරීම් ක්ෂේත්‍රයේ පමණක් නොවෙයි, හැම ක්ෂේත්‍රයකම කඩා වැටීම් ගණනාවක් ඇති වෙලා තිබෙනවා. වෙනදා නම් අපි ඇහුවේ රත්‍රන් බඩු කඩ හොරෙක් කැඩුවා කියලායි. අද බඩු මිල සම්බන්ධයෙන් කථා කරද්දී, අපට අහන්න ලැබෙන්නේ එළවලු කඩ කඩලා, එහෙම නැත්නම් ග්‍රොසරි කඩලා කියලායි. රතු ළූනු තමයි හොරෙන් අරගෙන යන්නේ. එවැනි තත්ත්වයකට අද මේ රට පත් වෙලා තිබෙනවාය කියන එක මතක් කරන්නට ඕනෑ. වර්තමානයේ ශක්තිමත් විපක්ෂයක් ලෙස කටයුතු කරමින්, ඉදිරි මහා මැතිවරණයේදී 113ට වඩා වැඩි මන්ත්‍රීන් සංඛ්‍යාවක් ලබා දීමට කටයුතු කරන්න කියා ජනතාවට මතක් කරමින්, මට කාලය ලබා දීම වෙනුවෙන් ඔබතුමාට ස්තුතිවන්ත වෙමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
මීළඟට, ගරු දයා ගමගේ මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි හතක කාලයක් තිබෙනවා.

[අ.භා. 5.32]

**ගරු දයා ගමගේ මහතා**
(மாண்புமிகு தயா கமகே)
(The Hon. Daya Gamage)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, සජිත් ප්‍රේමදාස මැතිතුමා නිවාස, ඉදිකිරීම් ඇමතිවරයා හැටියට සිටි කාලයේ තමයි මෙම පනත යටතේ නියෝග ඉදිරිපත් කළේ.

[ගරු දයා ගමගේ මහතා]

විශේෂයෙන්ම ඉදිකිරීම් සම්බන්ධව පවතින ආරාවුල් විසඳීම යටතේ තීරකවරුන් තෝරා ගැනීම, ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන අභියාචනා කාර්ය පටිපාටි නියෝග වශයෙන් හඳුනා ගැනීම, ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන තොරතුරු ලේකම් කාර්යාලයේ නියෝග සම්බන්ධවත් කටයුතු කිරීම සඳහා තමයි මේ පනත සකස් කරලා තිබෙන්නේ. ඇත්ත වශයෙන්ම ඉදිකිරීම් කර්මාන්තය ගත්තොත්, මේක රටේ සංවර්ධනයට විශාල දායකත්වයක් ලබා දෙන්නට පුළුවන් කර්මාන්තයක්. ඕනෑම රටක ආර්ථිකය දියුණු වනවා නම්, ආර්ථිකය දියුණු කරන්නට අවශ්‍යතාවක් තිබෙනවා නම්, ඒ ආණ්ඩුව ඉදිකිරීම් කර්මාන්තය වෙනුවෙන් අනිවාර්යයෙන්ම අවධානය යොමු කරන්නට අවශ්‍යයි.

මීට අවුරුදු 25කට විතර පෙර චීනය වාගේ රටවලට ගියාම අපි දැක්කා, ඒ රටවල ඇත ගම්වලට යන්න කොයි තරම් දුෂ්කරතාවක් තිබුණාද කියලා. නමුත් ඒ රටවල අධිවේගී මාර්ග හදලා, විශාල සංවර්ධනයක් ඇති වීම නිසා අනිකුත් සියලු කර්මාන්ත දියුණු වුණා. අද මුළු ලෝකයටම සියලු නිෂ්පාදන චීනයෙන් නිපදවන තත්ත්වයකට පත් වෙලා තිබෙනවා. මේකට ප්‍රධානම හේතුව තමයි අධිවේගී මාර්ග ඉදිකිරීම. 1994 ඉඳලා 2015 වන තුරුම අධිවේගී මාර්ග කිලෝමීටර් 178ක් තමයි අපේ රටේ හදලා තිබුණේ.

විශේෂයෙන්ම හිටපු ලක්ෂ්මන් කිරිඇල්ල ඇමතිතුමාට මා මේ අවස්ථාවේදී මගේ ගෞරවය පුද කරන්නට අවශ්‍යයි. මොකද, එතුමා කොළඹ - මහනුවර අධිවේගී මාර්ගය ඉතාම කඩිනම් වැඩ පිළිවෙළක් හැටියට දේශීය කොන්ත්‍රාත්කරුවන්ට දෙන්නට ඉල්ලීමක් කරලා, ඒ ව්‍යාපෘතිය පටන් ගත්තා. ඒ ව්‍යාපෘතිය අපේ ලංකාවේ මුදල්වලින් කළේ. ඒ වාගේම දේශීය ඉදිකිරීම් කොන්ත්‍රාත්කරුවන් තමයි ඒ කටයුතු කළේ.

ඉදිකිරීම් අංශය ගැන කථා කරන කොට මා මේ කාරණයත් කියන්න කැමතියි. 1994දී මා ව්‍යවසායකයකු හැටියට තමයි ඉදිකිරීම් අංශයට පිවිසුණේ. 1992දී ප්‍රථම ලෝක බැංකු ව්‍යාපෘතිය මා පටන් ගත්ත ලංකාවේ Daya Constructions (Pvt.) Limited එකට තමයි ලැබුණේ. ඊට පස්සේ ප්‍රථම ආසියානු සංවර්ධන බැංකු ව්‍යාපෘතියත් දේශීය කොන්ත්‍රාත්කරුවකු හැටියට Daya Constructions (Pvt.) Limited එකට තමයි ලැබුණේ. ඉදිකිරීම් අංශයේ හිටපු නිසා මා දන්නවා, ඉදිකිරීම් අංශය තුළින් අපේ රටේ සංවර්ධනයට කොයි තරම් දායකත්වයක් ලබා දෙන්න පුළුවන්ද කියලා. නමුත් අපේ රටේ තිබුණු හැම ආණ්ඩුවක්ම මේ ගැන නියම අවධානයක් යොමු කළේ නැහැ කියා මා හිතනවා. මොකද, ඉදිකිරීම් කර්මාන්තකරුවකු ඉන්නවා නම් ඒ කර්මාන්තකරුවාට දිගටම වැඩ තිබෙන්න අවශ්‍යයි. මොකද, විශාල ව්‍යාපෘතියක් කරනවා නම් ඒකට අවශ්‍ය machinery ගන්න විශාල ආයෝජනයක් කරන්න ඕනෑ. ඒ ආයෝජනය පියවා ගන්න නම් දිගටම වැඩ තිබෙන්න ඕනෑ. එහෙම වුණොත් තමයි එහි සංවර්ධනයට ඉදිකිරීම් කර්මාන්තකරුවා තුළින් ඉතා හොඳ මිලක් ලබා ගන්න පුළුවන් වන්නේ. අපේ කිසිම රජයක් මේ කටයුත්ත හරියට කළේ නැහැ කියා මා හිතනවා. ඒකේ ප්‍රතිඵලයක් හැටියට අද raw materials ගෙනෙන්න අපි විශාල වශයෙන් මුදල් පිට රටට දෙනවා. මේ සඳහා අවශ්‍ය කරන අමුද්‍රව්‍ය නිෂ්පාදනය කිරීම සඳහා අපේ රටේ තිබෙන නීති ගොඩක් ලිහිල් කරන්නට අවශ්‍යයි. ඒ වාගේම කොන්ත්‍රාත්කරුවන්ට නියමිත වෙලාවට මුදල් ගෙවන්න අවශ්‍යයි. මම හිතනවා, අපේ රජයෙන් පටන් ගත් ව්‍යාපෘති සියල්ල මේ වෙනකොට අවසන් කරලා, අම්පාර දිස්ත්‍රික්කයේ විතරක් දැනට රුපියල් දශලක්ෂ පන්සිය පණස්හතක මුදලක් ගෙවන්න තිබෙනවා. ව්‍යාපෘති නිම කරපු පොඩි පොඩි කොන්ත්‍රාත්කරුවන්ගේ මුදල් ගෙවන්න දිසාපතිතුමාට තවම මුදල් ලැබිලා නැහැ. ඒවායේ වැඩ කරපු උදවියට වැටුප් ගන්න විධියක් නැතුව විශාල අපහසුතාවකට පත් වෙලා තිබෙනවා. ඒ වාගේම හිටපු නිවාස, ඉදිකිරීම් සහ සංස්කෘතික කටයුතු ඇමති සජිත් ප්‍රේමදාස මැතිතුමා පටන් ගත් නිවාස ව්‍යාපෘතිවල මුදල් ගෙවලා නැහැ. අද මේ අවස්ථාවේ ගරු සභාවේ නිවාස රාජ්‍ය ඇමතිතුමාත් ඉන්නවා. මම ඉන්දික අනුරුද්ධ රාජ්‍ය ඇමතිතුමාගෙන් ඉල්ලීමක් කරනවා. මේ ගෙවල්වල ඉන්නේ එක්සත් ජාතික පාක්ෂිකයන් කියලා සමහර වෙලාවට ඔබතුමන්ලා හිතන්නට පුළුවන්. නමුත් ඒ ගෙවල් බොහොමයක් දීලා තිබෙන්නේ එක්සත් ජාතික පාක්ෂිකයන්ටම නොවෙයි. ඔබතුමන්ලා දැක්කා, පසුගිය ජනාධිපතිවරණය දිනපු වෙලාවේ සජිත් ප්‍රේමදාස මැතිතුමාගේ ගෙවල් ව්‍යාපෘතිවල හිටපු අයත් කිරිබත් හදාගෙන කාලා, ඒ ජයග්‍රහණය සැමරුවාය කියන එක. ඒ ආකාරයට පක්ෂ, පාට භේදයකින් තොරව අපි ලබා දුන් ඒ නිවාසවල සිටින සමහර මිනිසුන් සියයට දහයේ පොලියට මුදල් අරගෙන, තමන්ගේ නිවසේ ඉදිකිරීම් අඩක් නිම කරගෙන, ඉතුරු මුදල් ටික ලබා ගන්නට බැරුව ඉතාම අපහසුතාවකට පත් වෙලා තිබෙනවා. මම දන්නවා, රජයට මුදල්වල අපහසුතාවක් තිබෙනවා කියලා. නමුත් මම නිවාස රාජ්‍ය ඇමති ඉන්දික අනුරුද්ධ මැතිතුමාගෙන් ඉල්ලීමක් කරනවා, භාණ්ඩාගාරයට ගිහිල්ලා, මේ මුදල් ටික කෙසේ හෝ අරගෙන, අපේ මිනිසුන්ට ලබා දෙන්න කියලා.

පසුගිය අවුරුදු 20 තිස්සේ කරපු ඉදි කිරීම් ගැන බැලුවොත්, ඒ ඉදිකිරීම්වලට වඩා විශාල ඉදිකිරීම් ප්‍රමාණයක් පසුගිය අවුරුදු හතරහමාර ඇතුළත අපි සිදු කළා කියලා. ඒවා කිරීමේදී අපට මුදල් අපහසුතා තිබුණා; විශාල වශයෙන් ගත්ත ණය 2015 ඉඳලා ගෙවන්න තිබුණා. නමුත් අපි රටේ ආදායම වැඩි කරගෙන, කොහොම හෝ ඒ ණය ගෙවන ගමන් මේ සංවර්ධන වැඩ කටයුතුවලටත් ණය ගෙන ඒ වැඩ කටයුතු කරගෙන ගියා. එතකොට, අද වෙනකොට මෙම රජයේ ප්‍රතිපත්තිවල යම් වැරැද්දක් තිබෙනවාද කියලා කල්පනා කරන්නට ඕනෑ. මොකද, බදු සහන දුන්නාට ඒ බදු සහන ජනතාවට ලැබිලාත් නැහැ. නමුත්, දීපු බදු සහන තුළින් ලැබීමට තිබුණු ආදායම නැතිවීම තුළ රටේ ආර්ථිකය අද සම්පූර්ණයෙන්ම පහළට වැටිලා තිබෙනවා. ඒ නිසා මේ රජය ඒ තත්ත්වය ඉක්මනට හදා ගන්නට අවශ්‍යයි. කෙසේ වුණත්, අපේ ගම්වල ඉන්න ඉදිකිරීම් කොන්ත්‍රාත් කරපු ඒ සුළු කොන්ත්‍රාත්කරුවන්ට ඒ මුදල් ටික ගෙවන්න කියලා මම ඉල්ලීමක් කරනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ඊළඟට, ගරු මහින්ද යාපා අබේවර්ධන රාජ්‍ය ඇමතිතුමා. ඔබතුමාට විනාඩි 9ක කාලයක් තිබෙනවා.

[අ.භා. 5.41]

**ගරු මහින්ද යාපා අබේවර්ධන මහතා (වාරිමාර්ග සහ ග්‍රාමීය සංවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு மஹிந்த யாப்பா அபேவர்தன - நீர்ப்பாசன மற்றும் கிராமிய அபிவிருத்தி இராஜாங்க அமைச்சர்)
(The Hon. Mahinda Yapa Abeywardena - State Minister of Irrigation and Rural Development)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ අවස්ථාවේ ඉදිකිරීම් ක්ෂේත්‍රය සම්බන්ධයෙන් වචන කීපයක් කථා කරන්න ලැබීම ගැන මම සතුටු වෙනවා.

ඉදිකිරීම් ක්ෂේත්‍රයේ විශාලම පිබිදීම ඇති වුණේ 2010-2015 වර්ෂ කාල සීමාව තුළයි. ඊළඟට ආපු පාලකයන්ට ඒ පිබිදීම පවත්වාගෙන යැමට නොහැකි වුණා. ඒ වාගේම, අද මේ ක්ෂේත්‍රයේ රුපියල් බිලියන 10,000ක හිඟ මුදලක් ගෙවන්න තිබෙනවා. මේ ගැටලුව නිසා අද ඉදිකිරීම් ක්ෂේත්‍රය සම්පූර්ණයෙන්ම අඩපණ වෙලා තිබෙනවා කියලා කිව්වොත් ඒක නිවැරැදියි කියලා මා විශ්වාස කරනවා. මේ රජය ගෙන යන

වැඩපිළිවෙළ තුළ මේ ක්ෂේත්‍රය ගොඩ නැංවීම සඳහා ගරු අමාත්‍ය මණ්ඩලය විශාල මහන්සියක් දරනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, නමුත් අද මේ අංශය ගැනද අපි අවධානය යොමු කරන්නේ?

අද මේ රටේ අවධානය යොමුවෙලා තිබෙන්නේ කොහේටද? ගරු රන්ජන් රාමනායක මන්ත්‍රීතුමා ඊයේ මේ ගරු සභාවට ඇවිල්ලා ප්‍රකාශ කළා, මේ සභාවේ කුඩු වෙළෙන්දන්, වැලි ජාවාරම්කාරයන් ඉන්නවා කියලා. මම දන්නේ නැහැ, වැලි කපන එක කොපමණ දුරට අපරාධයක්ද කියලා. කුඩු විකුණන එක නම් අපරාධයක් කියලා අපි කවුරුත් අහලා තිබෙනවා. ඒ වාගේම බුකීකාරයන් ඉන්නවාය කියලාත් කිව්වා. මේ ආදී වශයෙන් මුළු පාර්ලිමේන්තුව කෙරෙහිම ඉතාම නරක විධියේ විවිධ චෝදනා ගොඩ නඟන්න තමයි එතුමා උත්සාහ කළේ. එතුමා ගැන මම කනගාටු වෙනවා. එතුමා ඒ විධියට චෝදනා කරන්නේ ඇයි?

මේ ගරු සභාවේ තිස්පස් අවුරුද්දක් මම ඉඳලා තිබෙනවා. මේ ගතවෙන්නේ මගේ පාර්ලිමේන්තු ජීවිතයේ තිස්පස්වන අවුරුද්දයි. මේ කාල සීමාව තුළ මාත් එක්ක වැඩ කරපු මන්ත්‍රීවරු ඉස්සරහ පේළියේ ඉන්නවා; ඒ වාගේම විරුද්ධ පක්ෂයේත් ඉන්නවා. මේ උදවියත් එක්ක අපි ඉතාම සමීපව, ඉතාම ළෙන්ගතුව වැඩ කරලා තිබෙනවා. එතුමාට අප ගැන එල්ල කරන්න තිබෙන චෝදනා මොනවාද කියා මා දන්නේ නැහැ. හැම මන්ත්‍රීවරයකුටම එක පාරටම එහෙම චෝදනා එල්ල කරන එක වැරැදියි. ගරු රන්ජන් රාමනායක මන්ත්‍රීතුමාගේ චරිතය, එතුමා ජීවත් වූ පරිසරය අපට අවශ්‍ය නැහැ. අපි ඒ ගැන කථා කරන්නේ නැහැ. නමුත් මේ සභාවේ ඉන්න සියලුදෙනාම එහෙමයි කියලා හිතන්නත් නරකයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, රන්ජන් රාමනායක මන්ත්‍රීතුමාගේ හඬ පට අහන්න හිරිකිතයි. අහන්න බැරි තරම් දේවල් තමයි ඒවායේ තිබෙන්නේ. මෙවැනි උත්තරීතර සභාවකට එය ආරෝපණය කරන්නේ කොහොමද? එය මේ සභාවට ආරෝපණය කරලා එතුමා මේ සභාව විනාශ කළා විතරක් නොවෙයි, එතුමා අපේ රටේ උත්තරීතර අධිකරණයටත් දැවැන්ත ප්‍රහාරයක් එල්ල කළා. එතුමා මුලින්ම කිව්වා, දූෂිත අධිකරණයක් තමයි මේ රටේ තිබෙන්නේ කියලා. මම හිතන හැටියට එය ඔප්පු කරන්න තමයි ඔය හඬ පට භාවිත කරන්න උත්සාහ කළේ. ඇත්ත වශයෙන්ම අධිකරණය ගැන මේ දැන් හෙළිවන තොරතුරු දිහා බැලුවාම අපි කනගාටු වෙනවා; ඉතාම ශෝක වෙනවා. මේකේ භයානකකම තිබෙන්නේ, තමන්ගේ උසස්වීම සඳහා ඒ වෙනුවෙන් කෙනකු මරණයට පත් කරන්න තීන්දුවක් දීලා තිබෙන එකයි. එහෙම තීන්දුවක් දීලා තිබෙනවා නම්, අපේ රටේ ශිෂ්ට සම්පන්න ජනතාව හෝ ඒ සම්බන්ධයෙන් උනන්දුවක් දක්වන අනිකුත් සියලු ජන කොටස් මොන විධියේ අදහසක්ද, ආකල්පයක්ද ඇති කර ගන්නේ? මේ තීන්දුව දුන්නේ කාන්තාවක්. ඒක ඊට වඩා භයානකයි. අපි සාමාන්‍යයෙන් කාන්තාවක් දිහා බලන්නේ ඉතාම ගෞරවනීය විධියටයි. ඉතාම සාධාරණව වැඩ කරන්න පුළුවන්, කිසිම දෙයකට කලබල වෙලා කටයුතු කරන්නේ නැති, ඕනෑම ප්‍රශ්නයක් නිරාකරණය කිරීමේදී දැවැන්ත සහායක් දෙන්න පුළුවන් කෙනෙක් තමයි කාන්තාව. අපට එදිනෙදා මුහුණගැහෙන ප්‍රශ්න විසඳන්න ඕනෑම වෙලාවක ඉතාම නිරවුල්ව මනස මෙහෙයවන්න පුළුවන් උදවිය තමයි කාන්තාවන්. කාන්තාවක් මෙවැනි තීන්දුවක් දුන්නාය කිව්වාම එය මුළු කාන්තා පාර්ශ්වයටම කරපු නිග්‍රහයක්. ඒ ගැන මගේ නම් කිසිම සමාවක් නැහැ. ඒ කථා කරපු විධියත්, කථා කරපු ශෛලියත් බලන්න. මේ කථා කරන්නේ කාටද කියා දැනගෙන කථා කළාද, එහෙම නැත්නම් නොදැන කථා කළාද? කොයි විධියේ කෙනකුටද කථා කළේ? අපේ රටේ අධිකරණ ක්ෂේත්‍රයේ ඉන්නේ අපේ රටේ වියතුන් හැටියටයි අපි දකින්නේ. ඔවුන් එසේ මෙසේ වියතුන් නොවෙයි. වියතුන් කියා අප විශ්වාස කරන උදවිය ඒ අයගේ කටයුතුවල යෙදෙන්නේ මේ විධියට නම්, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ රටේ අනාගතය පිළිබඳව වියතුන් කෙරෙහි විශ්වාසයක් තබන්න අපට පුළුවන්ද? මේවා සිද්ධ වෙන්නේ ඒ උදවියගේ අතින් නම්, වියතුන් කියා කොටසක් මේ රටේ නැහැයි කියන එක තමයි අපට කියන්න තිබෙන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මෙවැනි අවාසනාවන්ත තැනකට අපේ රට ගෙනාවේ මේ රටේ බයිස්කෝප්කාරයෝයි, මේ රටේ නැට්ටුවෝයි. යහපත් චරිතයක් නැති, වාරයක් නැති, කිසිම ලජ්ජාවක් නැති, කිසිම හැදියාවක් නැති උදවිය තමයි අපේ රට මේ තත්ත්වයට ඇදලා දැම්මේ. ඒකට මන්ත්‍රීවරුන්ට දොස් කියන්න එපා. මේ රටේ ජනතාව මන්ත්‍රීවරුන්ගෙන් බලාපොරොත්තු වන්නේ, සේවයක්. මේ කාල සීමාවේ විතරක් නොවෙයි, පාර්ලිමේන්තුව පිහිටවපු දවසේ ඉඳලා හිටපු මන්ත්‍රීවරු මේ රට වෙනුවෙන් ඉතාම ගෞරවනීය සේවයක් ඉෂ්ට කරලා තිබෙනවා. ඒක නැහැ කියන්න බැහැ. ඒ අතරතුර මේ වාගේ -මම ඒ වචනය පාවිච්චි කරන්නේ නැහැ- උදවියත් ඇති. නමුත්, ඒකෙන් අදහස් වන්නේ නැහැ, මුළු පාර්ලිමේන්තු සංහතියම මේ වාගේ පහත් චරිත තිබෙන උදවිය කියලා. ඒ වාගේ චරිත තිබෙන උදවිය දැන් සිටින අලුත් පරම්පරාවේ තවත් ඕනෑ තරම් ඇති. එවැනි කාන්තාවනුත් ඇති. නමුත්, ඒක විළිලජ්ජාසහගතයි. ඉතාම අවාසනාවන්තයි, මේ රටේ පවතින මේ තත්ත්වය.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි අහන්නේ මේ සභාවේ සිටින හැම මන්ත්‍රීවරයාටම ඒ තත්ත්වය ආරෝපණය කරනවාද කියලායි. මේ සභාවේ 225 දෙනාම එපා ලු. 225 දෙනාම එපා කියලායි කියන්නේ. මේ 225 දෙනාම එහෙමද? ඒකද මේ කියන්නේ? ඉතින් එහෙම කියන එක හරිද? ඒ වාගේ පහත් චරිත තිබෙන උදවිය එක්කෙනෙක් දෙන්නෙක් ඉන්නවා නම්, ඒ උදවිය ඉවත් කරන්න. රන්ජන් රාමනායක සිටිය යුතු තැන තමයි අද ඔය ඉන්නේ. එතුමා කියනවා, "උසාවියට කථා කරලා මට ඇප අරගෙන දෙන්න" කියලා. අද මේ සභාවේදී එහෙම කිව්වා. ඒවා තමයි එතුමන්ලාගේ කාලයේදී කරලා තිබෙන්නේ. අප ඇතුළට දැම්මේ ඒකට. මොන වරදක් කළාටද? මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ තිස්පස් අවුරුද්ද තුළ අපි දැනුවත්ව තඹ දොයිතුවක බාල වැඩක් කරලා නැහැ. අපි ඒක භය නැතිව කියනවා. කොහේදිවත් එවැන්නක් කරලා නැහැ. තිබෙනවා නම් කියන්න. අපි විවිධ තනතුරුවල ඉඳලා තිබෙනවා. පාර්ලිමේන්තුව ඇතුළේ වාගේම පාර්ලිමේන්තුවෙන් පිටත් ඉඳලා තිබෙනවා. අප සමඟ කටයුතු කළ මිනිස්සු තවමත් ඉන්නවා. ඕනෑම තැනකදී අප ගැන අහන්න. තඹ දොයිතුවක හොරකමක්, වංචාවක්, පහත් වැඩක්, තුට්ටු දෙකේ වැඩක්, ඒ උදවිය කථා කරනවා වාගේ වැඩක් -මම ඒ වචනය පාවිච්චි කරන්නේ නැහැ, මේ සභාවේ- අපි කරලා නැහැ. ඒ වාගේ දේවලට අප ආරෝපණය කරන්න පුළුවන්ද කියලා මා අහනවා.

එතුමා ඊයේ ඇවිල්ලා මෙතැන කෑ ගහලා කිව්වා, "මට උත්තර දෙන්න කෙනෙක් නැහැ" කියලා. මේක තමයි අපට දෙන්න තිබෙන උත්තරය. තමන්ගේ චරිතය දිහා බලන්න. තමන් කොයි වාගේද කියලා බලන්න. ඒක අනෙක් මිනිසුන්ට ආරෝපණය කරන්න යන්න එපා. තමන් පහත් මිනිහෙක් නම්, පහත් බව පිළිගන්න. තමන් නූගතකු නම්, නූගත් බව පිළිගන්න. මේ සභාවට ඇවිල්ලා හැසිරෙන්න දන්නේ නැත්නම්, ඒක පිළිගන්න. ඒක පිළිගෙන සභාවේ ගෞරවයත්, අනෙක් උදවියගේ ගෞරවයත් රැකගෙන මේකෙන් ඉවත් වෙලා යන්න. ඒක තමයි මේ සභාවටත්, මේ රටටත් කරන්න පුළුවන් ලොකුම සේවය කියා ප්‍රකාශ කරමින්, මාගේ වචන ස්වල්පය අවසන් කරනවා, මූලාසනාරූ ගරු මන්ත්‍රීතුමනි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

මීළඟට, ගරු හේෂා විතානගේ මන්ත්‍රීතුමා. ඔබතුමාට තිබෙන්නේ විනාඩි අටයි.

[අ.භා. 5.51]

**ගරු හේෂා විතානගේ මහතා**
(மாண்புமிகு ஹேசா விதானகே)
(The Hon. Hesha Withanage)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට අවස්ථාව ලබා දීම ගැන මුලින්ම ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා. අදාළ විෂය ක්ෂේත්‍රය ගැන, නැත්නම් මේ ඉදිරිපත් කරලා තිබෙන නියෝග පිළිබඳව කථා කරනවාට වඩා වෙනස් කථා ටිකක් තමයි අද අපි අහගෙන සිටියේ. එවැනි වෙලාවක මා කැමැතියි, මේ රටේ ඉදිකිරීම් ක්ෂේත්‍රය පිළිබඳ කරුණු කිහිපයක් කථා කරන්න.

මේ රටේ ඉදිකිරීම් ක්ෂේත්‍රය වෙනුවෙන් පසුගිය රජය කිසිම දෙයක් කළේ නැහැ කියලා මේ සභාවේ ප්‍රකාශ වුණා. එසේ ප්‍රකාශ වූ වෙලාවේ එයට පිළිතුරක් ලබා දීම වැදගත් වෙනවා. 2015 ජනවාරි 08 වන දා මේ රටේ වෙනසක් වෙලා යහපාලන රජය බලයට පත් වනකොට, මේ රටේ ඉදිකිරීම් ක්ෂේත්‍රයට සම්බන්ධ ප්‍රධාන සමාගම්වල සිට සාමාන්‍ය, කුඩා සමාගම් දක්වා සියලු සමාගම් කිසිදු ක්‍රමවේදයකින් තොරව කොන්ත්‍රාත්තුවලට අත්සන් කරලා, ඒ කොන්ත්‍රාත්තු භාගෙට නතර කරලා, ඒ සමහර ව්‍යාපෘතිවලට මුදල් ගෙවා ගන්න බැරිව අන්ත අසරණ තත්ත්වයකට පත් වෙලා තිබුණා. අපි දන්නා සමාගම් විශාල ප්‍රමාණයක් වැහිලා ගියා, ඒ මුදල් ලබා ගන්න උත්සාහ කළත් මුදල් ලබා ගන්න බැරි වෙලා. මොකද, සමහර ව්‍යාපෘතිවලට මුදල් ගෙවන්න බැහැ. අපේ ප්‍රදේශවල iRoad ව්‍යාපෘති විශාල ගණනක් කරගෙන ගිය සමාගම් ඒවා අත් හැර දමලා ගියා, නියම ප්‍රසම්පාදන ක්‍රියාවලියෙන් තොරව කොන්ත්‍රාත්තු පිරිනැමීමේ වරද නිසා මුදල් ලබා ගන්න බැරිව.

වර්තමාන රජය අද කුමන යෝජනාව කුමන ආකාරයකින් ගෙනාවත්, පසුගිය කාල සීමාවේ ඉදිකිරීම් ක්ෂේත්‍රයේ කඩා වැටීමට ඒ අය සෘජුව වග කියන්න ඕනෑය කියා අපි හිතනවා.

අපි දන්නවා, ඉදිකිරීම් ක්ෂේත්‍රය හා සම්බන්ධ කොන්ත්‍රාත්කරුවන් පාලනය කිරීමට, නියාමනය කිරීමට CIDA එක කටයුතු කරන බව. මේ ආයතනය දෙන නිර්දේශත් එක්කයි කොන්ත්‍රාත්කරුවන්ට කොන්ත්‍රාත් පිරිනැමීම සිදු කරන්නේ. ඒක එක නිර්ණායකයක්. එහි එක් එක් ශ්‍රේණි තිබෙනවා. ඒවා C9 ඉඳලා ඉහළටයි තිබෙන්නේ. අපි පසුගිය දිනවල සොයා බැලුවාම දැන ගන්න ලැබුණා, සමහර සමාගම්වලට බිහි වුණු ගමන්ම වාගේ කොන්ත්‍රාත් ප්‍රදානය කර තිබෙන ආකාරය. ඒ කියන්නේ, මාස හය යනකොට, C9 ශ්‍රේණියේ ඉඳලා ලංකාවේ ප්‍රධාන සමාගම් තිබෙන තැනට - C1 ශ්‍රේණියට- ඉතා ඉක්මනින් upgrade කරලා කොන්ත්‍රාත් පිරිනමන්න පුළුවන් වටපිටාවක් හදා දීලා තිබෙනවා. මා දන්නේ නැහැ, එහෙම කරන්න පුළුවන්ද කියලා. මා විශ්වාස කරන විධියට එවැනි ක්‍රමවේදයක් නම් ඉතිහාසයේ මේ රට තුළ තිබිලා නැහැ. අද කොන්ත්‍රාත් සමාගම්වලට ගෞරවයෙන් ආමන්ත්‍රණය කරන මේ රජය පැවැති පැරණි සමාගම්වලට අත් කර දී තිබෙන ඉරණම එයයි. දේශපාලන හෙංචයියන්ට ඉක්මනින් අර ප්‍රධාන සමාගම් එක්ක ගැටෙන්න අවස්ථාව ලබා දීමේ අරමුණින් හදිසියේම ශ්‍රේණි ඉහළ දැමීම CIDA එක සිදු කර තිබෙනවා. එහෙම කළේ නැහැ කියලා කියනවා නම්, ඔප්පු කර පෙන්වන්න අපි සූදානම්.

මේ රටේ කොන්ත්‍රාත්කරුවන් ආරක්ෂා කරන්න වර්තමානයේ කටයුතු කරනවා නම්, ඒක හොඳයි. ඒක වෙන්න ඕනෑ. හැබැයි, ඒක සැබෑවටම සද්භාවයෙන් කළ යුතු දෙයක්. මේ රටේ ප්‍රධාන කොන්ත්‍රාත් සමාගම්, පුංචි කොන්ත්‍රාත් කරන පෞද්ගලික සමාගම්, කොන්ත්‍රාත් කරන තනි පුද්ගලයන් එහෙම නැත්නම් තනි පුද්ගල සමාගම්, තනි පුද්ගල ව්‍යාපාර කරන උදවිය ආරක්ෂා කරන වැඩසටහනක් සද්භාවයෙන් ක්‍රියාත්මක කරනවා නම් හොඳයි. හැබැයි, අද මේ රටේ ප්‍රධාන කොන්ත්‍රාත් සමාගම්වලට තරග කරන්න වෙලා තිබෙන්නේ බහුජාතික සමාගම් එක්කයි. චීන සමාගම්, සිංගප්පූරු සමාගම් ආදි කොන්ත්‍රාත් commission එක තියාගෙන එන බහු ජාතික සමාගම්වල තුන්වන පාර්ශ්වකරුවන් විධියටයි අද මේ රටේ ප්‍රධාන කොන්ත්‍රාත් සමාගම්වලට කොන්ත්‍රාත් කරන්න වෙලා තිබෙන්නේ. මේ ක්‍රමය අවසන් කරන්න නම් මේ ක්‍රමයෙන් එහාට ගොස් දේශීය කොන්ත්‍රාත්කරුවන්ට ඒ අවස්ථාව ලබා දෙන වැඩසටහනක් නිර්මාණය විය යුතුයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ රටේ කොන්ත්‍රාත්කරුවන් ආරක්ෂා කරනවා නම් මේ ගැන ආණ්ඩුව හොඳට කල්පනා කරන්න ඕනෑ. සිංගප්පූරු සමාගමකට අක්කර 03ක් දීලා කරන ඒ ව්‍යාපෘතිය තුළ අඩුම තරමින් දේශීය කොන්ත්‍රාත් සමාගම්වලට පොඩි වැඩක්වත් කරන්න අවස්ථාවක් ලබා දෙයි කියලා මම හිතන්නේ නැහැ. පසුගිය කාල සීමාවේ වුණේ මොකක්ද? චීනයෙන් ණය ගත්තා, ණය ටිකට හරි යන කොන්ත්‍රාත් ටික චීනයෙන්ම ඇවිල්ලා කරලා ආපසු ඒ සල්ලි ටික අරගෙන ගියා. අපි ණය වාරික ගෙවනවා. ඒ නිසා කොන්ත්‍රාත් සමාගම් සැබෑවටම -නියත වශයෙන්ම- ආරක්ෂා කරන්න කටයුතු කරනවා නම්, දේශීය කොන්ත්‍රාත්කරුවන්ට ලබා දීමට සුදුසු හැම කොන්ත්‍රාත්තුවක්ම ප්‍රසම්පාදන ක්‍රියාවලිය තුළ ඔවුන්ට ආරාධනා කරලා ලබා දෙන්න පුළුවන් වැඩසටහනක් සකස් කළ යුතුයි. එසේ කරනවා විනා කොන්ත්‍රාත්කරුවා රවටා, පොඩි කොන්ත්‍රාත් ටිකක් දීලා ඔවුන් එක්තරා තැනක තියලා මහා පරිමාණ කොන්ත්‍රාත් බහුජාතික සමාගම්වලට ලබා දීම වැරදියි කියන කාරණාව මේ වෙලාවේ මතක් කරනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ කාලයේ නිවාස හා ඉදිකිරීම් අමාත්‍ය, ගරු සජිත් ප්‍රේමදාස මැතිතුමා -වර්තමාන විපක්ෂ නායකතුමා- එම අමාත්‍යාංශය කරපු කාලයේ කියපු කරුණු කාරණා ටිකක් ගැන ලොකු විග්‍රහයක් කරලා, චෝදනාත්මකව මේ අවස්ථාවේ කථා කළා. කාලය නැති වුණත් මම ඒ ගැන යමක් කියන්න ඕනෑ. එතුමාගේ අරමුණ වුණේ මොකක්ද? එතුමාගේ අරමුණ වුණේ මේ රටේ නිවාස නැති සුවහසක් මිනිසුන්ට නිවාස ලබා දීමයි. ඒ නිවාස ලබා දෙන කුමන හෝ ක්‍රමවේදයකින් මේ රටේ ලක්ෂ ගණනක් මිනිසුන්ට නිවසක් හදා ගන්න හයිය හදා දුන්නා. අද ඒක හැල්ලුවට ලක් කර තිබෙනවා. අද ඒවායෙහි ඉන්නේ යූඑන්පීකාරයෝ ද, ශ්‍රී ලංකාකාරයෝ ද, ජේවීපීකාරයෝ ද කියන එක නොවෙයි හොයන්න ඕනෑ. අද ඒවායෙහි ඉන්නේ මේ රටේ මිනිස්සු; නිවසක් නැතිව සිටි මේ රටේම මිනිස්සු. අන්න ඒ මිනිසුන්ට-

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තව විනාඩි දෙකක කාලයක් තිබෙනවා.

**ගරු හේෂා විතානගේ මහතා**
(மாண்புமிகு ஹேசா விதானகே)
(The Hon. Hesha Withanage)

මට මුජිබුර් රහුමාන් මන්ත්‍රීතුමාගේ වේලාව ගන්න කිව්වා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

එතුමාගේ කාලයෙන් ගත්තා.

**ගරු හේෂා විතානගේ මහතා**
(மாண்புமிகு ஹேசா விதானகே)
(The Hon. Hesha Withanage)

මේ රටේ අහිංසක මිනිසුන්ගෙන් දේශපාලන පළි ගැනීම් කරන්න එපා කියලා මම මේ අවස්ථාවේ දී කියනවා. පසුගිය රජය

කරගෙන ආපු නිවාස වැඩසටහනට ඔබතුමන්ලාගේ නම ගහ ගත්තාට කමක් නැහැ; එහි ගරුත්වය ඔබතුමන්ලා ගත්තාට කමක් නැහැ. නමුත් ඔබතුමන්ලා මේ අහිංසක මිනිසුන්ට සහන ලබා දෙන්න කටයුතු කරන්න. අපි කරගෙන ගිය වැඩසටහනට 'නිවාස ණය වැඩසටහන' හෝ 'ආධාර වැඩසටහන' යන මේ ඕනෑම නමක් දීලා, ඒ මිනිසුන්ට සාධාරණයක් කරන්න.

මේ රටේ නිවාස හා ඉදිකිරීම් අමාත්‍යාංශය යටතේ වැඩ කරපු සේවක සේවිකාවන් අද පාරට බැහැලා ඉන්නවා. ජනාධිපති ලේකම් කාර්යාලය ඉස්සරහා ඔවුන් රැස්වෙලා ඉන්නවා අපි ඊයේ දැක්කා. ඔවුන්ට සාධාරණයක් ඉටු කරන්න. වැරදි හොයලා මිනිසුන්ගෙන් පළි ගන්න දේශපාලනය නැවත මේ රටේ ආරම්භ කරන්න එපා. අපි ඒක 2015 දී අවසන් කළාය කියන එක මතක් කරනවා.

මම රත්නපුර දිස්ත්‍රික්කයේ මන්ත්‍රීවරයකු විධියට අතිගරු ජනාධිපතිතුමාගේ ඉඳලා මේ ආණ්ඩුවේ වගකිවයුත්තන්ගෙන් ඉල්ලීමක් කරනවා. රත්නපුර දිස්ත්‍රික්කය කියන්නේ මේ රටට විශාල ජාතික ආදායමක් එකතු කරන දිස්ත්‍රික්කයක්; මැණික් අපනයනය කිරීම තුළින් විශාල මුදලක් මේ රටට එකතු කරන දිස්ත්‍රික්කයක්. අද පුංචි පතල් කම්කරුවාගේ ඉඳලා මහා පරිමාණයේ මැණික් පතල් කරන ව්‍යාපාරිකයා දක්වා විශාල ප්‍රශ්නයක් තියෙනවා. පසුගිය කාලයේ එහෙම ප්‍රශ්න තිබුණේ නැහැ. මෛත්‍රීපාල සිරිසේන මැතිතුමාගේ කාලයේ යම් යම් ගැටලු තිබුණත්, මේ ව්‍යාපාරය හරියට කරගෙන යන්න පුළුවන් වටපිටාවක් තිබුණා. අද පතල් කම්කරුවා අනාථ කර දමා තිබෙනවා. අද පුංචි පතලක් භාර ගත්ත මනුෂ්‍යයාට තමන්ගේ වැඩේ කර ගන්න තිබිච්ච හයිය නැති කරලා තිබෙනවා. වර්තමාන ආණ්ඩුව ඇවිල්ලා තවම මාස දෙකයි ගෙවුණේ. රත්නපුරයේ අභිමානය මුළු ලංකාවටම ලබා දීපු, ඒ හයිය තිබෙන මිනිසුන් වෙනුවෙන් මා ඉල්ලීමක් කරනවා. අතිගරු ජනාධිපතිතුමනි, ගරු අගමැතිතුමනි, විෂය භාර අමාත්‍යතුමනි, කරුණාකර මේ රටේ ජාතික ආදායමට හයිය දෙන රත්නපුරයේ මිනිසුන් වෙනුවෙනුයි මේ ඉල්ලීම කරන්නේ. පතල් කර්මාන්තය දේශපාලනීකරණය කරන්න එපා. පතල් කර්මාන්තය අවුරුදු ගණනාවක් කරගෙන ආපු ඒ මිනිසුන්ගේ අයිතිය තහවුරු කරලා දෙන්න. ඒ සඳහා තිබෙන බාධා සියල්ල ඉවත් කිරීමට අවශ්‍ය කටයුතු කරන්න කියන එක මතක් කරන ගමන් වර්තමාන රජය රන්ජන්ගේ හඬපටවලින් ෂේප් වෙන්න හදනවා නම්, ජනතාව දෙන්න ඕනෑ උත්තරය ඉතා ළඟදීම ලබා දෙයි කියන එකත් මතක් කරමින් මගේ කථාව අවසන් කරනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
මීළඟට, ගරු රෝහිණී කුමාරි විජේරත්න මන්ත්‍රීතුමිය. ඔබතුමියට විනාඩි 5ක කාලයක් තිබෙනවා.

[අ.භා. 6.00]

**ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය**
(மாண்புமிகு (திருமதி) ரோஹினி குமாரி விஜேரத்ன)
(The Hon. (Mrs) Rohini Kumari Wijerathna)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන පනත යටතේ ගෙනෙන නියෝග පිළිබඳව අද පැවැත්වෙන මේ විවාදයේ දී අදහස් ප්‍රකාශ කරන්නට අවස්ථාව ලැබීම පිළිබඳව මා සතුටු වෙනවා. කාලය බොහොම කෙටි නිසා බොහොම කෙටියෙන් මගේ අදහස් ප්‍රකාශ කරන්නම්.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, පසුගිය 2008 වර්ෂයේ ඉඳලා ක්‍රියාත්මක වෙමින් ආපු මොරගහකන්ද ජලාශ ව්‍යාපෘතිය සහ කළු ගඟ ජලාශ ව්‍යාපෘතිවල ඉදිකිරීම් මේ වෙනකොට සියල්ල අත්හිටුවා තිබෙනවා. මොරගහකන්දේ පදිංචි ජනතාවට රජයෙන් ලබා දෙන වියළි සලාකයෙන් තව කෙතෙක් කාලයක් යැපෙන්නට සිද්ධ වෙනවාද කියන එක පිළිබඳව අද ජනතාවට ප්‍රශ්නයක් වෙලා තිබෙනවා. ඉදිකිරීම් නැවැත්වීමත් එක්ක අපට හැඟෙනවා, දැනෙනවා සහ පෙනෙනවා බෙදීම් ඇළවල්, කෙත් ඇළවල් හැදුවේ නැත්නම් ඒ පදිංචි කරපු ජනතාවට වගා කටයුතු කරගන්න බැහැ කියන කාරණය. එහෙම නම් තව කොච්චර කාලයක් රජයෙන් දෙන වියළි සලාකය දිහා බලාගෙන ඉන්න සිද්ධ වෙනවාද කියන එක පොහොට්ටුවට ඡන්දය දීපු, සෞභාග්‍යයේ උදානය බලාගෙන ඡන්දය දීපු ඒ සියලුදෙනාට අද ප්‍රශ්නයක් වෙලා තිබෙනවා. මොරගහකන්ද සහ කළු ගඟ ව්‍යාපෘතිය හේතුවෙන් අවතැන් වෙච්ච අයට වියළි සලාකයට පානීය ජලය ලබා දෙන්නත්, ඒත් එක්කම ව්‍යාපෘතියේ සේවය කරන අයට වැටුප් දෙන්න විතරක් මසකට රුපියල් මිලියන 100ක් අවශ්‍යයි. මේ මාස හතරටම ලබා දීලා තිබෙන්නේ රුපියල් මිලියන 600යි. එතකොට මාසයකට රුපියල් මිලියන 100 ගණනේ මාස හතරට රුපියල් මිලියන 400ක් ඕනෑ. තව ඉතුරු වෙන්නේ රුපියල් මිලියන 200යි. ගිය අවුරුද්ද අවසාන වෙනකොට කොන්ත්‍රාත් සඳහා රුපියල් මිලියන 1,100ක් ගෙවීම් කරන්නට තිබුණා. එතකොට මෙන්න මේ රුපියල් මිලියන 200න් රුපියල් මිලියන 1,100 සම්පූර්ණ කරලා වහ ගන්නේ කොහොමද, ගෙවීම් කරන්නේ කොහොමද කියන එක පිළිබඳව අද ඒ ව්‍යාපෘතියේ නිලධාරින්ට ගැටලුවක් මතුවෙලා තිබෙනවා. මොරගහකන්ද ව්‍යාපෘතිය කියන්නේ රට මැද සුනාමියක් කියන එක 2015දී මම මේ පාර්ලිමේන්තුවට ආපු ගමන්ම කිව්වා. ඒ වාගේම මම එදා කිව්වා, මොරගහකන්ද ව්‍යාපෘතිය කියන්නේ "සුදු අලියෙක්" කියලා. ඒ කාරණාව හේතුකොටගෙන අපි පත් කළ ජනාධිපතිම මට විරුද්ධ වුණා. ඒ කෙසේ වෙතත් අද නිම කර තිබෙන මේ ව්‍යාපෘතියේ ඇතැම් කොන්ත්‍රාත් වැඩ කිරීම සඳහා චීන සමාගමට මේ මුදල් ගෙව්වේ නැත්නම් ඒ අය ඒකට පොලියක් එකතු කරනවා. එතකොට මේ පොලිය ගෙවන්නේ කවුද කියන එක පිළිබඳ ප්‍රශ්නයක් තිබෙනවා. එහෙම නම් මේ රටේ දුප්පත් ජනතාවට තමයි එය ගෙවන්නට සිද්ධ වන්නේ. අද තවත් මන්ත්‍රීවරු කිව්වා වාගේ හඬපටවලින් මේ සියල්ල වහන්න බැහැ. කොයි වෙලාවක හරි මේ කරුණු එළියට ඇවිල්ලා ජනතාවට ඒවාට වන්දි ගෙවන්න සිද්ධ වන තත්ත්වයක් ඇතිවෙලා තිබෙනවා.

ඊළඟ කාරණාව හැටියට දඹුල්ල අධිවේගී මාර්ගයේ ඉදිකිරීම මා දකිනවා. ඒ සම්බන්ධයෙන් පසුගිය වසර පුරාවට අපි මේ පාර්ලිමේන්තුවේ දී කථා කළා. විහාරදේවාලගම් පනත යටතේ එම ඉදිකිරීම් කටයුතුවලට හසුවන ඉඩකඩම් සියල්ලේම පදිංචි ජනතාවට වන්දි ලැබෙන්නේ නැති නිසා අපි ඒ සම්බන්ධයෙන් විශේෂ කැබිනට් පත්‍රිකාවක් සකස් කරමින් සිටියේ. එම ඉදිකිරීම් කරන්න කලින් නැවත වතාවක් එම කැබිනට් පත්‍රිකාව ගෙනැල්ලා, ඒ ලබා දීමට නියම කළ සහන තුළින් ජනතාවට ලබා දිය යුතු වන්දිය ලබා දෙන්න කටයුතු කරන්න කියලා මා යෝජනා කරනවා.

ඊ ළඟ කාරණාව මෙයයි. දඹුල්ල දුම්රිය මාර්ගය ඉදිකිරීම සඳහා මේ වනකොට ඉඩම් අත්පත් කර ගනිමින් ඉන්නවා. ජනතාවට දැනුම් දෙනවා, හිමිකම් භාර දෙන්න කියලා. නමුත් මේ වන තෙක් කිසිම විධියකින් ඒ ඉඩම් ලබා ගැනීම තුළින් අවතැන්වන ජනතාවට වන්දි ගෙවන්නේ මොන ක්‍රමවේදය තුළද කියන එක දැනුම් දීලා නැහැ. එම නිසා මේ රටේ තිබෙන සැබෑ ප්‍රශ්න අද ඔය මාධ්‍යවල පෙන්වන 'හඬපට' නොවෙයි කියලා අපි කියනවා. අද දවස පුරාවට ජනතාවගේ සැබෑ ප්‍රශ්න ගැන නොවෙයි කථා කළේ කියන එක අපි දැක්කා.

මේ ගරු සභාවේ දී දැකපු දෙයක් ගැන මා කනගාටු වනවා. බොහොම වැඩිහිටි වගකිවයුතු මන්ත්‍රීවරයකු හිරුනිකා ප්‍රේමචන්ද්‍ර මැතිනිය අදත් මෙතැනදී අපහාසයට ලක් කළා. ඉදිකිරීම්

[ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය]

කටයුත්ත සහ හිරුනිකා ප්‍රේමචන්ද්‍ර මැතිතුමිය අතර තිබෙන සම්බන්ධය මොකක්ද කියලා අපට අහන්න සිද්ධවනවා. මේ පාර්ලිමේන්තුවට සදාචාරයක් අවශ්‍යද, නැද්ද කියන එක අපට අහන්න සිද්ධ වනවා. එම නිසා දීර්ඝ කාලීනව මේ පාර්ලිමේන්තුව ඇතුළේ කථා කිරීම සහ හැසිරුණු හැටි ඒ අයට අමතක වෙලා අද හිරුනිකා ප්‍රේමචන්ද්‍ර මන්ත්‍රීතුමිය, ඒ වාගේම, රන්ජන් රාමනායක මන්ත්‍රීතුමා මාතෘකා කර ගෙන මේ රටේ සැබෑ ප්‍රශ්න යටපත් කරමින් සිටින බව මා මතක් කරනවා. ඒ සඳහා උත්තරය ජනතාව ළඟදීම ලබා දෙන බව අපි දන්නවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, වසර හතරහමාරක කාලයක් තුළ අපි මාතලේ දිස්ත්‍රික්කයේ දැවැන්ත සංවර්ධනයක් කරලා තිබෙනවා. ඒ පිළිබඳව ජනතාව බොහොම උද්‍යෝගයෙන් කථා කරනවා. නමුත්, අද සිද්ධ වන දේවල් දිහා බැලුවාම ජනතාව පසුතැවිල්ලට පත්වෙලා සිටින බව අපට පෙනෙනවා. එදා සල්ලි තිබුණේ නැත්නම් "ගම්පෙරළිය" වැඩසටහන ගෙනාවේ කොහොමද, ඒ කටයුතු කළේ කොහොමද කියන එක පිළිබඳව ජනතාව ප්‍රශ්න කරන බව මේ සභාවට මතක් කරමින් මා නිහඬවනවා, ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
அடுத்து, கௌரவ எச்.எம்.எம். ஹரீஸ் அவர்கள். உங்களுக்கு 11 நிமிடங்கள் இருக்கின்றன.

[பி.ப. 6.06]

**ගරු එච්.එම්.එම්. හරීස් මහතා**
(மாண்புமிகு எச்.எம்.எம். ஹரீஸ்)
(The Hon. H.M.M. Harees)
*பிஸ்மில்லாஹிர் ரஹ்மானிர் ரஹீம்.*

கௌரவ சபைக்குத் தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, இன்று நடைபெறும் வீடமைப்பு வசதிகளுக்குப் பொறுப்பான அமைச்சு பற்றிய நிர்மாணத் தொழில் அபிவிருத்திச் சட்டத்தின்கீழான ஒழுங்குவிதிகள் தொடர்பான விவாதத்தில் கலந்துகொள்வதையிட்டு நான் மகிழ்ச்சியடைகின்றேன். வீடமைப்பு வசதிகளுக்குப் பொறுப்பான அமைச்சு என்பது இந்த நாட்டில் மிகவும் முக்கியமான ஓர் அமைச்சாகும். மனிதனின் மிக முக்கிய தேவையாக உள்ள வீட்டுத் தேவையை நிவர்த்தி செய்யவேண்டிய பொறுப்பு இந்த அமைச்சிற்கு இருக்கின்றது.

நான் பிரதிநிதித்துவப்படுத்துகின்ற அம்பாறை மாவட்டத்தில் சுனாமியின் பின்பு பல வீடமைப்புத் திட்டங்களை அரசாங்கமும் வெளிநாட்டு நிறுவனங்களும் இணைந்து செயற்படுத்தி வந்தன. கௌரவ பிரதமர் மஹிந்த ராஜபக்ஷ அவர்கள் 2005இல் பிரதமராகவும் பின்பு ஜனாதிபதியாகவும் இருந்த காலத்தில் அம்பாறை மாவட்டத்தில் குறிப்பாக, கல்முனைத் தொகுதியில் மருதமுனை, மேட்டுவெட்டை வீடமைப்புத் திட்டத்தை அமுல்படுத்தியிருந்தார். ஆனால், அந்த வீடமைப்புத் திட்டத்திலுள்ள 75 வீடுகள் இன்னும் குறித்த மக்களுக்குப் பகிர்ந்தளிக்கப்படாமல் இருக்கின்றன. இந்த வீடுகள் கடந்த 10 வருடகாலமாக மிகவும் அழிவுக்குள்ளான நிலைமையில் இருக்கின்றன. இது சம்பந்தமாகப் பலமுறை நாங்கள் சுட்டிக்காட்டியும் சம்பந்தப்பட்ட அரசாங்க அதிபர் அது குறித்து எந்த நடவடிக்கையையும் எடுக்கவில்லை. அதேபோன்று, கல்முனை 'கிரீன்பீல்ட்' வீட்டுத் திட்டத்திலும் சில வீடுகள் இருக்கின்றன. அதற்கப்பால், அம்பாறை, அக்கரைப்பற்றுப் பிரதேசத்திலுள்ள நுரைச்சோலை வீடமைப்புத் திட்டம் சவூதி அரசாங்கத்தினால் நிதியளிக்கப்பட்டு அமைக்கப்பட்டதாகும். இதுவும் இன்னும் மக்களுக்குப் பகிர்ந்தளிக்கப்படாமலிருக்கின்ற ஒரு சூழ்நிலையிருக்கின்றது. ஆகவே, இந்தச் சபையிலிருக்கின்ற கௌரவ வீடமைப்பு வசதிகள் இராஜாங்க அமைச்சர் அவர்கள் இந்த விடயங்களில் தலையிட்டு உரிய நடவடிக்கைகளை எடுக்கவேண்டும் என்று அம்மாவட்டப் பாராளுமன்ற உறுப்பினர் என்ற ரீதியில் நான் கேட்டுக்கொள்ள விரும்புகின்றேன்.

அடுத்து நீர்ப்பாசனம் சம்பந்தமான ஒரு விடயம். அம்பாறை, பொத்துவில் பிரதேசம் என்பது விவசாயிகளை உள்ளடக்கிய மிகப் பெரிய பிராந்தியமாகும். அதேபோன்று மொனறாகலைப் பிரதேசமும் விவசாயப் பிராந்தியமாகும். இந்த இரண்டு பிராந்தியங்களினதும் நன்மை கருதி ஹெட ஓயா நீர்ப்பாசனத் திட்டத்தை அமுல்படுத்துவதற்குக் கடந்த அரசாங்கம் நடவடிக்கை எடுத்ததுடன் இந்த அரசாங்கமும் நடவடிக்கை எடுத்து வருகின்றது. இதற்காக குறித்த இடைக்கால பட்ஜெட்டில் 50 மில்லியன் ரூபாய் நிதி ஒதுக்கீடு செய்யப்பட்டிருக்கின்றது. இத்திட்டத்தினூடாகப் பொத்துவில், லகுகல பிரதேசமும் மொனராகலை மாவட்டத்தின் மடுல்ல, சியம்பலாந்துப் பிரதேச செயலகத்திற்குட்பட்ட பல கிராமங்களும் குடிநீரைப் பெற்றுக்கொள்ளக்கூடிய வாய்ப்பு ஏற்படுகின்றது. அதேநேரம், இதன்மூலம் ஆயிரக்கணக்கான விவசாய நிலங்கள் பயன்பெறுகின்றபொழுது இந்த நாட்டின் பொருளாதாரம் மிகவும் விருத்தியடையக்கூடிய வாய்ப்பு ஏற்படும். எனவே, இந்த ஹெட ஓயா நீர்ப்பாசனத் திட்டத்தைத் தொடர்ந்தும் துரித வேகத்தில் செயற்படுத்துவதற்கான நடவடிக்கையை எடுக்குமாறு இந்த இடத்தில் கௌரவ பிரதமர் அவர்களையும் அரசையும் நான் வேண்டிக்கொள்கின்றேன்.

இன்று நான் பிரதிநிதித்துவப்படுத்துகின்ற முஸ்லிம் சமூகம் சம்பந்தமாகச் சில பாராளுமன்ற உறுப்பினர்கள் தனிநபர் பிரேரணையைச் சமர்ப்பித்துள்ளார்கள். கௌரவ பாராளுமன்ற உறுப்பினர் விஜேதாச ராஜபக்ஷ அவர்கள் 21, 22ஆவது அரசியல் அமைப்புத் திருத்தம் சம்பந்தமான பிரேரணையைச் இந்தச் சபையில் சமர்ப்பிக்கவிருக்கின்றார். அந்த வகையில் அவர் விகிதாசாரத் தேர்தல் முறை பற்றிய வெட்டுப்புள்ளியைப் பன்னிரண்டரை வீதத்திலிருந்து ஐந்து சதவீதமாகக் குறைக்க வேண்டுமென்று கோரியிருக்கின்றார். உண்மையில் குறித்த விகிதாசாரத் தேர்தல் முறை முஸ்லிம் சமூகத்திற்காக மட்டும் கொண்டுவரப்பட்ட ஒரு விடயம் அல்ல. இது இந்த நாட்டிலுள்ள ஜே.வீ.பீ., ஹெல உறுமய, இலங்கைத் தொழிலாளர் காங்கிரஸ், தமிழ்த் தேசியக் கூட்டமைப்பு அதேபோன்று ஸ்ரீலங்கா முஸ்லிம் காங்கிரஸ் போன்ற சிறு கட்சிகள் தங்களுடைய பாராளுமன்ற ஆசனங்களைப் பெற்றுக்கொள்வதற்காக உருவாக்கப்பட்ட ஒரு முறையாகும். ஆனால், இன்று இது குறித்து இனவாத ரீதியாகப் பேசுகின்றார்கள். எங்களுடைய பெருந்தலைவர் அஷ்ரப் இதனைக் கொண்டு வந்தார் என்று பிரச்சாரப்படுத்தி, சிங்களப் பெரும்பான்மை மக்களிடம் இனவாதத்தைத் தூண்டி, நாட்டுக்கு நன்மை பயக்கின்ற இவ்வாறான சட்டங்களை இல்லாமற்செய்கின்ற இந்த நடவடிக்கையை நான் வன்மையாகக் கண்டிக்கின்றேன்.

இப்பொழுது பயன்பாட்டிலுள்ள இந்த விகிதாசாரத் தேர்தல் முறையை மாற்றவேண்டும் என்று இன்று பரவலாகக் குரல் எழுப்பப்படுகின்றது. ஆனால், இந்த விகிதாசாரத் தேர்தல் முறை ஜனநாயகத்தின் ஓர் அச்சாணியாக இருந்துகொண்டிருக்கின்றது. அத்துடன் வாக்களிக்கின்ற சகல

மக்களினதும் அபிலாஷைகள் விகிதாசாரத்திற்கு ஏற்பப் பூர்த்திசெய்யப்படுகின்றது. இதனை மாற்றிவிட்டு, தொகுதிவாரித் தேர்தல்முறைக்கு வருகின்றபொழுது 51 சதவீதமானவர்கள் வாக்களித்த ஒரு வேட்பாளர் வெற்றி பெறுகின்ற அதேநேரத்தில், 49 சதவீதம் வாக்குகளைப் பெற்ற ஒரு வேட்பாளர் தோல்வியடைகின்றரர். அப்படியானால் 49 சதவீதமான வாக்குகளை அளித்த மக்களுடைய ஜனநாயக உரிமையும் அபிலாஷைகளும் மறுக்கப்படுகின்ற ஒரு சூழ்நிலை ஏற்படுகின்றது. இவ்வாறான ஒரு நிலைமை இருக்கத்தக்கதாக, இந்த நாட்டின் ஜனநாயகத்துக்கு உயிரோட்டம் கொடுக்கின்ற விகிதாசாரத் தேர்தல் முறைமையை மாற்றுகின்றபொழுது உண்மையில் ஜனநாயகம் - சட்டத்தின் ஆட்சி பலவீனப்படுத்தப்படும். இன்று சிறுபான்மை இனக் கட்சிகள் அரசாங்கத்தை ஆட்டிப்படைக்கின்றன என்று வீணான வதந்தி பெரும்பான்மை மக்கள் மத்தியில் பரப்பப்படுகின்றது. உண்மையில் இந்த விகிதாசாரத் தேர்தல் முறை அறிமுகப்படுத்தப்பட்ட காலத்திலிருந்து இந்த நாட்டின் ஆட்சியில் இவ்வாறான சிறிய கட்சியினர் ஜனநாயக ரீதியாகப் பங்குபற்றியிருக்கின்றார்களே ஒழிய, ஆட்சியைக் கவிழ்ப்பதற்கோ அல்லது ஆட்சியாளர்களை மிரட்டுவதற்கோ எந்தச் சந்தர்ப்பத்திலும் தமது பாராளுமன்ற உறுப்புரிமையைப் பயன்படுத்தவில்லை. மக்கள் மத்தியில் இவ்வாறான வீணான சந்தேகங்களை எழுப்புவதனூடாக இந்த நாட்டின் அபிவிருத்தியும் நாட்டு மக்களின் ஐக்கியமும் சமாதனமும் கேள்விக்குட்படுத்தப்படுகின்ற ஒரு நிலைமைதான் ஏற்படும்.

அதுமட்டுமல்ல, இன்று பொதுத் தேர்தலை எதிர்நோக்கியிருக்கின்ற ஒரு சூழலில், கிழக்கு மாகாணத்திலுள்ள சிலர் மற்றும் தமிழீழ விடுதலைப் புலிகளின் முன்னாள் தளபதியாக இருந்த கருணா போன்றவர்கள் முஸ்லிம் சமூகத்திற்கெதிராக வீணான இனவாதப் பேச்சுக்களை மிகக் கேவலமான முறையில் அப்பட்டமாகப் பேசி வருகின்றார்கள். தமிழ், முஸ்லிம் மக்களின் ஐக்கியத்தைக் கேள்விக்குட்படுத்துகின்ற இவ்வாறான கீழ்த்தரமான பேச்சுக்களையும் நடவடிக்கைகளையும் கட்டுப்படுத்துவதற்குப் புதிய அரசாங்கம் வெறுப்பூட்டும் பேச்சுக்கள் பற்றிய சட்டத்தை - hate speech law ஐ இந்தப் பாராளுமன்றத்தில் கொண்டுவர வேண்டும். புதிய ஜனாதிபதி அவர்கள் இது சம்பந்தமாகத் தலையிட்டு நடவடிக்கை எடுக்க வேண்டும். இன்று நாடு பூராவும் சிறுபான்மைச் சமூகங்களை இலக்குவைத்து இவ்வாறான பல தீவிரவாதப் பேச்சுக்கள் இடம்பெற்று வருகின்றன.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
கௌரவ உறுப்பினர் அவர்களே, உங்களுக்கு இன்னும் 3 நிமிடங்கள் உள்ளன.

**ගරු එච්.එම්.එම්. හරීස් මහතා**
(மாண்புமிகு எச்.எம்.எம். ஹரீஸ்)
(The Hon. H.M.M. Harees)
புதிய ஜனாதிபதி அவர்கள் பதவியேற்ற பின்பு, இந்த நாட்டில் வாழும் சிறுபான்மைச் சமூகமானது புதிய அரசாங்கத்துடன் எந்தவித முரண்பாடும் இல்லாமல் ஓர் இணக்கப்பட்டு அரசியலுக்குச் செல்ல வேண்டுமென்று எண்ணுகின்றபோதிலும், இன்று சிறுபான்மைச் சமூகத்தை இலக்குவைத்துக் குறித்த செயற்பாடுகள் இடம்பெற்று வருகின்றன. அதேநேரம் சிறுபான்மைப் பிரதிநிதிகள் பாராளுமன்ற உறுப்பினர்களாகத் தெரிவு செய்யப்படுகின்ற விகிதாசாரத் தேர்தல் முறைமை மாற்றுவதற்கு நடவடிக்கை எடுக்கப்படுகின்றது. குறிப்பாக, முஸ்லிம் சமூகம் அனுபவித்து வருகின்ற தனியார் சட்டமான முஸ்லிம் திருமணம், மணநீக்கச் சட்டத்தை நீக்க வேண்டுமென்ற அடிப்படையில் மாண்புமிகு அத்துரலியே ரதன தேரர் அவர்கள் பிரேரணை சமர்ப்பித்திருப்பது மிகவும் வேதனையைத் தருகின்றது. பெரும்பான்மை மக்களுடைய வாக்குகளைக் கூடுதலாகப் பெற்றுக்கொள்கின்ற தந்திரோபாய நடவடிக்கையாகவே இதனை நாங்கள் பார்க்கின்றோம். தயவுசெய்து ஆட்சியிலுள்ள முக்கிய தலைவர்கள் இவ்வாறான நடவடிக்கைகளைக் கைவிட வேண்டும், சிறுபான்மைச் சமூகத்தை அரவணைத்துச் செல்ல வேண்டும். இந்த நாடு 30 வருட காலமாக யுத்தத்திற்கு முகங்கொடுத்து வந்த நாடாகும். இந்நிலையில் அரசாங்கம் தனது பதவிக் காலத்தில் நாட்டை அபிவிருத்தி செய்ய வேண்டும், பொருளாதாரத்தை உச்ச நிலைக்குக் கொண்டுவர வேண்டும் என்ற அவா எங்கள் எல்லோர் மத்தியிலும் இருந்து கொண்டிருக்கின்றது. எனவே, சிறுபான்மை மக்களுக்கு எதிரான சட்டங்களைக் கைவிட்டுவிட்டுச் சிறுபான்மை மக்களை அரவணைத்துச் செல்கின்ற, சிறுபான்மை மக்களின் அபிலாஷைகளை ஏற்றுச் செல்கின்ற ஒரு சூழ்நிலையை இந்த நாட்டின் அரச தலைவர்கள் ஏற்படுத்த வேண்டும்.

இந்த உயரிய சபையில் நான் இன்னொரு விடயத்தையும் குறிப்பிட வேண்டும். இன்று எங்கு பார்த்தாலும் பல ஊடகங்கள் சிறிய விடயங்களை மிகக் கேவலமாக, பெரிதுபடுத்திக் கூறுகின்றன. பாராளுமன்ற உறுப்பினர் பொன்சேகா அவர்கள் எங்கள் அணியைச் சேர்ந்தவர். இருந்தபோதிலும் அவர்கூட இராணுவப் புலனாய்வுப் பிரிவுக்கு ஒரு முஸ்லிம் நியமிக்கப்பட்டமைக்கு எதிராக வெட்கமில்லாமல் குரலெழுப்பியிருக்கின்றார். இவ்வாறான பேச்சுக்கள் முஸ்லிம் சமூகத்தின் மத்தியில் பெரும் அதிருப்தியை ஏற்படுத்தி வருகின்றது. எதிர்வருகின்ற பாராளுமன்றத் தேர்தலில் தங்களுடைய வாக்கு வங்கிகளை அதிகரிக்கின்ற ஓர் உத்தியாகவே இவர்கள் இவ்வாறான செயற்பாடுகளை மேற்கொள்கின்றார்கள். இவற்றை எல்லாம் வங்குரோத்து நிலையை அடைந்துள்ள அரசியல்வாதிகளின் நடவடிக்கைகளாகவே நாங்கள் பார்க்கின்றோம். ஆகவே, இவர்கள் இவ்வாறான நடவடிக்கைகளை எல்லாம் விட்டு விட்டு ஆரோக்கியமான முறையில் செயற்பட வேண்டும் என்று கேட்டுக் கொள்கின்றேன். இறுதியாக, புதிய அரசியல் கலாசாரத்தினூடாகச் சகல சமூகங்களும் - தமிழ், முஸ்லிம், சிங்கள மக்கள் அனைவரும் இணைந்து அரசியல் செய்யக்கூடிய ஒரு சூழ்நிலை இந்த நாட்டில் ஏற்பட வேண்டும் என்று பிரார்த்தித்தவனாக விடைபெறுகின்றேன். நன்றி.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
මීළඟට, ගරු චමින්ද විජේසිරි මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 7ක කාලයක් තිබෙනවා.

[අ.භා. 6.18]

**ගරු චමින්ද විජේසිරි මහතා**
(மாண்புமிகு சமிந்த விஜேசிறி)
(The Hon. Chaminda Wijesiri)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඉදිකිරීම් කර්මාන්ත සංවර්ධන පනත යටතේ ගෙනෙන නියෝග සම්බන්ධව කථා කරන මේ අවස්ථාවට එකතු වීමට ලැබීම පිළිබඳව මම සතුටු වෙනවා. වර්තමාන ආණ්ඩුවේ පෙළගැස්ම තුළ මේ රටේ අවශ්‍යතාවට ගැළපෙන විධියට ඉදිකිරීම් ක්ෂේත්‍රයේ තිබෙන ගැටලු විසඳීම සඳහා අවශ්‍ය නියෝග ඉදිරිපත් කරන මේ මොහොතේ මට මතක් වන කාරණයක් තිබෙනවා මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. මේ රටේ ජනතාව වෙනුවෙන් අපි කර තිබූ ඉදි කිරීම් සහ මේ ආණ්ඩුවේ දේශපාලන ගමනට බාධා වෙයි කියලා හිතපු සමහර

[ගරු චමින්ද විජේසිරි මහතා]

ව්‍යාපෘති මේ ආණ්ඩුව බලයට පත් වූ දවසට පසු දින සිටම කඩලා බිඳලා විනාශ කරලා දැම්මා. කර තිබුණු ඉදිකිරීම් කඩලා දාලා නැවත ඉදිකිරීම් කිරීමට අවශ්‍ය ක්‍රියාමාර්ග ගන්න හදන්නේ කා වෙනුවෙන්ද, මොකක් වෙනුවෙන්ද කියන ප්‍රශ්නය අපට තිබෙනවා.

2015ට කලින් තිබුණු ආණ්ඩුව ඉදිකිරීම් ක්ෂේත්‍රයේ කටයුතු රටේ පැවති නීතියට පටහැනිව, පාර්ලිමේන්තුවෙන් සහ ඉන් පිටතදී අනුමතවෙලා තිබුණු නීති රීතිවලට පටහැනිව තම තමන්ගේ දේශපාලන අවශ්‍යතා සහ තමන්ගේ සාක්කුවට ලැබෙන කොමිස් මුදල කොහොමද කියලා  බලලා, ප්‍රසම්පාදනය පසුවට කල් තබලා, තමන්ගේ අවශ්‍යතාව වෙනුවෙන් කළේ කොහොමද කියලා අපි දැක්කා. මේ රට ආර්ථික වශයෙන් සහ සංවර්ධනය අතින් වැටිලා තිබුණු වෙලාවක තමයි අපි එදා රට භාර අරගෙන, ජාතික ආණ්ඩුවක් හදාගෙන, එහෙට මෙහෙට ඇදලා, ආර්ථික අතිනුත්, සංවර්ධනය අතිනුත් රට යම්කිසි මට්ටමකට ගේන්නට සමතුලිත වැඩ පිළිවෙළක් නිර්මාණය කරමින් කටයුතු කළේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ආණ්ඩුවේ වැඩ පිළිවෙළ ගැන යෝජනා ඉදිරිපත් වන වෙලාවේ විපක්ෂය හැටියට වැඩි පිරිසක් මේ සභාව තුළ සිටීම ගැන අපි සතුටු වෙනවා. ආණ්ඩුව කරන ඕනෑම හොඳ වැඩකට සහයෝගය දීම සඳහා විපක්ෂය කටයුතු කරනවාය කියන පණිවුඩය වර්තමාන ආණ්ඩුවට ලබා දෙන්නට පුළුවන් වීම ගැන මම සතුටු වෙනවා. ගරු රාජ්‍ය ඇමතිතුමායි, තවත් කීප දෙනෙකුයි පමණයි ආණ්ඩුව වෙනුවෙන් සභාව තුළ සිටින්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මෙතුමන්ලා එළියට ගිහිල්ලා කියන්නේ මොකක්ද? "අපට පාර්ලිමේන්තුවේ තුනෙන් දෙකක බලයක් දෙන්න, අපට තුනෙන් දෙකක බලයක් නැතිව වැඩ කරන්නට බැහැ. තුනෙන් දෙකක බලයක් නැතිව මේ රටේ ජීවන වියදම අඩු කරන්නට බැහැ. තුනෙන් දෙකක බලයක් නැතිව මේ රටේ ආර්ථිකය එහාට ගෙනියන්න හැකියාව නැහැ" කියන කාරණයයි. අපි ආණ්ඩුවට කියනවා, ආණ්ඩුව කරන ඕනෑම හොඳ වැඩකට දෙන්න පුළුවන් හයිය, ශක්තිය අපි සතුව තිබෙන බව. අද මේ වෙලාවේ  ඉදිරිපත් කරන මේ නියෝග තුළ යම් යම් ගැටලු තිබෙනවා. ඒ සියලු දේවල් හොඳ තැනකට ගෙනයන්න පුළුවන් වැඩ පිළිවෙළ අපි යෝජනා කරනවා. ඒ යෝජනා සියල්ලත් අරගෙන රටේ ඉදිරි වැඩ පිළිවෙළ ගෙන යෑම සඳහා කටයුතු කරන්නට ආණ්ඩුවට අපේ සහයෝගය දෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද අපේ ගරු විජිත හේරත් මන්ත්‍රීතුමා ඇහුවා ආරක්ෂාව සහ ආරක්ෂක අමාත්‍යාංශය භාරව කවුද ඉන්නේ කියලා. මම දැක්කා මුහුණු පොතේ  සටහනක් තිබෙනවා, මේ මොහොත වන විට යාපනය විශ්වවිද්‍යාලයේ ශිෂ්‍යාවක් මරා දාලා තිබෙනවා කියලා. මරා දාලාද, මැරිලාද කියන එක දන්නේ නැහැ. දැන් අපට මේ පිළිබඳව දැන ගැනීමේ අවශ්‍යතාවක් තිබෙනවා. ඒ විශ්වවිද්‍යාල දරුවා මැරුණේ මොන ආකාරයටද, මරලා දැම්මාද, නැද්ද කියන කාරණය  දැන ගැනීමට රටට වග කිව යුතු අමාත්‍යවරයෙක්  නැහැ. ඒ නිසා දේශපාලන වශයෙන් මේ රට මොන පැත්තට, මොන විධියට ක්‍රියාත්මක වෙනවාද කියන එක පිළිබඳව අපට ප්‍රශ්න තිබෙනවා මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. රටේ ජාතික ආරක්ෂාව පිළිබඳව  කථා කරලා මේ රටේ සමස්ත ජාතියම ආරක්ෂා කරන්නට බලයට පැමිණි ආණ්ඩුව, මේ රටේ බහුතර ජනතාව ජාතික ආරක්ෂාව පිළිබඳව විශ්වාසය තියලා ලබා දුන්නු වරම පාවා දෙමින් කටයුතු කරනවාය කියන කාරණයට හොඳම උදාහරණය තමයි මේ විශ්වවිද්‍යාල සිසුවියගේ මරණය ගැන පාර්ලිමේන්තුව තුළින් කිසිම තොරතුරක් දැනගැනීම සඳහා අවස්ථාවක් සැලසිලා නොමැතිකම කියලා මා හිතනවා මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

ඒ විතරක් නොවෙයි, විශේෂයෙන්ම මම මේ කාරණයත් කියන්නට ඕනෑ. මේ රටේ නීතිය ක්‍රියාත්මක වෙනවා. නීතිය මොන ආකාරයටද ක්‍රියාත්මක වෙන්නේ කියන කාරණය පිළිබඳව පුංචි උදාහරණයක් මම කියන්නම්. රත්නපුර ප්‍රාදේශීය සභාවේ වර්තමාන සභාපතිවරයාට දඬුවම් නියමවෙලා දැනට මාස දෙකක් වෙනවා. රත්නපුර ප්‍රාදේශීය සභාවේ වර්තමාන සභාපතිවරයාට උසාවියෙන් දඬුවම් නියම කරලා දැනට මාස දෙකක් ගතවෙලා තිබෙනවා. නමුත්, අද වන තුරු ඒ අධිකරණ තීන්දුව ක්‍රියාත්මක නොවන තැනට පත් වෙලා තිබෙනවා. අධිකරණයට එල්ල වෙච්ච සමහර බලපෑම් පිළිබඳව දිගින් දිගටම, දිගින් දිගටම සමහර හඬ පට පෙන්වලා කටයුතු කරන මේ ආණ්ඩුව, ආණ්ඩු පක්ෂය නියෝජනය කරන ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයාට අධිකරණය දුන් තීන්දුව දැන් මාස දෙකක් ගත වෙලාත් ක්‍රියාත්මක නොකරන තැනට පත් වුණේ ඇයි, ඒ නීතිය ක්‍රියාත්මක කරන තැන ඉන්නේ කවුද කියලා අපි අහනවා මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. රටට එකක් කියලා තම තමන්ගේ හෙලුව වසා ගැනීම වෙනුවෙන් කරන මේ බොරුව මේ රටේ ජනතාව අද ඉතා ඉක්මනින් දැන ගෙන තිබෙනවාය කියන කාරණාව කියන්න අපි මෙය අවස්ථාවක් කර ගන්නවා.

ආණ්ඩුවට මෙහෙම යන්න දෙන්න බැහැ මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. මොකද, මේ රටේ ජනතාව වෙනුවෙන් රජයේ වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කිරීම සඳහා අපි විපක්ෂය හැටියට අවශ්‍ය සහයෝගය ලබා දීමේදී ආණ්ඩුව කියපු දේවල්, ආණ්ඩුව කරනවාය කියපු දේවල් -ඒ සියලු දේවල්- මතක් කර දීමේ යුතුකම අපට තිබෙනවා. රජය එය මඟ හරිනවා නම්, එය මඟ හරින්න උත්සාහ දරනවා නම්, එය එසේ නොකළ යුතුයි කියන පණිවුඩය මතක් කර දීලා, විශේෂයෙන්ම රජයට එය කරන්න බැරි නම්, එය කරන්න සූදානම් නැත්නම්, එය කරන්න පුළුවන් වැඩ පිළිවෙළ නැවත නිර්මාණය කිරීම සඳහා අවශ්‍ය වැඩ පිළිවෙළ අපි මේ රටේ ජනතාව අතර නිර්මාණය කිරීම සඳහා කටයුතු කරනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

ආණ්ඩුව ලබා ගැනීම සඳහා පසුගිය කාලයේ එතුමන්ලා කරපු රඟපෑම මොකක්ද කියලා අපි දැක්කා නේ. ඒ රඟපෑම සඳහා නිර්මාණය කර ගත්තේ මොන මොන චරිතද, ඒකට මොන මොන ආයතනවල සහයෝගයද ලැබුණේ කියන කාරණය අපි දැක්කා. එය අද රටේ ජනතාවත් දන්නවා. මාධ්‍යවල ඒවා පළ නොවුණත් හන්දියේ කඩේට ගියාම, පොළට ගියාම ආණ්ඩුවේ නොහැකියාව පිළිබඳව ජනතාව හොඳින් තේරුම් අරගෙන තිබෙන බව පෙනෙනවා. අද මේ ආණ්ඩුව රටේ ජනතාවට කරුණු වසන් කරන්න වාරණ දාලා මොන උත්සාහය ගත්තත් සැබෑ තත්ත්වය ජනතාව දන්නවා. අද වේල් දෙකක් නොකා එක වේලක් පමණක් කා ජීවත් වන තත්ත්වයට රටේ ජනතාව පත් වෙලා. මේ රටේ ජනතාව එවැනි තත්ත්වයකට පත් කරපු මේ ආණ්ඩුව එළවා දැමීමට අවශ්‍ය වැඩ පිළිවෙළ නිර්මාණය කිරීම සඳහා අපි කටයුතු කරන්න ඕනෑය කියන කාරණය මම මේ වෙලාවේ මතක් කරන්න ඕනෑ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ රටේ ඉදිකිරීම් ක්ෂේත්‍රය තුළ තිබෙන දැවැන්ත අඩු පාඩු මඟ හරවා ගැනීමට යෝජනා කරන මේ සාධනීය වැඩ පිළිවෙළ ගෙන ඒම සඳහා අපේ සහයෝගය ලබා දීමට කටයුතු කරන බව සඳහන් කරමින්,  මේ අවස්ථාව ලබා දීම ගැන ඔබතුමාට ස්තුතිය ප්‍රකාශ කරමින් මා නවතිනවා.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## II

**ගරු (වෛද්‍ය) රමේෂ් පතිරණ මහතා (වැවිලි කර්මාන්ත සහ අපනයන කෘෂිකර්ම අමාත්‍යතුමා)**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ரமேஷ் பதிரண - பெருந் தோட்டக் கைத்தொழில் மற்றும் ஏற்றுமதிக் கமத்தொழில் அமைச்சர்)
(The Hon. (Dr.) Ramesh Pathirana - Minister of Plantation Industries and Export Agriculture)

Sir, I on behalf of the Prime Minister, Minister of Finance, Economy and Policy Development, Minister of Buddhasasana, Cultural and Religious Affairs and Minister of Urban Development, Water Supply and Housing Facilities, I move,

> "That the Regulations made by the Minister of Housing, Construction and Cultural Affairs under Section 58 of the Construction Industry Development Act, No. 33 of 2014 read with Sections 53(2) and 54(1)(a) of the aforesaid Act relating to Appeal Procedure and published in Gazette Extraordinary No. 2116/47 of 28th March, 2019, which were presented on 06.08.2019, be approved."

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## III

**ගරු (වෛද්‍ය) රමේෂ් පතිරණ මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ரமேஷ் பதிரண)
(The Hon. (Dr.) Ramesh Pathirana)

Sir, I on behalf of the Prime Minister, Minister of Finance, Economy and Policy Development, Minister of Buddhasasana, Cultural and Religious Affairs and Minister of Urban Development, Water Supply and Housing Facilities, I move,

> "That the Regulations made by the Minister of Housing, Construction and Cultural Affairs under Section 58 of the Construction Industry Development Act, No. 33 of 2014 read with Section 55(2) of the aforesaid Act relating to Information Secretariat and published in Gazette Extraordinary No. 2116/48 of 28th March, 2019, which were presented on 06.08.2019, be approved."

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

# කල්තැබීම
## ஒத்திவைப்பு
## ADJOURNMENT

**ගරු (වෛද්‍ය) රමේෂ් පතිරණ මහතා**
(மாண்புமிகு (வைத்திய கலாநிதி) ரமேஷ் பதிரண)
(The Hon. (Dr.) Ramesh Pathirana)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, "පාර්ලිමේන්තුව දැන් කල් තැබිය යුතුය" යි මා යෝජනා කරනවා.

***ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.***
*வினா எடுத்தியம்பப்பெற்றது.*
*Question proposed.*

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

Next, the Adjournment Motion to be moved by the Hon. Wijepala Hettiarachchi.

# දේශපාලන පළිගැනීම් නැවැත්වීම සහ ජනතාවට සහන සැලසීම
## அரசியல் பழிவாங்கலைத் தடுத்தலும் மக்களுக்கு நிவாரணம் வழங்குதலும்
## PREVENTION OF POLITICAL VICTIMIZATION AND PROVISION OF RELIEF TO THE PUBLIC

[අ.භා. 6.26]

**ගරු විජේපාල හෙට්ටිආරච්චි මහතා**
(மாண்புமிகு விஜேபால ஹெட்டிஆரச்சி)
(The Hon. Wijepala Hettiarachchi)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එක්සත් ජාතික පෙරමුණ විසින් මේ සභාව කල් තැබීමේ යෝජනාව ඉදිරිපත් කරන්න ලැබීම ගැන මා ඉතා සතුටු වනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

> "හැටනව ලක්ෂයක් ජනතාවගේ ජන වරමින් පත්වූ වත්මන් ගරු ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා සහ මහින්ද රාජපක්ෂ මැතිතුමා ප්‍රමුඛ වත්මන් රජය මඟින් ගෙවී ගිය මාස දෙකකට අධික කාලයක් රට පාලනය කළද, තම "සෞභාග්‍යයේ දැක්ම" ප්‍රතිපත්ති ප්‍රකාශය තුළින් ජනතාවට විවිධ පොරොන්දු රැසක් ලබා දුන්නද එකී බොහෝ පොරොන්දු ඉටු කිරීමට හැකියාව තිබුණද ඒවා ඉටු නොකිරීම නිසා, ජනතා අපේක්ෂා භංගත්වයට පත් වී ඇත.
>
> විශේෂයෙන් ජීවන වියදම පහත හෙළීමට බලපාන අත්‍යවශ්‍ය ආහාර ද්‍රව්‍ය වන සහල් මිල සියයට 40කින් පමණද, එළවලු මිල සියයට 300කින් පමණද ඉහළ ගොස් ඇත. අත්‍යවශ්‍ය සෑම භාණ්ඩයකම මිල පසුගිය රජය කාලසීමාට වඩා අධික ලෙස වැඩි වී ඇත.
>
> රැකියා ලක්ෂයක් ලබා දෙන බව ප්‍රකාශ කරමින් රජයේ හා පෞද්ගලික අංශයේ රැකියා 100,000කට ආසන්න ප්‍රමාණයක් අහිමි කිරීමට පිඹුරුපත් සකස් කරමින් සිටී. සමෘද්ධි දීමනාව කප්පාදු කිරීමට හා අහිමි කිරීමේ සූදානමක් පවතී.
>
> ආණ්ඩුව පත් වූ දා සිට සෑම දිනක් පාසා පාර්ලිමේන්තුවේ විපක්ෂ මන්ත්‍රීවරු සිරභාරයට ගැනීම, විවිධ චෝදනා නගමින් ඔවුන් අපහසුතාවට පත් කිරීම් සිදු වෙමින් පවතී. රැකියා අහිමි කිරීම, උසස් වීම් අහිමි කිරීම, විධිමත් ක්‍රියාමාර්ගවලට පටහැනිව ස්ථාන මාරුවීම් සිදු කිරීම් තුළින් පනස්හය ලක්ෂයක් ඡන්දය දුන් ජනතාවගේ ක්‍රියාකාරීන් අපහසුතාවට පත් කරමින් සිටී.
>
> එබැවින්, ජනතාවට පොරොන්දු වූ පරිදි අත්‍යවශ්‍ය ආහාර ද්‍රව්‍ය ඇතුළු භාණ්ඩ මිල අඩු කර ජනතාවට සහනයක් ලබා දී දේශපාලන පළිගැනීම් ලෙස කෙරෙන අකටයුතුකම් නතර කර, පසුගිය රජය මඟින් ස්ථාපිත කළ ප්‍රජාතන්ත්‍රවාදය සහ යහ පාලනය වඩාත් සුරක්ෂිත කරන ලෙස සුළුතරයක් නියෝජනය කරන රජයට බහුතරයක් නියෝජනය කරනු ලබන එක්සත් ජාතික පෙරමුණ ප්‍රමුඛ විපක්ෂ බලකර සිටින්නීය."

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එදා 69 ලක්ෂයක ඡන්ද ලබාගෙන, අතිගරු ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා ජනාධිපති ධුරයට පත් වුණාම, අගමැතිවරයා ප්‍රමුඛ අපේ අමාත්‍ය මණ්ඩලය අස් වෙලා සුළුතරයක් වූ ශ්‍රී ලංකා පොදුජන පෙරමුණට රජයේ වැඩ කටයුතු කරගන්න ඉඩ දුන්නේ, ජනතා පරමාධිපත්‍යය සලකායි. නමුත් කියන්න කනගාටුයි, ගෙවී ගිය දින 66ක කාලය තුළ හිතාමතාම කල් මරමින් එතුමන්ලා ජනතාවට පොරොන්දු වූ කාරණාවලින් ඉෂ්ට කරන්න පුළුවන් බොහෝ කාරණා ඉටු

[ගරු විජේපාල හෙට්ටිආරච්චි මහතා]

නොකර, ජනතාව අපහසුතාවට පත් කළ බව. අපි බලයට පත් වී "දින 100 වැඩසටහන" ක්‍රියාත්මක කළ කාල සීමාව තුළ බොහෝ වැඩ කොටසක් ඉෂ්ට කළා. ඒක අමුතුවෙන් කියන්න ඕනෑ නැහැ. රාජ්‍ය සේවකයන්ගේ වැටුප රුපියල් 10,000කින් වැඩි කළා, තෙල් මිල අඩු කළා. විශේෂයෙන්ම මේ රටේ අහිංසක දුප්පත් ගැබිනි මාතාවන්ට රුපියල් 2000ක දීමනාවක් ලබා දී පෝෂණ වැඩසටහනක් ක්‍රියාත්මක කළා. අපි එතැනින් නැවතුණේ නැහැ. මේ රටේ ඒ කාලය වෙනකොට තිබිච්ච භාණ්ඩවල මිල මට්ටම් අඩු කළා. අත්‍යවශ්‍ය ආහාර ද්‍රව්‍ය, කඩල, පරිප්පු, වෙනත් ධාන්‍ය වර්ග යනාදියෙහි මිල අඩු කළා. සහල් පවා රුපියල් 60-70ට ගන්න පුළුවන් තත්ත්වයට ඒවායේ මිල අඩු කරලා ජනතාවට සහන ලබා දුන්නා.

අද මම බඩු මිල ගැන කියන්නේ නැහැ. මෙතැන සිටින ගරු මන්ත්‍රීවරුන්, ගරු ඇමතිවරුන් හැම කෙනෙකුගේම බිරින්දෑවරුන් අඩු ගණනේ ගෙදරදී කියනවා ඇති දැන් හාල් මිල කීයද, එළවලු මිල කීයද කියලා. ඒ ගැන අමුතුවෙන් කියන්නට අවශ්‍ය නැහැ. අද රටේම ජනතාව දන්නවා ඉතිහාසයේ කවදාවත් ලංකාවේ හාල් මිල මෙවැනි ප්‍රමාණයකින් ඉහළ ගියේ නැහැ, එළවලු මිල මෙවැනි ප්‍රමාණයකින් ඉහළ ගියේ නැහැ කියලා. අද වෙළෙඳ පොළේ තිබෙන මිල දර්ශනය ගත්තාම, සෑම එළවලුවකම මිල රුපියල් දෙතුන් සියයකට අඩු කර ගන්නට මේ ආණ්ඩුවට අදත් පුළුවන්කමක් නැහැ කියා මා හිතනවා. ආණ්ඩුවට එළවලු වාගේ දේවල්වල මිල අඩු කරන්න බැහැ. අපි ඒක පිළිගන්නවා. හැබැයි, මතක තබා ගන්නට ඕනෑ, අයහපත් කාලගුණික තත්ත්වය නිමා වුණත්, කවදාවත් එවැනි කාලයකදීත් සිදු නොවෙච්ච ආකාරයට එළවලු මිල මට්ටම් මේ වනවිට ඉහළ ගිහිල්ලා තිබෙන බව.

අපේ ගරු රමේෂ් පතිරණ අමාත්‍යතුමා දන්නවා, පසුගිය දවස්වල බද්දේගම ප්‍රදේශයේ එළවලු කඩයක් කඩපු බව. එසේ කඩා අරගෙන ගියේ මොනවාද? ලූනු මිටි සහ ලීක්ස් මිටි තමයි අරගෙන ගියේ. [බාධා කිරීමක්] බොරු නොවෙයි. ඔබතුමා දන්නවා මේවා මාධ්‍යවල ඉතාම හොඳින් ප්‍රදර්ශනය වුණ බව. ඔබතුමන්ලාට මේවා පෙනෙන්නේ නැහැ. ඇමතිකම් ගන්න කොට, බලයේ රුඳෙන කොට විපක්ෂය දකින දේවල් තමුන්නාන්සේලා දකින්නේ නැහැ. ඒ සිද්ධ වෙච්ච දේ බොරුවක් කියලා කිව්වොත් මම ඒ ගැන කනගාටු වෙනවා. එහෙම නම් ඒ සම්බන්ධව මාධ්‍ය තුළින් සම්පූර්ණ බොරුවක් විකාශය කළාය කියලා එතුමන්ලාට කියන්න වෙනවා. මේවා පාර්ලිමේන්තුවේ හැන්සාඩ්ගත වෙනවා. ගරු රමේෂ් පතිරණ ඇමතිතුමා වාඩි වෙලා ඉන්න ආසනය හරිද කියලා මම දන්නේ නැහැ. එතුමා නැඟිටලා කියනවා "ඒක බොරු" කියලා. එසේ නැඟිටලා කියන කථා මම පිළිගන්නේ නැහැ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

එතුමා සහා ගර්භයෙන් යන්න ඉස්සෙල්ලා මේ කාරණයත් කියන්න ඕනෑ. එතුමා කියනවා, විශේෂයෙන්ම වතු කම්කරුවන්ගේ වැටුප රුපියල් දහසකින් වැඩි කරනවා කියලා. මේ වෙනකොට වතු කම්කරුවන් ඒ සම්බන්ධයෙන් උද්ඝෝෂණය කරනවා; පාරට බැස ඉන්නවා. අන්න, එතුමා සහා ගර්භයෙන් පිට වෙනවා. වතු සමාගම් මේ රුපියල් දහස ලබා දීමට සූදානම් නැහැ. මෙන්න, වේදිකාවක්-වේදිකාවක් ගණනේ එතුමන්ලා කළ ප්‍රකාශ අද අල්ලේ පැළ වෙන බොරු බවට පත් වෙලා තිබෙනවා. ඒ විතරක් නොවෙයි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. අපි උදාහරණයක් ගනිමු. මූල්‍ය ආයතනවල තිබෙන ණය කපා හරිනවා කියලා හැම තැනම බෙරිහන් දුන්නා. ඒවාට අණ දුන්නා කියලා කිව්වා, ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා ප්‍රකාශ කළාය කිව්වා. 2020 ජනවාරි 22 වැනි බදාදා "ලංකාදීප" පුවත් පතේ මෙහෙම සඳහන් වෙනවා:

"ණය ගෙවාගන්න බැරිව විස ගෙඩි කෑ තිදෙනකුගෙන් මව මරුට: දුවයි බෑනයි රෝහලේ"

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම මේ පුවත් පත් කොටස **සභාගත*** කරනවා. අපේ කාලයේ මේ වාගේ දෙයක් සිද්ධ වුණා නම් මෙතැන බෙරිහන් දෙන හැටි බලන්න ඕනෑ. පුළුවන් නම් එහෙම මැරිච්ච මිනිහාගේ පෙට්ටියත් ගෙන්වා පෙන්වයි; පාරේ තියයි. නමුත් අපි මේවාට කලබල වෙන්නේ නැහැ.

සදාචාරාත්මක ආණ්ඩුවක් හැටියට මේ කාරණය දැනගන්නට ඕනෑ. "ණයබරින් නිදහස් කරනවා. ණය කපා හරිනවා. සුළු පරිමාණ කුඩා කර්මාන්තකරුවන් ණයවලින් නිදහස් කරනවා" කියලා මේ ආණ්ඩුව කයිවාරු ගැහුවාට, VATවලින් රුපියල් බිලියන 500ක් අහිමි වෙලා තිබෙනවා. මේ ආණ්ඩුව ආවාට පස්සේ එක දවසකට රුපියල් ලක්ෂ 7,000ක් අහිමි වෙනවා. ඒ නිසා අද මොකක්ද වෙලා තිබෙන්නේ? භාණ්ඩාගාරය හිස් වෙමින් යනවා. වෙනදා රෝහල්වලට, මහා මාර්ගවලට, අධ්‍යාපනයට, දිනපතා ගෙවන බිල්පත්වලට ගෙවන්න පුළුවන්කමක් තිබුණා මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. එහෙම ගෙවන්න මුදලක් භාණ්ඩාගාරයේ තිබුණා. අද එක රුපියලක් නැහැ. මොකද වෙලා තිබෙන්නේ? අද රුපියල් ලක්ෂ 7,000ක් දවස ගානේ පාඩු වෙනවා. මේවා සොයා ගන්නා වැඩ පිළිවෙළක් නැහැ. මේවා සොයා ගන්නේ කොහොමද? මේ මුදල් සොයා ගන්නේ කොහොමද කියලා මුදල් ඇමති හැටියට ගරු අගමැතිතුමා එක වචනයක් කියන්නේ නැහැ. ආණ්ඩුව ගන්නකොට කයිවාරු ගැහුවේ, "අපි සියලු සැලසුම් හදලායි ආවේ. ඔක්කෝම සැලසුම් හදලායි ආවේ. අපට වැඩ පටන් ගන්න විතරයි තිබෙන්නේ. අපි පැය 24න්, පැය 48න් වැඩ කරනවා" කියලායි. හැබැයි, සමහර අමාත්‍යාංශවල සභාපති වැනි තනතුරුවලට තවමත් පත් කරගන්න පුළුවන්කමක් ලැබිලා නැහැ කියන එක අපි ඉතාම පැහැදිලිව දන්නවා. Expertsලා දමනවා කියලා සමහර තැන්වලට දාලා තියෙන්නේ හමුදාවේ විශ්‍රාම ගිය ඉහළ නිලධාරීන්.

ඒ විතරක් නොවෙයි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. විශ්වවිද්‍යාල ශිෂ්‍යයන් සඳහා මහපොළ ශිෂ්‍යත්වය රුපියල් දසදහස දක්වා වැඩි කරනවාය කියනවා. උසස් අධ්‍යාපන ඇමතිවරයා හැටියට බන්දුල ගුණවර්ධන මැතිතුමා දැන් කියන්නේ, "ඒක අපි දැන්ම වැඩි කරන්නේ නැහැ. ඒක අපි අය වැයෙන් ඉදිරියේදී තමයි වැඩි කරන්නේ" කියලා. මෙහෙම අසත්‍ය ප්‍රකාශ කරන්නට අවශ්‍ය නැහැ. ඒ අය කිව්වේ, "අපි බලයට ආ ගමන් කරන්න නියම විධියේ වැඩ පිළිවෙළක් අපට තිබෙනවා. අපේ ප්‍රතිපත්තියක් තිබෙනවා. අපි ඒවා ඔක්කෝම හදලා තිබෙනවා" කියලායි. හැබැයි, හදපු කෙහෙල් මලක් නැහැ. එහෙම හදනවා වෙනුවට, අටුව කඩා පුටුව හැදුවා වාගේ, ලක්ෂයක් එළියට දාලා ලක්ෂයකට රස්සාවල් දෙනවා.

මේ වෙනකොට රාජ්‍ය සහ පෞද්ගලික අංශවල, සමහර තැන්වල ඉන්න පෞද්ගලික ආරක්ෂක අංශයේ සියලුදෙනා ගෙදර යවලා, ඒ අයගේ වැටුප සම්පූර්ණයෙන්ම නතර කරලා ග්‍රාමාරක්ෂක හටයන් එ ස්ථානවලට දමන්න මේ වෙනකොට පිඹුරුපත් හදමින් යනවා. පත්තරවල දැන්වීම් දමලා තිබෙනවා, ලක්ෂයක බළකායක් හදනවා කියලා. හය ශ්‍රේණිය, හත ශ්‍රේණිය, එහෙම නැත්නම් අට ශ්‍රේණිය සමත් අය හෝ ඊට අඩු අය අරගෙන බළකායක් හදලා ග්‍රාමාරක්ෂක හටයන් හැටියට ඒවාට දමනවා ලු. එහෙම කරනවා නම් අපි කැමැතියි. හැබැයි, මතක තියාගන්න. මේ රටේ රාජ්‍ය අංශය වාගේම පෞද්ගලික අංශවල සිටින අහිංසක ආරක්ෂක නිලධාරීන් සේවය කරන්නේත් හරියට වැටුපක් නැතුවයි. වේල් දෙක යන්තම් කන්න, ජීවිතය ගැටගහගන්න මේ වාගේ පෞද්ගලික අංශවල වැඩ කරන අය සම්පූර්ණයෙන්ම කප්පාදු කරලා, ඒ අය ගෙදර යවලා, ඒ අය පැදුරෙනුත් බිමට දමන

***** *පුස්තකාලයේ තබා ඇත.*
* *நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
* *Placed in the Library.*

තත්ත්වයට පත් කරන්නට මේ ආණ්ඩුව මේ මාස දෙක ඇතුළත කටයුතු කරමින් යනවා.

විශ්වවිද්‍යාල ශිෂ්‍යයන්ට මහපොළ ශිෂ්‍යත්වය විධියට රුපියල් දසදහසක් දෙනවා කිව්වා. බොරුවට කියනවා, "මහපොළ ශිෂ්‍යත්ව අරමුදලේ හොරකමක් තිබෙනවා. මෙච්චර විනාශ කරලා තිබෙනවා" කියලා. අපි ඒවා කිව්වේ නැහැ, අපි එක රුපියලක් අඩුවෙන් ගෙව්වේ නැහැ, එක මාසයක් ඒවාට හිග තිබ්බේ නැහැ. පසුගිය නොවැම්බර්, දෙසැම්බර් මාසවල මහපොළ ශිෂ්‍යත්වලාභී ඒ දරුවන්ට මහපොළ ශිෂ්‍යත්වය ලැබුණේ නැහැ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. ඒ විතරක් නොවෙයි, අපි දන්නවා,-

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
අවසන් කරන්න, ගරු මන්ත්‍රීතුමනි.

**ගරු විජේපාල හෙට්ටිආරච්චි මහතා**
(மாண்புமிகு விஜேபால ஹெட்டிஆரச்சி)
(The Hon. Wijepala Hettiarachchi)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මගේ කථාව අවසාන කරන්න මට විනාඩි දෙකක් දෙන්න.

මහපොළ ශිෂ්‍යත්වය ලබන දරුවන් වෙනුවෙන් මම කරුණාවෙන් ඉල්ලීමක් කරනවා. ඒ දරුවන් අද මහ මගට බැහැලා ඉන්නවා. නොකා නොබී උපවාස කරන්න සිද්ධ වෙලා තිබෙනවා. මේ ආණ්ඩුව කයිවාරු ගැහුවා, "අපේ රජය කාලයේ උද්ඝෝෂණ නැහැ. පිකටින් නැහැ. උපවාස නැහැ" කියලා. නමුත්, රැකියා අහිමි වෙච්ච අය අදත් ජනාධිපති ලේකම් කාර්යාලය ළඟ, Galle Face පිටිය ළඟ පෝලිමේ ඉන්නවා. මෙන්න බලන්න තත්ත්වය! මේවා කරන්න නොවෙයි ආණ්ඩුව ආවේ. "රට සුරක්ෂිත කරනවා" කිව්වා. දැන් මොකක්ද රටේ සුරක්ෂිත කරන්නේ? අපි සුරක්ෂිත කරලායි තිබුණේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, එදා ජනාධිපතිවරයා හැටියට ගෝඨාභය රාජපක්ෂ මැතිතුමාට වාහන තුනකින්, barriers නැතුව ගිහිල්ලා රුවන්වැලිසෑය ළඟ දිවුරුම් දෙන්න පුළුවන් විධියට ඒ පසුබිම හැදුවේ ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා 16 වැනි දා දිනලා, 18 වැනි දා එතුමා ආණ්ඩුව අතට අරගෙන නොවෙයි. ඒ තත්ත්වය අපි හදලා තිබුණා. ඒ නිසා බොරුවට මවා පාන්න එපා. රට සුරක්ෂිතයි කිව්වා; ආහාර සුරක්ෂිතතාව හදනවා කිව්වා. නමුත්, දැන් ආහාර සුරක්ෂිතතාව සම්පූර්ණයෙන් විනාශ කරලා, කාබාසිනියා කරලා දාලා තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපි දන්නවා අද කොයිතරම් පිරිසක් දේශපාලන පළි ගැනීම්වලට ලක් කරලා තිබෙනවාද කියලා. මම අහනවා, මේ පොලිස් කොමිසම නිදිද? කියලා. ශානි අබේසේකර මහත්මයලා ගැන හඬ පටි ආවේ පස්සේ. හැබැයි, ශානි අබේසේකර මහත්මයා ප්‍රමුඛ 704කට විදේශගත වෙන්න ඉඩ දුන්නේ නැහැ. තමුන්නාන්සේලා තමයි බුද්ධි අංශය පිළිබඳ කථා කරලා මහ ලොකුවට කිඹුල් කඳුළු හෙළුවේ. අද තමුන්නාන්සේලා එහෙමයි කටයුතු කරන්නේ.

ඒ විතරක් නොවෙයි, අද පොලිස් ස්ථාන ගණනාවක ස්ථානාධිපතිවරුන් මාරු කරලා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම මේ සම්බන්ධව අදාළ ලේඛනය **සභාගත*** කරනවා.

---

** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

විශේෂයෙන්ම ගාල්ලේ හිටපු මූලස්ථාන පොලිස් පරීක්ෂක මුලතිව්වලට දාලා. බෝපේ-පෝද්දල පොලීසියේ හිටපු කෙනා මාතරට දාලා. උඩුගම හිටපු එක්කෙනා පුලියන්කුලමට දාලා. හිනිදුම හිටපු එක්කෙනා මහවෙලට දාලා. කෝ, පොලිස් කොමිසම? නිදිද? අපි ඉන්න කාලයේ මාස 6ක් ගියත් මාරුවක් හදන්න බැහැ. ඒකට කාලයක් ගියා, කොමිසමේ නිර්දේශ අරගෙන එනතෙක්. අද ඒ කොමිසම යටපත් කරලා දේශපාලන පළිගැනීම්වලට ඕනෑ විධියට කටයුතු කරන්න කරන්න පුළුවන් වෙලා තිබෙනවා.

අපි කිව්වා, තෙල් මිල අඩු කරනවා කියලා. දින 100 ආණ්ඩුව කාලයේදී පෙට්‍රල් මිල රුපියල් 33කින් අඩු කළා. පෙට්‍රල් ලීටර් 3ක් ගහන්න petrol shed එකට මෝටර් සයිකලයක් අරගෙන යනකොට, කාර් එකක් අරගෙන යනකොට, ත්‍රීවීලර් එකක් අරගෙන යනකොට රුපියල් 100ක් නැවත සාක්කුවේ දා ගන්න පුළුවන් විධියේ ලාභයක් අපි අරගෙන දුන්නා. අද ඒ මොකුත් නැහැ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, තෙල් සම්බන්ධ ඇමති කියනවා, තෙල් මිල වැඩි කරන්නේ නැහැ කියලා. හැබැයි, කැබිනට් ප්‍රකාශක බන්දුල ගුණවර්ධන මැතිතුමා කියනවා, තෙල් මිල වැඩි කරන්න වෙයි කියලා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම අවසාන වශයෙන් මේ ආණ්ඩුවට කියන්න කැමැතියි, මේ දින 66 තුළ බංකොලොත් දේශපාලනයක් කරලා, රට කාබාසිනියාවට ලක් කරලා, බඩු මිල වැඩි කරලා, දේශපාලන පළි ගැනීම් කරලා, ජනතාවට සහන ලබා නොදී කටයුතු කළ බව. ඒ නිසා මේ ජනතාවට, රටට අවශ්‍ය දේ ඉටු කරන්නය කියලා මේ ආණ්ඩුවට වගකීමෙන් කියන්න කැමැතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Next, the Hon. (Dr.) Harsha De Silva to second the Motion.

[අ.භා. 6.39]

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, බොහොම ස්තුතියි. ඉතාම කෙටි කාලයක් තමයි මට කථා කරන්න තිබෙන්නේ. මම හිතන හැටියට, රෝහිණී කුමාරි විජේරත්න මන්ත්‍රීතුමියත් කථා කරයි. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ගරු විජේපාල හෙට්ටිආරච්චි මන්ත්‍රීතුමා ගෙන ආ යෝජනාව ස්ථිර කරන්න මම බලාපොරොත්තු වෙන්නේ කාරණා තුනක් පිළිබඳ සඳහන් කරලායි.

මුලින්ම බඩු මිල ගැන කථා කරන කොට හාල් මිල ගැන කථා කරන්න ඕනෑ. අද තෙත වී නාඩු කිලෝවක් රුපියල් 37ත් 40ත් අතර මිලකට විකිණෙනවා; වියළි වී කිලෝවක් රුපියල් 43ක් පමණ වෙනවා. හැබැයි, ආණ්ඩුව කිව්වේ මොකක්ද? නාඩු වී කිලෝවක් රුපියල් 52කටත්, සම්බා වී කිලෝවක් රුපියල් 57කටත් ගන්නවා කියලායි. ඒක තමයි ගෝඨාභය රාජපක්ෂ අපේක්ෂකවරයා දීපු පොරොන්දුව. එතුමා කිව්වා, එතුමා දීපු පොරොන්දු ඉෂ්ට කරනවා කියලා. අපි කියනවා, මේ කන්නයේ නාඩු වී කිලෝවක් සඳහා මිල රුපියල් 52කටත්, සම්බා වී කිලෝවක් රුපියල් 57කටත් නියම කරලා ගැසට් කරන්න කියලා. කිරි සම්බා කිලෝවක් රුපියල් 63කට ගන්නවා කියලා තමයි කිව්වේ. ඒකත් කරනවා නම් කරන්න. ජනතාවට බොරු පොරොන්දු දෙන්නේ නැතිව ගෝඨාභය රාජපක්ෂ

[ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා]

ජනාධිපතිවරයා මේ වැඩේ කරයි කියලා අපි බලාපොරොත්තු වෙනවා. හාල් කිලෝවක් රුපියල් 98ට, රුපියල් 99ට දෙන්න ඕනෑ කියලා ගැසට් එකක් ගහලා තිබෙනවා. ඔව්, රුපියල් 98ට, රුපියල් 99ට හාල් තිබෙනවා. නැහැ කියන්නේ නැහැ. නාඩු තිබෙනවා, සම්බා තිබෙනවා රුපියල් 98ට. හැබැයි රතු කැකුළු, සුදු කැකුළු කිලෝවක මිල කීයද? රුපියල් 105ත්, රුපියල් 120ත් අතර වෙනවා. එතකොට ගැසට් එක ගහලා තිබෙනවා නම් රුපියල් 98ටයි, රුපියල් 99ටයි දෙන්න ඕනෑ කියලා, රුපියල් 105ත්, රුපියල්120ත් අතර මිලක් තිබෙන්නේ කොහොමද? ඉතින් ඒ නිසා මම රජයෙන් ඉල්ලා සිටිනවා, මිනිසුන්ව මුලා කරන්නේ නැතිව කියපු දේ ඒ විධියටම කරන්න කියලා.

අනෙක් කාරණය මෙයයි. අපි හොඳට දන්නවා, "ග්‍රාම ශක්ති ජනතා ව්‍යාපාරය" හරහා වී මෙට්‍රික්ටොන් 49,000ක් සතොස ගබඩාවල තිබුණු බව. නමුත්, ඔබතුමන්ලාගේ ආණ්ඩුව ආපු ගමන් ඒක පිරිසකට වික්කා. අපි හිතමු, ඉතිරි වෙලා තිබුණේ වී මෙට්‍රික්ටොන් 42000ක් කියලා. මොකද, අපි ගබඩාවෙන් මෙට්‍රික්ටොන් 7,000ක් නිකුත් කරලා තිබුණා. එහෙම නම් වී හාල් කළාම, හාල් මෙට්‍රික්ටොන් 27,000ක් තිබෙන්න ඕනෑ. මෙතුමන්ලා කිව්වා, සතොස හරහා තමයි සාමාන්‍ය පාරිභෝගිකයන්ට හාල් බෙදා හරින්නේ කියලා. ඒ හාල් මෙට්‍රික්ටොන් 27, 000න් සතොසට හාල් මෙට්‍රික්ටොන් කීයක් ඇවිල්ලා තිබෙනවාද? එහෙමනම්, ඇත්තවශයෙන්ම වෙලා තිබෙන්නේ මොකක්ද? අර හාල් මාෆියාවටම තමයි වී අළෙවි මණ්ඩලයේ ගබඩාවල තිබුණු වී ටික විකුණලා තිබෙන්නේ. ඉතින් අන්තිමට මොකද වුණේ? ආණ්ඩුවට වීත් නැහැ; සල්ලිත් නැහැ; හාලුත් නැහැ. මිනිස්සු රුපියල් 80ට, රුපියල් 85ට ගත්ත හාල් කිලෝ එක දැන් ගන්න වෙන්නේ රුපියල් 105ට, රුපියල් 120ටයි. මම කලින් කිව්වා වාගේ සුදු කැකුළු, රතු කැකුළුවලට වඩා අනෙක් හාල් වර්ග ඊට වඩා යම් කිසි අඩු ප්‍රමාණයකට ගන්න පුළුවන්. ඒ නිසා ගොවි මහත්තුරුන්ට දීපු පොරොන්දු ඉෂ්ට කරන්න කියලා කියන්න කැමැතියි.

එළවලු මිල ගැනත් කථා කළා. එළවලු මිල ඉහළ-පහළ යනවා. අපට ඒක තේරෙනවා. වැස්ස නිසා ඒ ප්‍රශ්න තිබෙනවා. නමුත්, එළවලු මිලෙහි උච්චාවචනය යම් කිසි ප්‍රමාණයකට හෝ අඩු කරන්න නම් ඒ සඳහා තෙතමනය හා උෂ්ණත්වය පාලනය කරපු ගබඩා හදන්න ඕනෑ. අවුරුදු ගණනාවක් තිස්සේ ඒක කළේ නැහැ. මම ඒ අමාත්‍යාංශයේ ඉන්න කොට මට අවස්ථාව ලැබුණු නිසා තමයි ලංකාවේ පළමුවැනි වතාවට එවැනි ගබඩාවක් දඹුල්ලේ හදන්න පටන් ගත්තේ. අපි ගිය අවුරුද්දේ අප්‍රේල් මාසයේ ඒ කැලැව ශුද්ධ කළා. ඒ සම්බන්ධ පින්තූර හතරක් තිබෙනවා. මම ඒවා **සභාගත*** කරන්න කැමැතියි.

දඹුල්ල මාර්කට් එකට එහා පැත්තේ අක්කර හයේ කැල්ල ශුද්ධ කරනවා. ඊට පස්සේ ඒක සිමෙන්ති දාලා හදා ගෙනයනවා. අපි යම් කිසි ප්‍රමාණයකට ඒක හදන්න කටයුතු කළා. නමුත් මේ කටයුතු ඇද - ඇද යනවා. මාර්තු මාසය වෙන කොට සමහරු ලූනු nurseries පටන් ගන්නවා. අගෝස්තු විතර වෙන කොට මේ ලූනු අස්වැන්න ගන්නවා. ඒ ලූනු අස්වැන්න ගන්න කොට ලූනු අස්වැන්න ගබඩා කරන්න තෙතමනයයි, උෂ්ණත්වයයි පාලනය කරන, මෙට්‍රික්ටොන් 5,000 ගබඩාව හදලා ඉවර කරන්න. කරුණාකරලා ඒකට priority එකක් දෙන්න. දැන් මිනිසුන්ට ලූනු කන්න බැහැ, ලූනු කිලෝ එකක් රුපියල් 800 ගණනක් වෙනවා. මගේ wife පවා ඒ ගැන complain කරනවා. ඒ නිසා ඉදිරි අස්වැන්න ලබන කාලයට ලූනු ගොවීන්ට සාධාරණ price එක ලබා ගන්නත්, පාරිභෝගිකයන්ට යම් කිසි සාධාරණයක් වෙන්නත් කරුණාකරලා ඒ ගබඩාවේ ඉදිකිරීම් කටයුතු ඉවර කරන්න. ඔබතුමන්ලාට යම් කිසි හෝ සහයෝගයක් අවශ්‍ය නම් අපි ඒ සහයෝගය දෙන්නම්. මේකට රුපියල් මිලියන 600ක් වියදම් වෙනවා. ටෙන්ඩර් දාලායි ඒ කටයුතු කළේ. ඒකෙන් රුපියල් මිලියන 300ක්ම නැවත නොගෙවන ප්‍රදානයක් හැටියට ඉන්දියානු රජයෙන් අපට ලබා දුන්නා. ඉතින් ඒ නිසා කරුණාකරලා එහි ඉදිකිරීම් කටයුතු ඉවර කරන්න කියලා මම ඔබතුමන්ලාගෙන් ඉල්ලනවා.

අවසාන වශයෙන් මම මේ කාරණය කියන්නම්. පොල් ගැනත් ඔබතුමන්ලාට කල්පනා කරන්න සිදු වෙයි. දැන් පොල් ගෙඩියක් රුපියල් 60යි. ජීවන වියදම ගැන කථා කරනවා නම්, ආණ්ඩුව දීපු පොරොන්දු ඉෂ්ට කරන්න; ඒ වැඩ පිළිවෙළ ඉස්සරහට කරගෙන යන්න. ගොවි මහත්වරුන්ට දීපු පොරොන්දුවත් ඉෂ්ට කරලා ඒ අයට වී කිලෝ එකකට නාඩු සඳහා රුපියල් 52යි, සම්බා සඳහා රුපියල් 57යි විධියට සහතික මිලක් ගෙවන්න. බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ඊළඟට, ගරු අශෝක් අබේසිංහ මහතා.

[අ.භා.6.44]

**ගරු අශෝක් අබේසිංහ මහතා**
(மாண்புமிகு அசோக் அபேசிங்க)
(The Hon. Ashok Abeysinghe)
ස්තුතියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

ඉතාම කාලෝචිත සභාව කල් තැබීමේ යෝජනාවක් තමයි විජේපාල හෙට්ටිආරච්චි මන්ත්‍රීතුමා විසින් ගෙන එනු ලැබුවේ. මෙම රජය බලයට පත් වෙලා මාස දෙකකට වැඩි කාලයක් ගත වෙලා තිබෙනවා. නමුත් මේ රජය අසමත් වෙලා තිබෙනවා, අත්‍යවශ්‍ය ආහාර ද්‍රව්‍ය මිල පාලනය කරන්න. 2015දී අපේ රජය බලයට පත් වුණාට පසු අපි පැකේජයක් වශයෙන් ගෙන අත්‍යවශ්‍ය ආහාර ද්‍රව්‍ය මිල පාලනය කළා. විශේෂයෙන්ම සහල් මිල පාලනය කළා. ඒ වාගේම, සැමන්, පරිප්පු, අල, සීනි ඇතුළු සියලු අත්‍යවශ්‍ය ආහාර ද්‍රව්‍ය මිල පාලනය කළා. පොල් ගෙඩියේ පවා මිල සාමාන්‍ය තත්ත්වයක තිබුණා.

පසුගිය රජයට ශ්‍රේෂ්ඨාධිකරණය තීන්දුවක් දීලා තිබුණා, පෙට්‍රල්, ඩීසල් මිල අඩු කරන්න කියලා. එහෙම කරන්නේ නැතුව ඉතාම වැඩි ගණනකට ඩීසල් මිල වැඩි කළා. එවැනි තත්ත්වයක් තුළ අපි 2015දී බලයට පත් වෙලා 2019 වන තෙක්ම ඉන්ධන මිල 2015 තිබුණාට වඩා අඩු තත්ත්වයක තියාගෙන හිටියා. ඒ වාගේම අත්‍යවශ්‍ය ආහාර ද්‍රව්‍යවල මිල පාලනය කරලා තිබුණා. හැබැයි, මේ මාස දෙකක කාලය තුළ අත්‍යවශ්‍ය ආහාර ද්‍රව්‍යවල මිල ජනතාවට දරා ගත නොහැකි තත්ත්වයට ඉහළ ගිහිල්ලා තිබෙනවා.

අපේ හර්ෂ ද සිල්වා මැතිතුමා කිව්වා, සහල් මිල පිළිබඳව. ඔබතුමන්ලාගේ ප්‍රතිපත්ති ප්‍රකාශනයේ කිව්වා, වී මිලදී ගන්නේ නාඩු කිලෝ එකක් රුපියල් 52කට, සම්බා කිලෝ එකක් රුපියල් 57කට, කීරි සම්බා කිලෝ එකක් රුපියල් 63කට කියලා. අපි සන්තෝෂ වෙනවා, මෙම සහතික මිලට ගොවීන්ගෙන් වී මිලදී ගන්නවා නම්. නමුත් සහල් කිලෝ එකක් නිපදවන්න වී කිලෝ එකයි දශම හයක් ඕනෑ. ඒ වාගේම වෙළෙඳ පොළට යද්දී වී කිලෝ එකක මිල දෙකයි දශම එකකින් වැඩි කළාම තමයි සහල් මිල තීන්දු වෙන්නේ. ඒ අනුව බලද්දී රුපියල් 52කට නාඩු

---

*** පුස්තකාලයේ තබා ඇත.**
* நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.
* *Placed in the Library.*

ගත්තොත්, වෙළෙඳ පොළට යද්දී සහල් කිලෝ එකක මිල රුපියල් 109ක් පමණ වෙනවා. කීරි සම්බා රුපියල් 63කට ගත්තොත් වෙළෙඳ පොළට යද්දී කීරි සම්බා කිලෝ එකක මිල රුපියල් 130ක් බවට පත් වෙනවා. ඉතින් මේ තත්ත්වය තුළ ඇතිවන තත්ත්වය පාලනය කරන්න ගොවීන්ටත් ඒ අවශ්‍ය පහසුකම දෙනවා වාගේම, පාරිභෝගිකයාටත් සහනයක් ලැබෙන වැඩ පිළිවෙළකට අනිවාර්යයෙන්ම යන්න සිදු වෙනවා. එහෙම නැතුව මෙම සහතික මිලට ගත්තොත් අනාගතයේදී සහල් මිල විශාල ලෙස ඉහළ යනවා.

පොල් ගෙඩියක මිලත් ඉතා ශීඝ්‍ර ලෙස වැඩිවෙමින් තිබෙනවා. ඒ සඳහාත් මේ රජය යම් වැඩ පිළිවෙළක් සකස් කළ යුතු වෙනවා. එහෙම නැත්නම් දැන් ජනතාවට තිබෙන ආර්ථික අපහසුතාවත් එක්ක තව ඉදිරියට යද්දී ජනතාව කබලෙන් ළිපට වැටෙන තත්ත්වයකට පත්වෙයි.

අපේ රජය විසින් රාජ්‍ය සේවකයන් දහහතර ලක්ෂයකගේ වැටුප සියයට 107කින් වැඩි කළා. මේ වසරේ ජනවාරි මාසයේ සිට රනුග්ගේ කොමිසමේ වාර්තාව අනුව රාජ්‍ය සේවකයෙකුගේ වැටුප අවම රුපියල් 3,000ක්, උපරිමය රුපියල් 20,000ක් අතර ප්‍රමාණයකින් වැඩි කරන්න තීන්දු කරලා තිබුණා. නමුත්, මේ නව රජය එය නතර කර තිබෙනවා. ඒ වාගේම, පසුගිය කාලයේ විධායක නිලධාරින් වැඩ වර්ජනයක නිරත වෙලා සිටියා, ඔවුන්ගේ දීමනාව වැඩි කරන්න කියලා. ඒ සම්බන්ධයෙන් පත් කළ කමිටුවේ මාත් සිටියා. එහිදී අපි තීන්දුවක් ගත්තා, ජනවාරි මාසයේ සිට එම නිලධාරින්ට රුපියල් 15,000ක දීමනාවක් ලබා දෙන්න. දැන් ඒ දීමනාවත් නතර කර තිබෙනවා. ගැබිනි මව්වරුන්ට දෙන දීමනාව වැඩි කරනවා කියලා ඔබතුමන්ලාගේ ප්‍රතිපත්ති ප්‍රකාශනයේ තිබුණා. නමුත්, අපට දැනගන්න ලැබී තිබෙන විධියට දැන් ඒ දීමනාවත් නොලැබෙන තත්ත්වයක් තිබෙනවා.

ඒ දීමනා සියල්ල නොලැබෙන තත්ත්වයක් තුළ ඉදිරියේදී ජනතාව තවත් අපහසුතාවට පත් වනවා, බඩු මිල ඉහළ යෑම නිසා. එම නිසා රට වෙනුවෙන් බලයට පත් වූ රජයක් ලෙස ජනතාවට සහන සැලසීම සඳහා යම්කිසි ක්‍රියා මාර්ගයක් ඉක්මනින් ගත්තේ නැත්නම් ඉදිරියේදී -විශේෂයෙන් අප්‍රේල් මාසයේදී- ජනතාව තවත් අපහසුතාවට පත් වෙයි කියා මම හිතනවා. මොකද, ඒ උත්සව සමයේදී අත්‍යවශ්‍ය ආහාර ද්‍රව්‍යවල මිල තවත් ඉහළ යන්න ඉඩ තිබෙන නිසා.

දැනටමත් ලෝක වෙළෙඳ පොළේ බොර තෙල් මිල ශීඝ්‍රයෙන් ඉහළ ගිහින් තිබෙනවා. එසේ මිල ශීඝ්‍රයෙන් ඉහළ යන තත්ත්වය තුළ ඉදිරියේදී රජයට ඉන්ධන මිලේත් යම්කිසි වෙනසක් කිරීමට සිදු වුණොත් මේ ආහාර ද්‍රව්‍යවල මිල තවත් ඉහළ යෑම වළක්වන්න බැහැ. ඒ නිසා මම විශේෂයෙන්ම රජයෙන් ඉල්ලා සිටිනවා, ජනතාවට සහන සැලසීම සඳහා යම්කිසි වැඩ පිළිවෙළක් සකස් කරන්න කියලා. එය විශේෂයෙන්ම ඡන්දය බලාගෙන කරන දෙයක් නොවිය යුතුයි. මොකද, දැන් අප්‍රේල් මාසයේ ඡන්දයකුත් එනවා. ඒ නිසා ස්ථිර වැඩ පිළිවෙළක් සකස් නොකළොත්, මේ බදු අඩු කිරීම තුළින් එන බර දැරීමේ තත්ත්වයටත් මුහුණ දෙන්න ජනතාවට සිද්ධ වෙයි.

අපි 2019 අය වැයෙන් ඉදිරිපත් කළා, රුපියල් බිලියන 2,400ක ආදායමක් ලැබෙනවාය කියන කාරණය. නමුත්, 2020 වර්ෂයට අය වැයකුත් නැහැ. දැන් මේ කළ බදු අඩු කිරීම යටතේ රුපියල් බිලියන 550ක පමණ බදු ආදායමක් අහිමි වෙනවා. ඒ කියන්නේ, රුපියල් කෝටි 55,000ක් පමණ. ඒ නිසා රාජ්‍ය ආදායම ශීඝ්‍රයෙන් අඩු වෙනවා. 2020 වසරේ රුපියල් කෝටි 150,000ක පමණ ආදායමක් තමයි එන්නේ. හැබැයි, වියදම රුපියල් කෝටි 470,000ක් -රුපියල් බිලියන 4,700ක්- බවට පත් වෙලා තිබෙනවා. ආදායම රුපියල් බිලියන 1,500ක් වෙලා වියදම රුපියල් බිලියන 4,700ක් වුණාම මේ රටේ ජනතාවට මේ සහන ලබා දෙන්නේ කෙසේද කියන ප්‍රශ්නයත් ඇති වෙලා තිබෙනවා.

ඔබතුමන්ලා ප්‍රකාශ කර තිබුණා, රැකියා ලක්ෂයක් ලබා දෙනවා කියලා. රාජ්‍ය ආදායම ශීඝ්‍ර ලෙස පහත වැටෙන තත්ත්වයක් තුළ රැකියා ලක්ෂයක් ලබා දෙන්නේ කෙසේද? ඒ රැකියා ලක්ෂයත් ලබා දුන්නාම එහි බරත් මේ සාමාන්‍ය ජනතාව මත පැටවෙන බව අපට හොඳින් තේරුම් යන දෙයක්. ඒ නිසා, මේ අත්‍යවශ්‍ය ආහාර ද්‍රව්‍යවල මිල ශීඝ්‍රයෙන් ඉහළ යන තත්ත්වය පාලනය කිරීම සඳහා කඩිනම් වැඩ පිළිවෙළක් සකස් කරන ලෙස රජයෙන් විශේෂයෙන් ඉල්ලා සිටිමින් මගේ කථාව අවසන් කරනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
මීළඟට, ගරු ජානක වක්කුඹුර රාජ්‍ය අමාත්‍යතුමා.

[අ.භා.6.50]

**ගරු ජානක වක්කුඹුර මහතා (අපනයන කෘෂිකර්ම රාජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு ஜானக வக்கும்புர - ஏற்றுமதிக் கமத்தொழில் இராஜாங்க அமைச்சர்)
(The Hon. Janaka Wakkumbura - State Minister of Export Agriculture)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ ගරු මන්ත්‍රීතුමා ගෙනාපු යෝජනාවත් එක්ක එතුමන්ලා මේ මාස දෙකක තරම් වූ කාලය තුළ හරියට උඩින් පහත් වුණා වගේ තමයි කථා කරන්නේ. අපි මේ ආණ්ඩුව ගන්නකොටත් මේ සෑම භාණ්ඩයකම මිල වැඩි වෙලා තිබුණා. හැබැයි අපි ආණ්ඩුව ගත්තාට පස්සේ ගොවියාගේ නිෂ්පාදනවලට සාධාරණ මිලක් ලබා දුන්නා. පසුගිය කාලයේ ඒ සියලු දේ පිටරටින් ගෙනෙන්න පටන්ගත්තා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Order, please! මේ අවස්ථාවේදී කවුරුන් හෝ ගරු මන්ත්‍රීවරයකු ගරු ශ්‍රියානි විජේවික්‍රම මහත්මියගේ නම මූලාසනය සඳහා යෝජනා කරන්න.

**ගරු ඩබ්ලිව්.ඩී.ජේ. සෙනෙවිරත්න මහතා**
(மாண்புமிகு டபிள்யு.டி.ஜே. செனெவிரத்ன)
(The Hon. W.D.J. Senewiratne)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, "ගරු ශ්‍රියානි විජේවික්‍රම මහත්මිය දැන් මූලාසනය ගත යුතුය" යි මා යෝජනා කරනවා.

**ගරු නිහාල් ගලප්පත්ති මහතා**
(மாண்புமிகு நிஹால் கலப்பத்தி)
(The Hon. Nihal Galappaththi)

***විසින් ස්ථිර කරන ලදී.***
*ஆமோதித்தார்.*
*Seconded.*

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***අනතුරුව ගරු ක. තුරෙයිරෙත්නසිංහම් මහතා මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු ශ්‍රියානි විජේවික්‍රම මහත්මිය මූලාසනාරූඪ විය.***
*அதன்பிறகு, மாண்புமிகு க. துரைரெட்ணசிங்கம் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு (திருமதி) ஸ்ரீயாணி விஜேவிக்கிரம அவர்கள் தலைமை வகித்தார்கள்.*
*Whereupon* THE HON. K. THURAIRETNASINGAM *left the Chair, and* THE HON. (MRS.) SRIYANI WIJEWICKRAMA *took the Chair.*

**ගරු ජානක වක්කුඹුර මහතා**
(மாண்புமிகு ஜானக வக்கும்புர)
(The Hon. Janaka Wakkumbura)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි. ගම්මිරිස්, ඉඟුරු, කහ, කරුංකා ආදි සෑම දෙයක්ම පිටරටින් ගෙනාවා. ගෙනැල්ලා මේ රටේ ගොවියා නැත්තටම නැති කළා. මේ යෝජනාව ගෙනාපු මන්ත්‍රීතුමාගේ ගමේ සිටින ගම්මිරිස් ගොවියාටත් ගම්මිරිස් විකුණා ගන්න බැරිව සිටියා. හැබැයි, අපි පිටරටින් ගම්මිරිස් ගෙන්වන එක නතර කළාට පස්සේ අද ඒ ගොවියාගේ අත මිට සරු වෙන්න පටන් ගෙන තිබෙනවා. ඒ නිසා අපි බලාපොරොත්තු වෙනවා, ගොවිතැන් කරන සෑම කෙනෙකුගේම ගොවිතැනට සාධාරණයක් ඉෂ්ට කරලා දෙන්න. පසුගිය කාලයේ ගොවීන් ගොවිතැනින් ඈත් වෙලා සිටියා. අපි දැන් හුඟක් වෙලාවට සොයාගෙන යනවා, ඇයි මේ ගොවීන් ගොවිතැනින් ඈත් වුණේ කියලා. පසුගිය ආණ්ඩුව ගොවියාට කිසිදු සහනයක් ලබා දුන්නේ නැහැ. ඒ වාගේම, කුඹුරු එහෙමපිටින්ම වගා කළේත් නැහැ. ඒ නිසා සහල් නැති වුණා. එය අපේ වරදක් නොවෙයි. පසුගිය ආණ්ඩුව කාලයේ ඒ වැඩසටහන හරියාකාරව කරගෙන ආවේ නැති නිසායි මේ රටේ ගොවීන් ගොවිතැන් නොකළේ. අපි දැන් ඒ ගොවිතැනට අවශ්‍ය කරන පහසුකම් ලබා දෙනවා. එදා ඇළ වේල්ලක්, වතුර පාරක් එන තැනක්, anicut එකක් හදලා දුන්නේ නැහැ. ඒ නිසා තමයි ගොවියා ගොවිතැනින් ඈත් වුණේ. ගොවිතැනින් ඈත් වුණු ගොවියා නැවත වරක් ගොවිතැනට යොමු කරන්න තමයි අපි කටයුතු කරලා තිබෙන්නේ. වර්තමාන ජනාධිපතිතුමා කිව්වේ, ගොවියා උද්සෝෂණය කරන එක නතර කරලා ගොවිතැනට යොමු කරන්න කියලායි. අපි දැක්කා, කොළඹ පාරවල වැඩ කරන්න පසුගිය දවස්වල ආවේ මේ රටේ ගොවීන් බව. මේ රටේ ගොවියෝ ගොවිතැන් කරනවා වෙනුවට බඳාම ඇනුවා. එතකොට රටක් සංවර්ධනය වෙයිද? මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, ඔබතුමිය සිටින ප්‍රදේශය දෙස බැලුවත් එහෙමයි. ඒ සෑම ප්‍රදේශයකම වාගේ කළේ ගොවිතැනයි.

පසුගිය ආණ්ඩුව කාලයේ පැල්වත්ත සීනි කර්මාන්තායතනය රුපියල් මිලියන 1,100ක් පාඩු ලැබුවා. හිටපු ජනාධිපති, අතිගරු මහින්ද රාජපක්ෂ මැතිතුමාගේ කාලයේ ඒක ලාභ ලබපු ආයතනයක් බවට පත් කළා. ඒ ආයතනයේ fixed deposit එක විතරක් රුපියල් මිලියන 8,000ක් තිබුණා. හැබැයි, අද එම ආයතනය රුපියල් මිලියන 1,100කින් පාඩු කරලා.

සෙවනගල සීනි කර්මාන්තායතනය සෑම දාම ලාබ ලබපු ආයතනයක්. පැවැති ආණ්ඩුව ඒකත් පාඩු ලබන ආයතනයක් බවට පත් කළා. ඒ අය මේ රටේ තිබෙන අපේ කර්මාන්තායතන පාඩු ලබන ආයතන බවට පත් කළා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මා ඔබතුමියට කියන්න සතුටුයි, එතනෝල් පිටරටින් ගෙනෙන එක නතර කරපු නිසා මේ කර්මාන්තශාලා නැවත වරක් ලාභ ලබන තත්ත්වයට පත් කරන්න අපට අද පුළුවන්කම ලැබිලා තිබෙන බව. ඒ ගොල්ලෝ පසුගිය කාලයේ එතනෝල් ලීටර් එකක් විකුණුවේ රුපියල් 290කට. අපි ඒක රුපියල් 550 දක්වා වැඩි කළා. එදා කෝටිපතියන් අතට ගිය ඒ සල්ලි නැවත වරක් මෙරටට හිමි කර දෙන්න අපි කටයුතු කළා. එක ලීටරයක මිල රුපියල් 260කින් වැඩි කරලා, අපි ඒ ලාභය අරන් දුන්නා. එතනෝල් ලීටර 280,000ක් විකුණුවා. ඒ විකුණපු ටිකෙන් විතරක් රුපියල් මිලියන 72ක් ලාභ ලැබුවා. තවත් විශාල ප්‍රමාණයක් තිබෙනවා. එතුමන්ලා එදා රජයේ ආයතන හිතා මතා පාඩු කළා. ඒ ආයතන විකුණා දමන්නයි පාඩු කළේ. නමුත්, අපි ඒ ආයතන අද ලාභ ලබන ආයතන බවට පත් කර තිබෙනවා. එදා පැල්වත්ත සීනි කර්මාන්තායතනයේ සේවකයන් 4,800ට පඩි ගෙවා ගන්න බැරි වුණා. පඩි ගෙවා ගන්න බැරි වෙච්ච ඒ ආයතනයේ සේවකයන්ට පඩි ගෙවන්න අවශ්‍ය මුදල් ඒ ආයතනය තුළින්ම සොයා දෙන්න අපි කටයුතු කර තිබෙනවා.

මේ රටේ ගොවියා ශක්තිමත් කරනවා වාගේම ගෙවතු දසලක්ෂයක් හදන්නත් අපි බලාපොරොත්තු වෙනවා. ගෙවතු දසලක්ෂය හදන්නේ නිවැසියන්ට අවශ්‍ය කරන දේවල් තමන්ගේ ගෙවත්තේම හදා ගන්නයි. අපි දන්නවා, ගෙදර හදාගන්න පුළුවන් සෑම දෙයම අද පොළට ගිහින් ගන්නා බව. රම්පේ කොළයත් ගන්නේ පොළෙන්. කරපිංචා ගන්නේත් පොළෙන්. ඒ ආදි සෑම දෙයක්ම පොළෙන් ගන්නවා. එම නිසා, වර්තමාන ජනාධිපතිතුමාගේ සංකල්පයක් අනුව අපි බලාපොරොත්තු වෙනවා, ගෙවත්තක් හදා ගන්න මුදලකුත් දීලා, ඒ අයට අවශ්‍ය කරන පැළ ටිකකුත් දීලා, තමන්ට අවශ්‍ය කරන දේවල් තමන්ගේ ගෙවත්තේ හදාගන්නා ක්‍රමයක් සකස් කර දෙන්න. අපි එමඟින් බලාපොරොත්තු වෙනවා, මේ රටේ දැනට තිබෙන බඩු මිල මීට වඩා පහළට ගෙන එන්න කටයුතු කරන්න.

මේ, ගොයම් කැපෙන කාලය. ඒ නිසා අපි බලාපොරොත්තු වෙනවා, ඒ වී සතොස මඟින් මිලදී ගෙන, ජනතාවට මීට වඩා අඩු මුදලකට සහල් ලබා දෙන්න. හැටනව ලක්ෂයක ජනතාවගේ බලාපොරොත්තු සුන් වුණේ නැහැ. ඒ ජනතාවගේ බලාපොරොත්තු මල් ඵල ගන්වන්න අපි අද කටයුතු කර තිබෙනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මේ රටේ එකම උපාධිධාරියකුවත් මාර්තු 01 වැනි දා වෙන කොට රැකියාවක් නැතිව ගෙදර ඉන්නේ නැහැ. ඒ අය නියත වශයෙන්ම රාජ්‍ය සේවයට බඳවා ගන්නවා. තමුන්නාන්සේලා කළා වාගේ උපාධිධාරින් 20, 30 ඉස්කෝලවලට දමලා නිකම් බලාගෙන ඉන්න සැලැස්වීම නොවෙයි, ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල පුටු පුරවන එක නොවෙයි අප කරන්නේ. මේ රටේ සංවර්ධනයේ කොටස්කාරයන් බවට පත් කිරීම සඳහා ඒ අයට සුදුසු රැකියා ඉදිරි මාසයක වාගේ කාලය තුළ අපි ලබා දෙනවා. ඒ වාගේම, ලක්ෂයකට රාජ්‍ය සේවයේ රස්සාවල් දෙනවා කියලා අපි කිව්වා. අපි දැන් ඒ කටයුත්ත පටන් ගෙන වැඩ කටයුතු කරගෙන යනවා. දුප්පත්කම තුරන් කරන්න, රාජ්‍ය සේවයේ රැකියාවක් ලබා දෙන්න අපි කටයුතු කරනවා. ඉදිරි කාලය තුළ ඒ රැකියා ලබා දෙන වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කරන්න අපේ රජය කටයුතු කරනවා.

අප මේවා කර ගෙන යනකොට, විපක්ෂයේ මන්ත්‍රීවරුන් අද ගමේ යන්න බැරි තත්ත්වයට පත් වෙලා ඉන්නවා. ඒක නිසා තමයි අපේ ආණ්ඩුවට දැන් යම් යම් චෝදනා එල්ල කරන්නේ. දැන් රන්ජන් රාමනායක මන්ත්‍රීතුමා ඇලා තවත් දෙයක් කරන්න යනවා. එතුමා ඊයේ කිව්වා, මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමාත් එතුමාට කතා කළා කියලා. එතුමාට සුබ පැතුවා, උපන්දිනයට. මම දන්නවා, ගරු මහින්ද රාජපක්ෂ හිටපු ජනාධිපතිතුමා සෑම දාම පක්ෂ, විපක්ෂ කියලා භේදයක් නැතිව උපන් දිනයට ඕනෑම කෙනෙකුට සුබ පතනවා කියලා. ඇත්ත තමයි කතාව. දැන් කාගේ හරි උපන් දිනයකට සුබ පැතුවොත්, ඒකත් ඉතින් කථා කිරීමක් තමයි. අන්න එහෙම කථා කරපු ඒවාත් අල්ලාගෙන තමයි අද මේ පහර ගහන්නේ. ඒ මන්ත්‍රීතුමා පාර්ලිමේන්තුවේ ඉන්න මන්ත්‍රීවරුන් 225 දෙනා ගැන ම කිව්වා. අපි එතුමාට කියනවා, පුළුවන් නම් අපි ගැන කියන්න කියලා. අපි එතුමාට අභියෝගයක් කරනවා, අප යමක් කරලා තිබෙනවා නම් ඒ ගැන කියන්න කියලා. ඒ චෝදනාව සම්බන්ධයෙන්, විපක්ෂය පැත්තේ සිටින ජනතා විමුක්ති පෙරමුණේ මන්ත්‍රීවරුවත් කටක් ඇරියේ නැහැ. හැබැයි, මම කියනවා, අපි මොනවා හරි කළාය කියා එතුමාට කියන්න පුළුවන් නම් කියන්න කියලා. අපි නිර්දෝෂී මිනිස්සු. එතුමා වැලි පර්මිට්, අරක්කු බාර් ආදිය ගැන කිය කියා මේ පාර්ලිමේන්තුවේ හැම දෙනාටම දෝෂාරෝපණය කරනවා. අපි කියනවා, ඒවා ගැන කියන කොට, නම් එක්කම කියන්න, එහෙම කියන්නේ නැත්නම් මන්ත්‍රීවරු 225 දෙනාටම චෝදනා කරන්න එපා කියලා.

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)

ගරු රාජ්‍ය අමාත්‍යතුමනි, රන්ජන් රාමනායක මන්ත්‍රීතුමා ඒ ඔක්කෝම සභාගත කළා. එතුමා ඊයේ කිව්වා නේ, ඒවා සභාගත කරනවා කියලා. එතකොට, telephone calls 15,000ක් සහිත සීඩී තැටි විශාල ප්‍රමාණයක් මීට ටික වෙලාවකට කලින් පාර්ලිමේන්තුවට ලබා දුන්නා. අද හැන්දෑවේ සීඩී තැටි විශාල ප්‍රමාණයක් පාර්ලිමේන්තුවට ලබා දුන්නා.

**ගරු මහින්ද යාපා අබේවර්ධන මහතා**
(மாண்புமிகு மஹிந்த யாப்பா அபேவர்தன)
(The Hon. Mahinda Yapa Abeywardena)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, එතුමාගේ හඬපටවලින් අපට ඇති වැඩක් නැහැ. නමුත් ඒවායින් හෙළි වුණේ එතුමන්ලා ළඟ තිබෙන, එතුමන්ලාගේ පක්ෂයේ තිබෙන ඉතාම නිහීන, නිර්ලජ්ජිත වැඩ පිළිවෙළ ගැනයි. ඒ වැඩ පිළිවෙළ ගැන තමයි එතුමන්ලා ඔය වගේ මිනිස්සු ගෙනැල්ලා කථා කළේ. අපි කථා කරන්නේ ඒක ගැන නොවෙයි. මේ ගොල්ලන් කුමන ආකාරයෙන් අධිකරණයට ඇඟිලි ගහලා තිබෙනවාද, අධිකරණය හරහා අහිංසක මිනිසුන් හිරේට දැම්මාද කියන එකයි අපට තිබෙන ප්‍රශ්නය. සමහරුන්ට මරණ දණ්ඩනය නියම කළා. අන්න ඒකයි අපට තිබෙන ප්‍රශ්නය.

**ගරු ජානක වක්කුඹුර මහතා**
(மாண்புமிகு ஜானக வக்கும்புர)
(The Hon. Janaka Wakkumbura)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, ගරු රන්ජන් රාමනායක මන්ත්‍රීතුමා මේ මන්ත්‍රීවරු 225දෙනා ගැනම කිව්වා. එතකොට තමුන්නාන්සේත් ඒ 225න් එක්කෙනෙක්. හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමාත් එක්කෙනෙක්. ඒකයි මම කියන්නේ. 225දෙනා ගැන කියනකොට, එතුමා සමඟ සම්බන්ධ අය සියලුදෙනාගේම නම් කියන්න කියලායි මම කියන්නේ. හඬ පටවල අපේ නමත් තිබෙනවා නම් කියන්න කියලායි මම කියන්නේ. මේ 225දෙනාගෙන් 224 දෙනෙකුගේ නම් තිබුණත්, එතැන මගේ නම නැහැ. [බාධා කිරීමක්] ඒක තමයි මම කියන්නේ, ඒක වැරැදියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු රාජ්‍ය අමාත්‍යතුමනි, දැන් ඔබතුමාගේ කථාව අවසන් කරන්න. [බාධා කිරීමක්] එහෙම නැති වුණොත් කාලය කළමනාකරණය කරන්න බැරි වෙනවා.

**ගරු ජානක වක්කුඹුර මහතා**
(மாண்புமிகு ஜானக வக்கும்புர)
(The Hon. Janaka Wakkumbura)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, 225 දෙනෙක් ගැන කියන්න එපා කියන එකයි මම කියන්නේ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, ඉදිරි කාලයේ දී මේ හැටනවලක්ෂයකගේ පමණක් නොවෙයි, ඡන්දය දුන් නොදුන් මේ රටේ සියලුදෙනාගේම බලාපොරොත්තු මල් ඵලගන්වන්න අපේ රජය කටයුතු කරනවාය කියමින් මා නිහඬ වෙනවා,

ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

මීළඟට, ගරු රෝහිණී කුමාරි විජේරත්න මන්ත්‍රීතුමිය.

[අ.භා. 7.00]

**ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය**
(மாண்புமிகு (திருமதி) ரோஹினி குமாரி விஜேரத்ன)
(The Hon. (Mrs) Rohini Kumari Wijerathna)

ස්තුතියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි. කාන්තාවක් හැටියට ඔබතුමිය මූලාසනයේ වාඩිවෙලා සිටින වෙලාවක ජීවන වියදම ගැන කථා කරන්න ලැබීම පිළිබඳව මා සතුටු වෙනවා.

එළවලු මිල පිළිබඳව මා කථා කරන්නේ නැහැ. ඒ වාගේම හාල් මිල පිළිබඳවත් මා කථා කරන්නේ නැහැ. නමුත්, පසුගිය කාලයේ පොල් බැය, ලූනු ගෙඩිය, මිරිස් කරල අරගෙන වේදිකාවට නැඟපු මේ රටේ අප්පච්චි කියාගත් අය අද මේ රට පාලනය කරන වෙලාවක, අද අපේ ජනතාවට තුන්වේල නොවෙයි, දෙවේලක්වත්, එහෙම නැත්නම් එක වේලක්වත් හරියට කන්න බැරිව ඉන්නවාය කියන කාරණය මතක් කරන්න ඕනෑ.

විශේෂයෙන්ම අඩු ආදායම්ලාභී ගැබිනි මාතාවන්ට අපි පෝෂණ මල්ලක් ලබා දුන්නා. අපි මාසයකට රුපියල් 2,000 ගණනේ මාස 10ක් සඳහා රුපියල් 20,000ක පෝෂණ මල්ලක් ලබා දුන්නා. "පෝෂණ මල්ල විතරක් නොවෙයි, අපි සහන මල්ලකුත් දෙනවා" කියලා තමයි පසුගිය මැතිවරණ වේදිකාවේ දී කිව්වේ. දැන් අපට පෙනෙනවා, ලැබී තිබෙන සහනය මොකක්ද කියලා. අද අපට එක තැනකින් හාල් කිලෝ 10ක් ගන්න නැහැ. මම එදාත් කිව්වා, මගේ ගම වන පුබ්බිලිය කියන ගමේ කඩේකින් හාල් කිලෝ දෙකකට වඩා දෙන්නේ නැහැ කියලා. එම නිසා ඔය කියන මල් ඵලගැන්වීම කරන තෙක් අවුරුදු 5ක් බඩගින්නේ බලාගෙන ඉන්න වෙයිද කියන ගැටලුව අපට තිබෙනවා.

ඒ වාගේම, රෝහල්වල ඖෂධ හිඟයක් තිබෙනවා. ඒ ඔක්කෝම පැත්තකින් තිබ්බොත්, හිසේ කැක්කුමට, බඩේ කැක්කුමට හදිසියට ගත්ත පැනඩෝල් කාඩ් එක අද රුපියල් 32ක් වෙලා තිබෙනවා. ඒක රුපියල් 16ට තිබුණේ.

ඊළඟට, කාලය නැති නිසා මම අදාළ කාරණය පමණක් ඉදිරිපත් කරන්නම්. සුරක්ෂා රක්ෂණය ගත්තොත්, පසුගිය වසර ඇතුළත විතරක් මාතලේ දිස්ත්‍රික්කයේ දරුවන්ට සුරක්ෂා රක්ෂණය හරහා අපි රුපියල් දෙකෝටි තිස්ලක්ෂයක් ලබා දුන්නා. එම රක්ෂණ ක්‍රමය අද නවත්වලා තිබෙනවා. දරුවෙක් රෝහල්ගත වුණාම රුපියල් ලක්ෂ 2ක් දක්වා දුන්නා. බාහිර ප්‍රතිකාරවලට රුපියල් ලක්ෂ 2 බැගින් දුන්නා. අසාධ්‍ය රෝගවලට රුපියල් ලක්ෂ 2 බැගින් දුන්නා. ඒ වාගේම දෙමව්පියන්ගෙන් කෙනෙක් මිය ගියොත්, දරුවෙකුට රුපියල් ලක්ෂ 2 බැගින් දරුවන් තුන්දෙනෙකුට රුපියල් ලක්ෂ 6ක් ලබා දුන්නා. මේ ආදී වශයෙන් තිබුණු සහන කපා හැරීමක් මේ රජයේ පාලන කාලය තුළ සිද්ධ වෙලා තිබෙනවාය කියන කාරණය කියන්න ඕනෑ.

ඊළඟට, රජයේ සේවකයන්ට අග්‍රහාර රක්ෂණය තිබුණා. එම රක්ෂණය හරහා සැත්කම් සඳහා රුපියල් ලක්ෂ 10ක් ලබා දෙන්න අපේ රජය කාලයේ අවශ්‍ය ප්‍රතිපාදන සහ ඉඩ හසර ලබා දීලා තිබුණා. අද වන විට අග්‍රහාර රක්ෂණය පිළිබඳව බලාපොරොත්තු තබාගෙන සැත්කම් කරගත් අයට අද හිඟාකන්න සිද්ධවෙලා තිබෙනවා, රෝහල්වලට ගෙවන්න ණය වූ ලක්ෂ 10 සොයන්න.

ඒ වාගේම පාසල් නිල ඇඳුම් වවුචරය ගැන කථා කළොත්, නිල ඇඳුම විතරක් නොවෙයි, පාවහන් යුගළකුත් දෙනවා කියලා තමයි ගෝඨාභය රාජපක්ෂ ජනාධිපතිතුමා මැතිවරණ වේදිකාවේ දී කිව්වේ. පාවහන් කෙසේ වෙතත්, බලයට ආවාට පස්සේ මොකක්ද කළේ? පාසල් නිල ඇඳුම් වවුචරය කප්පාදු කළා. රුපියල් 750ක් ලෙස තිබුණු වවුචරය රුපියල් 525 දක්වා අඩු

[ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය]

කළා. රුපියල් 1,050ක් ලෙස තිබුණු වවුචරය රුපියල් 750ක් කළා. ඔය ආදී වශයෙන් ගත්තාම, කප්පාදු කිරීමක් තමයි කරලා තිබෙන්නේ.

අපි වැඩි කරපු රුපියල් 12,500 ඕනෑ නැහැයි කියලා, මේ රජය ගැන විශ්වාස කරලා මේ රජයට ඡන්දය දීපු රජයේ සේවකයාට මොකක්ද කළේ කියන එක අපට අහන්න සිදුවෙලා තිබෙනවා. විශේෂයෙන්ම රාජ්‍ය සේවකයන්ට දීලා තිබුණු දීමනා කපා හැරලා තිබෙනවා. වසර ගණනාවක් රජයේ ආයතනවල සේවය කරලා විශ්‍රාම යන රාජ්‍ය සේවකයන්ට තමන්ගේ විශ්‍රාම ජීවිතය සුවයෙන් ගත කරන්නට ඕනෑ නිසා අපේ රජය කාලයේ ලක්ෂ 5කට අධික විශ්‍රාමිකයන් වෙනුවෙන් රුපියල් 10,000ක් ලබා දෙන්න 35/2019 චක්‍රලේඛය යටතේ අපි යෝජනා කරලා තිබුණා. ඒකත් අද අවලංගු කරලා තිබෙනවා. මම මේ අවස්ථාවේ දී එම චක්‍රලේඛයත්, වැටුප් විස්තරය සහ එය තහනම් කරලා, අත් හිටුවලා එවපු ලියුමත් **සභාගත*** කරනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමියනි, දැන් කථාව අවසන් කරන්න.

**ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය**
(மாண்புமிகு (திருமதி) ரோஹினி குமாரி விஜேரத்ன)
(The Hon. (Mrs) Rohini Kumari Wijerathna)
මට තව විනාඩියක් දෙන්න, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි.

රැකියා ලබා දෙනවා කියලා අද ජානක වක්කුඹුර රාජ්‍ය ඇමතිතුමා ප්‍රකාශයක් කළා. මම කියන්න ඕනෑ, මොරගහකන්දේ වැඩ නවත්වපු නිසා අද වන විට මගේ ලග්ගල ප්‍රදේශයේ විතරක් එහි සේවය කරපු කම්කරුවෝ 2,000කට ආසන්න පිරිසක් රැකියා අහිමිව ගෙවල්වලට වෙලා සිටින බව. එතකොට ඒ අය ජීවත් වෙන්නේ කොහොමද? ඒ සියලුදෙනාම ඡන්දය දුන්නේ කාටද කියලා ඔබතුමන්ලා දන්නවා. ඔබතුමන්ලා ඔය කියන ආකාරයට මල්පල ගැන්වෙනකම් ඒ අය බඩගින්නේ ඉන්න ඕනෑද කියලා අපි අහනවා. ඒ නිසා අපි කියනවා, වෙච්ච පොරොන්දු ටික ඉෂ්ට කරන්න කියලා. එහෙම නැත්නම් අපි දීලා තිබුණු සහන ටික මේ රටේ ජනතාවට ලබා දෙන්න. අඩුම තරමින් කන්න බොන්න පුළුවන් විධියට මේ බඩු මිල පාලනය කරලා, ගෙදර බත් හැළියක් ඉදෙන තත්ත්වය උදා කරලා දෙන්න කියන ඉල්ලීම කරමින් මම නිහඬ වෙනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
මීළඟට, ගරු නිහාල් ගලප්පත්ති මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 3ක කාලයක් තිබෙනවා.

[අ.භා.7.05]

**ගරු නිහාල් ගලප්පත්ති මහතා**
(மாண்புமிகு நிஹால் கலப்பத்தி)
(The Hon. Nihal Galappaththi)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, "සෞභාග්‍යයේ දැක්ම" ප්‍රකාශය තුළ කුඩා දරුවාගේ සිට වියපත් දෙමවුපියන් දක්වා හැම කෙනාටම සහන සලසනවා කියන කථාව අන්තර්ගත වෙලා තිබෙනවා. මෙන්න මේ දැක්ම යථාර්ථයක් බවට පත් කරන්න මේ රටේ ලක්ෂ 69ක් ජනතාව සිය කැමැත්ත ප්‍රකාශ කළා. ඒ මොහොතේ මේ ඡන්ද ලබා ගන්න 'චෛතිය ගණයේ' පට්ටපල් බොරු තමයි මෙතුමන්ලා විසින් මහජනතාව වෙත මුදා හැරියේ; ප්‍රකාශ කළේ. නමුත් දැන් අපට පැහැදිලිවම පෙනෙනවා, ඒ දැක්මේ යථාර්ථය අද විකෘති වෙලා තිබෙනවා කියලා. ඒ මොහොතේ දැක්ම වුණේ මොකක්ද? "හොඳට තිබුණු රටක් - අපි වැටිච්ච තැනක්" මේක තමයි තොරතෝංචියක් නැතිව ප්‍රධාන පෞද්ගලික මාධ්‍ය දෙකක විශාල වශයෙන් ප්‍රචාරය වුණේ. අනේ! මිනිස්සු ඇස් දල්වාගෙන ඒක බලාගෙන හිටියා. බලයට ඇවිල්ලා තවම මාස දෙකයි ගතවෙලා තිබෙන්නේ. දැන් මොකද වෙලා තිබෙන්නේ? පොදුජන පෙරමුණ කියපු විධියටම දැන් අපට කියන්න සිද්ධ වෙලා තිබෙනවා, "හොඳට තිබුණු රටක ගෝඨාභය මහත්මයාට ඡන්දය දීලා අනේ අපි කරගත්ත විනැහියක්; අනේ අපට වෙච්ච දෙයක්" කියලා. ඒ වාගේම, -[බාධා කිරීමක්]- නැහැ, ඔබතුමන්ලා කියාපු විධියටයි මම මේ කියන්නේ. ඒ නිසා "හොඳට තිබුණු රටක ගෝඨාභය රාජපක්ෂ මහත්මයාට ඡන්දය දීලා අනේ අපි කන පරිප්පුවක්" කියලා තමයි ඡන්දය දුන් ජනතාවට දැන් කියන්න සිද්ධ වෙලා තිබෙන්නේ. ඔබතුමන්ලාට කියන්න සිද්ධ වෙන්නේත් ඒකයි. ඒ නිසා අපේ සහෝදර මැති ඇමතිවරු අදවත් ඔය ඉන්න වහල් මානසිකත්වයෙන් මිදිලා, පොඩ්ඩක් එළියට බැහැලා රටේ ජනතාව දිහා බලලා, ඒ මිනිසුන්ට සංවේදී වෙන දෙයක් හරි කළොත් යන්තම් ජාමේ බේරා ගන්න පුළුවන් කියමින් මම නිහඬ වෙනවා.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
මීළඟට, ගරු තාරක බාලසූරිය රාජ්‍ය ඇමතිතුමා. ඔබතුමාට විනාඩි 5ක කාලයක් තිබෙනවා.

[අ.භා.7.08]

**ගරු තාරක බාලසූරිය මහතා (සමාජ ආරක්ෂණ රාජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு தாரக்க பாலசூரிய - சமூகப் பாதுகாப்பு இராஜாங்க அமைச்சர்)
(The Hon. Tharaka Balasuriya - State Minister of Social Security)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, එක්සත් ජාතික පක්ෂය ගෙනැල්ලා තිබෙන මෙම යෝජනාව පිළිබඳව මම ඇත්ත වශයෙන්ම පුදුම වෙනවා. ඊයේ-පෙරේදා ඉපදුණු කට්ටිය හැටියට තමයි මේ අය අද කථා කරන්නේ. අපේ ගරු විජේපාල හෙට්ටිආරච්චි මන්ත්‍රීතුමාගෙන් මම අහන්න කැමැතියි, බෝංචි ඇටයක් හිටෙවුවොත් ඒකෙන් පලදාව ගන්න කොච්චර කාලයක් යනවාද කියලා. අපි කැරට් පැළයක් හිටෙව්වොත් අස්වැන්න ගන්න කොපමණ කාලයක් ගත වෙනවාද? ගෝවා හිටෙව්වොත් අස්වැන්න ගන්න කොපමණ කාලයක් ගත වෙනවාද? බටු පැළයක් හිටෙව්වොත් අස්වැන්න ගන්න කොපමණ කාලයක් ගත වෙනවාද? පොල් පැළයක් හිටෙව්වොත් අස්වැන්න ගන්න කොපමණ කාලයක් ගත වෙනවාද? මේ ආණ්ඩුව බලයට ඇවිත් තවම ගත වී තිබෙන්නේ දින කීයද බලන්න.

**ගරු විජේපාල හෙට්ටිආරච්චි මහතා**
(மாண்புமிகு விஜேபால ஹெட்டிஆரச்சி)
(The Hon. Wijepala Hettiarachchi)
Madam Presiding Member, I rise to a point of Order.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, අපේ රාජ්‍ය ඇමතිතුමා බෝංචි ගැන කථා කරනවා. 2015දී අපි ආණ්ඩුව අරගෙන දින 100කින් සියල්ල වෙනස් කළා. අපි ගත්තේ දින සියයයි. අපි පැළ වෙනකම් හිටියේ නැහැ; ගෙඩි හැදෙනතුරු හිටියේ නැහැ.

---
** පුස්තකාලයේ තබා ඇත.*
** நூனிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

**ගරු තාරක බාලසූරිය මහතා**
(மாண்புமிகு தாரக்க பாலசூரிய)
(The Hon. Tharaka Balasuriya)

ඒක point of Order එකක් නොවෙයි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි.

එතුමන්ලා ආණ්ඩුව ගන්නකොට මේ රටේ වී අතිරික්තයක් තිබුණා. ඒ නිසා තමයි මේ අය beer companiesවලට වී දුන්නේ. මත්තල ගුවන් තොටුපළටත් වී ගිහින් දැම්මා. ඒ නිසා තමයි එතුමන්ලාට සහල් මිල අඩු කරන්න පුළුවන් වුණේ. අපි ආණ්ඩුව ගන්නකොට තිබුණු තත්ත්වය මොකක්ද? පසුගිය කාලය තුළ මේ අය ගෙවතු වගා කටයුතුවලටවත් ජනතාව උනන්දු කළාද? මේ අය පුරුදු වුණේ පිට රටින් භාණ්ඩ ගෙනැත්, ඒකෙන් කොමිස් අරගෙන ජීවත් වෙන්නයි.

ගරු මන්ත්‍රීතුමා දැන් රැකියා ලක්ෂයක් දෙන එකටත් බණිනවා. VAT එක අඩු කරනවාටත් දැන් බණිනවා; බිලියන 500ක් විතර නැති වුණාය කියනවා. VAT එක තිබුණත් වැරදියි. [බාධා කිරීමක්] ඔබතුමා මට දිගටම බාධා කරනවා. ඔබතුමා කියන අසත්‍ය දේවල්වලට ජනතාව ඉදිරි මැතිවරණයේදී පිළිතුරු දෙයි. මට පිළිතුරු දෙන්න තිබෙනවා. ඒ නිසා ඔබතුමා නිහඬව ඉන්න.

පසුගිය අවුරුදු හතරහමාර තුළ ඔබතුමන්ලා කෘෂිකර්මයට කිසිම දෙයක් කළේ නැහැ කියලා ජනතාව පැහැදිලිව දන්නවා. අපේ මංගල සමරවීර හිටපු ඇමතිතුමාගේ නියෝලිබරල් ප්‍රතිපත්තිය තුළ තිබුණේ මොකක්ද? ජනතාවට සහනයක් දෙන්න කියලා ඕනෑම දෙයක් පිට රටින් ගෙන්වීම. අන්න ඒකයි ඔබතුමන්ලාගේ ප්‍රතිපත්තිය. දැන් මොකක්ද අපට කරන්න කියන්නේ? අපට කියන්නේ ඒ ප්‍රතිපත්තියම ඉදිරියට ගෙන යන්න කියලාද? අපේ දේශීය ගොවියා ආරක්ෂා කරන්න එපා කියලාද? ඒවාට ඔබතුමන්ලා පිළිතුරු දෙන්නේ නැහැ. මම ඔබතුමන්ලාට කියන්නේ මේ ප්‍රශ්න දිහා ඒ විධියට බලන්න එපා කියලායි.

අපි දන්නවා, මෙතැන මූලික ප්‍රශ්නයක් තිබෙන බව. ඒ ප්‍රශ්නය තමයි ගෙනාපු දහනව වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය. ඒ ගැන කථා කරන්නේ නැහැ. අපේ ගෝඨාභය රාජපක්ෂ මහත්මයාගේ ප්‍රතිපත්ති මාලාව ඉදිරියට ගෙන යන්න වුවමනාවක් තිබෙනවා නම්, එක්සත් ජාතික පක්ෂයට මේ රට ගැන මෙච්චර කැක්කුමක් තිබෙනවා නම්, තුනෙන් දෙකක සහයෝගය දීලා මහ මැතිවරණයකට යන්න එතුමන්ලාට ඕනෑ තරම් ඉඩ තිබෙනවා. නමුත් එතුමන්ලා මැතිවරණයකට යන්න බයයි. මැතිවරණයකට ගියාම තමුන්නාන්සේලාට එහි ප්‍රතිඵලය තේරෙයි. ඒ නිසා දැන්වත් අපට අපේ වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කරන්න ඉඩ දෙන්න.

දැනට මේ ආණ්ඩුව බලයට පත් වී මාස දෙකයි ගත වී තිබෙන්නේ. දැන් අපට කැරට් වවන්න ලු; ගෝවා වවන්න ලු; වී වගා කරන්න ලු; පොල් මිල අඩු කරන්න ලු. ඔබතුමන්ලාගේ ප්‍රතිපත්තිය ඉදිරියට ගෙන යනවා නම්, භාණ්ඩ ඔක්කොම පිට රටින් ගෙනැත් මිල අඩු කරන්න අපටත් පුළුවන්. හැබැයි, ඒක නොවෙයි අපේ ප්‍රතිපත්තිය. හැබැයි, අනෙක් සහන දෙන්නත් අපි අය වැයක් ගෙනෙන්න ඕනෑ.

අපි දන්නවා, මෙතැන දේශපාලන ප්‍රශ්නයක් තිබෙන බව. [බාධා කිරීමක්] ඔබතුමා මට නැවතත් බාධා කරනවා. මම කියන දෙය අහගෙන ඔබතුමා පොඩ්ඩක් පැත්තකට වෙලා ඉන්න. අපි අය වැයක් ගෙනෙන්නේ නැත්තේ ඇයි? අපට පාර්ලිමේන්තුවේ බහුතරයක් නැහැ. අපි ඒක දන්නවා. ඔබතුමන්ලා සහයෝගය දෙනවා කිව්වාට, අපි දන්නවා නේ, ඔබතුමන්ලාගේ "ගේම්" මොනවාද කියලා. රන්ජන් රාමනායක මන්ත්‍රීතුමාගේ ටේප්වලින් ඔය "ගේම්" ඔක්කොම හෙළිදරව් වෙනවා. ඔබතුමාගේත් හඬ පට ඉදිරියේදී හෙළිදරව් වේවි. අපි ඒවා පස්සේ බලා ගනිමුකෝ.

මේ යෝජනාව කිසිම එලක් නැති යෝජනාවක්. එළවලු මිල වැඩි වෙලා තිබෙනවා කියලා අපි දන්නවා. සහල් මිල වැඩි වෙලා තිබෙනවා කියලාත් අපි දන්නවා. ගෝඨාභය රාජපක්ෂ මහත්මයා දිවුරුම් දුන් දවසේම සහල් මුදලාලි කෙනෙක් සහල් මිල වැඩි කිරීමට උත්සාහ දැරූ බවත් අපි දන්නවා. සහල් මාෆියාවක් තිබෙනවාය කියන එක අපි මුල ඉඳන්ම කියනවා. අපි අදත් ඒක කියනවා. ඉදිරියේදී අපි ඒක අනිවාර්යයෙන්ම නැති කරනවා.

අපේ හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමා බොහොම හොඳ යෝජනාවක් ගෙනාවා, cold storage facilities අනිවාර්යයෙන්ම හදන්න ඕනෑ කියලා. මාත් ඒක පිළිගන්නවා. අපේ ප්‍රතිපත්ති ප්‍රකාශනයේත් ඒ යෝජනාව තිබෙනවා. නමුත් මේවා මාස දෙකෙන් හදන්න බැහැ. Google balloon, Volkswagen factory වාගේ දේවල් ඔබතුමන්ලා මාස දෙකෙන් ගෙනාවා වාගේ කටයුතු කරනවා නම් අපටත් කරන්න පුළුවන්. හැබැයි, නිවැරදි සැලසුමක් අනුව කරනවා නම් අපි ඉස්සෙල්ලා අය වැයක් ගෙනෙන්න ඕනෑ, ගරු හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමනි. අය වැයක් ගෙනාවාට පසුව තමයි අපට ඉදිරි කටයුතු ටික කරන්න පුළුවන් වන්නේ.

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha De Silva)

ගරු රාජ්‍ය ඇමතිතුමනි, ඒ ගබඩාව හදන්න budget එකක් ඕනෑ නැහැ. මම ඒකට අවශ්‍ය සල්ලි ඔක්කොම වෙන් කරලා තිබෙන්නේ. ඒකේ වියදම රුපියල් මිලියන 600යි. ඒ රුපියල් මිලියන 600න් රුපියල් මිලියන 300ක් ඉන්දියාවෙන් ප්‍රදානයක් වශයෙන් ලැබුණා. මගේ අමාත්‍යාංශයෙන් තව රුපියල් මිලියන 300ක් දුන්නා. ඒ සල්ලි ඔබතුමන්ලා ළඟ තිබෙනවා. ඇද ඇද ඉන්නේ නැතිව ඒ කටයුත්ත ඉක්මන් කරන්න කියලායි මම කියන්නේ.

**ගරු තාරක බාලසූරිය මහතා**
(மாண்புமிகு தாரக்க பாலசூரிய)
(The Hon. Tharaka Balasuriya)

හැබැයි, දැන් RDA එකේ කොච්චර ණය ප්‍රමාණයක් ගෙවන්න ඕනෑද කියලා ඔබතුමාත් දන්නවා. ගිය ආණ්ඩුවෙන් ගත්ත ණය කියලා ඔබතුමන්ලා මඟ හරිනවා වාගේ, අපි අපේ වගකීමෙන් මඟ හරින්න බලන්නේ නැහැ. අපි අනිවාර්යයෙන්ම ඒ ණය ගෙවන්න ඕනෑ. RDA එකේ විතරක් කොච්චර ණය ගෙවන්න ඕනෑද කියලා ඔබතුමා මට පොඩ්ඩක් කියන්නකෝ. ඒ ණය ගෙවන්නේ නැතිව ඔබතුමන්ලා කොච්චර projects කරලා තිබුණාද?

ඔබතුමන්ලා මොරගහකන්ද ගැන කථා කළා. රුපියල් බිලියන 10කට වඩා මොරගහකන්දට ගෙවන්න තිබෙනවා කියලා එදා ජනාධිපතිතුමාම කිව්වා නේ. අපේ සැලැස්ම ඉදිරියට ගෙනයන්න නම් අපි මේ තිබෙන ව්‍යවස්ථාදායක ගැටලු ටික ඉස්සෙල්ලාම විසඳා ගන්න ඕනෑ. ගරු හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමාත් මේ කාරණය පිළිගනීවි. මෙතැන විශාල ගැටලුවක් තිබෙනවා. පාර්ලිමේන්තු මැතිවරණයයි, ජනාධිපතිවරණයයි link කරලා නැහැ. මේ gap එක එන්න එන්න වැඩි වුණොත්, මේ ප්‍රශ්නය තවත් උග්‍ර වනවා. අපි ඉස්සෙල්ලා ඒ ප්‍රශ්නය විසඳා ගත්තොත් අපේ රට යම්කිසි විධියකින් ඉදිරියට ගෙනයන්න පුළුවන් වනවා.

මම එක්සත් ජාතික පක්ෂයට කියනවා නිකම් කිඹුල් කඳුළු හෙළන්න එපා කියලා. අද රටේ ජනතාව මේ කාරණා තේරුම් අරගෙන තිබෙනවා. පුරන් කුඹුරු අස්වැද්දීම සඳහා අද විශාල වැඩ පිළිවෙළක් තිබෙනවා. මේ කටයුතුවලට අපට සහයෝගය ලබා දෙන්න. මේවා මාස දෙකෙන් මාස හයකින් කරන්න කිව්වාට, එහෙම කරන්න බැහැ.

ස්තුතියි.

[අ.භා. 7.16]

**ගරු ඩබ්ලිව්.ඩී.ජේ. සෙනෙවිරත්න මහතා (ආර්ථික සහ ප්‍රතිපත්ති සංවර්ධන රාජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு டபிள்யு.டி.ஜே. செனெவிரத்ன - பொருளாதார மற்றும் கொள்கைகள் அபிவிருத்தி இராஜாங்க அமைச்சர்)
(The Hon. W.D.J. Senewiratne - State Minister of Economy and Policy Development)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, ගරු විජේපාල හෙට්ටිආරච්චි මන්ත්‍රීතුමා අද දින සභාව කල් තබන අවස්ථාව ඉදිරිපත් කළ යෝජනාව සම්බන්ධයෙන් මට කරුණු කාරණා කීපයක් කියන්න තිබෙනවා. එතුමාගේ මේ යෝජනාව ප්‍රධාන වශයෙන්ම කරුණු කීපයක් පදනම් කරගෙනයි ඉදිරිපත් කරලා තිබුණේ. සහල් මිල වැඩි වීම, එළවලු මිල වැඩි වීම, රැකියා ලක්ෂයක් ලබා දීම, සමෘද්ධි දීමනාව වැනි කාරණා සහ "සෞභාග්‍යයේ දැක්ම" ප්‍රතිපත්ති ප්‍රකාශනයත් මුල් කරගෙනයි එතුමා මේ යෝජනාව ඉදිරිපත් කරලා තිබෙන්නේ.

මේ යෝජනාවේදී පළමුවෙන්ම එතුමා ඉදිරිපත් කළේ සහල් මිල වැඩි වීම පිළිබඳවයි. සහල් මිල වැඩි වීමට අද ප්‍රධාන වශයෙන්ම වග කියන්නට ඕනෑ හිටපු එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුවයි. 2015 වනකොට මේ රට සහලින් ස්වයංපෝෂිත වෙලා තිබුණා. මේ රටේ ඉතිහාසයේ පළමුවැනි වතාවට තමයි 2013, 2014, 2015 කියන වර්ෂවල රටට වුවමනා තරම් සහල් නිපදවන්න පුළුවන්කම ලැබුණේ. එහෙම ඕනෑ තරම් සහල් නිපදවන්න පුළුවන්කම ලැබුණේ එදා ආණ්ඩුව කෘෂිකර්මයට මුල් තැනක් දුන් නිසායි. ගොවීන්ට සහන ලබා දුන්නා; පහසුකම් ලබා දුන්නා. ඒ විතරක් නොවෙයි, එදා රුපියල් 350ට පොහොර ලබා දුන්නා. ඒ කියන්නේ, සහනදායක මිලට පොහොර මිටියක් ලබා දුන්නා. මේ පොහොර පාවිච්චි කරලා, එදා කුඹුරු අස්වද්දලා රටට වුවමනාවටත් වඩා සහල් නිපදෙව්වා. පසුව අපි විදේශ රටවලට මේ සහල් විකුණන්න හැදුවා. නමුත් විදේශ රටවල් අපේ සහල් ගත්තේ නැහැ. ඒගොල්ලන් කන්නේ අපේ සහල් නොවෙයි. ඒ නිසා මොකද කළේ? අප්‍රිකාවේ සෝමාලියාව වාගේ ජනතාව සාගින්නෙන් පෙළෙන රටවලට මේ සහල් අපි නිකම් යැව්වා. ඒ 2015 අවුරුද්දේ. 2016 අවුරුද්දේත් මේ හාල් තිබුණා. 2014, 2015 අවුරුදුවල අස්වද්දලා, පොහොර දාලා, වගා කරපු කුඹුරුවල අස්වැන්න තමුන්නාන්සේලාත් භුක්ති වින්දා.

නමුත් 2016 අවුරුද්ද වනකොට පොහොර සහනාධාරය කැපුවා. පොහොර මිටිය රුපියල් 2,500 කළා. ඊට පස්සේ මොකද වුණේ? ගොවියෝ ගොවිතැන් අත් හැරියා; කුඹුරු අස්වැද්දීම නතර කළා. සියලු කුඹුරු පුරන් වුණා. ඒ නිසා මේ රටේ ලොකු හාල් හිඟයක් ඇති වුණා. ඒ අතරතුර තමුන්නාන්සේලා මොකද කළේ? තමුන්නාන්සේලා වී ටික කුකුළු කෑමවලට විකුණුවා. කුකුළු කෑමවලට ඒ වී ටික දුන්නා. මේවා ගැන නොයෙක් කතන්දර එදා පැතිරුණා. ගබඩාවල විශාල වශයෙන් තිබුණු වී ටික කුකුළු කෑම සඳහා විකිණීම නිසා නොයෙක් ආකාරයේ සැක කටයුතු දේවල් සිදු වුණා. නමුත්, ඊට පස්සේ මොකද වුණේ? දිගින් දිගටම, දිගින් දිගටම තමුන්නාන්සේලා පිටරටින් සහල් ගෙන්නුවා. එතකොට ගොවියා නන්නත්තාර වුණා. අද මොකද වෙලා තිබෙන්නේ? තමුන්නාන්සේලා ගිය අවුරුද්දේ දෙවැනි භාගයේදී ගෙන්විය යුතු සහල් ගෙන්නුවේ නැහැ. පසුගිය නත්තල කිට්ටු වෙනකොට, මැතිවරණය කිට්ටු වෙනකොට සහල් හිඟයක් තිබුණා. පසුගිය මැතිවරණය කාලයේත් සහල් කිලෝව රුපියල් 110යි; 115යි. ඇයි ඒ? ඒ වෙනකොට ලංකාවට ලැබිය යුතු සහල් ගෙන්වන්න තමුන්නාන්සේලා කටයුතු කළේ නැහැ. මේ ආණ්ඩුව බලයට ඇවිල්ලා සහල් ගෙන්වීමට කටයුතු කළා නම්, සහල් එනකොට මේ කාලය වෙනවා. මේ ජනවාරි මාසයේ අග. සහල් ලංකාවට එනකොට පෙබරවාරි විතර වෙනවා. පෙබරවාරි මාසයේ අපේ රටේ කුඹුරුවල අස්වැන්න කැපෙනවා. ලබන මාසය වෙනකොට නැගෙනහිර පළාතේ සහ අනුරාධපුර, කුරුණෑගල යන ප්‍රදේශවල අස්වැන්න කැපෙනවා. ඒ අස්වැන්න ගොඩට එනවා. ඒ කාලයට පිටරටින් සහල් ගෙන්නුවොත් ගොවියා අමාරුවේ වැටෙනවා. ඒ නිසා ගොවියාට සහනයක් ලැබෙන විධියට, ගොවියා නිෂ්පාදනය කරන වීවලට සාධාරණ මිලක් ලැබෙන විධියට වෙළෙඳ පොළක් සකස් කිරීම සඳහා තමයි අපි සැලසුම් කරලාම සහල් ගෙන්වීම පමා කළේ; ක්‍රියාත්මක නොකළේ. ඒ නිසා තාවකාලිකව සහල් මිල වැඩි වෙලා තිබෙනවා. එහෙම වුණේ අපේ වරදක් නිසා නොවෙයි. අපි ජාතික වැඩ පිළිවෙළක කොටස්කරුවන් ලෙසින් සහල් ගෙන්වීම නවත්වලා, මේ රටේ ගොවියාට වී ගොවිතැන් කරන්න ඉඩකඩ සලසා දීලා, ඔහුට අනාගතයේදී පහසුකම් සැලැස්වීමේ බලාපොරොත්තුවෙන් තමයි එහෙම කළේ.

ඊළඟට විජේපාල හෙට්ටිආරච්චි මන්ත්‍රීතුමා එළවලු මිල ගැන කිව්වා. එළවලු මිල වැඩිවීම තමුන්නාන්සේලාගේ කාලයේත් වරින්වර සිද්ධ වුණා. මේ එළවලු අපි වවන එළවලු නොවෙයි. වැහි කාලයට එළවලු වවන්න බැරි තත්ත්වයක් තිබෙනවා. වැහි කාලයට වවන එළවලු කුණු වෙනවා; නරක් වෙනවා. ඒ එළවලුවලින් එලදාව ගන්න බැහැ. ඒ නිසා තමයි හැමදාම වර්ෂා කාලයට එළවලු හිඟයක් ඇති වෙන්නේ. ඒක තමුන්නාන්සේලා බලයේ ඉඳිද්දි කීප වරක්ම ඇති වුණා. මේ රටේ පසුගිය මාස හතරක්ම දිගින් දිගටම -අඛණ්ඩවම- වැස්ස තිබුණා. ඒ අඛණ්ඩව තිබුණු වැස්ස නිසා මේ රටේ ලොකු එළවලු හිඟයක් ඇති වුණා. එළවලු වවන ප්‍රදේශවල එළවලු වවන්න බැරි වුණා. නමුත් දැන් වැස්ස අවසාන වෙලා තිබෙනවා. අද "ලංකාදීප" පත්තරයේ මෙසේ සඳහන්වී තිබෙනවා:

> "දඹුල්ල ආර්ථිකයේ එළවලු මිල පහළට. මාස කීපයක් තිස්සේ ශීඝ්‍රයෙන් ඉහළ යමින් තිබූ එළවලු මිල ඊයේ (21) සිට විශාල වශයෙන් පහත වැටෙමින් පවතින බව දඹුල්ල ආර්ථික මධ්‍යස්ථානයේ වෙළෙන්දෝ පවසති"

දඹුල්ල ආර්ථික මධ්‍යස්ථානය කියන්නේ අපේ රටේ තිබෙන ප්‍රධානම එළවලු වෙළෙඳ පොළ. දඹුල්ල ආර්ථික මධ්‍යස්ථානයෙන් කොළඹට පමණක් නොවෙයි එළවලු ගෙනෙන්නේ. මා නියෝජනය කරන රත්නපුර ප්‍රදේශයේත් වෙළෙන්දෝ තමන්ගේ වෙළෙඳ පොළවලට, කඩවලට එළවලු ගෙනෙන්නේ දඹුල්ල ආර්ථික මධ්‍යස්ථානයෙන්. එම පුවත් පත් වාර්තාවේ තවදුරටත් මෙසේ සඳහන් වනවා:

> "උඩරට ප්‍රදේශවලින් ලැබෙන ගෝවා, බෝංචි, කැරට් සහ ලීක්ස් වැනි එළවලු වර්ග හැර සෙසු එළවලු වර්ග බොහොමයක මිල මේ ආකාරයෙන් පහත වැටීම විශේෂත්වයකි. එළවලු වර්ග බොහොමයක් ඉකුත් සතියේ තොග මිල කිලෝවක් රුපියල් 150ත්, 300ත් අතර මට්ටමක පැවැති අතර, ඊයේ පෙරවරුව වන විට ඒවායේ තොග මිල රුපියල් 60 සිට 80 දක්වා මට්ටමට පහත වැටී තිබුණි. රාබු, නෝකෝල්, වට්ටක්කා, කරවිල, පතෝල, වම්බටු, දඹල, මැකරල් ආදී එළවලු වර්ග කිලෝවක තොග මිල රුපියල් 40 සිට රුපියල් 80 දක්වා මට්ටමක පැවැති අතර, මීට ඉහත දී එළවලු වර්ග කිලෝව රුපියල් 150 සිට 300 දක්වා මිල ගණන්වලට අලෙවි කෙරුණු බව වෙළෙන්දෝ පවසති"

ඒ කියන්නේ රුපියල් 150 සිට රුපියල් 300 දක්වා තිබුණු එළවලු මිල අද රුපියල් 60ට, රුපියල් 80ට අඩු වෙලා තිබෙනවා. ඇත්ත වශයෙන්ම මේ තත්ත්වය එළවලු මිල පහත වැටීමේ ආරම්භයක්. ඒ නිසා එළවලු මිල ගැන හෙට අනිද්දා කථා කරන්න පුළුවන් වෙන්නේ නැහැ. මොකද, දැන් ඇති තරම් එළවලු මේ රටේ වෙළෙඳ පොළට එන නිසා.

එතුමාගේ යෝජනාවේදී තවත් කාරණයක් කිව්වා. එනම් රැකියා ලක්ෂයක් ලබා දීමේ දී දැනට පෞද්ගලික අංශයේ සිටින සේවකයන්ව ඉවත් කරලා, රැකී රක්ෂා ලබා දෙනවා කියලා එතුමා කිව්වා. කෙසේවත් එහෙම සිද්ධ වෙන්නේ නැහැ. මම ඒක පැහැදිලිව කියන්නට ඕනෑ. මොකද, රක්ෂා කරන අය එළියට දමලා, අලුතින් රක්ෂා දීමෙන් මේ ප්‍රශ්නය විසඳෙන්නේ නැහැ. මැතිවරණ කාලයේදී ජනාධිපතිතුමා කිව්වා, "මේ රටේ දුප්පත්ම

පන්තියේ අය අද කිසිම හච් හරණක් නැතුව ඉන්නේ. සාමාන්‍ය පෙළ සමත් නැති පුද්ගලයාට මේ රටේ අද කිසිම රැකියාවක් නැහැ. ජීවත්වීම සඳහා ක්‍රමයක් සොයාගන්න බැරි වුණොත් ඔවුන්ට වෙන්නේ මුහුදේ පනින්නයි; සිය දිවි නසා ගන්නයි. එවැනි තත්ත්වයක් අද නිර්මාණය වෙලා තිබෙනවා. ඒ නිසා ජීවත්වීමේ මාර්ගයක් නැති අයට රැකියාවක් දීමේ වැඩ පිළිවෙළකට පළමුවෙන්ම අපි යන්න ඕනෑ" කියලා. අද එතුමා ඒ වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කරන්න කටයුතු කරනවා. ඕනෑවට වඩා දේශපාලනය ගාවන්නේ නැතුව ඒ වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කරන්න යෑම ගැන තමුන්නාන්සේලා සන්තෝෂ වෙන්න ඕනෑ. මා හිතන හැටියට ප්‍රාදේශීය ලේකම් කාර්යාල මට්ටමින් සම්මුඛ පරීක්ෂණ කැඳවා, දේශපාලන නැඹුරුවක් නැතුව ඒ වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කිරීමටයි එතුමා බලාපොරොත්තු වන්නේ. එසේ ක්‍රියාත්මක වීම තුළින් මේ රටේ සැබෑවටම රැකියා අවශ්‍ය, දිළිඳුකමේ පතුලටම බැහැලා ඉන්න, වෙනත් රැකියාවක් ලබාගන්න සුදුසුකම් නැති උදවියටත් රජයේ රැකියාවක් කරලා ජීවිකාව ගෙන යන්න පුළුවන්කම ලැබෙනවා.

ඊළඟට සමෘද්ධි දීමනාව කප්පාදු කරනවාය කිව්වා. කිසිම විධියකින් සමෘද්ධි දීමනාව කප්පාදු කරන්න අපි බලාපොරොත්තු වන්නේ නැහැ. අපි බලාපොරොත්තු වන්නේ සමෘද්ධි දීමනාව ලබන අය දිළිඳුභාවයෙන් මුදවා ගන්නයි. තමුන්නාන්සේලා දේශපාලන වුවමනා සඳහා පාවිච්චි කරන්න සමෘද්ධි දීමනාව තබාගෙන ඉන්නවා. තමුන්නාන්සේලාට වුවමනා කරන්නේ, සමෘද්ධි දීමනාව අවුරුද්දෙන් අවුරුද්ද කාට-කාට හෝ දීලා ඡන්දය ලබා ගන්නයි. ඒක තමයි පසුගිය කාලයේ කළේ. ලක්ෂ 6කට සමෘද්ධි දීමනාව දීමේ වැඩ පිළිවෙළ යටතේ සමෘද්ධි දීමනාව ලැබිය යුතු අයට පමණක් නොවෙයි, නොලැබිය යුතු අයටත් දුන්නා. ඒ තුළින් බලාපොරොත්තු වන්නේ මොකක්ද? ඒ අයගේ ඡන්දය ලබා ගන්නයි. නමුත් ඒක නොවෙයි අපේ ප්‍රතිපත්තිය. අපේ ප්‍රතිපත්තිය ඒ අය දිළිඳුභාවයෙන් මුදවන්නයි. මේ වැඩ පිළිවෙළින් අදහස් කරන්නේ, ඒ ගොල්ලන් සදහටම දුප්පත්, දිළිඳු පවුල් වශයෙන් ගණන් නොගෙන, හැම දාම දිළිඳු පවුල් වශයෙන්ම හංවඩු නොගසා, දිළිඳුකමින් මුදවාගෙන, දෙපයින් හිටගන්න පුළුවන් තත්ත්වයකට ගෙනෙන්නයි.

ඊළඟට "සෞභාග්‍යයේ දැක්ම" වැඩසටහන ගැන මා කියන්න ඕනෑ. ඇත්ත වශයෙන්ම "සෞභාග්‍යයේ දැක්ම" වැඩසටහනේ පළමුවන පියවර අපි ආරම්භ කළා. තමුන්නාන්සේලා යම්තම් මාස 2ක් වයසැති මේ ආණ්ඩුවට නොයෙක් ආකාරයෙන් දොස් කියනවා, අරක නැහැ, මේක නැහැ, බෙහෙත් ගණන් කියලා. නමුත් මා කියන්න ඕනෑ, බෙහෙත් ගණන් ගියේ අපේ ආණ්ඩුව කාලයේදී නොවෙයි, පසුගිය ආණ්ඩුව කාලයේදීයි කියලා. එදා රජයේ වෛද්‍ය නිලධාරින්ගේ සංගමයත් සෞඛ්‍ය ඇමතිවරයාට නොයෙක් විධියේ චෝදනා කරනවා අපි දැක්කා, බාල බෙහෙත් ලංකාවට ගෙනෙනවාය කියලා. මේ රටට සාම්ප්‍රදායිකව හොඳ ප්‍රමිතියකින් යුක්ත බෙහෙත් ගෙන්වීම නතර කරලා බාල බෙහෙත් මේ රටට ගෙනැවිත් ලෙඩුන් මැරෙන තත්ත්වයක් ඇති කළේ තමුන්නාන්සේලාගේ රජයෙන්, මේ රජයෙන් නොවෙයි. ඒ තත්ත්වය නැති කරන්න අද අපි කටයුතු කරගෙන යනවා.

ඒ විතරක් නොවෙයි. තව එක කාරණයක් මා කියන්න ඕනෑ. පෞද්ගලික හේතු මත, දේශපාලන පළිගැනීම් මත අත්අඩංගුවට ගැනීම් සිදු කරනවාය කිව්වා. ඒක සම්පූර්ණයෙන් අසත්‍යයි. ජනවාරි 14වන දා ජනාධිපතිතුමා විසින් නිකුත් කරන ලද ප්‍රකාශනයක් මා කියවන්නම්. මෙය එතුමාගේ ප්‍රකාශනයක්. ඒ ප්‍රකාශනයේ මෙසේ සඳහන් වෙනවා:

> "ජනපතිගෙන් වැඩ බලන පොලිස්පතිට උපදෙස්.
>
> අත්අඩංගුවට ගැනීම දඬුවමෙන් කොටසක් නොවන අතර, අත්අඩංගුවට පත්වීම පුද්ගල කීර්ති නාමයට හා සමාජ තත්ත්වයට දැඩි බලපෑමක් එල්ල කරන හෙයින් ඒ සම්බන්ධව කටයුතු කිරීමේ දී ඉතා සුපරික්ෂාකාරීව හා දැඩිව නීතියට අනුකූලව ක්‍රියාකරන ලෙසට පොලිස්පතිවරයා දැනුවත් කරන ලෙස ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා ජනාධිපති ලේකම් ආචාර්ය පී.බී. ජයසුන්දර මහතා වෙත උපදෙස් ලබා දී ඇත."

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමිය**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු රාජ්‍ය ඇමතිතුමනි, දැන් ඔබතුමාගේ කථාව අවසන් කරන්න.

**ගරු ඩබ්ලිව්.ඩී.ජේ. සෙනෙවිරත්න මහතා**
(மாண்புமிகு டபிள்யு.டி.ஜே. செனெவிரத்ன)
(The Hon. W.D.J. Senewiratne)
මට තව විනාඩියක් දෙන්න, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි.

ඇත්ත වශයෙන්ම එදා මේ විධියටයි කටයුතු සිද්ධ වුණේ. තමුන්නාන්සේලා FCID කියා ආයතනයක් හදලා, එය විශේෂ පරීක්ෂණ ඒකකයක් වශයෙන් ක්‍රියාත්මක කළේ දේශපාලනඥයන්ගේ ඕනෑකමටයි. එදා සොලිසිටර් ජනරාල් සුහද ගම්ලත් මහත්මයා ප්‍රසිද්ධියේ ප්‍රකාශ කළා, "මා ගෙන්වා, වාඩිකරවා ප්‍රශ්න කළා. එතැන රනිල් වික්‍රමසිංහ මහත්මයා, චන්ද්‍රිකා බණ්ඩාරනායක මැතිනිය, අනුර දිසානායක මහතා සිටියා. ඒ අය තමයි මට කිව්වේ, අසවල් අය අත් අඩංගුවට ගන්න." කියලා. ඒ විධියටයි තමුන්නාන්සේලා කටයුතු කළේ. කාට හෝ "රාජපක්ෂ" කියලා නම තිබුණා නම් ඔහු රිමාන්ඩ් කිරීමට තමයි තමුන්නාන්සේලා එදා බලාපොරොත්තු වුණේ. අද එවැනි දෙයක් සිද්ධ වෙන්නේ නැහැ.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***පාර්ලිමේන්තුව ඊට අනුකූලව අ. භා. 7.27ට, 2020 ජනවාරි 23 වන බ්‍රහස්පතින්දා පූ. භා. 10.30 වන තෙක් කල් ගියේය.***

*அதன்படி பி. ப. 7.27 மணிக்கு பாராளுமன்றம், 2020 சனவரி 23, வியாழக்கிழமை மு.ப. 10.30 மணிவரை ஒத்திவைக்கப்பட்டது.*

*Parliament adjourned accordingly at 7.27 p.m. until 10.30 a.m. on Thursday, 23rd January, 2020.*

**සැ.යු.**

මෙම වාර්තාවේ අවසාන මුද්‍රණය සඳහා ස්වකීය කථාවල නිවැරදි කළ යුතු තැන් දක්වනු රිසි මන්ත්‍රීන් මින් පිටපතක් ගෙන
නිවැරදි කළ යුතු ආකාරය එහි පැහැදිලිව ලකුණු කොට, පිටපත ලැබී දෙසතියක් නොඉක්මවා
**හැන්සාඩ්** සංස්කාරක වෙත ලැබෙන සේ එවිය යුතුය.

**குறிப்பு**

உறுப்பினர் தமது உரையின் இறுதிப் பதிப்பிற் செய்யவிரும்பும் பிழை திருத்தங்களை தமது பிரதியில் தெளிவாகக் குறித்து அதனைப் பிழை திருத்தப்படாத பிரதி கிடைத்த இரு வாரங்களுள் **ஹன்சாட்** பதிப்பாசிரியருக்கு அனுப்புதல் வேண்டும்.

**NOTE**

Corrections which Members suggest for the Final Print of their speeches should be clearly marked in their copy and sent to the Editor of HANSARD within two weeks of receipt of the uncorrected copy.

---

**Contents of Proceedings :**

**Final set of manuscripts Received from Parliament :**

**Printed copies dispatched :**

හැන්සාඩ් වාර්තා
**කොළඹ 5, පොල්හේන්ගොඩ, කිරුළපන පාර, අංක 163 දරන ස්ථානයෙහි පිහිටි රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිල දී ගත හැක.**

**මෙම හැන්සාඩ් වාර්තාව www.parliament.lk වෙබ් අඩවියෙන් බාගත හැක.**

ஹன்சாட் அறிக்கையின் பிரதிகளை
இல. 163, கிருலப்பனை வீதி, பொல்ஹேன்கொட, கொழும்பு 5இல் அமைந்துள்ள அரசாங்க தகவல் திணைக்களத்தின் அரசாங்க வெளியீடுகள் அலுவலகத்தில் பணம் செலுத்திப் பெற்றுக்கொள்ளலாம்.

இந்த ஹன்சாட் அறிக்கையை www.parliament.lk எனும் இணையத்தளத்திலிருந்து பதிவிறக்கம் செய்ய முடியும்.

Hansard Reports can be purchased from the Government Publications Bureau
at the Department of Government Information,
No. 163, Kirulapone Avenue, Polhengoda, Colombo 5.

This Hansard Report can be downloaded from
www.parliament.lk

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.